ISSN 1927-5218 Dasatha(Print)
ISSN 1927-5226 Dasatha(Online)
Tel: 416 822 2789
dasathainfo@gmail.com
www.dasatha.com

# දසත Dasatha

සතුට. විනෝදය. දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

Beyond Your Expectations
For ALL Your Real Estate Needs
Gamini Abeysinghe
Sales Representative

The Diamond Realty Inc
Tel: 416 822 2789
www.gaminiabeysinghe.com

Pages 52 DECEMBER 2018 Issue : 108 මාසික සංග්‍රහය 2018 දෙසැම්බර්, 108 කලාපය $ 1.00




මෙවර නත්තල වෙනුවෙන් කැනඩාවේ නිර්මාණය කළ උසම නත්තල් ගස ලෙස සැලකෙන්නේ ටොරොන්ටෝ CF Eaton Centre හි ප්‍රදර්ශනය කෙරෙන මෙම නත්තල් ගසයි. මෙහි උස අඩි 108 ක් බව සඳහන් වේ.

# ඔසාවා GM අවසන් !

ජෙනරල් මෝටර්ස් සමාගමට අයත් ඔසාවා හි පිහිටි මෝටර් රථ එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව 2019 දී වසා දැමීමට තීරණය කොට ඇති බව එම සමාගම පසුගියදා නිවේදනය කරන ලදී.

GM සමාගම විසින් ගත් මෙම ක්‍රියාමාර්ගය නිසා එම සමාගමේ සේවය කරන සේවක සේවිකාවන් 2,500 ක් පමණ රැකියා අහිමි වීමේ අවදානමට මුහුණ පා සිටී.

මේ පිළිබඳව අදහස් දැක්වූ ඔසාවා නගරාධිපතිවරයා පැවසුවේ GM කර්මාන්ත ශාලාව වසා දැමීමේ පුවත තමාව දැඩි ලෙස කම්පනයට පත් කළ බවත් එය සිහිනයක් පමණක්ම වේවා යන්න තම ප්‍රාර්ථනාව බවත්ය.

ඔසාවා කර්මාන්ත ශාලාව වසා දැමීමේ තීරණය පිළිබඳව තමාද දැඩි කණස්සල්ලට පත්ව සිටින බව ට්විටර් පණිවිඩයක් නිකුත් කරමින් අගමැති ට්‍රෘඩෝ පවසා තිබුණි. මෙම වාහන එකලස් කිරීමේ මධ්‍යස්ථානයෙහි සේවකයින් පරම්පරා ගණනාවක සිට මෙහිම සේවය කර ඇති බවත් දැන් එය ඔවුන්ගේ ආත්මයේ කොටසක් බවට පත්ව ඇති බවත් ට්‍රෘඩෝ පවසයි. කෙසේ වෙතත් මෙම පුවතින් පීඩාවට පත් පවුල්වලට නැවතත් දෙපයින් නැගී සිටීමට අවශ්‍ය සියලු උපකාර කිරීමට කැනේඩියානු රජය පියවර ගන්නා බවටද ට්‍රෘඩෝ සිය ට්විටර් පණිවිඩයෙන් ප්‍රතිඥා දී තිබුණි.

ලොව මෝටර් රථ නිෂ්පාදන සමාගම් අතර දැවැන්තයකු ලෙසත් ඇමරිකාවේ විශාලතම මෝටර් රථ නිෂ්පාදකයා ලෙසත් කටයුතු කරන ජෙනරල් මෝටර්ස් සමාගම 1908 සැප්තැම්බර් 16 වන දින පළමු වරට සිය නිෂ්පාදන කටයුතු අරඹා ඇත. ඉන් වසර කීපයකට පසු එනම් 1953 දී එම සමාගම ඔසාවා නගරයේ වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව ආරම්භ කළ අතර එය මෙතෙක් කලක් කැනඩාවේ ජෙනරල් මෝටර්ස් මූලස්ථානය ලෙස පැවතුණි. මුල් කාලයේදී Pontiac, Chevrolet, Buick වැනි රථවාහන මාදිලි නිපදවනු ලැබූ මෙහි වර්තමානයේදී Cadillac XTS, Chevrolet Impala, Chevrolet Silverado, GMC Sierra යන රථ මාදිලි නිපදවති.

කර්මාන්ත ශාලාව වසා දැමීමෙන් පසු මෙම නිෂ්පාදන ක්‍රියාවලිය සිදුවන ආකාරය පිළිබඳව කරන ලද විමසුමකදී එහි ප්‍රධානියකු පවසා ඇත්තේ, තවදුරටත් ඔසාවාහිදී ඉහත නිෂ්පාදන සිදු නොවන බවයි. එම ඇතැම් රථ GM සමාගම විසින් නිපදවීම සම්පූර්ණයෙන්ම නවතා දැමීමට තීරණය කර ඇති බවද ඔහු පැවසීය. ඊට අමතරව ඔසාවාහි GM කර්මාන්ත ශාලාවේ සිදුකරන අනිකුත් සියලුම මෙහෙයුම් කටයුතු 2019 අවසානය වන විට නවතා දමන බවද ඔහු සඳහන් කළේය. එසේම GM සමාගම නව ලොවට සරිලන කාර්යක්ෂම මෝටර් රථ (ඉලෙක්ට්‍රික් සහ ස්වයංක්‍රීය මෝටර් රථ වැනි) නිර්මාණයන්ට ප්‍රමුඛත්වය දීමට සැලසුම් කර ඇති නිසා ඉදිරියේදී ඔසාවා කර්මාන්ත ශාලාව තුළ නිපදවෙන සාමාන්‍ය මාදිලියේ මෝටර් රථවලට ඉල්ලුමක් නොලැබෙන තත්ත්වයකට පත්විය හැකි බව එම ප්‍රධානියා පවසා සිටී.

ජෙනරල් මෝටර්ස් සමස්ත ව්‍යාපාරික කාර්ය සාධනය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ගනු ලබන මූලික පියවරක් වශයෙන් උතුරු ඇමරිකාවේ පිහිටි GM අතිරික්ත කර්මාන්ත ශාලා වසා දැමීමට පියවර ගනිමින් සිටින බව මේ පිළිබඳව අදහස් දක්වන GM ප්‍රධාන මධ්‍යස්ථානය පවසයි. එහිදී ඔසාවා කර්මාන්ත ශාලාවට අමතරව එක්සත් ජනපදයෙහි Detroit, Warren-Ohio, White Marsh-Maryland, සහ Warren-Michigan යන පළාත්වල පිහිටි කර්මාන්ත ශාලා හතරක් වසා දැමීමට ඔවුන් තීරණය කොට ඇත. මෙම කප්පාදුව මගින් නිෂ්පාදන කාර්ය මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීමටත් නිෂ්පාදන ධාරිතාව නව ලොවට ගැළපෙන ලෙස සිදු කිරීමටත්, වැටුප් ලබන සේවක සංඛ්‍යාව අඩු කිරීමටත් GM බලාපොරොත්තු වේ. මෙම කර්මාන්ත ශාලා වසා දැමීම නිසා 2020 අවසානය වන විට ජෙනරල් මෝටර්ස් සමාගමට ඩොලර් බිලියන 6 ක් ඉතිරිකර ගත හැකි වන බව ඔවුන් පෙන්වා දේ. ඒ නිසා GM ගත් මෙම ක්‍රියාමාර්ගය සමාගමේ අභිවෘද්ධිය වෙනුවෙන් කරන ලද ඉතාමත් හොඳ ආයෝජනයක් බවත් එයින් වඩාත් ප්‍රශස්ත සහ ලාභදායී නිෂ්පාදන ක්‍රියාවලියක් සිදුකිරීමට හැකියාව ලැබෙන බවත් ජෙනරල් මෝටර්ස් ප්‍රධානීහු පවසති. සමාගම විසින් ගත් මෙම පියවර සම්බන්ධයෙන් මාධ්‍ය වෙත අදහස් දැක්වූ එහි ප්‍රධාන විධායක නිලධාරිනී (CEO) Mary Barra පැවසුවේ තම සමාගම ප්‍රතිව්‍යුහගත කිරීමේ පියවර යටතේ ඉදිරියේදී GM මගින් රැකියා සඳහා

8 වන පිටුව බලන්න

CHAI
CANADIAN HOME APPRAISALS INC.

S.K.Bales CRA ,DAR, MVA Residential,FRI,CRES.
President
Bus: 416-438-2200
Cell: 416-801-3219
Email: skbales@hotmail.com
If you need a accurate and speedy appraisal for Street Capital "A" side or "B" side, Genworth Canada, CMLS Financial, Industrial Alliance, ICICI Bank, IC Savings, Equity Credit Union, Most Private Lenders, Canada Revenue Agency (CRA) and Legal and Listing Purpose you can order via our website WWW.CHAINC.CA or please contact


ඔබ සැමට
සාමය සතුට පිරි
සුභ නත්තලක් වේවා....
ගාමිණී අබේසිංහ
Gamini Abeysinghe
The Diamond Realty Inc Brokerage
දසත Dasatha

## වංචාකරුවන්ට ගොදුරු වෙන වැඩිහිටියෝ

ජ්‍යෙෂ්ඨයන් (seniors) තනිව සිටින නිවෙස් වෙත දුරකථන ඇමතුම් ලබා දී ඔවුන්ගෙ න්ම තොරතුරු ලබාගෙන එම නිවෙස්වලට ගොස් සොරකම් සිදුකළ අවස්ථා කීපයක් පිළිබඳව පසුගියදා ටොරොන්ටෝවෙන් වාර්තා වී ඇත. ස්කාබරෝ ඇතුළු පළාත් කීපයකින් මෙවැනි වංචා සම්බන්ධ පැමිණිලි පොලිසිය වෙත ලැබී ඇති අතර ටොරොන්ටෝ පොලිසිය ඒ පිළිබඳව අවධානයෙන් පසුවන ලෙස මහජනතාවට පවසා සිටී.

මෙම වංචාකරුවන්ට හසු වූ එක් වැඩිහිටි කාන්තාවක් පවසා ඇත්තේ, ඇයගේ ජල තාපකය (water heater) පරීක්ෂා කරන මුවාවෙන් එම පුද්ගලයින් ඇගේ නිවසට පැමිණ ඇති බවයි. පළමුවෙන්ම ජල තාපකය පරීක්ෂා කිරීමට පැමිණිය යුතු බව කියා දුරකථන ඇමතුමක් ලැබී ඇති අතර එහිදී ඇය එම පුද්ගලයාගේ පැමිණීම ප්‍රතික්ෂේප කර ඇත. නමුත් එසේ ප්‍රතික්ෂේප කිරීමෙන් පළාත් රජය විසින් ඇයට ඩොලර් 1000 ක දඩයක් ගැසිය හැකි යැයි එම කාන්තාව බිය ගැන්වීමට එම වංචාකරුවා කටයුතු කර ඇත. අවසානයේ නිවෙසට පැමිණෙන ලෙස ඇය ඔවුන්ට අවසර දී ඇත. පසුවදා සවස 4 ට පමණ පුද්ගලයින් දෙදෙනෙකු පැමිණ බේස්මන්ට් කොටසට ගොස් ජල තාපකය පරීක්ෂා කොට furnace යට අලුත් ෆිල්ටරයක්ද සවිකොට ඇත. පසුව තවත් වැඩිදුර පරීක්ෂාවක් සඳහා නිවසේ ඇටික් කොටසට යෑමට අවශ්‍ය බව එක් අයෙකු විසින් පවසා ඇති අතර පසුව ඔහු තනිවම එම නිවසේ උඩුමහලට ගොස් ඇත.

මෙම පුද්ගලයින් නිවසින් පිටව ගොස් මඳ වේලාවකින් නිවසේ තිබූ මුදල් සහ වෙනත් වටිනා දෑ අතුරුදහන්ව ඇති බව හෙළිදරව් වී ඇත.

පසුගිය කාලයේදී වරින් වර මෙවැනි සිදුවීම් පිළිබඳව පොලිසිය වෙත වාර්තා වී ඇති අතර මෙසේ දුරකථන මගින් දැනුම් දී පැමිණෙන නොහඳුනන පුද්ගලයින් පිළිබඳව පරීක්ෂාකාරී වන ලෙස පොලිසිය මහජනයාගෙන් ඉල්ලා සිටී. විශේෂයෙන්ම යම් කිසි නොදන්නා කරුණක් පිළිබඳව යම් අයෙකු ඔබව බිය ගන්වන්නේ නම් ඒ සම්බන්ධව ඔබ හොඳින් දන්නා හඳුනන අයෙකුට පවසා සිටීමට හෝ අදාළ කරුණ සම්බන්ධව දැනුමක් ඇති අයෙකුගෙන් විමසා සිටීමට කටයුතු කරන ලෙස පොලිසිය පවසයි. යම් සැක කටයුතු අයෙකු යයි සිතුණහොත් වහාම පොලිසියට දැන්වීමට පියවර ගන්නා ලෙසද පොලිසිය සඳහන් කරයි.

එසේම යම් සේවාවක් හෝ ව්‍යාපාරයක් පිළිබඳව පවසමින් නිවසට පැමිණෙන පුද්ගලයින්ගේ අනන්‍යතාව ඔබ සෑහීමකට පත්වන ලෙස තහවුරු කරගන්නා තෙක් එම පුද්ගලයින් නිවෙස් තුළට නොගැනීමේ අයිතියද ඔබ සතුව පවතින්නකි. විශේෂයෙන්ම තනිව නිවෙස්වල සිටින වයසක පුද්ගලයින් මෙම වංචාකරුවන් ඉලක්ක කරන බව පෙනී ගොස් ඇති අතර කිසිදු විටෙක ඔබ තනිව සිටින අවස්ථාවක නිවෙස තුළට පිටස්තරයින් ඇතුළු කරගැනීමෙන් වැළකී සිටීම සුදුසු වේ.

දුරකථන, ජල තාපක, උණුසුම්කරණ යන්ත්‍ර වැනි ජනතාවට අත්‍යවශ්‍ය සේවාවන් සිදුකිරීමට යැයි පවසමින්ද කැනඩා ආදායම් බදු ඒජන්සිය (CRA), නිවාස උගස් ණය ආයතනය, බැංකුව ආදි ලෙස පවසමින් එම සේවාවන් පිළිබඳව ජනතාව බිය ගන්වමින් ලබාදෙන විවිධ දුරකථන ඇමතුම්වලින් සිදුකරන වංචාවන් රැසක් පිළිබඳව මේ දිනවල පොලිසිය ඇතුළු අදාළ අංශ විශේෂ පරීක්ෂණ සිදුකරමින් පවතී. ඒවා අවම කර ගැනීමට ජනතාවගේ සහයෝගයද අත්‍යවශ්‍ය බව පොලිස් මූලස්ථානය පවසයි. ඔබත් මේ ආකාරයේ දුරකථන ඇමතුම්වලින් පීඩාවට පත්ව සිටී නම් යම් පුද්ගලයින් පිළිබඳ සැකයක් පවතී නම් එම පැමිණිලි Toronto police or Crime Stoppers අංශය වෙත දැනුම් දීමට පියවර ගන්න.

## බීමත් රියදුරන්ට දැඩි නීති

බීමතින් රිය පැදවීම නිසා සිදුවන රථ වාහන අනතුරු සංඛ්‍යාව ඉතාමත් අධික වී ඇති බව දිනපතා පළවන මාධ්‍ය වාර්තා දෙස බැලීමේදී පෙනී යයි. මේ පිළිබඳව සිදුකරන ලද සමීක්ෂණයකදී හෙළි වී ඇත්තේ සෑම කැනේඩියානුවන් හතර දෙනකුගෙන් එක් අයෙකු බීමතින් රිය පදවා හසු වී ඇති බවයි.

අධික මත්පැන් පානය කොට නොසැලකිලිමත්ව රිය පැදවීමෙන් වටිනා ජීවිත රැසක් රටට අහිමි වී ඇති අතර තවත් දහස් ගණනක් සදාකාලික ආබාධිත තත්ත්වයන්ට ගොදුරුව සිටී. කැනඩාවෙහි රථ වාහන පැදවීම සහ මධ්‍යසාර භාවිතය සම්බන්ධයෙන් දැඩි නීති රෙගුලාසි පැවතියද ඒවා අනුග මනය නොකරන්නෝ බොහෝය. මෙරට රියදුරන් සඳහා පවතින මධ්‍යසාර නීතිරීතිවලට අනුව රුධිර මිලිලීටර 100 ක අඩංගු විය හැකි මධ්‍යසාර සාන්ද්‍රණය ලෙස සටහන්ව ඇත්තේ මිලිග්‍රෑම් 80 කි. ඒද එම රියදුරා පූර්ණ රියදුරු බලපත්‍ර ලාභියෙකු (fully licensed driver) නම් පමණි. යම් හෙයකින් මෙම සීමාව ඉක්මවා රුධිරයේ මධ්‍යසාර සාන්ද්‍රණය ඉහළ ගොස් ඇත්නම් එම රියදුරා සාපරාධී වරදකරුවකු ලෙස දඬුවම් ලැබීම්වලට ලක්වේ. මෙහිදී ක්‍රියාත්මක වන නීති ඔබ ජීවත් වන පළාතට හෝ ප්‍රදේශයට අනුව වෙනස් වේ. මේ වසරේ ඔක්තෝබර් 17 වෙනි දින සිට කැනඩාව තුළ මරිජුවානා නීත්‍යනුකූල කිරීමත් සමග මත්පැන් මෙන්ම මත්ද්‍රව්‍ය භාවිත කර රිය පදවන්නන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීමට රජය පියවර ගනු ලැබුණි. ඒ අනුව රියදුරන් සඳහා වඩාත් දැඩි නීති සහිත පනත් කෙටුම්පතක් C-46 නමින් පසුගිය ජූනි මාසයේදී පාර්ලිමේන්තුවේ සම්මත විය. පියවර දෙකකින් යුතුව සංශෝධනය කර ඇති මෙහි, 2018 ජූනි 21 වන දින සිට මත්ද්‍රව්‍ය ගෙන රිය පදවන්නන් සඳහා නීති බලාත්මක කෙරෙන බවත් 2018 දෙසැම්බර් 18 වෙනි දින සිට මත්පැන් පානය කර රිය පදවන්නන් සඳහා හඳුන්වා දෙන නව නීති රෙගුලාසි බලාත්මක කෙරෙන බවත් සඳහන් වී ඇත.

ඒ අනුව දෙසැම්බර් 18 සිට බලාත්මක කෙරෙන මත්පැන් පානය කළ රියදුරන් සඳහා වන නව නීතිරීතිවලට අනුව පොලිසිය මගින් නතර කරනු ලබන ඕනෑම රියදුරෙකුගෙන් සාධාරණ සැකයකින් තොරව වුවත් ශ්වසන නියැදියක් ඉල්ලීමේ බලය පොලිසියට පවතී. එහිදී මෙතෙක් බලපැවැත්වූ 'සාධාරණ සැකයකින් තොරව නියැදි ඉල්ලීමට නොහැකිය' යන කරුණ ඉදිරියේදී බල නොපවත්වයි. එසේම දඩ මුදලට වඩා කළ වරදට දඬුවම් පැමිණ වීම කෙරෙහි අවධානය යොමු කෙරෙනු ඇත.

## Romaine lettuce අවදානම

සලාද සඳහා යොදා ගන්නා කොළ වර්ග අතරින් සුලභවම ආහාරයට ගනු ලබන Romaine lettuce නම් සලාද කොළ වර්ගය මගින් E.coli O157 නම් බැක්ටීරියා ආසාදනය හටගත හැකි බව කැනේඩියානු ආහාර පරීක්ෂක ඒජන්සියත් (CFIA) කැනඩා මහජන සෞඛ්‍ය කාර්යාංශයත් (PHAC) අනතුරු අඟවා සිටී.

පසුගිය නොවැම්බර් 23 වන සිකුරාදා සෞඛ්‍ය කාර්යාංශය නිකුත් කළ නිවේදනයක සඳහන් වූයේ සතියක කාලයක් තුළ ඊ-කොලි බැක්ටීරියාවට ගොදුරු වූවන් විසි දෙදෙනෙකු (22) කැනඩාවෙහි පළාත් කීපයකින් සොයාගෙන ඇති බවයි. එම රෝගීන් අතරින් 4 ක් ඔන්ටේරියෝවෙන්ද 17 ක් කුබෙක් පළාතෙන්ද එක් අයෙකු නිව්බ්‍රවුන්ස්වික් පළාතෙන්ද වාර්තා වී තිබුණි.

මෙහිදී මෙම රෝගීන් පිළිබඳව කරන ලද පරීක්ෂණවලදී තහවුරු වී ඇත්තේ Romaine lettuce නම් සලාද කොළ වර්ගය ආහාරයට ගැනීමෙන් පසු ඔවුන් මෙම රෝගී තත්ත්වයන්ට ගොදුරු වී ඇති බවයි. එහෙත් කැනේඩියානු සෞඛ්‍ය අංශ පවසන්නේ පරීක්ෂාවට ලක් කළ රොමේන් සලාද කොළවල ඊ-කොලි බැක්ටීරියාව ඇති බවට සාධක නොතිබුණු බවයි. මේ වන විට එක්සත් ජනපදය තුළද මෙම රෝගයට ගොදුරු වූවන් 30 කට අධික සංඛ්‍යාවක් වාර්තා වී ඇත. මේ පිළිබඳව අදහස් දක්වන එක්සත් ජනපද ආහාර හා ඖෂධ පරිපාලනය (FDA) පවසන්නේ මෙම සැක සහිත Romaine lettuce වර්ගය කැලිෆෝනියාවෙන් පැමිණ ඇති බවයි.

කැනේඩියානු ආහාර පරීක්ෂණ ඒජන්සිය මෙම සලාද වර්ගය කැනඩාවේ වෙළඳපොළෙන් සම්පූර්ණයෙන් ඉවත් කිරීම (recall) සඳහා වූ නිල නිවේදනයක් මෙතෙක් නිකුත් කර නොමැති වුවත් Romaine lettuce ආහාරයට නොගන්නා ලෙස ජනතාවට දැනුම් දී ඇත. විශේෂයෙන්ම ඊ-කොලි බැක්ටීරියාව ආසාදනය වූ රෝගීන් හමු වූ ඔන්ටේරියෝ, කුබෙක් සහ නිව්බ්‍රවුන්ස්වික් යන පළාත් වාසීන් මේ පිළිබඳව වඩාත් සැලකිලිමත් විය යුතු බවත් යම් හෙයකින් ඉහත සලාද වර්ගය නිවෙස්වලට ගෙන ගොස් ඇත්නම් වහාම ඒවා විනාශ කොට එම සලාද ගබඩා කර තැබූ ශීතකරන, බහාලුම් හා රාක්ක ආදිය විෂබීජහරණය (sterilize) කරන ලෙසත් දන්වා ඇත.

E.coli බැක්ටීරියා වර්ග කිහිපයක්ම පවතින අතර මේවා බොහොමයක් හානිකර නොමැත. නමුත් මෙවර කැනඩාවෙන් සහ ඇමරිකාවෙන් වාර්තා වී ඇති ඊ.කොලි 0157 නම් බැක්ටීරියාව දරුණු ආසාදන ඇති කළ හැකි බැක්ටීරියාවක් බව සඳහන් වේ.

## Birth Tourism ඉහළ යයි

කැනඩාවේ දරු උපත් සංඛ්‍යාලේඛන දත්ත වාර්තාවලට අනුව කැනඩා පුරවැසිභාව හෝ ස්ථිර පදිංචිය රහිත කාන්තාවන් විශාල සංඛ්‍යාවක් පසුගිය වසර කීපය තුළ තම දරු ප්‍රසූතීන් කැනඩාවේ රෝහල්වල සිදුකර ඇති බව අනාවරණය වී ඇත. මෙහි වැදගත්ම කරුණ වන්නේ මෙම විදේශිකයන් සංචාරක වීසා මගින් මෙහි පැමිණීමයි.

සැලසුම් සහගතව සිදුවන මෙම ක්‍රියාව 'උපත් සංචාරක ව්‍යාපාරය' නැතහොත් birth tourism ලෙස හඳුන්වනු ලබයි. උපදින සෑම දරුවෙක් සඳහාම ස්වයංක්‍රීයව පුරවැසි භාවය ලැබෙන ලොව ධනවත් රටවල් රැසක මෙම සංචාරක උපත් ව්‍යාපාරය පැතිර පවතී. ඒ අතරින් කැනඩාව ප්‍රධාන තැනක් ගන්නා බව ඒ පිළිබඳව සිදුකර ඇති සමීක්ෂණ වාර්තාවක සඳහන් වේ.

කැනේඩියානු සෞඛ්‍ය තොරතුරු සඳහා වන ආයතනය (CIHI) මේ සම්බන්ධයෙන් වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් කරගෙන ඇත. මෙම කණ්ඩායම එම දරු උපත් පිළිබඳව ඉතාමත් සූක්ෂ්මව විශ්ලේෂණය කොට ඇති අතර 2016 වසරේදී පමණක් විදේශීය කාන්තාවන් 3,200 ක් පමණ දරුවන් ප්‍රසූත කර ඇති බව එහිදී හෙළි වී ඇත. මෙම සමීක්ෂණ දත්ත එකතු කිරීම සඳහා කියුබෙක් පළාත හැර කැනඩාවේ සෙසු සියලුම පළාත් යොදා ගැනීමට මෙම පර්යේෂකයින් කටයුතු යොදා තිබුණි.

මෙම පර්යේෂණ තොරතුරු අදාළ කොටගෙන එම කණ්ඩායමේ Andrew Griffith විසින් ලියූ Policy Options නමැති ලිපිය පසුගිය දා රාජ්‍ය ප්‍රතිපත්ති සහ පර්යේෂණ ආයතනය විසින් ප්‍රකාශයට පත් කරන ලද අතර එහි එක් තැනක මෙසේ සඳහන් වේ. 'ඉංග්‍රිසි කැනඩාව තුළ සිදුවන සමස්ත සජීවි දරු උපත්වලින් සියයට 1 කට වැඩි ප්‍රතිශතයක් මෙහි සංචාරය සඳහා පැමිණෙන විදේශී කාන්තාවන් විසින් සිදුකරන දරු ප්‍රසූතීන් වේ' ඉහත ප්‍රකාශය මගින් මෙහි ඇති බලපෑම කෙතෙක්ද යන්න ඕනෑම අයෙකුට පැහැදිලි වනු ඇත.

කැනඩාවේ සමාජ සුභසාධන පද්ධතිය උල්ලංඝනය කරමින් සිදුකරන මෙම උපත් සංචාරක ව්‍යාපාරය අනාගතයේදී විශාල ගැටලු ගෙන එන්නක් විය හැකි නිසා එය නතර කිරීමට ශක්තිමත් ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි මේ වන විට ෆෙඩරල් රජයේ අවධානය යොමු වී තිබේ. ඒ සඳහා පසුගියදා ලිබරල් පාර්ලිමේන්තු මන්ත්‍රී Joe Peschisolido විසින් ඔටාවා පාර්ලිමේන්තුව වෙත පෙත්සමක්ද ඉදිරිපත් කොට තිබුණි. උපත් සංචාරක ව්‍යාපාරය පිළිබඳ අදහස් දක්වන ආගමන විගමන අමාත්‍ය අහමඩ් හුසේන් පවසන්නේ මෙය ප්‍රවේසමෙන් මර්ධනය කළ යුතු කාර්යයක් බවයි. එහි අභ්‍යන්තරයේ පවතින තත්ත්වයන් පිළිබඳ පැහැදිලි රූපයක් ඇති කරගෙන ඊට අවශ්‍ය පියවර ගත යුත්තේ කෙසේදැයි අධ්‍යයනය කිරීම සඳහා යම් කාලයක් අවශ්‍ය බවත් ඒ සඳහා මේ දිනවල සොයා බැලීම් සිදුකරන බවත් ඔහු පවසයි. වර්තමානයේ කැනඩාවේ පවතින ආගමන විගමන නීති රීතිවලට අනුව රාජ්‍ය තාන්ත්‍රික සේවයේ (foreign diplomats) නියුතු වන්නන්ට උපදින දරුවන් හැර කැනඩා පොළොවේ උපදින අන් සෑම දරුවෙකුටම ස්වයංක්‍රියවම මෙහි පුරවැසිභාවය හිමි වීමේ අයිතිය පවතී. කැනඩාවේ පවතින මෙවැනි ආගමන නීතීන් ආරක්ෂා කර ගැනීමට නිරතුරුව කටයුතු කරන ලිබරලුන් මෙම ප්‍රශ්නයේදී ගන්නා පියවර පිළිබඳව පාර්ලිමේන්තුව තුළද නොයෙක් ආකාරයේ වාද විවාද පවතී.

මේ සම්බන්ධයෙන් කොන්සර්වේටිව් පක්ෂයේ ස්ථාවරය වන්නේ විදේශිකයන්ට උපදින දරුවන්ට කැනේඩියානු පුරවැසිභාවය ලබා නොදිය යුතු බවයි. කැනඩාවේ උපත ලබන දරුවන්ගේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ කැනේඩියානු පුරවැසියකු (Canadian citizen) හෝ කැනඩාවේ ස්ථිර පදිංචිකරුවකු (permanent resident of Canada) වෙතොත් පමණක් එම දරුවන් කැනේඩියානු පුරවැසියන් ලෙස භාරගැනීම කළ යුතු බව කොන්සර්වේටිව් අදහසයි.



# නත්තල් පුරාණය හා ඓතිහාසික පර්යේෂණ

■ ඩී. අමරසිරි වීරරත්න

බයිබලයේ අලුත් ගිවිසුම පටන්ගන්නේ ජේසුතුමාගේ උප්පත්තිය පිළිබඳ කතාවෙනි. ජේසු උපතේ විස්තර මතෙව් හා ලියුක් යන ශුභාරංචි ලේඛකයින් දක්වා තිබේ. සෑම නත්තල් දිනක් පාසාම අපි මේ විස්තර අසා හෝ කියවා ඇත්තෙමු. බෙත්ලෙහෙම් නගරය, හෙරඩ් රජතුමා හා අගොස්තීනු රෝම අධිරාජයා තමාට යටත් රටවල ජන සංගණනයක් පැවැත්විය යුතු යැයි දුන් නියෝගය මේ විස්තරවලට ඇතුළත් වේ. අප්‍රකට නගරයක් වූ බෙත්ලෙහෙම දැන් සුප්‍රසිද්ධ වන්දනාකරුවන්ගේ සිද්ධස්ථානයක් බවට පත් වී ඇත. බයිබලයේ සඳහන් ජේසු උපතේ කතාව නත්තල් සමයේ බැතිමතුන්ට ඇසෙන සේ කියා දෙනු ලැබේ. ඒ බයිබල් පුවත දේවානුභාවයෙන් ලියන ලද 'දේව වචන' ලෙස බැතිමත්හු විශ්වාස කරති.

මේ උප්පත්ති කතාව බයිබල් ශුභාරංචි සතරේම දක්නට නැත. ඇත්තේ දෙකක පමණි. එනම් මතෙව් හා ලියුක්ගේ ශුභාරංචිවල පමණය. මාර්ක් උප්පත්ති කතාව මග හැර සිය ලියවිල්ල පටන්ගන්නේ ජේසුතුමා ජෝර්දාන් නදියේ බවුතීස්ම කිරීමේ පුවතිනි. යොහාන්ද උත්පත්ති කතාව මග හැර තිබේ. මතෙව් සිය ශුභාරංචියේ ජේසු උපත සිදුවූයේ හෙරඩ් රජුගේ අවසාන කාලයේ බව සඳහන් කරයි. එය සිදුවූයේ බෙත්ලෙහෙම් නගරයේ බව පවසයි. තවද ඒ දවස්වල රෝම අධිරාජ අගොස්තීනු සීසර්ගේ අණ පරිදි ජන සංගණනයක් පැවැත් වූ බවද පවසයි. මේ ජන සංගණනය පවත්වන ලද්දේ රෝම ආණ්ඩුකාර ක්විරිනියස් සිරියාව පාලනය කළ සමයේ බව හේ දක්වා තිබේ.

## ඓතිහාසික කරුණු

හෙරඩ් රජු, ක්විරිනියස් ආණ්ඩුකාරයා, අගොස්තීනු සීසර් රෝම අධිරාජයා හා එතුමා අණ කළැයි කියන ජන සංගණනය රෝම ඉතිහාසයට සම්බන්ධ කරුණුය. මේවාවල සත්‍ය හෝ අසත්‍යතාව රෝම ඉතිහාසය, රෝම ශිලා ලිපි, රෝම කාසි ආදියෙන් පුරා විදුදරයින්ට සනාථ කරගත හැකිය. මේ අනුසාරයේ ජේසු උපත පිළිබඳ කතාවේ සත්‍යතාව ඉතිහාසඥයින්ට හා පුරාවිද්‍යාඥයින්ට උරගා බැලීමට හැකි වී තිබේ. නාසරත් නම් නගරයක් තිබූ බවද ජේසුතුමා එකල විසූ ඓතිහාසික පුරුෂයෙක් බවද මෙ නයින් පිළිගත හැකි බව විද්වතුන්ගේ අදහසයි.

එහෙත් ප්‍රශ්නය වන්නේ ජේසුතුමා උපන්නේ කවදාද, කොතැනකද යනාදී කරුණු ශුභාරංචි ලේඛකයින් නිවැරදිව දැන සිටියේද යන වගයි. මේ ගැටලු පැනනගින්නේ එක් කරුණක් කේන්ද්‍ර කොටයි. ක්‍රි. ව. 75 වැනි වර්ෂයේදී පමණ ජොසෙපස් නමැති යුදෙව් පඬිවරයෙක් යුදෙව් වර්ගයාගේ ඉතිහාසය දක්වන ග්‍රන්ථයක් ලියා තිබේ. එහි සඳහන් අයුරු ක්විරිනියාස් නමැති රෝම ආණ්ඩුකාරවරයා ක්‍රි. ව. 6 දී සිරියාව පාලනය කරමින් එතෙක් ස්වාධීනව තිබූ ජුඩියා ප්‍රාන්තයද ඈඳා ගත්තේය. එතැන් සිට එම ප්‍රාන්තයද රෝම අධිරාජ්‍යයට යටත් විය. මේ ඓතිහාසික කරුණ සඳහන් වීම නිසා ජොසෙපස්ගේ ඉතිහාසය කෘතිය ඉතා වැදගත් වන්නේය.

## හෙරඩ් හා ක්විරිනියස්

ලියුක්ගේ ශුභාරංචියෙන් අවුල් සහගත ගැටලුවක් ඉස්මතු වේ. හෙතෙම ජේසු උපත හෙරඩ් රජුගේ රාජ්‍ය කාලයටත් ක්විරිනියස්ගේ පාලන කාලයටත් අයත් අවධියක සිදුවූ බව සඳහන් කරයි. එහෙත් ක්විරීනියස් සිරියාවේ ආණ්ඩුකාර ධූරයට පත් වූයේ ජේසුතුමාගේ මරණින් පසු වර්ෂ 6 ක් ගත වූ පසුවය. ඒ වනවිට හෙරඩ් රජු මිය ගොසින්ය. ලියුක්ගේ ශුභාරංචිය අනුව හෙරඩ් රජු රෝම ආණ්ඩුකාර ක්විරිනියස් සමකාලීනයෝය.

එහෙත් ඔවුන්ගේ ජීවිත අතර වර්ෂ 10 ක පරතරයක් තිබුණේය. හෙරඩ් රජතුමා රෝමයට කප්පම් ගෙවන යුදෙව් රජෙක් ලෙස ජීවත්ව සිට චන්ද්‍රග්‍රහණයකින් පසු සතියක් පමණ කාලයක් ගතවීමෙන් පසු මියගිය බව ජොසෙපස් සඳහන් කරයි. මේ චන්ද්‍රග්‍රහණය සිදුවූයේ ක්‍රි.පූ. 4 වැනි වර්ෂයේ මාර්තු 12 වැනි දින බව තාරකා විද්‍යාඥයින් ගණන් බලා තිබේ. එම නිසා හෙරඩ් රජු හා රෝම ආණ්ඩුකාර ක්විරීනියස් සමකාලීනයන් නොවේ.

ඔවුන්ගේ ජීවිත කාලය අතර වර්ෂ 10 ක පමණ පරතරයක් තිබේ. මහ හෙරඩ් රජුගේ මරණින් පසු ඔහුගේ රාජ්‍ය වූ ජුඩියා ප්‍රාන්තය ඔහුගේ පුතුන් දෙදෙනකු අතර බෙදා වෙන්කර දෙන ලදී. එම පුතුන්ගෙන් හෙරඩ් ඇන්ටිපාස් නමැත්තා ක්‍රි.ව. 39 වන තෙක් ජුඩියාව පාලනය කළේය. ඉන්පසු එම රාජ්‍යය රෝම පාලනයට යටත් කර ක්විරිනියස්ට භාර දෙන ලදී. එහෙත් ලියුක් ශුභාරංචිකරු එතුමාගේ 3.1 යන බයිබල් පාඨයේ ජේසු උපත මහ හෙරඩ් රජුගේ රාජ්‍ය කාලයේ සිදුවූ බව සඳහන් කර තිබේ.

## ජන සංගණනය

මතෙව්ගේ ශුභාරංචිය පටන්ගන්නේ හෙරඩ් රජු විසින් බෙත්ලෙහෙමේ කුඩා බිළිඳුන් මරාදැමීමේ ප්‍රවෘත්තියෙනි. මේ ළදරු ඝාතනය වැළැක්වීම සඳහා මරියතුමී හා ජොශප් යන දෙදෙනා ජේසූ බිළිඳා රැගෙන මිසර දේශයට පළා ගිය බව හේ සඳහන් කරයි. එම නිසා හෙරඩ් රජු හා ක්විරිනියස් රෝම පාලකයා සමකාලීන යන බව ලියුක් සිතා සිටිය බව ගම්‍යවේ. එහෙත් ඔවුන් දෙදෙනා අතර වර්ෂ 10 ක පරතරයක් තිබූ බව ඓතිහාසික පර්යේෂණ මගින් හෙළිදරව් වී තිබේ. මේ වැරදි කාල නිර්ණය නිසා පටලැවිලි සහිත ගැටලු ඉස්මතු වන්නේය. ලියුක්ගේ ශුභාරංචියේ උප්පත්ති කතාව පාදකවන්නේ එක් කරුණක් මතය. එනම් අගොස්තීනු සීසර් රෝම අධිරාජයා හෙරඩ් රජු ජුඩියා ප්‍රාන්තයේ රාජ්‍ය කරන සමයේ 'මුළු ලොවම' සංගණනය කිරීමට නියෝග කළ බවය.

අගොස්තීනු සීසර් එකල රෝම අධිරාජයා වූ බව ඓතිහාසික සත්‍යයි. ජේසු උපත සිදුවූයේ හෙරඩ් රජුගේ රාජ්‍ය කාලයේ නම් එකල යුදෙව්වරුන් රජ වූ හෙරඩ්ගේ යටත් වැසියෝය. හෙරඩ් රෝම අධිරාජයාට කප්පම් ගෙවූ යුදෙව් පාලකයෙකි. ඔහු පාලනය කළ ජුඩියා ප්‍රාන්තය පාලනය වූයේ හෙරඩ්ගේ යුදෙව් නීති අනුව මිස රෝම අධිරාජ්‍යයේ බලපෑ රෝම නීතිවලින් නොවේ. අයබදු ගැනීම සඳහා තම රටේ සංගණනය පැවැත්වීම හෙරඩ් රජුට අයත් කාර්යයක් මිස රෝමවරුන්ට අයත් කාර්යයක් නොවිණි. හෙරඩ් රජුගේ රාජ්‍ය කාලයේ රෝම අධිරාජයාගේ නියෝග මත ජුඩියාවේ ජන සංගණන පැවැත්වූවේ යැයි කීම සිදුවිය නොහැකි මිථ්‍යා ප්‍රබන්ධයකි.

## සාක්ෂි නැත

රෝම අධිරාජ අගොස්තීනු සීසර් 'මුළු ලොවම සංගණනය කිරීම' සඳහා නියෝග පැනවූ බව රෝම ඉතිහාසයෙන් සාක්ෂියක් නොලැබේ. රෝම පාලකවරු තමන්ට කප්පම් ගෙවන රාජ්‍යවල එදිනෙදා පාලනය හෝ සංගණන පැවැත්වීම නොකළහ. ඒ රාජකාරි ඔවුන් තමාට යටත් කප්පම් ගෙවන රජවරුන්ටම පවරා තිබුණි. රෝම පාලක රජවරුන්ගේ ජන සංගණන වාර්තා, ශිලා ලිපි, කාසි හා ලේඛනගත වාර්තා අදත් ඉතිහාසඥයින්ට පරීක්ෂා කර බැලිය හැකිය. මේ කිසිවකින් ශුභාරංචිවල සඳහන් ජන සංගණනය පිළිබඳ කිසිම සාක්ෂියක් නොලැබේ. එහෙත් ක්‍රි.ව. 6 දී අගොස්තීනු සීසර් තම රට රෝමන්වරුන්ගෙන් අලුත් බද්දක් අය කළ බව නම් සඳහන්ය. මෙය ඔහුගේ විදේශීය යුද වියදම් පියවා ගැනීමට සිදුකර තිබේ. මෙය යුදෙව්වරුන්ට බලපෑවේ නැත.

ක්‍රි. ව. 6 වන වර්ෂයේදී ජුඩියා ප්‍රාන්තයේ හෙරඩ් රජවරුන්ගේ පාලනය අවසන් විය. එය රෝමන්වරුන්ගේ යටතට පත්විය. ඔවුහු එය ක්විරිනියස් රෝම ආණ්ඩුකාරයාගේ භාරයට පැවරූහ. එවිට එම ප්‍රාන්තයේ නිසි ලෙස අයබදු අයකර ගැනීම සඳහා ක්විරිනියස් ජන සංගණනයක් පැවැත් වූ බව යුදෙව් ඉතිහාසඥ ජොසපස් ඔහුගේ කෘතිවල සඳහන් කර තිබේ. මේ සංගණනයට හා එමගින් පනවන ලද අයබදුවලට යුදෙව්වන් විරෝධය පෑ බවද හෙතෙම දක්වා තිබේ.

ක්‍රි.ව. 6 වන විට ගලීලය රෝමන්වරු යටත් කරගෙන තිබුණේ නැත. ජුඩියාව නම් යටත්ව තිබුණි. එබැවින් ගලීලයේ ජන සංගණනයක් පැවැත්වීම රෝමවරුන්ට කළ හැකි කාර්යයක් නොවීය. ගලීලයේ පාලකයා හෙරඩ් රජුගේ පුතකු බව යුදෙව් ඉතිහාස පොත්වලින්ද එම රජුගේ කාසි වලින්ද අපි දනිමු. මරියාතුමී හා ජෝසප් ගලීලයේ නාසරත් නුවර පදිංචිකරුවන් වූ බැවින් ඔවුන්ට රෝම ජන සංගණනයක් සඳහා නාසරත් සිට බෙත්ලිහමට ගමන් කිරීමට අවශ්‍යතාවක් නොවීය. එසේ යන්ට සිදු වූ බව කීම ප්‍රබන්ධ කතාවකි. රෝමවරු ජනසංගණන ගත්තේ මිනිසුන්ගේ පදිංචි ගම් හෝ නගරවලය. මක්නිසාද ඔවුන්ට අයත් ඉඩකඩම් හා ආදායම් මාර්ග ගණන්ගෙන එය අනුව ඔවුන්ගෙන් අය බදු අය කරගැනීමටය. තමන්ට ඉඩකඩම් හා ඥාතීන් බෙත්ලෙහෙමේ නොතිබුණි. ඔවුන්ට නවාතැන් ගැනීමට පවා සිදුවූයේ ගවගාලකය. එබැවින් මේ ශුභාරංචි පුවත අමූලික ප්‍රබන්ධයකි.

## වැරදිවලට හේතුව

ලියුක් විසින් දක්වන වැරදි හා පරස්පර විරෝධී පුවත් සිදුවූයේ කෙසේද? ආදි කිතුනුවෝ ජේසු උපන්නේ කවදාද කොතැනකද යනාදී කරුණු නොදැන සිටියහ. ඔවුන් සැලකිලිමත් වූයේ ජේසු උපත ගැන නොව මරණය ගැනය.

ජේසුතුමා යුදෙව් වර්ගයා බලාපොරොත්තුවෙන් සිටි විමුක්තිදායකයා නම් පෙර අනාවැකි අනුව එතුමා දාවිත් රජුගේ පරම්පරාවෙන් පැමිණිය යුතුයි. දාවිත් රජුගේ උපන්ගම වන බෙත්ලිහම් නගරයේම ඉපදිය යුතුය. එබැවින් ඔවුන් ජේසු උපත පිළිබඳ කතාව ලියා ඇත්තේ යුදෙව් ගැලවුම්කාරයා පිළිබඳ අනාවැකිවලට ගැලපෙන ආකාරයෙනි.

මයිකා 5.2 යන බයිබල් පාඨයේ අනාවැකිය මෙසේය.

'එම්බා බෙත්ලෙහෙම් නගරය... ඔබ තුළ උපදින පුද්ගලයා අනාගත ඉස්රායලයේ රජු වන්නේය.'

මේ කරුණු සලකා බැලීමෙන් ශුභාරංචිවල සඳහන් ජේසු උප්පත්ති කතාව කරුණු හරිහැටි නොදැන සිටියවුන් තමාට අභිමත පරිදි පෙර අනාවැකි බලා ඒවා ඉටුවීම දැක්වීමට ශුභාරංචි ලියා ඇත්තේ ජේසුතුමාගේ මරණින් පසු වසර සීයකට පමණ පසු කාලයේ බව මෙහිලා සැලකිය යුතුයි.

## දෙවැනි පැමිණීම

ජේසුතුමා ජීවමාන කල තම ගෝලයින් අමතා තම මරණයෙන් පසු නැවත පැමිණ තමා රාජ්‍ය පිහිටුවන බව අවස්ථා තුනකම කියා දී තිබුණි. ඒ දෙවැනි පැමිණීම සිය ගෝලයින්ගේ ජීවිත කාලය තුළම සිදුවන බව කියා දී තිබුණි. මෙය විශ්වාස කළ ගෝලයෝ ලෝක විනාශය ළඟ නිසා පොත්පත් ලියා තැබීම අනවශ්‍ය යැයි සිතූහ. අන්තිම ගෝලයා අවුරුදු 120 ක් ආයු විඳ මළේය. ඉන්පසු මේ අනාවැකිය ඉටු නොවන බව දැනගත් ඔවුහු පොත්පත් ලිවීම, ගස් සිටුවීම ආදිය පටන් ගත්හ. ශුභාරංචි ලියනවිට එතුමාගේ උප්පත්ති කතාව ප්‍රබන්ධ කතා හා මිශ්‍රකොට ලිවීම හේතු වූයේ මේ නිසාය.

# සල්ලි කන ලංකාවෙ මැති සබේ.... !

පසුගිය දිනවල ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව තුළ හටගත් මන්ත්‍රී ගැටුම් නිසා පාර්ලිමේන්තු සභා ගර්භයේ දේපළවලට විශාල ලෙස හානි සිදුවූ අයුරු අප කවුරුත් දුටු දෙයකි. එහිදී මයික්‍රෆෝන, මන්ත්‍රී ආසන ඇතුළු දේපළ රැසක් අර්ධ සහ පූර්ණ වශයෙන් හානි වී ඇති බවත් එම අලාභහානි තක්සේරු කොට ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු යොදන බවත් ඒ පිළිබඳව අදහස් දැක්වූ පාර්ලිමේන්තු ප්‍රකාශකයෙකු පවසා තිබුණි.

ඒ අනුව එම හානි වූ දේපළ පිළිබඳ තක්සේරු කිරීම සඳහා පසුගිය නොවැම්බර් 21 වෙනි දින රක්ෂණ කණ්ඩායම් පාර්ලිමේන්තු පරිශ්‍රයට පැමිණ ඇති අතර එහිදී හානියට පත් දේපළ පිළිබඳ විමසා එම දේපළ ලබාගත් සමාගම් වෙතින් ඊට අදාළ තක්සේරු වාර්තා ලබාගත යුතු බව අදාළ නිලධාරීන්ට පෙන්වා දී තිබුණි.

පාර්ලිමේන්තුව යනු කිසිවෙකුගේ පෞද්ගලික දේපළක් නොවන අතර එය මහජන දේපළකි. එසේ වූ ආයතනයක් මෙසේ විනාශ කර දැමීම සඳහා දායක වූයේ එම උත්තරීතර ආයතනයට රැස්වන මන්ත්‍රීවරුන් 225 දෙනෙකි. පහත සඳහන් වන්නේ පාර්ලිමේන්තුව සහ මේ මන්ත්‍රීවරුන් 225 දෙනා නඩත්තු කිරීම සඳහා රටේ මහජනතාව විසින් දරනු ලබන වියදමයි. මෙම වාර්තාව 2017 වසර සම්බන්ධයෙන් වන අතර 2018 වසර සඳහා සියලු වියදම් ලේඛන තවමත් එළිදක්වා නොමැත.

ඒ අනුව 2017 වසරේ පාර්ලිමේන්තුව රැස් කිරීම සඳහා වැය කර ඇති මුළු මුදල රුපියල් 2,443,534,315 කි. එසේත් නොමැති නම් රුපියල් මිලියන 2443 කි. එම වසරේදී දින 95 ක් පාර්ලිමේන්තුව රැස් වී තිබුණු අතර එසේ රැස් වූ දිනක වියදම රුපියල් 25,721,413 කි. එනම් රුපියල් මිලියන 25 කි.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු සඳහා ලබාදෙන දීමනා මෙසේයි. මන්ත්‍රීවරයකුගේ වැටුප රුපියල් 54,285 කි. සංග්‍රහ දීමනාව රුපියල් 1000 කි. එක් සභා වාරයක් සඳහා රියදුරු දීමනාව රුපියල් 3500 කි. වැටුපට අමතරව පාර්ලිමේන්තු රැස්වීමකට සහභාගි වීම වෙනුවෙන් මන්ත්‍රීවරයකුට එක් දිනකට රුපියල් 2500 ක් හිමිවන අතර කාරක සභා රැස්වීම් දීමනාද ලැබේ. පාර්ලිමේන්තු රැස්වීමක් නොමැතිව කාරක සභා රැස්වීමකට පැමිණියහොත් රුපියල් 2500 ක දීමනාවක් හිමි වෙයි. එපමණක් නොව කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා මසකට රුපියල් 100,000 ක්ද දුරකථන බිල්පත් සඳහා 50,000 ක්ද කාර්ය මණ්ඩල සාමාජිකයින් සිව් දෙනෙකුට මසකට රුපියල් 10,000 ක දීමනාවක්ද නිදහස් තැපැල් දීමනාව ලෙස වසරකට රුපියල් 350,000 ක් වටිනා මුද්දරද ලැබේ.

මේ සියලු දේ ලබා ගනිමින් ශ්‍රී ලංකාවේ ජනතාවගේ බදු මුදලින් පෝෂණය වන 225 ක් වන මන්ත්‍රීන් විසින් පාර්ලිමේන්තුවේදී ජනතාව වෙනුවෙන් සිදුකරන දෙයක් ඇද්ද? අවම වශයෙන් ඔවුන් පාර්ලිමේන්තුවේ පවතින න්‍යායයන් අනුව වත් කටයුතු නොකරන බව පසුගියදා ඇති වූ අශීලාචාර හැසිරීම්වලින් පෙනී යයි. රටේ වගකිව යුතුම උත්තරීතරම ආයතනය තුළ මේ 225 දෙනාගේ පෙනී සිටීම පැය 8 ක් 10 ක් වුවත් විනාඩි 5 ක් 10 ක් වුවත් මේ සෑම සභා වාරයක් සඳහාම මහජන මුදල් රුපියල් මිලියන 25 කට වැඩි ප්‍රමාණයක් වැය කිරීම සිදු වේ.

# බිලියන 30 ක විදෙස් ආයෝජන ඉවතට

ඔක්තෝබර් 26 වැනි දා සිට ගත වූ සති 3 ක කාලයේදී රුපියල් බිලියන 30 කට වැඩි මුදලක් විදෙස් ආයෝජකයින් විසින් ශ්‍රී ලංකාවේ වෙළඳපොළෙන් ඉවත් කරගෙන ඇති බව වාර්තා වේ. මේ පිළිබඳව අදහස් දක්වන ආර්ථික විශ්ලේෂකයින් පවසන්නේ, වර්තමානයෙහි රට තුළ පවතින දේශපාලන අස්ථාවරත්වය සමග පවතින අවිනිශ්චිත තත්ත්වය මෙසේ ආයෝජන ඉවත් කර ගැනීමට බලපා ඇති බවයි.

නොවැම්බර් 14 වැනි දා වන විට ශ්‍රී ලංකාවේ විදෙස් සංචිත ප්‍රමාණය ඇමරිකානු ඩොලර් බිලියන 7.2 ක් වූ අතර එය මේ වසර අවසානය වන විට බිලියන 7.8 දක්වා ඉහළ යනු ඇතැයි මහ බැංකු අධිපති ආචාර්ය ආනන්ද කුමාරස්වාමි මහතා පවසා ඇත. ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්ති දැනුම් දීම සඳහා වන මාධ්‍ය හමුවේදී ඒ මහතා මේ තොරතුරු පවසා ඇති අතර ශ්‍රී ලංකාව වසරකදී සාමාන්‍ය වශයෙන් ගෙවීමට ඇති ණය ප්‍රමාණය ලබන වසරේ සිට ඇමරිකානු ඩොලර් බිලියන 4 ක් වන බවද ඔහු එහිදී වැඩිදුරටත් සඳහන් කර තිබුණි.

මේ අතර ශ්‍රී ලංකා රුපියලේ කඩා වැටීම තවදුරටත් සිදුවෙමින් පවතින අතර නොවැම්බර් 23 වැනි දා මහ බැංකුව විසින් නිකුත් කළ විනිමය අනුපාතිකන්ට අනුව ඇමරිකානු ඩොලරයේ විකුණුම් මිල රුපියල් 180.66 ක් ලෙස පැවතුණි.

ශ්‍රී ලංකා මහ බැංකුව සතිපතා නිකුත් කරන දත්තවලට අනුව 2018 ජනවාරි 01 දා සිට නොවැම්බර් 16 වනදා දක්වා කාලය තුළ ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල සියයට 13.4 කින් අවප්‍රමාණය වී ඇත.

# IMF ණය දීම කල් දමයි

ශ්‍රී ලංකාවට මීළඟ ණය වාරිකය ලබාදීම සඳහා පැවැත්වීමට නියමිතව තිබූ සාකච්ඡා කලා දමා ඇතැයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (International Monetary Fund -IMF) ප්‍රකාශ කර ඇත.

ශ්‍රී ලංකාවේ වත්මන් දේශපාලන තත්ත්වය නිසා මේ සාකච්ඡා කල් දැමීමට පියවර ගත් බව පසුගිය නොවැම්බර් 20 වෙනි දින රොයිටර් පුවත් සේවය වෙත අදහස් දක්වමින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ප්‍රකාශකයෙකු සඳහන් කොට තිබුණි.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඩොලර් බිලියන 1.5 ක මුදලක් ශ්‍රී ලංකාව වෙත ලබා දීම අනුමත කරන ලද්දේ 2016 වසරේදීයි. ඒ ශ්‍රී ලංකාවේ මූල්‍ය අර්බුදය මගහැර ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙළක් කරා ගමන් කිරීම සඳහායි. ඒ වෙනුවෙන් අනුමත මුදලින් ඩොලර් බිලියනකට වැඩි ප්‍රමාණයක් මේ වන විට මූල්‍ය අරමුදල විසින් මුදා හැර ඇත. ශ්‍රී ලංකාවට ලබාදෙන ණය මුදලෙහි පස්වන ආර්ථික කාර්යසාධන සමාලෝචනය සිදුකිරීම සඳහා පසුගිය සැප්තැම්බර් මාසයේදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත පිරිසක් ශ්‍රී ලංකාවට ගිය අතර එහිදී සාකච්ඡා කෙරුණු කරුණු ඔක්තෝබර් මාසයේ පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහ ලෝක බැංකුවේ වාර්ෂික රැස්වීම් අතරවාරයේදී නැවතත් සාකච්ඡාවට බඳුන් කොට තිබුණි.

ඉන්පසු ඔක්තෝබර් 26 වැනි දා අන්තර්ජාතික මූල්‍ය අරමුදල සහ ශ්‍රී ලංකා රජය අතර සාකච්ඡාවක් පැවති අතර එහිදී IMF සෑහීමකට පත්විය හැකි ආකාරයේ වැඩපිළිවෙළකට එකඟ වීමට හැකි වූ බව ශ්‍රී ලංකාවේ මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා පවසා තිබුණි.

එම එකඟතාවයෙන් අනතුරුව ශ්‍රී ලංකාවට අනුමත කරනු ලබන ණය මුදලේ අවසන් වාරිකය ලබාදීම සඳහා පැවැත්විය යුතු අධ්‍යක්ෂ මණ්ඩල සාකච්ඡාව නොවැම්බර් මස මැද දී පැවැත්වීමට නියමිතව තිබුණත් ලංකාවේ මතුව ඇති දේශපාලන වාතාවරණය මත එය දෙසැම්බර් මස පළමු සතිය දක්වා කල් ගොස් ඇති බව වාර්තා වේ.

# සයිබර් රෙජිමේන්තුව

ශ්‍රී ලංකා යුද හමුදාව 'සයිබර් ආරක්ෂක රෙජිමේන්තුව' නමින් නව රෙජිමේන්තුවක් ස්ථාපිත කිරීමට කටයුතු යොදා ඇත.

අනාගතයේදී ශ්‍රී ලංකාවට එල්ල විය හැකි ඕනෑම ආකාරයක හදිසි සයිබර් ප්‍රහාර වැළැක්වීම සඳහා ශ්‍රී ලංකාව සූදානම් වී සිටිය යුතු බවත් එය ඉලක්ක කර ගනිමින් මෙම ඒකකය පිහිටුවීමට කටයුතු කළ බවත් ශ්‍රී ලංකා යුද හමුදාපති ලුතිනන් ජෙනරාල් මහේෂ් සේනානායක මහතා පවසා ඇත. එවැනි හදිසි අවස්ථා සඳහා ගත හැකි පියවර සම්බන්ධයෙන් සයිබර් ආරක්ෂක රෙජිමේන්තුව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට නියමිතව ඇත.

මෙම රෙජිමේන්තුව ස්ථාපිත කිරීමත් සමග ශ්‍රී ලංකාව පුරා පිහිටි සෑම යුද හමුදා කඳවුරකටම මේ යටතේ සුදුසුකම් සහිත නිලධාරීන් පත් කිරීම කෙරෙනු ඇත.

මෙහිදී සයිබර් ලෝකය පිළිබඳව විශේෂ දැනුවත් කිරීම් මහජනයා වෙත කිරීමට මෙම ඒකකය බලාපොරොත්තු වන අතර කිසියම් අයෙකුට එල්ල වන සයිබර් තර්ජන සඟවාගෙන නොසිට ඒවා අදාළ අංශ වෙත දැනුම් දීම මගින් එම ප්‍රහාර අවම කර ගැනීමට පියවර ගත හැකි බවත් පවසයි.

# මහ බැංකු පොලී අනුපාතික ඉහළට !

2018 නොවැම්බර් 13 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති තීරණවලට අනුව පොලී අනුපාතිකවල වෙනසක් සිදුකර ඇති බව වාර්තා වේ. රටක 'මුදල් ප්‍රතිපත්තිය' ලෙස අදහස් කෙරෙන්නේ මිල ස්ථායිතාව ළඟා කර ගැනීම සඳහා මහ බැංකුවක් විසින් ආර්ථිකයක් තුළ මුදලේ පිරිවැය සහ මුදල් සැපයුම් කළමනාකරණය කිරීමේ ක්‍රියාවලියයි.

ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (Standing Deposit Facility Rate -SDFR) පදනම් අංක 75 කින් සියයට 8 (8%) දක්වාද නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (Standing Lending Facility Rate - SLFR) පදනම් අංක 50 කින් සියයට 9 (9%) දක්වාද ඉහළ දැමීමට තීරණය කර ඇත. ඒ සමගම ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය (Statutory Reserve Ratio-SRR) සියයට 6 දක්වා පදනම් අංක 150 කින් විශාල ලෙස පහත දමා ඇත.

පොලී අනුපාත වෙනස් කිරීම තුළින් මහ බැංකුව විසින් බලාපොරොත්තු වන්නේ බැංකු ණය පරිමාව වෙනස් කිරීමටයි. ප්‍රතිපත්ති පොලී අනුපාත වෙනස් කරන විට ඊට අනුකූලව වෙළඳපොළ පොලී අනුපාතද වෙනස් වනු ලබයි. මෙවැනි මූල්‍ය ප්‍රතිපත්ති මගින් පොලී අනුපාත ඉහළ දැමීමෙන් බැංකු ණය වර්ධනය අඩු කිරීමටත් අදහස් කෙරේ.

# හෝර්ටන්තැන්නට ආරක්ෂක දැලක්

හෝර්ටන්තැන්න ලෝකාන්තයේ අවදානම් සහිත නැරඹුම් ස්ථාන දෙකකට ආරක්ෂිත දැලක් එළීමට කටයුතු යොදමින් පවතින බව වාර්තා වේ. පසුගියදා ලෝකාන්තය නැරඹීමට පැමිණි ජර්මානු ජාතික කාන්තාවක් අනාරක්ෂිත ලෙස සෙල්ෆි ඡායාරූපයක් ගැනීමට උත්සාහ කිරීමේදී කන්දෙන් පහළට ඇද වැටී මිය යෑමත් සමග මෙවැනි පියවරක් ගැනීමට අදහස් කොට ඇත. සෑම වසරකම දෙස් විදෙස් සංචාරකයන් ලක්ෂ පහක් පමණ ලෝකාන්තය නැරඹීම සඳහා හෝර්ටන්තැන්න වෙත පැමිණෙන බව ඒ පිළිබඳව සඳහන් වාර්තාවල දැක්වේ. මෙම සංචාරකයින් හට ප්‍රවේශ පත්‍ර නිකුත් කරන අවස්ථාවේදීම මෙහිදී ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳව සැලකිලිමත් විය යුතු ආකාරය පිළිබඳව විවිධ දැනුවත් කිරීම් කරනු ලැබුවත් ඇතැම් අය ඒවා නොතැකීම නිසා මෙවැනි ජීවිත හානි සිදුවන බව හෝර්ටන්තැන්න ජාතික වන උද්‍යානයේ භාරකරු ප්‍රදීප් කුමාර මහතා පවසයි.

ලෝකාන්තය නැරඹීම සඳහා ආරක්ෂිත නැරඹුම් ස්ථානයක් දෙපාර්තමේන්තුව විසින් ඉදිකර ඇතත් ඇතැම් අය එම ස්ථානයට පහළින් අවදානම් ස්ථානවලට ගොස් ඡායාරූප ගැනීමට පෙළඹීම බොහෝ විට සිදුවන බව ඔහු පවසයි.

# අලුත් කාසි නිකුතුවක් !

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රට තුළ සංසරණය සඳහා අලුතින් කාසි කාණ්ඩ කිහිපයක් නිකුත් කර තිබේ. ඒ අනුව රුපියල, රුපියල් දෙක, රුපියල් 5 සහ රුපියල් 10 යන කාසි වර්ග හතර මේ යටතේ නිකුත් කර ඇත. එම කාසි මේ වසරේ දෙසැම්බර් 03 වන දින සිට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා රට තුළ සංසරණයට නිකුත් කරන බව මහ බැංකුව සඳහන් කර සිටී.

මෙම කාසි කල්පැවැත්ම සහිත මළ නොබැඳෙන වානේ වර්ගයකින් නිෂ්පාදනය කර ඇති බවත් කාසිවල විෂ්කම්භය හා ඝනකම කාසියේ වටිනාකම අනුව වැඩිවෙන පිළිවෙළට සකස් කොට ඇති බවත් මහ බැංකුව පවසයි. එසේම මෙම නව කාසි දෘෂ්‍යාබාධිත පුද්ගලයන්ට පහසුවෙන් වෙන් කර හඳුනාගත හැකි වීම විශේෂයකි.

දසත Dasatha

2018 දෙසැම්බර් DECEMBER 2018

**Published by Dasatha Publications**

**Publisher** - Gamini Abeysinghe

**Consultant Editor** - Sirisena Vithanage

**Editor in Chief** - Chamari Abeysinghe

**Graphic Design & Layout** - Sampath Ranaweera

**Creative graphics** - Jagath Hewapanna

**Web Master** - Dhanushka Bandara

--------------------------------------------

**114 Chatfield Dr. Woodbridge
L4H 0Z7. Ontario. Canada**

--------------------------------------------

**Telephone : 416 822 2789**

**Fax : 289 553 5668**

**E-Mail : dasathainfo@gmail.com**

**www.dasatha.com**

Canada We acknowledge the financial support of the Government of Canada. «Nous reconnaissons l'appui financier du gouvernement du Canada'
www.canada.ca

# ටොරොන්ටෝවේ අපරාධ රැල්ල

2018 වසර අවසන් වීමට ඉතිරිව ඇත්තේ මාසයකට අඩු කාලයකි. අද අප කතුවැකිය යොමු කරන්නේ පසුගියදා මාධ්‍ය මගින් හෙළිදරවු කෙරුණු ටොරොන්ටෝ නගරයේ මිනීමැරුම් පිළිබඳ වාර්තාවක් වෙතයි.

එම වාර්තාවෙහි දැක්වෙන අන්දමට, ටොරොන්ටෝ ඉතිහාසය තුළ මින් පෙර නොවූ විරූ අන්දමේ මනුෂ්‍ය ඝාතන සිදුවූ වසරක් ලෙස 2018 වසර සඳහන් කොට ඇත.

නොවැම්බර් 18 වෙනි දින ස්කාබරෝ වෙස්ට්හිල්හි සිදුවූ වෙඩි තැබීම නිසා මිය ගිය පුද්ගලයාත් සමග මේ වසර තුළ ටොරොන්ටෝවෙහි මිනිසුන් 90 දෙනෙකු ඝාතනය වී ඇති අතර එම ඝාතනයත් සමග 2018 වසර මිනීමැරුම් අතින් ඉහළම අගය ගත් වසර ලෙස වාර්තාගත විය. මින් පෙර ටොරොන්ටෝ ඉතිහාසය තුළ වැඩිම මිනීමැරුම් සංඛ්‍යාවක් සිදුව ඇත්තේ 1991 දී වන අතර ඒ වසර අවසානය වන විට සිදුවී තිබූ සම්පූර්ණ මිනීමැරුම් සංඛ්‍යාව 89 ක් විය. 2018 වසරේ සිදුවූ මිනීමැරුම් 90 අතරින් 47 දෙනෙකු වෙඩි තැබීමෙන් මියගොස් ඇති අතර, පිහි ඇණුම්, කැපිලි කෙටිලි නිසා මිය ගොස් ඇති සංඛ්‍යාව 19 කි. සෙසු 24 දෙනා වෙනත් ආකාරවලින් ඝාතනයට ලක්ව ඇත. ටොරොන්ටෝවේ සිදුවූ අපරාධවලින් මියගිය සංඛ්‍යාව පමණක් ඉහත සඳහන් කොට ඇති අතර මීට අමතරව සිදුකරනු ලැබූ වෙඩිතැබීම්, පිහි ඇණුම් වැනි සිදුවීම් නිසා ජීවිත හානි සිදු නොවුණත් සදාකාලිකව ආබාධිතව හා විවිධ රෝගාබාධයන්ට ගොදුරුව පීඩාවට පත් වූ විශාල පිරිසක්ද සිටිති.

ඉහත ඝාතන පිළිබඳ විමසා බැලීමේදී එම මරණ අතරින් වැඩි ප්‍රමාණයක් ගිනිඅවි මගින් සිදු කළ අපරාධ බව පෙනී යයි. මෙයින් අනුමාන කළ හැක්කේ නගරය තුළ විශාල ලෙස ගිනිඅවි පරිහරණය වන බවයි. කැනඩාවෙහි ගිනිඅවි පනතට අනුව බලපත්‍ර රහිත ගිනි අවියක් ළඟ තබාගැනීම දඬුවම් ලැබිය හැකි වරදකි. නමුත් මේ වෙඩි තැබීම් පිළිබඳ සලකා බැලීමේදී මේ අපරාධකරුවන් බහුතරයක් බලපත්‍ර රහිත ගිනිඅවි භාවිත කරමින් මේවා සිදුකර ඇති බව පෙනී යයි. මේ ආකාරයට නගරය තුළ ගිනිඅවි නිදැල්ලේ පැවතීමට ඉඩ හැරිය හොත් වර්තමානයේ ඇමරිකාවේ සිදුවන ආකාරයේ සමූහ ඝාතන මේ නගරය තුළ නුදුරු අනාගතයේදී සිදු නොවෙතැයි කාට නම් කිව හැකිද?

ඉහත සංඛ්‍යා ලේඛනවල සඳහන්ව ඇත්තේ 2018 නොවැම්බර් 18 වෙනි දා දක්වා සිදු වූ මිනීමැරුම් පමණි. තවමත් 2018 වසරෙහි දින කිහිපයක් ඉතිරිව ඇති නිසා මේ වසර සඳහා සියයට සියයක් නිරවද්‍ය මිනීමැරුම් සංඛ්‍යාලේඛන වාර්තාවක් එළිදක්වා නොමැත. නමුත් නොවැම්බර් 18 වෙනිදා වෙස්ට්හිල්හි සිදුවූ මනුෂ්‍ය ඝාතනය මෙම නගරයෙහි සිදුවිය යුතු අවසන් මිනීමැරුම යැයි අපි අදහස් කරමු. එය එසේ වේවායි ප්‍රාර්ථනය කරමු.

එය ඒ ආකාරයෙන්ම සිදුවීමට නම් රජය මෙන්ම ටොරොන්ටෝ වැසියන් වන අපද එක ලෙසම කැප වී කටයුතු කළ යුතු බව සිහි තබාගත යුත්තකි. මන්ද යත්, අන් සෑම දෙයකටම වඩා වටින්නේ ජීවිත ආරක්ෂා කර ගැනීම වන හෙයිනි. ආහාර, ඉඳුම්හිටුම්, සෞඛ්‍ය ආදි මූලික අවශ්‍යතා මෙන්ම ගැටුම්වලින් තොර සාමකාමී පරිසරයක සුරක්ෂිතව ජීවත් වීමට ඇති අයිතිය මිහිපිට වෙසෙන ලොකු කුඩා සෑම මිනිසකුටම හිමි විය යුත්තකි. එය විනාශ කර දැමීමට වෙර දරන්නා සමාජයට විශාල පිළිලයකි. යම් පුද්ගලයකුගේ නොදැමුණු, නොහික්මුණු කමක් තවත් අයෙකුගේ ජීවත් වීමේ අයිතිය උදුරාගැනීම දක්වා ඉහවහා යතොත් එය කොතරම් අවාසනාවක්ද? එය විශාල සමාජ ව්‍යසනයකි.

දියුණුවේ හිණිපෙත්තේ පවතින, අංක එකේ සාමයක් බලපවත්වන කැනඩාවෙහි ටොරොන්ටෝ නගරය මෙවැනි බිහිසුණු තත්ත්වයකට ගොදුරු වීම සැබවින්ම ඛේදනීය වූවකි. මෙය තවදුරටත් වැඩී වර්ධනය වුවහොත් නිදහසේ සාමකාමීව ගලා යන ටොරොන්ටෝ ජන ජීවිතය සම්පූර්ණයෙන්ම අවුල් වී යා හැක. තැන තැන සිදු වන වෙඩි තැබීම්, කපා කොටා ගැනීම්වලදී ඒ සිදුවීම්වලට කිසි සේත්ම අදාළ නොවන පුද්ගලයින් සිය ජීවිතවලින් වන්දි ගෙවන ආකාරය මාධ්‍ය මගින් කොතෙකුත් අප දැක ඇත.

නගරය ගිල ගනිමින් පවතින මෙම භීෂණකාරී තත්ත්වය පාලනය කරගැනීම සඳහා රජය ආරක්ෂක අංශ සමග එක්ව විවිධ පියර ගනිමින් සිටින අතර ඒ සඳහා මහජනතාවගේ සහයෝගයද ඔවුහු වෙසෙසින්ම බලාපොරොත්තු වෙති. එහිදී සැලසුම් සහගතව සිදු නොකරන බොහෝ මිනීමැරුම් මහජන සහාය මත වළක්වා ගත හැකි බව මනෝ වෛද්‍යවරුන්, ආරක්ෂක අංශ නිලධාරීන් සහ ඒ පිළිබඳ විශේෂඥයින්ගේ අදහසයි. විශේෂයෙන්ම මෙහිදී තමා සමග ජීවත් වන පුද්ගලයින්ගේ අසාමාන්‍ය චර්යා රටාවන් පිළිබඳව විමසිලිමත් වීම තුළින් ඔවුන් පෙළෙන ආතති තත්ත්වයන් වටහා ගෙන එවැනි පුද්ගලයන් නිසි ප්‍රතිකාර සඳහා යොමුකරවීම මගින් සිදුවිය හැකි බරපතල අපරාධ බොහොමයක් වළක්වාගත හැකි බව ඔවුහු පවසති.

මෙවැනි බරපතල අපරාධ සිදුකරන පුද්ගලයින් පිළිබඳව සඳහන් වාර්තාවලට අනුව 'අධි අවදානම්' වයස් කාණ්ඩය ලෙස සඳහන් වන්නේ අවුරුදු 15 සිට 29 දක්වා වූවන්ය. තරුණ වයසේ පසුවන මොවුන් මෙතරම් ප්‍රචණ්ඩකාරී බවකට පත්වන්නේ කුමක් නිසාද යන්න පිළිබඳව පසුගියදා අධ්‍යයනයක් සිදුකොට තිබුණි. එහිදී හෙළි වූ ප්‍රධාන කරුණ වී ඇත්තේ, ටොරොන්ටෝවේ නිවාස, රථවාහන, ඇඳුම්පැළඳුම් ආදි සෑම දෙයකම පවතින මිල අධිකත්වයත් ඒ සමග හටගනු ලබන දරිද්‍රතාවයත් මීට ප්‍රධාන වශයෙන් බලපා ඇති බවයි. එයින් ඇතිවන සමාජ දුරස්ථතාව නිසා තරුණ තරුණියන් තුළ ඉබේම සිදුවන දැඩි අපේක්ෂා භංගත්වය මෙවැනි බොහෝ දරුණු අපරාධ සිදුකිරීමට සෘජුවම බලපෑම් ඇති කරන බව එහි සඳහන් වේ. ඒ සමගම පවුල් හා පවතින සබඳතා බිඳී යාමත් ආදරය කරුණාව වැනි අත්‍යවශ්‍ය මිනිස් ගුණාංග ගිලිහී යාමත් නිසා මෙවැනි ව්‍යසනකාරී තත්ත්වයන් නිර්මාණය වීම සිදුවේ.

මෙවැනි තත්ත්වයන්ගෙන් ජනතාව මුදා ගැනීම සඳහා රජය බරපතල ලෙස මැදිහත් විය යුතු බව අවිවාදාත්මක වූවක් වන අතර ඉහත වයස් කාණ්ඩවල දරුවන් පිළිබඳව අපද දැඩි අවධානයක් යොමු කළ යුතු වේ. විශේෂයෙන්ම තම තමන්ගේ පවුල තුළ සිටින තරුණ වයසේ දරුවන් කෙරෙහි සැලකිලිමත් වීම තුළින් ඔවුන්ට සිදුවිය හැකි බිහිසුණු ව්‍යසන අවම කරගත හැකි බව අප වටහා ගත යුතුය. 'අපේ දරුවා ඒ වගේ කෙනෙක් නෙවෙයි' යැයි සිතා දරුවා පිළිබඳ සොයා බැලීම බැහැර කිරීම සුදුසු දෙයක් නොවේ. ඔබේ දරුවා යහපත් අයෙකු විය හැකි වුවත් ඔවුන් සමග ගැවසෙන්නන් පිළිබඳව විමසා බැලීම සුදුසු වේ. එය අතපසු කිරීමෙන් සුළු සිදුවීමක් වුවත් ඉතාමත් කණගාටුදායක තත්ත්වයකට පත්ව අප සදාකාලික සන්තාපයන්ට ලක් විය හැක.

ටොරොන්ටෝවේ ජීවත් වන පුරවැසියන් අතරින් හරි අඩක්ම කැනඩාවෙන් පිටත රටවල උපත ලබා මෙහි සංක්‍රමණය වූවන් වන අතර ඒ නිසාම මෙම නගරය බහු සංස්කෘතිකත්වය අතින් ලොව ප්‍රමුඛම නගරය ලෙස සැලකේ. විවිධ භාෂාවන් 140 කට අධික ප්‍රමාණයක් කතා කරන ජනවාර්ගික කණ්ඩායම් 200 ක් පමණ මෙහි ඉතාමත් සමගියෙන්, සහයෝගයෙන් ජීවත් වෙති. එසේම පසුගිය වසර කීපය පුරාම ලොව සාමකාමී රටවල් පිළිබඳ වර්ගීකරණයේදී මුල්ම රටවල් දහය අතරට කැනඩාව නිතැතින්ම ගැනුණි. එසේ සාමකාමී වූ රටක ප්‍රධානම නගරයක් තුළ මේ ආකාරයට ප්‍රචණ්ඩත්වය හිස එසවීම සැබවින්ම කණගාටුවට කරුණකි. මෙම ක්‍රියා වැළැක්වීම සඳහා සෘජු ක්‍රියාමාර්ග ගැනීමට අපට නොහැකි වුවත් අප අවට සිදුවන දේ පිළිබඳව හොඳින් ඇස් කන් හැර අවධානයෙන් සිටීම තුළින් ඒවා වළක්වාගත හැකි බව මෙහිදී අප විසින් සිහි තබාගත යුතුය.

# ඇත රට වනසා - නොදනිම් කාගෙ දොසා

■ **දුරදර්ශි විසිනි**

'රටක් ලොව හමුවට ගෙන යන කැඩපත එරට නායකයින්ගේ හැසිරීමය' යි මින් ශතවර්ෂ 26 කට එනම්, අවුරුදු 2600 කට පමණ පෙර ග්‍රීසියේ ජීවත් වූ සොක්‍රටීස් නමැති මහා දාර්ශනිකයා පැවසීය. ඔහු එදා ඒ ප්‍රකාශය කළේ කුමන අත්දැකීමක් පෙරදැරි කොට ගෙනදැයි අපි නොදනිමු. එහෙත් එයට කදිම නිදසුනක් පසුගියදා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේදී අපට අත්දකින්නට ලැබුණේය.

එසේම රටක නායකයන් හැසිරිය යුත්තේ කෙසේදැයි ඊට ශත වර්ෂයකට පසු එනම්, ක්‍රි.පූ. 6 වෙනි සියවසේදී භාරතයේ විශාලා මහනුවර ලිච්ඡවීන්ගේ රාජ සභාවේදී අපට දක්නට ලැබුණේය. එදා ඒ රාජ සභාවේ නියෝජිතයෝ සත්දහස් සත්සිය සත් දෙනෙක් සිටියහ. ඔවුහු විවිධ මත දරන්නෝ වූහ. එහෙත් ඔවුහු සියල්ලෝම එක්ව විවිධ මතවාද සාකච්ඡාවෙන්, සම්මුතියෙන් විසඳා ගත්හ. සමගියෙන් එක්ව සමගියෙන් විසිර ගියහ. එවැනි රාජ සභාවක කණපිට නැතහොත් විරුද්ධ පැත්ත කෙබඳුදැයි පසුගියදා අපේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු ලෝකයට පෙන්වා දුන්හ.

පසුගියදා අපේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු පාට, පක්ෂ නොබලා එකිනෙකාගේ ශරීර ශක්තිය උරගා බලමින් ගුටිබැට හුවමාරු කර ගත්හ. පිහි ආදි ආයුධවලින් ඇණ කොටා ගනිමින් ලේ හලා ගත්හ. මිරිස් කුඩු ආදි මංකොල්ලකාරයින් භාවිත කරන ද්‍රව්‍යවලින් එකිනෙකාට පාඩම් උගන්වා ගත්හ. මේ කිසිවක් කරකියාගත නොහැකි දුර්වලයෝ පාර්ලිමේන්තුවේ වෙනදා කුණු දමන්නට භාවිත කරන කුණු බාල්දිවලින් සටන් කළහ. පාර්ලිමේන්තුව ත්‍රාසජනක සටන්හි යෙදෙන අදාන්ත නළු නිළියන්ගේ සටන් ජවනිකාවක් බවට පත් කළහ. සටන් පාඨ රැගත් පුවරු පෙන්වමින් අත් ඔසවමින් මුල්ම කාලයේ සම සමාජ පෙළපාලියක් බවට එය පත් කළහ.

මෙහිලා කිව යුතු කරුණු රැසක්ම ඇතත් ඒ සියල්ල කියන්නට මේ අවස්ථාව නොවේ. එබැවින් කිහිපයක් ගැන පමණක් කියමි.

පළමුවැන්න නම් මේ කිසිවෙක් 'තමන් මේ සිටින්නේ කොහේදැ' යි නොසිතීමය. නොතැකීමය. නොබැලීමය. මෙතැනට කියමනට නම් කියන්නේ 'උත්තරීතර පාර්ලිමේන්තුව' කියාය. රට වැසියන් නියෝජනය කරමින් 'නීති සම්පාදනය කරන තැනය' කියාය. 'ප්‍රජාතන්ත්‍රවාදය රජයන තැනය' කියාය. එවිට මෙහි සිටින්නෝ උත්තරීතරයෝය. නීති සම්පාදකයෝය. ප්‍රජාතන්ත්‍රවාදය ගරු කරන්නෝය. එහෙත් මොවුන් කවුරුත් එදා හැසිරුණේ උත්තරීතරයින්, නීති සම්පාදකයින්, ප්‍රජාතන්ත්‍රවාදීන් හැටියටද? චණ්ඩීන්, නීති කඩ කරන්නවුන්, ප්‍රජාතන්ත්‍ර විරෝධීන් හැටියට නොවේද? මේ අතරම කිව යුතු තවත් කරුණක්ද ඇත. එනම්, මේ තත්ත්වයට පත් වූයේ 'ජීවිතයේ කුණාටු සමය' යයි හඳුන්වනු ලබන පාර්ලිමේන්තුවේ සිටින ආවේගශීලී තරුණ මන්ත්‍රීන් කීපදෙනා පමණක් නම් එය ඔවුන්ට සමාව දීමට හේතුවක් වන බවයි. එහෙත් මේ සියල්ල මෙහෙයවූයේ වයසින් අවුරුදු තිහ, හතළිහ, පනහ ඉක්මවූ එසේම අවුරුදු තිහ, හතළිහ පාර්ලිමේන්තුවේම නාකි වූ මහල්ලන් වීම සමාව දිය නොහැකි වරදක් නොවන්නේද?

මට මෙහිදී සිහිවන්නේ හෙළුවෙන් ගිය රජු දෙස බැලූ මැති ඇමතියන්ද 'රජු හෙළුවෙන් නොවේ' යැයි කී කතාවයි. මෙහි සිටි ඒ ඒ පක්ෂවල දේශපාලන නායකයෝද තම ගෝල බාලයින් දෙස බලමින් පසෙකට වී වාඩි වී සිටියේ පෙර කී රජුගේ මැති ඇමතියන් සේමය. අවාසනාව

**22 වන පිටුව බලන්න**

# භූ කම්පාවක හෂ්ඩාවශේෂ



■ **සුරංජා පතිරණ**

ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ සිදුවූ සුනාමි ව්‍යසන ගැන සොයා යාමේදී 2004 වසර පිළිබඳ ප්‍රමුඛස්ථානයක් ගත්තද සුනාමියක් පළමුවෙනි වරට සිදුවී ඇත්තේ මීට වසර 2115 කට පෙර කැලණි තිස්ස රජ සමයෙහිය. ඒ සමයේ රහතන් වහන්සේ නමක් තෙල් කටාරමක දමා මරා දැමූ පාපයට භූමිය කම්පා වූ බැවින් මුහුද ගොඩ ගලන්නට පටන් ගත් බවත් එම පාපයෙන් රට මුදා ගැනීම සඳහා විහාර මහාදේවිය මුහුදට බිලි වූ බවත් වංශ කතාවල සඳහන් වේ. 1983 වසරේදී ඉන්දුනීසියාවේ සුන්ඩා සමුද්‍ර සන්ධිය අසල සිදුවූ භූමි කම්පාවකින් ඇතිවූ සුනාමි ව්‍යසනය නිසා ජාවා සුමාත්‍රා ප්‍රදේශවල මිනිස් ජීවිත 3600 ක් විනාශ වූ බවට වාර්තා වුවද එම සිද්ධියෙන් අප රටේ සිදුවූ ජීවිත හානි වාර්තා වන්නේ එකක් පමණි.

නමුත් 1983 වසරේදී සිදුවූ එම සුනාමි ව්‍යසනය නිසා ශ්‍රී ලංකාවට පාරිසරිකව දැඩි බලපෑම් ඇති කර ඇත. මීටර් 2 ක් 3 ක් අතර ප්‍රමාණයකින් ඉහළ නැගී සුනාමි රළ නිසා කොළඹ, ගාල්ල, හම්බන්තොට හා ආරුගම්බේ වරාය ආශ්‍රිත ප්‍රදේශවලට දැඩි හානි සිදුවී ඇත.

නමුදු 2004 වසරට පෙර සිදුවූ මෙම මුහුදු ගොඩ ගැලීම්වලට සුනාමි යන නාමයක් අර්ථකථනය වී නොමැත. සුනාමි යන නාමය යෙදී ඇත්තේ ජපන් භාෂාවෙනි. සුනාමි - Tsunami යන්නෙහි සාමාන්‍ය අර්ථය වන්නේ වරාය තරංග - Harbour Waves හෙවත් උදම් තරංග - Tidal Waves යන්නයි. ජපන් භාෂාවෙන් Nami යනු තරංග යන්නයි. ජපන් ධීවරයන් විසින් මෙම Tsunami නම තබා ඇත.

'පොළොව කම්පා වී මුහුද ගොඩ ගලනවා' යනුවෙන් අතීතයේ සිට ජනවහරෙහි පැවතුනද මෙහි සත්‍ය විද්‍යාත්මක පදනම නම් මුහුදු පත්ලේදී භූ තල එකිනෙකට ගැටීම හෙවත් තැටි තල 2 ක් එකිනෙකට වෙනස්ව සිරස්ව (උඩු අතට) චලනය වීමේදී එක් තලයක් අනෙක් තලය අබිබවා ඉහළට හෝ පහළට ගමන් කිරීමයි. එයින් තැටි කිඳා බැස ඉහළට නැගී භූ ස්ථරය මත ඇති ජල කඳ ඉහළට ගමන් කරයි. මෙසේ සිදුවන සුනාමි වර්ග 4 ක් හඳුන්වා දිය හැක. ඒවා නම් ගිනිකඳු පිපිරුම මගින් ඇතිවන සුනාමි, නාය යෑම් මගින් ඇතිවන සුනාමි, ග්‍රහාංශු, උල්කා කඩා වැටීමෙන් ඇතිවන සුනාමි හා මානව ක්‍රියාකාරකම් නිසා ඇතිවන සුනාමිය.

මෙහිදී 04 වන අවස්ථාව ජනවහරෙහි ආ මිනිසුන් වැරදි කරන විට පොළොව කම්පා වනවා යන්න විද්‍යාත්මකවද ඔප්පු වන බව අපට සනාථ කර ගැනීමට හැකිය.

එය තවදුරටත් විග්‍රහ කළහොත් මිනිසා විසින් රටේ සංවර්ධන කටයුතු හෝ ආරක්ෂක (යුදමය) කටයුතු සඳහා සාගරික පත්ල හෝ ජල තලය මත ඇති කරන පීඩනයද සුනාමි රළ ඇති වීමට හේතුවන බවට සොයා ගෙන ඇත. මෙයට උදාහරණයක් ලෙස 1994 වසරේදී නොවැම්බර් 03 වෙනිදා ඇලස්කාවේ ස්කැග්වේ (Skagway) නම් වෙරළබඩ කලාපයේ වරායක් ඉදිකිරීමට කියුබික් මීටර් මිලියනයක පමණ ගල් කැබලි ඇතිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් ගැඹුරු සාගරික පත්ලේ සිදුවූ නාය යාමකින් මීටර් 12 ක් පමණ උස සුනාමි රළක් හටගෙන ඇත. 1979 වසරේදී ප්‍රංශයේ නයිඩ් වරාය ආශ්‍රිත මාර්ගය පුළුල් කිරීම නිසා මීටර් 3 ක් උස සුනාමියක්ද 1917 වසරේදී කැනඩාවේ හැලිෆැක්ස් වරායේ සිදුකළ න්‍යෂ්ටික පිපිරවීමක් නිසා සුනාමියක් සිදුවූ බවද වාර්තා වී ඇත.

සුනාමියේ අතීතය ගැන කෙසේ කතා කළද අප රටට මහත් ව්‍යසනයක් ඇති කළ දරුණුතම ඛේදවාචකය 2004 වසරේ දෙසැම්බර් 26 වෙනි දින පෙ.ව. 9.20 ට වාර්තා විය. මෙය අප රටට පමණක් නොව ලෝක ඉතිහාසය තුළදී හමුවන දැවැන්තම භූ කම්පනය ලෙසද වාර්තා වේ. රිච්ටර් පරිමාණයෙන් 9.5 ක් පමණ වූ එම භූ කම්පනය ඉන්දියානු තැටිය හා බුරුම තැටිය එකිනෙකට මුහුණලා ගැටීම නිසා ඉන්දුනීසියාවේ සුමාත්‍රා දිවයිනට කි.මී. 250 ක් ඔබ්බෙන් බණ්ඩා ආචෙයි දූපතේ ඇති වූවකි. උස මීටර් 15 ක් ඉක්මවමින් සුනාමි රළ ඉහළට නැගී අතර දකුණු හා අග්නිදිග ආසියාතික රටවල් ප්‍රමුඛ රාජ්‍යයන් 13 කට එමගින් සෘජුවම බලපෑම් එල්ල විය. තවත් රටවල් 58 කට පමණ වක්‍රාකාරයෙන් බලපෑම් සිදුවී ඇත. ශ්‍රී ලංකාවේ විනාශ වූ මිනිස් ජීවිත හතළිස් දහසින් වැඩිම පිරිසක් වාර්තා වන්නේ අම්පාර හා ගාල්ල දිස්ත්‍රික්කවලිනි.

අම්පාර දිස්ත්‍රික්කයෙන් මරණ 10436 ක්ද ගාල්ලෙන් 4248 ක්ද වාර්තා වන අතර අඩුම මරණ සංඛ්‍යාවක් වාර්තා වන දිස්ත්‍රික්ක වනුයේ ගම්පහින් 6 ක්ද, පුත්තලමෙන් 04 ක්ද වශයෙනි. දේපළ හානි වාර්තාවලට අනුව විනාශ වූ නිවාස සංඛ්‍යාව 118937 කි. ඉන් පූර්ණ නිවාස හානි 78126 ක්ද අර්ධ නිවාස හානි 40841 ක්ද වාර්තා වෙයි. අම්පාර, මඩකලපුව, යාපනය හා ගාල්ල යන දිස්ත්‍රික්කවලින් පූර්ණ නිවාස හානිද ත්‍රිකුණාමලය, මඩකලපුව, හම්බන්තොට මාතර අර්ධ නිවාස හානිද වැඩි ප්‍රමාණයක් වාර්තා වේ. මෙයින් වර්තමානය වනවිට මීටර් 100 වෙරළ කලාපය ආශ්‍රිත විනාශ වූ නිවාස මුළුමනින්ම අත්හැර දැමූ ඉඩකඩම් වී ඇති අතර මීටර් 100 කලාපයෙන් ඇතුළට වන්නට හානි වූ අර්ධ හා පූර්ණ නිවාස 90% ක් පමණ නැවත යථා තත්ත්වයට පත්කොට තිබේ. එම බොහෝ නිවාසවලට රජයෙන් ලබාදුන් ලක්ෂ 2 1/2, ලක්ෂය, පනස් දහය බැගින් ආධාර ඔවුන් විසින් ලබාගෙන ඇත.

විවිධ ක්ෂේත්‍රයන් අතරින් ජාතික ආර්ථිකයට ප්‍රබල බලපෑමක් එල්ල වූවේ කාර්මික හා කෘෂිකාර්මික කටයුතු මුළුමනින්ම පිරිහීමකට ලක්කරමිනි. ධීවර හා සංචාරක කර්මාන්තයට එමගින් සිදුවූ බලපෑම දෙස බලන විට ධීවර යාත්‍රා 32000 ක්ද ධීවර ආම්පන්න හා ධීවර වරාය, තොටුපල විනාශ වීමෙන් රුපියල් මිලියන 30000 ක්ද සංචාරක කර්මාන්තය විනාශ වීමෙන් රුපියල් මිලියන 20000 ක්ද වූ බව ඇස්තමේන්තු කර ඇත. ජාතික ආර්ථිකයෙන් 17% ක් පමණ අප රට ආදායම් ලබන්නේ සංචාරක කර්මාන්තයෙනි. මේ නිසා සුනාමියෙන් දර්ශනීය වෙරළ තීරය විනාශ වීම සංචාරක කර්මාන්තයට එල්ල වූ ප්‍රධාන අභියෝගයයි. ගාල්ල, මාතර දිස්ත්‍රික්කවල මුහුදු රැකියාවට ගිය බොහෝ පිරිසක් සමඟ සාකච්ඡා කිරීමේදී ඔවුන් පවසන්නේ මුහුදේ යාමට බිය වීමත් සිදුවූ දේ සිතට කම්පනයක් වෙමින් මැවි මැවී පෙනීමත් නිසා එම රැකියාව අත්හළ බවය.

සුනාමියෙන් ආපදාවට ලක්වූ මහජන සේවා අතර සෞඛ්‍ය හා අධ්‍යාපන ක්ෂේත්‍රයට මහත් බලපෑමක් එල්ල විය. පාසල් 41 ක් සම්පූර්ණයෙන්ම විනාශ වූ අතර පාසල් 71 ක් අර්ධ හානි තත්ත්වයට පත්ව ඇත. පාසල් නැවත ප්‍රතිසංස්කරණයට පත්කිරීමට වැයවූ මුදල කෝටි 400 කි.

සුනාමිය සිදුවනවිට ඉතා දක්ෂව ඉගෙන ගනිමින් හිඳි බොහොමයක් දරුවන් ඉන්පසුව ඇතිවූ කම්පනය නිසා ඉගෙනීමේ අදක්ෂයන් වී ඇත. සුනාමි ව්‍යසනය නිසා දිවි ගලවාගත් වූවන්ට පිහිටවීමට ජාත්‍යන්තර වශයෙන් බොහෝ ආධාර උපකාර ගලා ආ අතර ශ්‍රී ලාංකේය ජනයාද අසරණ වූවන්ට දැක්වූවේ මහත් දයානුකම්පාවකි. එයද අප ඉතිහාසයේ රන් අකුරෙන් ලියවෙන අතර සුනාමිය හේතු කරගෙන අප රට තුළ මහා පරිමාණයෙන් සිදුවූ වංචා සහගත දේද බොහෝය.

සුනාමියෙන් ඇඳිවත පමණක් ඉතිරි වූ බොහොමයක් ජනතාවගේ ධනය, රන්, බඩු බාහිරාදිය 50% කට වඩා විනාශ වී ඇත්තේ රැවුල ගිනිගත් වෙලාවේ සුරුට්ටු පත්තු කර ගත් සොරුන්ගෙන්ය. තවද රජයේ හා සමහර රාජ්‍ය නොවන සංවිධානවල සමහර පුද්ගලයන් අසරණයන්ට පැමිණි සහනාධාර මෙන්ම නිවාස තැනීමට ලැබූ මුදල් බොහොමයක් වංචාකර ඇත.

# අතීතයේ බල පෑ සුනාමි

## සමුද්‍ර වාණිජ ජාතකයේ දැක්වෙන සුනාමිය

බෞද්ධයින්ගේ ජාතක කතාවක් වන සමුද්‍ර වාණිජ ජාතකයේ සුනාමියක් ගැන සඳහන් වෙයි. හැම ජාතක කතාවකින්ම බුදුරජාණන් වහන්සේ පෙර ආත්ම භවයකදී බෝසත් වරයකු වශයෙන් ක්‍රියා කළ අයුරු පිළිබිඹු වෙයි. දිනක් බුදුරජාණන් වහන්සේ දෙව්රම් වෙහෙර වැඩ සිටිනා කල්හි දේවදත්ත තෙරුණුවන්ට දේශනා කළ ජාතකය මෙසේය.

ජම්බුද්වීපයේ (ඉන්දියාවේ) බරණැස් නුවර බ්‍රහ්මදත්ත නම් රජ කෙනෙකු වාසය කරන කල්හි යහපත් මිනිසකු වාසය කළේය. පොහොසත් අයකු වන ඔහු අසල්වැසියන් ආධාර ඉල්ලා සිටි විට තම වස්තුවෙන් ආධාර උපකාර කළේය. ආධාර ඉල්ලන අය සීඝ්‍රයෙන් වැඩි විය. බැරිම තැන ඔහු බෝට්ටුවකට නැගී බරණැස් නුවරින් ඉවත්ව යන කල්හි දූපතකට ගසා ගෙන ගියේය. එහි ඔහුට අවශ්‍ය ආහාර පලතුරු තිබූ බැවින් ඊට ගොඩ බැස සතුටින් කල් ගෙවීය. ටික කලකින් වඩුවන් දහසක් ඔවුන්ගේ දරු පවුල් සමග නැවකින් පැමිණ දූපතට ගොඩ වූහ. දූපතේ සිටි යහපත් මිනිසා ඔවුනට පැවසුවේ එම දූපත දෙවියන් පිනවන එකක් බැවින් අපවිත්‍ර නොකළ යුතු බවයි.

ඊට කන් නොදුන් වඩුවෝ දූපත අපවිත්‍ර කළහ. එහි විසූ දේවතාවෝ ඉන් උරණ වූහ. එක් නපුරු දේවතාවකුට බාරයක් වූහ. භූමිය අපවිත්‍ර කිරීම මිනිසුන් නතර නොකරන්නේ නම් මුහුදින් විශාල රැල්ලක් පැමිණ ඔවුන් ගිල ගත යුතු බවය. අනිකුත් යහපත් දෙව් දේවතාවෝ මෙය දැනී භූමියේ සිටි අයට අනතුරු ඇඟවීමක් කළහ. එය විශ්වාස කළ පිරිස වහා බෝට්ටුවක නැඟ ඉවත් වී පණ බේරා ගත්හ. භූමියට කෑදරකමක් දැක් වූ පිරිස අනතුරු ඇඟවීම විශ්වාස නොකළ බැවින් රැඳී සිටියහ. ඉක්බිතිව පුන් පොහෝ දිනක මහ මුහුද ගොඩ ගැලීය. ඉවත්ව නොගිය පිරිස ඔවුන්ගේ නිවාස වස්තුව ඉඩම්ද විනාශයට පත් විය. එකල ඉන්දියාව සහ ලංකාව එකම ගොඩ බිමකි. කතාවේ විස්තර කෙරුණු මනරම් එලබර දිවයින ශ්‍රී ලංකාව බව බෞද්ධයෝ විශ්වාස කරති. යහපත් දේවතාවා වූයේ ඉහත ආත්මයක බෝධි සත්ව වූ බුදුරජාණන් වහන්සේමය. නපුරු දේවතාවා වූයේ කෝකාලික තෙරුණුවෝය.

## ක්‍රි.පූ. 6 වැනි සියවසදී වයඹ දිග වෙරළට ගැසූ සුනාමි රළ

ලංකාව දෙසට පැමිණ පළමු වැනි සුනාමි රළ විජය කුමරු ලංකාවට පැමිණීමට පෙර සිදු වූවකි. ක්‍රි.පූ. 6 වැනි සියවස වයඹ දිග ප්‍රදේශයේ පවතින පුරාවෘත්තයක් අනුව පැරණි කාලයක දී අල්ලරසාමි නම් වූ බිසවක් විසින් එහි වෙරළබඩ ප්‍රදේශයේ පැවති රාජධානියක් පාලනය කළ බව දැක් වේ. ඇය බෝට්ටුවකින් රාජධානියේ වෙරළ දිගේ යාමට පුරුදුව සිටියාය. ඇගේ මාලිගය තිබුණේ විල්පත්තු කුදිරමලේට ආසන්නවය. පසු දවසකදී සාගරයේ සිට පැමිණි යෝධ රැල්ලකින් ඇගේ මාළිගය වළලා දමා ජනතාවද මරුමුවට පත් කෙරිණ.

## ක්‍රි.පූ. 130 කැලණියට ගැසූ සුනාමි රළ

මහා වංශයේ 23 වැනි පරිච්ඡේදයේ සුනාමිය කුමක්දැයි සඳහනක් ඇතුළත්ය. ක්‍රි.පූ. 3 වැනි සියවසේ ගිනිකොණ දිග ප්‍රදේශයේ රුහුණු ජාතික උද්‍යානය ආවරණය වන ප්‍ර දේශයේ කුඩා රාජධානියක් වූ කැලණිය පාලනය කරන ලද්දේ කැලණිතිස්ස නම් රජකු විසිනි.

ඔහුගේ සොහොයුරා උත්තීය රජුගේ බිසව සමග ඇති කර ගත් නොමනා ප්‍රේම සම්බන්ධතාව මත ඔහු භික්ෂු වේසයෙන් රහත් භික්ෂූන් පිටුපසින් රජ මාලිගයට පැමිණ රජ බිසවගේ අතට පෙම් හසුනක් බාර දුණි. එය දුටු රජතුමා උත්තිය මරා දමා කිසිත් නොදැන සිටි රහත් භික්ෂුව උණු කළ තෙල් කටාරමක ගිල්වා මරා දැමීය.

මෙයින් කම්පාවට පත් මුහුදට අරක් ගත් දේවතාවෝ භූමිය දෙසට දැවැන්ත රළ පහර එවූහ. රජතුමා කළ වරද නිවැරදි කර ගන්නා ලෙසට රට වැසියන් බල කළෝය. ඉක්බිතිව දෛවඥ උපදෙස් ප්‍රකාරව රජතුමාගේ වයස අවු. 15 ක තරුණ දියණිය රන් ඔරුවක බහා මුහුදේ පා කොට හැරීය.

ගොඩ ගැලූ මුහුදු ජලය බැස ගියේය. රළ පහර ද නතර විණි. දකුණේ කිරින්දට පාවී ගිය ඔරුවේ සිටි රජ කුමරිය මාගම (තිස්සමහාරාම) රජ කළ කාවන්තිස්ස රජු විසින් සරණ පාවා ගැනිණ. ඇය විහාර මහා දේවිය හැටියට නම් කෙරිණි.

2004 සුනාමිය වූ කලී මෙතෙක් වාර්තා කර ඇති ඉතාම විශාල වූ ද විනාශකාරී වූද සුනාමිය වන අතර ඓතිහාසික යුගයේ හට ගත් ඉතාම දරුණු වූ ස්වාභාවික ව්‍යසනය විය.

මිනිසාගේ අයහපත් ක්‍රියාවලට දෙවියන් කෝපයට පත් වී දෙන දඬුවමක් හැටියට සුනාමි ව්‍යසනය සැලකීම වරදක් නැතැයි වරෙක මට සිතේ.

# අන්දමන් දූපත්හි හුදෙකලා ගෝත්‍රිකයන් හමුවීමට ගිය ඇමෙරිකානුවෙකු මරා දමයි

■ (බී.බී.සී. සිංහල පුවත්)

ඉන්දියාවට අයත් අන්දමන් සහ නිකොබා දූපත්හිදී ඝාතනය වූ ඇමෙරිකානු ජාතික තරුණයා පිළිබඳ තොරතුරු අනාවරණය වී තිබේ.

එම දූපත් ආසන්න මුහුදු තීරයේ ධීවර කටයුතුවල නිරත වන ඉන්දීය ධීවරයින් පවසන්නේ, ජෝන් ඇලන් චාවු නමැති ඇමෙරිකානු තරුණයා පිටස්තරයින්ට තහනම් කර ඇති උතුරු සෙන්ටිනල් දූපතට ගොඩ බැසීමෙන් පසු දුනු ඊතල ප්‍රහාරයකට ලක්ව ඇති බවය.

27 හැවිරිදි එම තරුණයා ක්‍රිස්තියානි ධර්ම දූත සේවයේ නිරතව සිටි අයෙකු බව ඉන්දීය බලධාරීහු පවසති.

කෙසේ වෙතත්, සමාජ මාධ්‍යවල සඳහන් තොරතුරු සහ ඔහුගේ සම්මුඛ සාකච්ඡාවකට අනුව ඔහු වීර ක්‍රියාවල නිරත වීමට කැමැත්තක් දැක්වූ අයෙකි.

"මම කැමතියි අලුත් දේවල් හොයාගෙන යන්න" ඔහු සිව් වසරකට පෙර Outbound Collective නමැති වෙබ් අඩවියට පවසා තිබිණි.

"වනාන්තරයේ කොතරම් ගස් වැවිලා තිබුණත් අන්දමන් දූපත්වල කැළෑවක තියෙන දිය ඇල්ලක් සොයා ගැනීම හෝ නගරයක් වටේ ඇවිදීම වගේ දේවලින් මට සතුටක් ලැබෙනවා. මම හදවතින්ම ගවේෂකයෙක්."

මේ වන විට වාර්තා වී ඇති ආකාරයට, නීතිවිරෝධී ලෙස ධීවරයින් පිරිසකට මුදල් දී අන්දමන් දූපත් වෙත ගිය අවස්ථාවේ ඔහු සෙන්ටිනල් ගෝත්‍රිකයින් විසින් ඝාතනය කරනු ලැබ තිබේ.

"ජෝන් චාවු සෙන්ටිනල් දූපතට මීට කලින් හතර පස් වතාවක් ගිහින් තියෙන බව පොලීසිය කියනවා" වසර ගණනක සිට මෙම දූපත් ආවරණය කරන මාධ්‍යවේදියෙකු වන සුබීර් භෞමික් බීබීසී හින්දි සේවයට පැවසීය.

ඉන්දීය වෙබ් අඩවියක් වන හැෆි එසබමෑ වෙත අන්දමන් දූපත් භාර ඉන්දීය පොලිස් අධ්‍යක්ෂ ජනරාල් දිපේන්ද්‍ර පතාක් පවසා ඇත්තේ, චාවු ඇමෙරිකාවේ ඇලබාමා ප්‍රාන්තයේ පදිංචිකරුවෙකු වූ අතර ඔහු 'එක්තරා ආකාරයක ප්‍රථමාධාර පිළිබඳව දැනුමක් පැවති අයෙකු' බවය.

"මිනිස්සු හිතාගෙන ඉන්නේ ඔහු දූත සේවයේ නිරත වුණා කියලා. එහෙම හිතනවා ඇත්තේ, ඔහු දෙවියන් වහන්සේ ගැන ගොඩක් සඳහන් කරල තිබුණු නිසා. ඒත් හරියටම බැලුවොත් ඔහු දූත සේවයේ යෙදී සිටි කෙනෙක් නොවෙයි. ඔහු වීර ක්‍රියාවලට ප්‍රිය කළ කෙනෙක්. ඔහුගේ අරමුණ වුණේ අන්දමන් දූපතේ ආදි වාසීන් මුණ ගැහෙන එකයි."

ඉන්දීය බලධාරීන් පවසන්නේ, වසර 60,000ක් පමණ හුදෙකලා වී සිටි මෙම ගෝත්‍රික දූපත් වාසීන් උපරිම වශයෙන් 150 දෙනෙකු පමණ වාසය කරනු ඇති බවට විශ්වාස කරන බවය.

අදාළ තරුණයා දූපත් වාසීන්ට තිලිණ කිරීම සඳහා කුඩා පාපන්දුවක්, බිලී පිතිවලට භාවිත කරන නූලක් සහ කතුරක් ආදී ත්‍යාග කිහිපයක් රැගෙන ගිය බව වාර්තා වී තිබේ.

ඔහු 2014 වසරේදී Outbound Collective වෙබ් අඩවියට පවසා තිබුණේ, වැන්කුවර්හි පදිංචිව සිටින තමන් පාපන්දු පුහුණුකරුවෙකු ලෙස සේවය කරන අතර කුඩා කාලයේ සිටම සංචාරයේ නිරත වීමට දැඩි කැමැත්තක් දක්වන බවය.

"මගේ සහෝදරයායි මමයි පොඩි කාලේ මූණුවල බ්ලැක්බෙරි ඉස්ම ගාගෙන කෝටුවලින් දුනු ඊතල සහ හෙල්ල හදාගෙන සෙල්ලම් කළා. ඒ කාලෙ ඉඳලම මගේ ගෙදර වුණේ ගෙයින් පිටතයි."

ඔහු පැවසුවේ, ගවේෂකයෙකු වූ ඩේවිඩ් ලිවින්ග්ස්ටන් සහ ජේසුස් වහන්සේ කෙරෙහි වැඩි ඇල්මක් දැක්වූ බවය.

ඔහු එහිදී පවසා තිබුණේ, සිය ඊළඟ අරමුණ අන්දමන් සහ නිකොබා දූපත් වෙත යළිත් ගොඩ බැසීම බවය.

"එහෙ බලන්න දේවල් වගේම කරන්න දේවලුත් ගොඩක් තියෙනවා."

චාවු මෑතකදී ඉන්ස්ටග්‍රෑම්හි පළ කර තිබුණේ, ඔහු අන්දමන් දූපත්හි විශාලතම නගරය වන ඩිග්ලිපූර් වෙත ගමන් කරමින් සිටින බවය.

### සමාව

මේ අතර, සිය පුත්‍රයා වන චාවු ඝාතනය කළ අන්දමන් දූපත්හි ගෝත්‍රික වැසියන්ට සමාව දෙන බව ඔහුගේ පවුලේ සාමාජිකයින් පවසා තිබේ.

නිවේදනයක් නිකුත් කරමින් ඔවුන් පවසා ඇත්තේ, ජෝන් ඇලන් චාවු "දෙවියන්ට, ජීවිතයට සහ උපකාර අවශ්‍ය අයට ආදරය කළා. ඒත් ඔහුට කිසි දෙයක් ලැබුණේ නැහැ. මොනවා වුණත් සෙන්ටිනල් වැසියන්ට ආදරය කරමු" යනුවෙනි.

චාවුට අන්දමන් දූපත් වෙත ළඟා වීමට සහය දුන් බව කියන ධීවරයින් ඇතුළු පුද්ගලයින් 7 දෙනෙකු මේ වන විට අත්අඩංගුවට ගෙන තිබේ. එහෙත් ඔහුගේ පවුලේ සාමාජිකයින් ඉල්ලා සිටින්නේ, ඔවුන් නිදහස් කරන ලෙසය.

"අන්දමන් දූපත්වලට යන්න ඔහුට උදව් කළ අනෙක් මිතුරනුත් නිදහස් කරන ලෙස ඉල්ලා සිටිනවා. ඔහු එහි ගියේ ඔහුගේම කැමැත්තෙන්. ඒ නිසා ඔහුට උදව් කළ පුද්ගලයින් ඔහුගේ ක්‍රියාවක් නිසා නීතියෙන් දඬුවම් විඳිය යුතු නැහැ."

# ඉන්දීය සුපිරි නළු අමිතාභ් බච්චන් රුපියල් මිලියන 40 ක ගොවි ණය ගෙවා දමයි

■ (බී.බී.සී. සිංහල පුවත්)

ඉන්දීය ගොවීන්ගේ රුපියල් මිලියන 40 ක ණය මුදල් තමන් විසින් ගෙවා දමනු ලැබූ බව බොලිවුඩ් සුපිරි නළු අමිතාභ් බච්චන් පවසයි.

අඟහරුවාදා සිය වෙබ් අඩවියේ සටහනක් තබමින් ඔහු පවසා ඇත්තේ, තමන් ගොවීන් 1398 දෙනෙකුගේ ණය ගෙවා දමමින් ඔවුන් ආරක්ෂා කළ බවය. එය "යුතුකම් ඉටු කිරීමක්" ලෙස තමන්ට දැනෙන බව ඔහු සඳහන් කර තිබිණි.

එම ගොවීන් සියලු දෙනා උත්තර් ප්‍රදේශ් ප්‍රාන්තයේ පදිංචිකරුවන් වන අතර එය අමිතාභ් බච්චන්ගේ උපන් ප්‍රදේශයයි.

දශක ගණනක් පුරා ඉන්දීය ගොවිහු නියඟය, ජලය හිඟකම, නිෂ්පාදනය අඩුවීම සහ නූතන ක්‍රම භාවිතයට නොයෑම යන කරුණුවලින් පීඩා විඳිමින් සිටිති.

ඒ හේතුවෙන් මේ වන විට ඉන්දියාවේ දස දහස් ගණනක් ගොවිහු ණය බරින් මිරිකී සිටිති.

තමන් මුහුණදෙන ගැටලු හේතුවෙන් ගොවීන් සියදිවි නසා ගැනීම්වලට නැඹුරු වී සිටි අතර, 1995 වසරේ සිට මේ දක්වා ගොවීන් 300,000 ක් පමණ සියදිවි හානි කරගෙන තිබේ.

76 හැවිරිදි අමිතාභ් බච්චන් ඉන්දියාවේ මෙතෙක් බිහිවූ වඩාත්ම ජනප්‍රිය සිනමා නළුවෙකු ලෙස සැලකේ. ඔහු පවසන්නේ, බැන්ක් ඔෆ් ඉන්දියා නමැති ඉන්දීය රජයට අයත් බැංකුවෙන් ණය ගත් ගොවීන්ගේ ණය තමන් පියවූ බවය. එහි වටිනාකම ඉන්දීය රුපියල් මිලියන 40 ට අධිකය.

"මම කැමතියි මේ ණය ගෙවීම පිළිබඳ ලිපි පෞද්ගලිකව ඔවුන් අතටම දෙන්න," බච්චන් සඳහන් කර තිබේ.

සියලු ගොවීන් තමන් වෙසෙන මුම්බායි නගරය වෙත රැගෙන ඒම දුෂ්කර හෙයින් දුම්රියක් වෙන් කරවා ගොවීන් 70 දෙනෙකු ගෙන්වාගෙන ඔවුන් අතට සියලු බැංකු ලේඛන ලබා දීමට කටයුතු කරන බව ඔහු පවසයි. එම ගොවීන් ලබන 26 වන දා මුම්බායිහිදී බච්චන් හමුවීමට නියමිතය.

මේ වසර මුලදී අමිතාභ් බච්චන් මුම්බායි නගරය අයත් මහාරාෂ්ට්‍ර ප්‍රාන්තයේ ගොවීන් 350 දෙනෙකුගේ ණය ගෙවා දැමීය.

අමිතාභ් බච්චන් ඉන්දීය චිත්‍රපට 190 කට අධික සංඛ්‍යාවකට රංගනයෙන් දායක වී තිබේ. ඊට අමතරව ඔහු හොලිවුඩ් සිනමා නිර්මාණ කිහිපයකටද දායක විය.

ඔහු ඉන්දියාවේ වඩාත් ජනප්‍රිය රූපවාහිනී වැඩසටහනක් වන Who Wants to be a Millionaire වැඩසටහනේ හින්දි නිෂ්පාදනය වන අතර Kaun Banega Crorepati වැඩසටහන මෙහෙයවන්නා ලෙසද කටයුතු කරයි.

1 වන පිටුවෙන්

## ඔසාවා GM ....

කරන බොහෝ කැඳවීම් මෘදුකාංග හා විද්‍යුත් මෝටර් රථවාහන පිළිබඳ විශේෂඥ දැනුමින් යුත් පිරිසට පමණක් සීමා විය හැකි බවයි.

සමස්තයක් ලෙස ගත් කළ සමාගම ගත් මෙම පියවර ඔවුන්ට වාසිදායක වුවත් වුවත් ඔවුන් විසින් උතුරු ඇමෙරිකාවේ වසා දමන කර්මාන්ත ශාලා නිසා අහිමි වී යන රැකියා ප්‍රමාණය 14,700 ඉක්මවති. ඊට අමතරව තවදුරටත් වියදම් කපා හැරීම සඳහා උතුරු ඇමෙරිකාව තුළ ඉතිරිව ඇති GM කර්මාන්ත ශාලාවල සේවය කරන ශ්‍රම බලකාය වෙත මෙතෙක් ගෙවූ වැටුප සියයට 15 කින් අඩු කිරීමටද සමාගම තීරණයක් ගෙන තිබේ.

ඔසාවා කර්මාන්ත ශාලාව වසා දැමීම පිළිබඳව එහි සේවක පක්ෂය වෙනුවෙන් අදහස් දැක්වූවකු පවසා ඇත්තේ GM සමාගම සේවකයින් පිළිබඳව කිසිදු තැකීමක් නොකොට ඔවුන් මුහුණ දෙන ඊළඟ ආර්ථික පසුබෑමෙන් ගැලවීමට ඉතාමත් ආත්මාර්ථකාමී අන්දමින් දැන් සිටම සූදානම් වන බවයි. එසේම ඇමරිකානු ජනාධිපති ට්‍රම්ප් යටතේ පසුගිය දිනවල සිදුකෙරුණු වෙළෙඳ ගිවිසුම්වල පවතින ආනයනික වාහන මත අය කෙරෙන විභව ගාස්තුවද කැනඩාව තුළ මෝටර් රථ කර්මාන්තය මේ ආකාරයට අඩපණ කිරීමට සෘජුවම බලපා ඇති බව ඔහුගේ අදහසයි.

ජෙනරල් මෝටර්ස් සමාගම මීන් දශකයකට පෙර බංකොලොත්භාවයට පත් වූ අවස්ථාවේදීත් ඔසාවාහි GM වාහන එකලස් කිරීමේ කර්මාන්ත ශාලාව පවත්වාගෙන යාම පිළිබඳව විවිධ ගැටලු මතු විය. නමුත් ඒවා මැඩ පවත්වාගෙන වාහන එකලස් කිරීමේ කටයුතු සිදුකිරීමට ඔසාවා පාලන අධිකාරිය කටයුතු කොට තිබුණි. එහෙත් මෙවර කර්මාන්තය දියුණු කිරීමේ පියවරක් වශයෙන් එය ඔසාවා වෙතින් ගලවා දැමීමට කටයුතු කිරීම පිළිබඳව බොහෝ දෙනෙකු අප්‍රසාදය පළ කොට සිටී. මේ පිළිබඳව කැනේඩියානු රජයද යම් පමණකට වගකිව යුතු බව විවිධ සංවිධාන පවසති.

2009 වසරේදී කැනේඩියානු රජය හා GM සමාගම එක්ව ගෙන ගිය ආර්ථික ප්‍රතිපත්ති කොන්දේසිවලට අනුව උතුරු ඇමෙරිකාවේ නිෂ්පාදනය කරනු ලබන සමස්ත GM වාහනවලින් සියයට 16 ක් නිෂ්පාදනය කිරීමේ අයිතිය කැනඩාව වෙත පැවරුණි. නමුත් එම කොන්දේසිය 2016 දී අවසන් වූ අතර එතැන් පටන් කැනඩාවේ GM වාහන නිෂ්පාදන කර්මාන්තය ක්‍රමයෙන් බිඳ වැටීමට පටන් ගැනුණි. 2015 වසරේ ඇමරිකාවේ මිචිගන් ප්‍රාන්තයේ GM වාහන එකලස් කිරීමේ ප්‍රධාන මධ්‍යස්ථානය විවෘත කිරීමත් සමග ඔසාවා කර්මාන්ත ශාලාව දැඩි පසුබෑමකට ලක් විය. එතෙක් ඔසාවා කර්මාන්ත ශාලාවෙන් සිදුකෙරුණු බොහෝ කටයුතු මිචිගන් වෙත යොමු වුණු අතර මිචිගන් හි නිපදවන වාහන ලොව පුරා බෙදා හැරුණි. එවර එම හේතුව නිසා ඔසාවා කර්මාන්ත ශාලාවේ සේවය කළ 1,000 ක් පමණ රැකියාවලින් ඉවත් කිරීමට ඔසාවා GM පියවර ගෙන තිබුණි.

කැනඩාවේ වෘත්තීය සමිති එකමුතුවක් වන Unifor ද මෙම කර්මාන්ත ශාලාව වසා දැමීමට GM ගෙන ඇති පියවර ගැන නිවේදනයක් නිකුත් කර තිබුණි. එයට අනුව, කර්මාන්ත ශාලාව වසා දැමීම පිළිබඳව සම්පූර්ණ තොරතුරු මෙතෙක් Unifor වෙත ලැබී නොමැති බවත් එම තොරතුරු ලද වහාම මේ පිළිබඳව අදාළ අංශ සමග සාකච්ඡා කිරීමට බලාපොරොත්තු වන බවත් ඔවුන් පවසා සිටී. දහස් ගණනකගේ රැකියා අහිමි කරමින් GM වසා දැමීම සම්බන්ධයෙන් වෘත්තීය සමිතියක් ලෙස ගත හැකි සියලු වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමට ඔවුන් කටයුතු කරන බව එහි සඳහන් වේ. කැනඩාවේ පෞද්ගලික අංශයේ සේවයේ නියුතු 315,000 කගේ පමණ වෘත්තීය අයිතිවාසිකම් නියෝජනය කරන Unifor, කැනඩාවේ පෞද්ගලික අංශයේ විශාලතම වෘත්තීය සමිතියයි.

මේ අතර උතුරු ඇමෙරිකාවේ GM මෝටර් රථ කර්මාන්ත ශාලා 5 ක් වසා දැමීමට ගත් තීරණය වැනිම වූ තවත් සුවිශේෂී තීරණයක් පසුගියදා ජෙනරල් මෝටර්ස් සමාගම විසින් නිවේදනය කොට තිබුණි. ඒ GM මෙතෙක් නිපදවූ සෙඩාන් වර්ගයේ මෝටර් රථ 6 ක් 2019 වසරේ සිට නිෂ්පාදනය නොකරන බවයි. එහිදී පහත සඳහන් මෝටර් රථ 6 තවදුරටත් GM මෝටර් රථ ලැයිස්තුවට ඇතුළත් නොවනු ඇත. Buick LaCrosse, Cadillac CT6, Cadillac XTS, Chevrolet Cruze, Chevrolet Impala, Chevrolet Volt.

පසුගිය වසර කීපය තුළ වෙළඳපොළෙහි මෙම මෝටර් රථ වර්ගවල අලෙවිය සීඝ්‍රයෙන් පහත වැටීමට පටන් ගැනීමත් සමග එම රථ නිෂ්පාදනය නතර කර දැමීමට GM සමාගම තීරණය කොට ඇත.

# නත්තල් කැරොල් ගී



සිංහල ගීත සාහිත්‍යයේ කිතුනු ගීවල එන ගිතිකා වෙනස්ම ගීත විශේෂයකි. එහෙත්, අවාසනාවකට ලංකාවේ කිතුනු ගීත සාහිත්‍ය පිළිබඳව විද්වතුන්ගේ අවධානය යොමු වී නොමැත. ලංකාවේ කිතුනු ගීත ගැන වැඩි වශයෙන්ම අවධානයට සහ කතාබහට යොමුවන්නේ දෙසැම්බර් මාසයෙන් එළඹෙන නත්තල් සමයේදීය. ඒ අසිරිමත් නත්තල් සමයේ නිරන්තරයෙන් මාධ්‍යය ඔස්සේ නත්තල් ගීත ඇසේ. ඒ නිසා මේ කිතුනු ගීත ගැන කතා කරන්නට කලින් මෙම ගීත කොටස් කිපයකට බෙදා වෙන්කර ගත යුතු බව පෙනේ.

- නත්තල් ගී
- කැරොල් ගී
- පසම් ගී
- කන්තාරු ගී

මේ ගීත වර්ග හතරද තවත් කොටස් ගණනාවකට බෙදිය හැකි වුවත් එතරම් ගැඹුරු අධ්‍යයනයකට නොයා අපේ සරල රස වින්දනය උදෙසා මේවා එක එක කොටස් වෙන වෙනම විමසා බලමු. තවද මේ ගීතිකාවලින් සමහරක් කිතුනු බැතිමතුන් යාඥා ස්වරූපයෙන් ගයන ගීත විලසටද, තවත් ගීතිකා කොටසක් දේව ස්තෝත්‍ර වශයෙන්ද ගායනා කරති. ඒ ඒ අවස්ථාවන් අනුව මෙම ගීතිකා කැරොල් ගීත, නත්තල් ගීත, දුක් ප්‍රාප්ති ගීත (පසම් ගීත) යනුවෙන්ද විවිධ කොටස් වශයෙන් කිතුනු ගීත සාහිත්‍යයේ ඇත.

## කිතුනු ගීයේ ඉතිහාසය

ලංකාවේ කිතුනු ගීත සාහිත්‍යයට ඇත්තේ ඉතාමත් දීර්ඝ ඉතිහාසයකි. ලන්දේසීන්ගේ සමයේ පටන් මෙරට කිතුනු ගීත සාහිත්‍යයේ පිබිදීම ඇතිව තිබුණි. එහෙත් සාහිත්‍ය අංගයක් වශයෙන් කිතුනු ගීතයේ පිබිදීම ඇති වූයේ ජෝශප් වාස් පියතුමා නිසාය. ශ්‍රී ලාංකිකයෙක් නොවුනත් ලන්දේසින්ගෙන් සැඟවෙමින් හා ආරක්ෂා වෙමින් කිතුනු ආගම හා සාහිත්‍යය ලංකාවේ ආරක්ෂා කර ගැනීමට කැප වී ක්‍රියා කළ පියතුමෙකි. උන්වහන්සේගෙන් පසුව කිතුනු ගීතය සහ සාහිත්‍යය ලංකාව පුරා ව්‍යාප්ත කිරීමට පුරෝගාමී මෙහෙවරක් ඉටුකරන ලද්දේ ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් විසිනි. ඒ නිසා ලංකාවේ කිතුනු ජනතාව ඉදිරියට ගෙන ගොස් කලාත්මක සාහිත්‍යාංගයක් ලෙස ජනප්‍රිය කරවීමේ පුරෝගාමියා ලෙසට පිළිගැනුමට ලක් වෙමින් ජාකෝමේ ගොන්සාල්වෙස් පියතුමන් ඉතිහාසගත වෙයි.

මේ පියවරුන් දෙදෙනාම විදේශ සම්භවයක් සහිත පියවරුන් දෙදෙනෙකු වුවත් උන්වහන්සේලා මෙරටට වැඩම කොට එකල මෙරට විසූ භික්ෂුන් වහන්සේලාගෙන් සිංහල භාෂාව මැනැවින් ඉගෙන ගෙන කිතිනු ගීත සාහිත්‍ය, පාස්කු නාට්‍ය, කැරොල් ගී, මෙන්ම ශුද්ධ වූ බයිබලයද සිංහල බසට පරිවර්තනය කිරීමට පුරෝගාමී වූහ.

## කැරොල් ගී හෙවත් නත්තල් ගී

කැරොල් ගී යනු සතුට විනෝදය දනවන ගීතිකා විශේෂයකි. මේවා නත්තල් ගීත වශයෙන්ද හැඳින්වෙයි. මේ කැරොල් ගීත ජනප්‍රිය ආකෘතියේ ගීත වන අතර දේවස්ථානයන්හි ඉදිරිපිට තැනූ වේදිකාවල සිට හෝ රථයක නැගී නගරවල වීදි සංචාරය කරමින් විවිධ වර්ණයෙන් යුතු පහන්, බකට් මෙන්ම විවිධ මල් වර්ග අත තබාගෙන කැරොල් ගී ගායනා කරති.

නත්තල් කාලයට වැදගත් වන කැරොල් ගීත සලකා බලමු. 'කැරොල්' යන ප්‍රංශය වචනය මුලදී උත්සවවලදී ගයන ගීත වෙනුවෙන් යෙදුනත් පසුකාලීනව එය නත්තල් ගීත වෙනුවෙන් යෙදුණි. මේ ගීතවල විශේෂත්වය වන්නේ නත්තල් කාලයට පමණක් ගායනා කිරීමත් එමගින් සතුට සෞභාග්‍යය සංකේතවත් කිරීමත්ය. පොදුවේ ගත් කල අතීතයේ සිට අද දක්වා දහස් ගණන් කැරොල් ගීත ලියවුණත් පහත සඳහන් ගීත අදටත් සාම්ප්‍රදායික කැරොල් ගීත ලෙස සෑම නත්තලකදීම ගායන කරයි. අදටත් එක සේ ජනප්‍රියයි. ඔබ එයින් එකක් හෝ කීපයක් අනිවාර්යයෙන්ම අසා ඇති.

- Angels We Have Heard on High
- Deck the Halls (Deck the Hall)
- Ding Dong Merrily on High
- The First Nowell (The First Noël)
- Go Tell It on the Mountain
- I Saw Three Ships
- It Came Upon the Midnight Clear
- Joy to the World
- O Holy Night (Cantique de Noël)
- O Little Town of Bethlehem
- Silent Night
- The Twelve Days of Christmas
- We Three Kings of Orient Are
- We Wish You a Merry Christmas

මෙහි වැදගත් කරුණ වන්නේ බෞද්ධයන් වෙසක් භක්ති ගීත ගැයීම ආරම්භ කරන්නේ කිතුනු කැරොල් ගීතිකා අනුසාරයෙනි. ඒ නත්තල් කැරොල් ගීත අනුකරණය කිරීමෙන් 1950 -60 පමණ දශකයේ සිටය. එය වෙසක් කැරොල් ගීත වශයෙන් නිවැරදිව භාවිත කළ යුතු වුවත් අද බොහෝ දෙනෙක් ඒවා වෙසක් බැති ගී හෝ පොසොන් බැති ගී ලෙස හැඳින්වීමට පුරුදුව සිටිති. එහෙත් ඒ අනුව වෙසක් බැති ගීයට මුලාශ්‍රය සපයා ගන්නේ දේවස්ථානයේ ගැයෙනු කැරොල් ගීත සහ ගීතිකා ඇසුරින් බව කිසිවකු නොදනිති. එහි ආරම්භයට මුල දේවස්ථානයන්හි ගැයුණු කැරොල් ගීතිකා බව කිසිවකු නොකියති.

පසුකාලයේ මේ ගී තවත් දියුණු වෙමින් නත්තල් ගීත වශයෙන් ගීත විශේෂයක්ද බිහිවිය. නිදසුනක් ලෙස පුළුන් වගේ සුදු රැවුල දිගයි, සීනු හඬින් ලොව පිබිදෙනවා, අද නත්තල් වැනි ගීත දැක්විය හැකිය. එසේවුත් ආගමික මුහුණුවරක් ගන්නා ගීත කැරොල් ගීත වශයෙන් හැඳින්විය හැකිය. ලංකාවේ ජනප්‍රිය කැරොල් ගී රැසක් අප නත්තල් ගී ලෙස හඳුන්වන, අපට නිරන්තරයෙන් ඇසෙන ගීය. ඒ සියල්ලම අයත් වන්නේ කැරොල් ගීතවලටය. මතු දැක්වෙන්නේ එවන් ගීයකි.

බෙත්ලෙහෙම් පුරේ - දිළිඳු ගව ලෙනේ
ඔරුව තුළේ සිසිලෙ නිදයි
ජේසු බිලින්දා - ජේසු බිළින්දා

ලෙළෙන කැන් දිදී - අමුතු තරුවෙකී
අඳුර මැදින් එළිය මවයි
ජේසු බිළින්දා - සාමෙ රජින්දා

නිරිඳුන් තිදෙනා - තරු වන් දිලෙනා
මග අහගෙන යති දැකුමට
ජේසු බිලින්දා - සාමෙ රජින්දා

සත වෙත කරුණා
පිනිදිය ගලනා

මුදු උල්පත පාදා දුනි
ජේසු බිලින්දා - සාමෙ රජින්දා

## පසම් ගී

පසම් ගීතද කිතුනු ගීවල හමුවන විශේෂිත ගීත කොටසකි. මේවාද බැති ගී ලෙස හැඳින්වූවාට වරදක් නොපෙනේ. නත්තල් සමයේ මේ ගී ඇසෙන්නේ නැතුවා සේම මාධ්‍ය ඔස්සේද ප්‍රචාරය නොවේ. මේ ගීත නිර්මාණය වී ඇත්තේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තිය නිමිති කරගෙනය. ඒ නිසා පසම් ගීත සහ දුක් ප්‍රාප්තිය අතර නිරන්තරයෙන් අත්‍යන්ත බැඳීමක් දැකිය හැකිය. ළතෝනිය වැලපීම යන වචනද නිරන්තරයෙන් මේ පසම් ගීත සම්බන්ධයෙන් යෙදේ. මේවා සියවස් ගණනක් තිස්සේ පැවතෙමින් ආ බව පැහැදිළි වන නමුත් අද මේවා දේවස්ථානයන්හි පවා ගායනා වන්නේ ඉතාම මඳ වශයෙනි. එයද ගායනා කරන්නේ මුහුදුබඩ පළාත්වල වෙසෙන කිතුනු ජනයා පමණි.

පසම් ගීවල විශේෂතා කීපයකි. එනම් පසම් ගී ගැයෙන්නේ චතාරික සමයේදීය. නිවෙස්වල එළිමහනට වී පවුලේ උදවිය සමග හෝ කුඩා කණ්ඩායම් වශයෙන්ද ගායනා කෙරන්නේ මුද්‍රිත පොතක් බලා ගැනීමෙන්ය. එය සමූහ ගායනයකි. පදයෙන් පදය මාරුවෙන් මාරුවට ගායනා කරනු ලබයි.

පසම් ගීත ගැයෙන්නේ අළු බදාදා සිට පාස්කු ඉරිදා දක්වා සති හය හමාරක කාලයේදීය. සංගීතයක් නැති තරම්ය. ඇසෙන්නේ වධබෙරය හෙවත් කටකටකයේ හඬ පමණි. බෙහෝ විට මේවා දුක්මුසු ස්වරූපයෙන්ම ගැයේ. මතු දැක්වෙන්නේ පසම් ගීයකි.

බෝ සෝ දැරූ ජේසු පුතණුනේ - මා අතහැරා
මේ වූ රැයේ කොහෙද පුතු මගේ
දෑස සේ මගේ විසූ නුඹ පුතේ - මා අතහැරා
මේ වූ රැයේ කොහෙද පුතු මගේ
ලේ කිරි දිදී සැදුවෙ පණ ලෙසින් - මා අතහැරා
මේ වූ රැයේ කොහෙද පුතු මගේ
දිළිඳු ගවලෙනේ බිළිඳු සීතලේ - වෝ කාඬු
කොහෙද පුතු මගේ කොහෙද පුතු මගේ
බෝ සෝ දැරූ ජේසු පුතණුනේ - මා අතහැරා
මේ වූ රැයේ කොහෙද පුතු මගේ

## කන්තාරු ගී

කන්තාරු යනුවෙන් හඳුන්වන්නේ දේවස්ථානයේ ගායනා කරන ස්තොත්‍රයන්ය. මෙයද එක් ආකාරයක කිතුනු ගීත

22 වන පිටුව බලන්න

DENTAL OFFICE
Dr. Iru Vijayanathan, BDS(Peradeniya), MFDS, FAGD
Dental Surgeon (දන්ත ශල්‍ය වෛද්‍ය)

3150 Eglinton Ave E, Scarborough, Unit 5
Phone: (416) 264-3232
3351 Markham Rd, Scarborough, Unit 129 (Red Building)
Phone: (416) 609-2022

- Emergency Dental Care
- Filling - Silver, White
- Root Canal Treatment
- Crown and Bridges
- Cosmetic Dentistry
- Gum Treatment
- Minor Oral Surgery
- Partial Denture
- Complete Denture
- Tooth Extraction
- Wisdom Tooth Extraction





# කැනඩාවෙහි ඉහළ නගින පොලී අනුපාතිකයන් හසුරුවා ගන්නේ කෙසේද?

ඇත්ත වශයෙන්ම ණයගැතියන් හට මුදල් ඉතිරි කිරීම සහ ඊළඟ විනෝද ගමනට කටයුතු සිදුකිරීමට පෙර නැගී එන පොලී අනුපාතිකයන් පිළිබඳව බොහෝ දෑ සිදු කළ හැක. මුදල් ඉතිරි කිරීම පිළිබඳව සලකන විට, එය ණය මුදලෙහි කොටසක් ලෙස අනෙකුත් වත්කම් වෙනුවෙන් පොලී නොගෙවන අය හට පහසු වන නමුත් එය සෑම අයෙක්ටම අදාළ නොවේ. ඔබ ණයගැතියා වන විට ඇත්තෙන්ම මෙම පොලී අනුපාතික වෙනස්වීම ඔබට දැඩි පීඩනයක් වනු ඇත. පොලී අනුපාතිකයන්ගේ ඉහළ යාමට පහසුවෙන් මුහුණ දීම සඳහා යම් ක්‍රම කිහිපයක් මෙහිදී ඉදිරිපත් කර ඇති නිසා ඔබ කණගාටු විය යුතු නැත.

**ඔබ සතු ආයෝජන මත ඔබට දරා ගත හැකි ප්‍රමාණය පිළිබඳව ආතති පරීක්ෂාවක් සිදු කරන්න.**

මෙහිදී, ආතති පරීක්ෂණයක් යනුවෙන් මූලිකව හඳුන්වනු ලබන්නේ මෙම ඉහළ නගින පොලී අනුපාතිකයත් සමග ගනුදෙනු කළ හැකිද යන වග ඔබ සතු ආයෝජන මත පරීක්ෂා කිරීමයි. මෙය මිනිසුන් වෙළඳපොළෙහි දැනට පවතින අවම පොලී අනුපාතිකයන් පිළිබඳ වැඩි අවධානයක් යොමු කරනවා වෙනුවට ප්‍රමුඛතාවය අනාගතය සඳහා ඉලක්ක කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම මගින් තහවුරු කළ හැකිය.

ඔබ මිල දී ගන්නා පාර්ශවය වන විට දැනට පවතින ගණන දෙස නොබලන්න. දැනට වෙළඳපලෙහි පවතින විවිධ අනුපාතිකයන් පිළිබඳව අවධානය යොමු කරන්න. විවිධ පොලී අනුපාතිකයන් සොයා බැලීම සඳහා වෙළෙඳපොළ ගවේෂණය කරන්න.

ඔබට මේ මොහොතේ වැඩි වුණු මුදල් ප්‍රමාණය ගෙවීම ආරම්භ කිරීමට හැකි වීම මගින්ද පොලී අනුපාතිකය ඉහළ යාම සමග ඔබ සතු ආයෝජනයන්ට ගනුදෙනු කළහැකි බවට තහවුරු කරගත හැකිය. වැඩි වූ අනුපාතිකයන් ගෙවීමට හැකි වන ලෙස ඔබගේ අයවැය සැකසීමට උත්සාහ කරන්න. ඔබට ඔබගේ උකස් ණය ගෙවීම ඉහළ ගිය පොලී අනුපාතයට අනුව සම්පූර්ණ ගෙවීමක් ලෙස සිදු කළ හැකි අතර එවිට එය ඔබට වැඩි උකසක් ගෙවීමේදී එතරම් අපහසුවක් නොවනු ඇත.

අයවැය ක්‍රියාත්මක කිරීම, වැඩි මුදලක් ගෙවීම වැනි දේ සඳහා ඔබ කැපවිය යුතුය.

**වෙළඳපොලෙහි තත්වය පිළිබඳ අවධානයෙන් සිටින්න.**

විශේෂයෙන්ම ඔබගේ අවධානය විවිධ ආයෝජන වත්කම් වෙතට යොමු වූ විට ඔබගේ ඉලක්කය මග හැරීම සිදු විය හැකිය. වෙළඳපොළෙහි සිදුවන්නේ කුමක්ද යන්න වෙත ඔබගේ අවධානය යොමු වී ඇති බවට තහවුරු කර ගන්න. එමෙන්ම වෙළෙඳපොළ දැනට හෝ අනාගත ආයෝජනයන් සඳහා ඵලදායි වන බවටද තහවුරු කර ගන්න.

ඔබට ඒ සඳහා පුවත්පත් සහ උකස් තැරැව් කරුවන්ගෙන් ලැබෙන තොරතුරු උපයෝගී කරගත හැකිය. එය ඔබට වෙළඳපොළ තත්ත්වය පිළිබඳව දැනගැනීමට උපකාරී වනු ඇත. වෙළඳපොළ ස්වභාවය වෙනස් වීම අනුව ඔබගේ සැලසුම් වෙනස් කිරීම සෑම විටම වඩාත් යහපත් වනු ඇත. මක්නිසාද යත්, එය ඥානවන්ත ක්‍රියාවක් වන අතරම අවසානයේදී ඔබට මුදල් අහිමි වීමක්ද සිදු නොවනු ඇත.

**ඉහළ නගින පොලී අනුපාතිකයන් වෙනුවෙන් ඔබ සූදානමින් සිටින්න.**

පොලී අනුපාතිකයෙහි ඉහළ යාමකට පෙර ඔබට හැකිතාක් ණය මුදල් ප්‍රමාණයක් ගෙවීමට උත්සාහ කරන්න. ඔබට ගෙවීමට ඇති ණය ප්‍රමාණය අවම අවස්ථාවකදී එය එකවර ගෙවා දමා ඔබගේ ණය බරෙන් නිදහස් වීමට වග බලාගන්න. මෙය ඔබගේ මූල්‍යමය ගැටලු අවම කරනවා පමණක් නොවන අතර එය ඉහළ ණය මුදල් ප්‍රමාණයක් ගෙවීමේ පීඩනයෙන් ඔබ මුදවනු ඇත.

**වැඩි වන පොලී අනුපාතිකයන් වෙනුවෙන් ඔබට සූදානම් විය හැකි ආකාරය මෙහි දැක්වේ.**

- ඔබගේ වියදම් අවම කරන්න. එමගින් ඔබට ඔබගේ ණය මුදල් නැවත ගෙවීමට මුදල් ඉතිරි කරගත හැකි වේ.
- ඉහළ පොලී අනුපාතිකයන් සහිත ණය සඳහා ගෙවීම් සිදු කිරීමට උත්සාහ කරන්න. එමගින් පොලී වෙනුවෙන් අවසානයේදී ඔබට ගෙවීමට සිදුවන්නේ අඩු මුදලකි.
- ණයපත් වැනි ඉහළ පොලී අනුපාතිකයන් සහිත ණය සහ අඩු පොලී අනුපාතිකයන් සහිත ණය ඒකාබද්ධ කිරීමට උත්සාහ කරන්න. නමුත් ඒ සඳහා සමානවම ගෙවීම් නඩත්තු කරන්න.
- අනෙක් අය ඔබට යෝජනා කරන ඉහළ උකස්/සීමාවන් සහිත ණයපත් ලබා නොගැනීමට උත්සාහ කරන්න.
- අමතර මුදල් ණයට ගැනීම ඔබගේ අරමුණ වෙනුවෙන් මුදල් ඉතිරි කිරීම අවහිර කිරීම පිළිබඳව සිතා බලන්න.
- ණය ගෙවීම සඳහා අමතර මුදල් ඉපයීමේ මාර්ගයක් සොයා බලන්න.
- එමෙන්ම, ඔබට බලාපොරොත්තු නොවන ආකාරයට විය හැකි හදිසි අවශ්‍යතාවන් වෙනුවෙන් උපකාර වන ලෙසට අරමුදල් නඩත්තු කර එය ඔබගේ වියදමට එකතු කරන්න.
- දඩ මුදල් ලෙස අමතරව ගෙවීමක් සිදු වීම වළක්වා ගැනීම සඳහා සියලුම ගෙවීම් කටයුතු නිවැරැදි වේලාවටම සිදු කරන්න.
- අවශ්‍ය නම් ඔබගේ ගිණුමක් සහිත බැංකුවක් මගින් ඔබට ඒකාබද්ධ සැලසුම් ණයක් වෙනුවෙන් ඉල්ලුම් කළ හැකිය. ඔබගේ ණය අනුමත වුවහොත් ඔබට වැඩි වාරික මුදලක් ලැබෙනු ඇති අතර එය ඔබගේ සුළු ණය මුදල් ගෙවීමට උපකාරී වනු ඇත.
- අනවශ්‍ය වියදමක් ලෙස ඔබට හැඟෙන ජීවන වියදම්, ගෘහස්ථ වියදම් හැකිතාක් අවම වන ලෙසට අයවැය සැලසුම් කර ගන්න.
- ඔබ ඔබගේ ණය නොගෙවන්නේ නම්, එම මුදල් ඔබගේ ගිණුමෙහි තැන්පත් කරන්න.

කැනඩාවෙහි පොලී අනුපාතික පිළිබඳ කතා කතාකිරීමේදී, එය සැබැවින්ම පෙර සැලසුම්කරණයකින් තොරව ගනුදෙනු කිරීම තරමක් අපහසු දෙයකි. කාලය ගත වීමට පෙර අනාගතය සදහා ඔබ ඔබගේ මූල්‍යමය අරමුණු සැලසුම් කළ යුතුය. සැමවිටම ඔබගේ ණය මුදල් ගෙවීම ඉක්මනින් අවසන් කර ගැනීම සඳහා සෑම මාසයක් සඳහාම ඔබගේ පොලිය වෙනුවෙන් අමතර මුදලක් ගෙවීම ආරම්භ කිරීම අනුමත කළ හැකිය. ඔබට මේවා ක්‍රියාවට නැංවීමෙන් එහි ඵලදායිතාවය දැනගැනීමට හැකිවන අතරම ඔබ බලාපොරොත්තු වූවාටත් වඩා අඩු කාලයකදී ඔබට ණයෙන් නිදහස් වීමටද හැකි වනු ඇත. ඕනෑම ණය පතක් ඉල්ලුම් කිරීමට පෙර ඔබ ඔබගේ මූල්‍යමය තත්ත්වය පිළිබඳව සිතා බැලිය යුතුය. නිසි සැලසුම්කරණය මගින් සහ මුදල් නිවැරදි අයුරින් හැසිරවීම මගින් ඔබට පහසුවෙන් දේවල් කළමනාකරණය කරගත හැකිය.

මුදල් සම්බන්ධ ඕනෑම තීරණයක් ගැනීමට පෙර පොලී අනුපාතික ඉහළ යාම ඔබගේ මූල්‍යමය තත්ත්වයට බලපානු ලබනුයේ කෙසේද යන්න දැන ගැනීම ඔබට මූල්‍යමය ප්‍රවීණයකු මගින් උපකාරයක් ලබා ගත හැකිය. මූල්‍යමය ප්‍රවීණයන් ඔබට ඔබගේ ණය මුදලට සහ ආදායමට අදාලව ඔබගේ පොලී අනුපාතිකයන් ගණනය කිරීම සඳහා උපකාර කරනු ඇත. එමගින් ආයෝජනයන් සඳහා යොමු වනවාද නැද්ද යන වග ඔබට තීරණය කළ හැකිය. මෙම අදහස ඉහළ නගින පොලී අනුපාතිකයන් හට ඔබගේ මුදල් තත්ත්වය කෙසේ වෙනස් කළ හැකිද යන්න පිළිබඳ පැහැදිලි අදහසක් ලබාගැනීම සඳහාය. මෙම ඉහළ නගින පොලී අනුපාතිකයන් හට බලවත් ලෙස ඔබගේ අරමුණු සඳහා බලපෑමට හැකි නිසා ඔබගේ අනාගත මූල්‍යමය අරමුණු සැලසුම් කර තිබීම වඩාත් යහපත්ය. එම නිසා වැඩි වුණු ඉහළ අනුපාතිකයන් සඳහා ඔබ සූදානමින් සිටින්න. එවිට ඔබට මූල්‍යමය අර්බුදයකට මුහුණ දීමට සිදුවීම වැළකෙනු ඇත.

ඉහළ නගින පොලී අනුපාතිකයන් නිසා ඔබගේ එදිනෙදා ජීවන රටාවට බලපෑම් ඇති කළ හැකිය යන කරුණ නොසලකා හැරීමෙන් වැළකී සිටින්න. එමෙන්ම පවතින ජීවන රටාව පවත්වාගෙන යාමට උපකාරී වන ලෙසට ඔබගේ පෙර සූදානම් වීමද අවශ්‍ය වේ. වෙළෙඳපොළ තත්ත්වය පිළිබඳවද අවධානය යොමු කරන්න. එමෙන්ම ඔබගේ මුදල් කළමනාකරණය කරගැනීම පිළිබඳව නිවැරදි මග පෙන්වීමක් සඳහා ඔබගේ මූල්‍යමය විශේෂඥයා අමතන්න.

**ඕනෑම මූල්‍යමය ගැටලුවක් සඳහා gtacredit.com වෙබ් අඩවියට පිවිසෙන්න හෝ 416 650 5400 අමතන්න.**

# කිලෝග්‍රෑමයට නිවැරදි අලුත් අර්ථ දැක්වීමක්

**(බී.බී.සී. සිංහල පුවත්)**

කිලෝග්‍රෑමය අර්ථ දැක්වීමේ ක්‍රමවේදය වෙනස් කිරීමට විද්‍යාඥයෝ සූදානම් වෙති.

මේ වන විට කිලෝග්‍රෑමය අර්ථ දක්වනුයේ, ප්‍රංශයේ පැරිස් නුවර සේප්පුවක තබා ඇති Le Grand K නමැති ප්ලැටිනම් උපකරණයක් භාවිත කරමිනි.

එම ක්‍රමය අත්හැර කිලෝග්‍රෑමය විද්‍යුත් තරංග භාවිතයෙන් අර්ථ දැක්වීමේ ක්‍රමවේදයකට අවතීර්ණ වීම සඳහා ඡන්ද විමසීමකට පර්යේෂකයින් පිරිසක් බලාපොරොත්තුවෙන් සිටිති. මෙම තීන්දුව ගත යුත්තේ, ප්‍රංශයේ පැවැත්වෙන බර සහ මිනුම් සම්බන්ධ මහා සම්මේලනයේදීය.

කෙසේ වෙතත්, පර්ඩේ විලියම්ස් ඇතුළු විද්‍යාඥයින් කිහිප දෙනෙකු මෙම වෙනස් කිරීම සම්බන්ධයෙන් මිශ්‍ර අදහස් පළ කර තිබේ. පර්ඩේ විලියම්ස් පැවසුවේ, “මේ ව්‍යාපෘතියෙ මම වැඩි කාලයක් වැඩ කළේ නැහැ. ඒත් මට හිතෙන්නේ මේක කිලෝග්‍රෑම් එකට කරන විකාර වෙනසක් කියලා” යනුවෙනි.

“මොනවා වුණත් මේක ලොකු වැඩක්. මේ වෙනස ගැන මට ටිකක් දුකයි. ඒත් ඒක වැදගත් පියවරක් එය ක්‍රියාවට නැගීම හොඳ දෙයක් විය හැකියි. මම නොඉවසිල්ලෙන් බලාගෙන ඉන්නෙ ඒක සිද්ධ වෙනකම්”

Le Grand K උපකරණය බර මැනීම සඳහා වන ජාත්‍යන්තර ක්‍රමවේදය ලෙස භාවිතයට ගැනුණේ, 1889 වසරේ සිටය. එහෙත්, කිලෝග්‍රෑමය නිර්ණය කරන ප්‍රධාන උපකරණය මේ වන විට පැරණි වී තිබේ. වසර ගණනක් තිස්සේ පරිහානියට පත්වීමෙන් එහි බර වෙනස් වී තිබේ. කිලෝග්‍රෑමය කිසිදා වෙනස් විය නොහැකිය. එහෙයින්, එය නිර්ණය කිරීම ක්‍රමානුකූලව වෙනස් විය යුතුය.

දියුණු ඖෂධ නිෂ්පාදනය, නැනෝ තාක්ෂණය සහ නිරවද්‍ය ඉන්ජිනේරු ක්‍රම වර්ධනය වෙමින් පවතින වත්මන් ලෝකයේ වඩා නිවැරදි මිනුම් ක්‍රම අවශ්‍ය වී ඇති හෙයින් Le Grand K වැනි ක්‍රම වෙනස් විය යුතුය.

## Le Grand K කොපමණ වැරදිද?

මෙම ක්‍රමවේදයේ වරද බිලියනයකට කොටස් 50ක් එනම් ඇස් පිල්ලම් ගැසීමකට වඩා අඩුය. එහෙත්, එය කුඩා අගයක් වුවද එය නිවැරදි කිරීම ඉතා වැදගත් බව විද්‍යාඥයින්ගේ අදහසය.

“පැරිස් නුවර තබා ඇති කිලෝග්‍රෑමය සහ ලෝකය පුරා තියෙන කිලෝග්‍රෑමයේ පිටපත් (තරාදි පඩි) සන්සන්දනය කළාම ඒවා අතර විෂමතා තියෙන බව අපි දන්නවා.” ආචාර්ය ස්ටුවර්ට් ඩේවිඩ්සන් පවසයි.

“විද්‍යාත්මකව ගත්තොත් ඒ තත්ත්වය අපට පිළිගන්න බැහැ. Le Grand K ක්‍රමය දැනට සුදුසු වුණත් තව අවුරුදු 100 ක් වගේ ගත වෙනකොට ඒක කොහොමටවත් සුදුසු වෙන්නෙ නැහැ”

## නව ක්‍රමය ක්‍රියාත්මක වන්නේ කෙසේද?

විද්‍යුත් චුම්භක තුළින් බලයක් උපදී. විදුලිය සහ බර අතර සෘජු සබඳතාවක් පවතී. ඒ අනුව, යම් බලයකට ප්‍රතිචාර දැක්වීමට අවශ්‍ය විදුලි ප්‍රමාණය ආශ්‍රයෙන් කිලෝග්‍රෑමය හෝ ඕනෑම බරක් අර්ථ දැක්වීමට විද්‍යාඥයින්ට හැකියාව පවතී.

## නව ක්‍රමවේදයෙහි වාසි මොනවාද?

සෑම දශක කිහිපයකට වරක්ම ලෝකයේ කිලෝග්‍රෑම් මිනුම් පිටපත් Le Grand K භාවිත කර නිරවද්‍යතාව තහවුරු කරගත යුතුව තිබේ. එහෙත්, ‘කිබල් සමබරතාව‘ (Kibble balance) නමැති නව ක්‍රමය යටතේ කිලෝග්‍රෑමය මනින දෘඪ ඒකකවල නිරවද්‍යතාව ඕනෑම අයෙකුට ඕනෑම ස්ථානයක සිට එය තහවුරු කරගත හැකි වනු ඇත.

“මේක ඉතාම හොඳ ඒ වගේම නිවැරදි තීරණයක් බව හිතෙනවා. මෙය ක්‍රියාත්මක කළාම එය අනාගතයේ ස්ථාවරව පවතීවි” ආචාර්ය ඉයන් රොබින්සන් පවසයි.

මෙම නව ක්‍රමය හඳුන්වා දී ඇත්තේ, ආචාර්ය බ්‍රයන් කිබල් නමැති විද්‍යාඥයාය. එහෙයින් එය ‘කිබල් බැලන්ස්’ ලෙස නම් කර තිබේ.



SPECIAL RATE ON RENEWALS & INSURED MORTGAGES

**ANTON DHARMASEELAN**
MORTGAGE AGENT
LIC #M14000425
Available Till **Midnight**
**Including Weekends & Holidays**

**CALL ME FIRST FOR ALL YOUR MORTGAGE NEEDS**

PURCHASE
REFINANCE
SELF EMPLOYED
RENEWAL
BAD CREDIT
INVESTMENT PROPERTY

**416 704 1200**

**MAJOR BANKS - BEST RATES**

ANTON@MYHOMEMLS.CA | MORTGAGE ALLIANCE | FAX: 1-800-566-3068

# ඇමෙරිකානු සංචාරයක මතකය ........2



## Friends කථා මාලාවේ සෝපාවත් එලන්ගේ වැඩසටහන රූගත කෙරෙන මැදිරියත් බලමු....

■ සටහන අනුරුද්ධ වැලිගමගේ
සේයාරූ හෙසදී වැලිගමගේ

1994 න් පටන්ගෙන 2004 දක්වා පුරා වසර 10 ක් කථාංග 236 ක් විකාශය වුණු උතුරු ඇමෙරිකාවේ තරුණ පරපුර අතර ජනාදරයට පත් කථා මාලාවක් ලෙස Friends හඳුන්වා දෙන්නට පුළුවන්. ඔබ ඒ කථා නැරඹූ රසිකයෙක් නම් එහි සෝපාව හොඳට මතක ඇති. එතකොට මේ වනවිට අතිශය ජනප්‍රිය Talk Show එකක් වන Ellen Degeneres show පටිගත කෙරෙන මැදිරිය. අද අපි ඔබව එක්ක යන්නේ හොලිවුඩයේ බ'ර්බැන්ක් ප්‍රදේශයේ තිබෙන ඒ මතක බලන්න.

අපි තාමත් ඉන්නෙ ලොස් ඇන්ජලීස් නුවර. කැලිෆෝනියාවේ සුවබර කාලගුණය අතරෙ අපි තීරණය කළේ උදෙන්ම වර්නර් සහෝදරයන්ගේ චිත්‍රාගාර චාරිකාවේ (Warner Bros Studio Tour) යෙදෙන්න. කලින්ම මෙය අන්තර්ජාලයෙන් වෙන්කර ගන්නත්, උදෙන්ම යන්නත් මතක තබා ගැනීම හොඳ වෙන්නෙ දවල් වෙනකොට චිත්‍රාග ාරයේ සමහර මැදිරි පටිගත කිරීම් සඳහා කාර්යබහුල වුණාම නරඹන්නට නොහැකි නිසා.



## වෝනර් සහෝදරයන්ගේ චිත්‍රාගාරය Warner Brothers Studio

1923 දී පෝලන්තයෙන් ඇමෙරිකාවට පැමිණි පවුලක හැරී, ඇල්බට්, සෑම්, ජැක් නම් සහෝදරවරු හතරදෙනා පටන් ගත් චිත්‍රාගාරය හොලිවුඩයේ චිත්‍රාගාර අතර ප්‍රචලිත වුණේ වාර්තා පිහිට වූ චිත්‍රපට නිෂ්පාදන නිසා. ඇමෙරිකාව පුරා ඉතා විශාල සිනමාහල් සහ චිත්‍රපට බෙදාහැරීමේ ජාලයක් තිබූ වර්නර් සහෝදර සමාගම මාධ්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයෙක්. සුප්‍රකට NBC රූපවාහිනියත් ඔවුනගේ.

අපි කුඩා රථයට නැගුණා. නියාමකවරයා ඇතුළු 15 දෙනෙක් රථයේ. ඔහු තැනින් තැන ගොඩනැගිලි, විඩී පෙන්වමින් එක එක චිත්‍රපටයේ දර්ශන විස්තර කරනවා. දන්න අය ප්‍රශ්න අහනවා. සමහර තැනකදී අපි රථයෙන් බහිනවා. ගොඩනැගිලි ඇතුළට යනවා. බොහෝ ගොඩනැගිලි ඇතුළතින් හිස්. පිට බිත්ති නාමපුවරු විතරයි. තැනක රූපගත කිරීම්වලට අවශ්‍ය පසුතල හදනවා. අමතර ආලෝකකරණ උපකරණ සවි කරනවා. කැමරා අටවනවා. තණකොළ කපනවා. ගස් කප්පාදු කරනවා.

අරුම ගැහැණිය (Wonder Woman) හැරී පොටර් කථා මාලාව (Harry Potter series) බැට් මෑන් (Batman) සුපර් මෑන් (Superman) ඇතුළු විවිධ චිත්‍රපට සඳහා භාවිත වුණු ඇඳුම් සහ උපාංග එකතුවක් තියෙන තැනකටයි අපි ඊළඟට ගියේ. එතැනින් අපි යන්නේ පසුතල හදන විශාල වැඩපොලක් මැද්දෙන්. ඊළඟට විවිධ මාදිලියේ ගෘහභාණ්ඩ හදන වැඩපොලක. තව ටික වෙලාවකින් චිත්‍රපට සඳහා යොදාගන්නා වාහන වැඩපොලක් මැද්දෙන් ගිහින් අමුතුම මාදිලියේ වාහන තිබෙන ගරාජයකට යනවා. ඒවා අමුතු හැඩයේ වුණාට ධාවන තත්ත්වයේ තියෙන ඒවා. වාහනයෙන් බැහැලා කට්ටියම ඒ වාහන ඉස්සරහින්, පැත්තෙන් ඉඳගෙන සෙල්ෆි ගහන්න, ෆොටෝ ගන්න පොරකනවා. 'ජනප්‍රිය ලෝකය කොච්චර පුදුමද?' මට හිතෙනවා .

අප ගිය දවස එලන් වැඩසටහන රූගත නොකෙරෙන දවස් කිහිපයෙන් එකක්. ඒ හින්ද අපට ඒ පසුතලය තිබෙන මැදිරිය බලන්නට ඉඩ ලැබුණා. අවසානයේ අපි ආවේ Friends හි සෝපාව සහ පසුතලය ඇතුළු තවත් පසුතල රැසක් තියෙන ප්‍රදර්ශනාගාරයට. La La Land චිත්‍රපටයේ Mia සේවය කල අවන්හල අදත් මේ පරිශ්‍රය තුළ ක්‍රියාකාරීව තිබෙනවා. එක් එක් යුගයට වෙනස් වූ පිරිමි සහ ගැහැනු ඇඳුම්, චිත්‍රපට සඳහා භාවිත වූ රූ සටහන්, පියවරෙන් පියවර චිත්‍රපටයක් හැදෙන හැටි මේ මධ්‍යස්ථානයේදී ඉගෙන ගන්න පුළුවන්. සිනමා කලාව අධ්‍යයනය කරන කාට වුණත් මෙතැන සරසවියක් වගේ.



## මුහුදු වෙරළ - Los Angeles Beaches

ජනප්‍රිය සංස්කෘතියේ ඉහළම තැනක තිබෙන ලොස් ඇන්ජලීස් නුවර පැසිෆික් සාගරයට මුහුණ ලා තිබෙන නිසා දර්ශණීය වෙරළ තීරයකින් සමන්විතයි. ඒ අතරින් මේ වෙරළ ප්‍රදේශ 10 අතිශයින්ම ජනප්‍රියයි. හොඳ තැනක් අල්ලා ගන්නටත්, වාහනය නවත්වා ගන්නටත් උදෙන්ම යා යුත්තේ ඒ නිසා.

El Matador, Malibu, Santa Monica north & south, Manhattan, Hermosa, Dockweiler, Venice, Zuma, Mother's, Redondo එම මුහුදු වෙරළ දහයයි. අපගේ ගමනේදී අපට යන්නට ඉඩ ලැබුණේ Santa Monica සහ Venice යන වෙරළ තීරයන්ට පමණයි. බොහෝ ඇමෙරිකානු චිත්‍රපට Beverly Hills 90210, Sunset Beach වැනි රූපවාහිනී වෘතාන්තවලින් ඔබ මේ ලස්සන මුහුදු තීරයන් දැක ඇතුවාට කිසිම සැකයක් නැහැ.



### මේ ගමනේදී එක්කර ගත හැකි තවත් තැන්

- Paramount Studios
- Griffith Observatory
- Union station
- Walt Disney Concert hall
- Disneyland
- Getty centre



## සංචාරක මතකය

සංචාරක මතකයත් එක්ක අප ඔබව කැඳවාගෙන යන්නේ විවිධ තැන්වලට. ඔබේ අදහස්, ප්‍රතිචාර, ඉල්ලීම් අපට ලියන්න. ඒ අනුව අපේ ලිපි පෙළ පෙළගස්වන්නට පුළුවන්. ඉඩකඩ සීමාසහිත නිසා අප සඳහන් කරන්නේ සීමිත තොරතුරු. ඒත් අපේ ඉඟි ඔස්සේ අන්තර්ජාලය පීරා ගමනට පෙර තොරතුරු සොයාගන්නත්, ඒ අනුව ගමන සැලසුම් කරන්නත් ඔබට පුළුවන්.

ජනවාරි තුන්වැනි සතියේ ගුවන් ටිකට් පත්, මාස 3 කට පමණ කලින් ඉරිදාට නවාතැන් වෙන්කරවා ගැනීම ලාභදායකයි. ඔබ කියවන තොරතුරු අනුව සෙනඟ අඩු වේලාවන්, දවස් වගේම ඒ ඒ සංචාරක පරිශ්‍රය බලන්නට සුදුසු වෙලාව හොයා ගැනීමත්, අන්තර්ජාලයෙන් පූර්ව වෙන්කරවා ගැනීමත් කාලයත් මුදලුත් ඉතිරි කරන බව කිව යුතුයි.



කාලගුණය, දේශගුණය සහ වාහන තදබදය සදහා අතිරේක වෙලාවක් තබාගැනීමත්, යම් හෙයකින් වෙනස් කරන්නට වුවහොත් අතිරේක සැලැස්මක් හිතේ තබාගෙන ඉන්න එකත් හොඳයි.



සමහර භූ කලාපවලදී දුරකථන සහ චන්ද්‍රිකා සන්නිවේදන ක්‍රියාත්මක නොවෙන නිසා මුද්‍රිත සිතියම්, මුදල් සහ ප්‍රථමාධාර පෙට්ටියක් ඔබේ ගමනට එක්කර ගැනීම ගුණදායකයි.

**ඔබේ ඉල්ලීම් සහ තොරතුරු සදහා අලුත් විද්‍යුත් ලිපිනයක් පටන් ගත්තා.**

dasatha.sancharayakamathakaya@gmail.com

**විස්තර සදහා ලියන්න. ඉඩ ලැබෙන පරිදි පිළිතුරු ලියන්නම්.**

**ලබන මාසයේදී**

**කැනඩාවේ පැසිෆික් මනාලිය වැන්කුවර් දූපත බලන්නට යමු.**






## ළමා පිටුව - CHILDREN'S CORNER

# හිම බබා

එකෝමත් එක අෑත කාලෙක රුසියාවේ අෑත පිටිසර ගමක එක් අඹුසැමි යුවළක් විසුවා. මේ දෙන්නට ගොඩාක් මිල මුදල් නෑ. ඒත් ලොකු අගහිඟයකුත් නෑ. ඒ දෙන්නා ඉතාමත් සමගියෙන් ආදරයෙන් ජීවත් වුණා.

මේ දෙන්නාගේ ජීවිතයේ තිබුණු ලොකුම දුක වුණේ ඒ අයටම කියල දරුවෙක් නැති කමයි. ඒ දෙන්නා පොඩි ළමයින්ට හරිම ආදරෙයි. වටපිට සිටින පුංචි ළමයින්ට නොයෙක් කෑම බීම තෑගි බෝග නිතරම ගෙනත් දුන්නා. ඒ අයගෙ ගෙමිදුල නිතරම පුංචි ළමයින් සඳහා විවෘතව තිබුණා. ලස්සනට හිරු පායපු හැම දවසකම ඒ වත්ත පුරාම පුංචි පැටව් දුව පැන ඇවිදිමින් සෙල්ලම් කළා.

ඉතිං ඔය විදියට කාලය ගෙවිලා ගියා. මේ අඹුසැමි දෙදෙනාත් ටිකින් ටික වියපත් වුණා. දැන් ඒ අයගේ වත්තේ සෙල්ලම් කරන්නේ අර ඉස්සර සෙල්ලම් කරන්න ආව දරුවන්ගේ දරුවන්. ඒ අයත් මේ මහලු දෙපළත් සමග බොහොම ආදරෙන් හිටියා.

ඒත් කොච්චර අනුන්ගේ දරුවන් ඒ වත්තේ පිටියේ සෙල්ලම් කරමින් දැඟලුවත් මේ දෙන්නගේ හිතේ තිබුණු දුක නම් අඩු වුණේ නෑ. හවස් ජාමයේ අර දරුවන් නිවෙස්වලට ගියාට පස්සෙ මේ මහලු කාන්තාව ජනේලය ළඟට වෙලා අෑත පාර දිහා බලාගෙන ඉන්නවා. එහෙම ඉන්නකොට එයාගෙම දරුවෙක් හිටියා නම් වැඩ ඇරී නිවසට එයි නේද කියා එයාට සිතෙනවා. මහලු මිනිසාගේ සිතෙත් දුකක් නොතිබුණා නොවෙයි. එහෙත් එයා ඒක බිරිඳට පෙන්නුවේ නෑ.

ඔන්න ඉතිං ඒ ගමටත් ශීත කාලය ආවා. හැම තැනම හිම වැටිලා සුදු පාටින් බබළනවා. හැම ශීත කාලවලදීම පුංචි පැටව් ඒ වත්තෙ සෙල්ලමට එන්නෙ නෑ. ඒ අයව එයාලගේ අම්මලා තාත්තලා ගෙවල්වලින් පිටතට එවන්න කැමති නෑ. ඉතිං ශීත කාලය මේ මහලු යුවළ ගෙවන්නේ හරිම කාංසියෙන්. ඒ දෙන්නට ඒ දෙන්න විතරමයි. බැලුව බැලුව තැන තියෙන්නෙ මුසල පාළුව. මහලු කාන්තාවට මෙය ඉවසා සිටීමට හරිම අපහසුයි. වියපත් බවත් එක්ක ඒ කාංසිය වඩ වඩාත් ඇයට දැනෙනවා. ඇය දිනක් ඒ බව ඇගේ ස්වාමියාට කිව්වා...

"මට නම් මේ පාළුව තවත් උහුලග න්න බෑ. මට අර පොඩි දරුවන්ගේ හඬ නැතිව සිටින්නට අමාරුයි. ඒ අයව දකින්න මට ඕන"

"එහෙම කොහොමද නෝනා... මේ කාලයේදී එළියට ඒම අනතුරුදායකයි. ඒ දරුවන් ඒ අයගේ අම්මලා ළඟ ඉන්න ඕන. එයාල අපි ළඟට එවන්නෙ නෑ"

"මම දන්නවා. ඒත් මට ගොඩක් දුකයි"

"බලන්න එළිමහන.... හිම මතට හඳ එළිය වැටිල දිළිසෙන ලස්සන. ඒ ගැන හිතන්න. ඔබේ හිත සංසුන් වෙයි"

"මම ඒ හිම හැමදාම දකිනවා...... මේ ජනේලය ළඟට වෙලා ඒ ගැන හිත හිතා හිටියත් මගේ හිතේ දුක අඩු වුණේ නෑ."

"හොඳයි අපි දෙන්නා හෙට එළියට යමු. හිම උඩ ඇවිදිමු. ඔබට සැනසීමක් ලැබේවි"

පසුවදාට එළිය වැටුණා. උදෑසන ආහාරය ගත් විගස මහලු කාන්තාව එළියට යාමට සැරසුණා. එළිමහනේ තද ශීත සුළං හමා ගියත් ඇය සිටියේ සතුටින්. ඇගේ සැමියාටත් දැන් සතුටුයි. ඇයව තවත් සන්තෝශයෙන් තැබීමට ඔහු සිතුවා.

"මට හොඳ අදහසක් ආවා."

"ඒ මොකක්ද?"

"මේ ශීත කාලෙදි අපේ වත්තට පුංචි දරුවන් එන්නෙ නැති නිසා අපි පුංචි දරුවෙක් හදමු"

"ඔබ මට විහිළු කරනවා නේද?"

"නෑ නෑ නෑ... එන්න අපි මේ හිමවලින් පුංචි හිම දරුවෙක් හදමු"

සැමියා කී දේ ඇයට තේරුණා. ඇයත් හරිම සතුටින් ඊට කැමති වුණා. ඊට පස්සෙ මේ දෙන්නා ඒ ගෙවත්තේ ලස්සන පුංචි හිම බබෙක් හැදුවා. එයාට නමකුත් දැම්මා. මේ හිම බබාගේ නම ස්නෙගුරච්කා. හරිම පුදුමයක්. හිම බබා හදල ඉවර වෙලා ඇගේ හැඩරුව බලද්දි මේ හිම බබාට පණ ආවා. සුදුම සුදු පාට හිම බබා ඒ වත්තේ දුව පැන ඇවිද්දා.

මහලු යුවළට හරිම සතුටුයි. එදා දවසම ස්නෙගුරච්කා බබා එක්ක සෙල්ලම් කළා. හවස් වෙද්දි එයාව ගෙදරට එක්ක එන්න හැදුවත් එයා ඒකට කැමති වුණේ නෑ. මොකද ගෙදර ඇතුළෙ තිබුණු උණුසුමට බබා බය වුණා. ඉතිං අකමැත්තෙන් වුණත් නිවසෙන් එළියේ බබාට ආරක්ෂිතව ඉන්න තැනක් හදලා දුන්නා.

දැන් ඉතිං මේ දෙන්නාට රාජකාරියක් තියෙනවා. උදේට නැගිටලා වත්තට ඇවිත් හිම බබා එක්ක සෙල්ලම් කරනවා. කතා කරනවා. සිංදු කියනවා. හරිම සතුටින් කාලය ගත වෙනවා.

ශීත කාලය හැමදාම නෑ... ටික ටික වසන්ත කාලයේ උණුසුම දැනෙන්න පටන් ගත්තා. පුංචි ස්නෙගුරච්කාට ඒ රශ්නය දරාගැනීමට අමාරුයි. ඇය ඒ බව මහලු යුවළට පැවසුවා.

ඔවුන් ඇයට ආරක්ෂිතව සිටීමට නිවස තුළ ශීතල කළ කාමරයක් සැදුවා. ඇය සුවෙන් සනීපෙන් එහි සිටියා.

වසන්ත කාලයත් සමග ආයෙමත් කුඩා දරුවන් වත්තට ආවා. මේ ගෙදර සිටින පුංචි ගැහැනු ළමයා ගැන වටපිට අයටත් ආරංචි වී තිබුණු නිසා පුංචි අය ඇයව බලන්න ඒ කාමරයට ගියා. කාමරයට වී සෙල්ලම් කළා. ඒත් ළමයි කැමති නෑ කාමරය ඇතුළේ විතරක් සෙල්ලම් කරන්න. ඔවුන් ඇවිටිලි කරමින් ස්නෙගුරච්කාව එළියට රැගෙන ගියා.

අනේ ඒත් ඇයට ගොඩක් වෙලා එහෙම ඉන්න පුළුවන් වුණේ නෑ. හිමවලින් සෑදී තිබුණු ස්නෙගුරච්කා දිය වී ගියා.

මහලු දෙමහල්ලන් හඬා වැටුණා. එහෙත් ස්නෙගුරච්කා නැවත නොඑන බව ඔවුන් ඉක්මනින්ම වටහා ගත්තා.

## පුංචි අපට ගී

### රෑ තරු බබළනවා

**රෑ තරු බබළනවා**
**මල් පිපිලා වාගේ**
**එළියෙන් නැහැවෙනවා**
**මල් වැහැලා වාගේ**

**රැව් පිළිරැව් දෙනවා**
**ගීත නාද වාගේ**
**බිළිඳෙකු හිනැහෙනවා**
**මුහුදක රැළි වාගේ**

**සීත සුළං එනවා**
**උයනක සිරි වාගේ**
**ගොපළුන් දුර එනවා**
**පැණි බඹරුන් වාගේ**

**බිළිඳෙකු හිනැහෙනවා**
**පොපියන කුසුම් වගේ**
**තුරුලක පෙරැලෙනවා**
**හිම මත හිම වාගේ**

**ගී පද - ගරු මර්සලීන් ජයකොඩි පියතුමා**
**ගී තනු - ගරු මර්සලීන් ජයකොඩි පියතුමා**
**ගායනය - ලතා වල්පොල**

EVERYTHING MORTGAGES
LIC#12755
www.everythingmortgages.ca



**We'll Target The Best Rates!**

Why won't your bank give you the best interest rate? Call our team today or apply online and learn how we can negotiate a better rate than your banks can offer you! We work hard to give you the best options so you can make an informed decision.

**Mortgage Renewals and Refinancing**

First Time Homebuyer? Mortgage coming up for renewal? We can help you save money!

**Investment Properties**

Looking to invest in a second piece of property? Thinking about a vacation or recreational property? We can help!

**Safe and Secure Application**

Use our easy to comlpete online mortgage application form if you're looking to buy, renew, refinance or need a pre-approval for your next property purchase.

**Manzeel Patel**
Mortgage Broker - M11002628

**Direct: 647-272-8355**

Suite 704 – 1500 Don Mills Road,
Toronto, ON M3B 3L7

T 416 - 840 - 6368
F 416 - 850 - 5153

info@everythingmortgages.ca
www.everythingmortgages.ca

RMG · Meridian · MERIX Lendwise · Scotiabank · Paradigm · Alterna · Equitable Bank · blueprint · Bridgewater Bank · MCAP
Industrial Alliance · radius financial · ICICI Bank · National Bank Financial Group · Canadiana · CMLS Financial · First National Financial LP · B2B Bank
Optimum Mortgage · TD · XCEED · MCAN · Street Capital · Fisgard · Home Trust · HomEquity · Savings

ARUN BAKERY
TAKEOUT & CARERING



**905 303 4141**
**9699 Jane Street, Unit 23, Maple, ON L6A 3X5**
(Jane & Major Mackenzie)


Majestic City
Sri Lankan
සාප්පු සංකීර්ණය
Shop | Dine | Entertainment
COMPLETION AUGUST 2019
Prime locations: Markham/ McNicoll
Signage
Signage
Five Plus
LEASING OPPORTUNITY
CRISH (KUMA)
PROJECT MANAGER
Tel : 647-218-3698
www.majesticcity.ca
info@majesticcity.ca

කැනඩාව නම් උතුරු ඇමෙරිකානු රාජ්‍යය - 7

# කැනඩා චාරිකා

## ඇල්බර්ටා ප්‍රාන්තය



■ ආනන්ද විජේසිංහ
කැල්ගරි සිට ලියයි

### වෝටර්ටන් විල් ජාතික උද්‍යානය
### Waterton Lakes National Park



ජනාකීර්ණ කැල්ගරි (SW) සිට ප්‍රධාන මහාමාර්ග අංක 2හි යන මගැ පිළිවෙළින් ඔකටොක්ස්, හයිරිවර්, නැන්ටන්, පාක්ලන්ඩ්, ස්ටැව්ලි, ක්ලේයාස්හෝම් පසු කොට ඕල්ඩ්මෑන් ගඟ හරහා ගොස් හමුවන කලින් කී ක්‍රොස්නෙස්ට් ට්‍රේල් වෙත පිටවීමේ අතුරුමග නොගැනීමට ප්‍රවේසම් විය යුතුය. මන්ද? එසේ ගියොත්, යැවෙන්නේ ෆ්‍රෑන්ක් ස්ලයිඩ් පැත්තට බැවිනි. නමුත් එක එල්ලේම රිය පදවමින් වම්පස වංගුවෙහිම ධාවනය කොට ඉහත සඳහන් කළ ක්‍රොස්නෙස්ට් ට්‍රේල් නොහොත් හයිවේ 3 මාර්ගය හා නිරුත්සාහයෙන් ඒකාබද්ධ වීමත් සමග සුළු වෙලාවකින් හමුවන්නේ 'ෆෝට්මැක්ලවුඩ්' නම් වූ ඉපැරණි කුඩා නගරයයි.

ෆෝට්මැක්ලවුඩ් නගර කෙළවරැදී හමුවන සිව් මංසලින් දකුණට හැරී හයිවේ 2 යළිත් ආරම්භ වේ. එමගින් ගමන් කරන්නන්ටද 'කාඩ්ස්ටන්' නගරයෙන් හැරී යන මාර්ග අංක හයෙහි (6) ධාවනය කොට වෝටර්ටන් ජාතික උද්‍යානයට පහසුවෙන් පැමිණිය හැක. කැල්ගරි සිට ෆෝට්මැක්ලවුඩ් දක්වා කිලෝමීටර් 174 කි. එතැන් සිට වෝටර්ටන් වෙත කිලෝමීටර් 94 ක් පමණ වේ.(හයිවේ අංක 2 වූ කලී, කාඩ්ස්ටන් නගරයෙන් හැරීගොස් 'කාර්වේ' නම් වූ ස්ථානයේදී ඇමෙරිකානු දේශසීමාවෙන් කෙළවර වේ.) කෙසේ වුවත් ෆෝට්මැක්ලවුඩ් සිට තරමක පාළු ස්වභාවයක් උසුලන මාර්ග අංක 2 හරහා මෙන් නොව, හයිවේ අංක තුනේම (3) ගොස් ලෙත්බ්‍රිජ් නගරය හරහා හයිවේ අංක 5 මගින් වෝටර්ටන් යාමට බොහෝදෙනා පෙළඹෙන බව පෙනී ගොස් තිබේ. ෆෝට්මැක්ලවුඩ් සිට ලෙත්බ්‍රිජ් දක්වා කිලෝමීටර් 48 කි. එතැන්සිට වෝටර්ටන් දක්වා කිලෝමීටර් 116 ක් වුවද මේ අතිරේක වැඩිදුරක් ගෙවා, වෝටර්ටන් විල් උද්‍යානයට යන්නෝ බොහෝ බැව් මගේ අත්දැකීමයි. 2, 5 මාර්ග දෙකෙන්මැ යැවෙන්නේ 'කාඩ්සටන්' වෙතය. එතැන් සිට අංක 6 මාවතේ කි.මී. 54 කි.

### ජාත්‍යන්තර සාම උද්‍යාන
### International Peace Park

අප කැනඩාවට පැමිණියේ ශීත සෘතුවේ ආරම්භයේ වුවද දර්ශනීය හා මනබඳින සංචාරක කේන්ද්‍රයන් වෙත වහ වහා අප කැඳවාගෙන යාම ලොකු පුතාගේ අභිප්‍රාය විය. ඒ අනුව නුදුරු වෝටර්ටන් ජාතික උද්‍යානයට ප්‍රථම වරට අප කැඳවාගෙන ගියේ දේශසීමා නැති, ඇමෙරිකාවේ මොන්ටානා ප්‍රාන්තයෙන් අවසන් වන වොටර්ටන් විලෙහි දිය මිදී යමින් තිබූ දෙසැම්බරයේ බව මතකය. හිම ක්‍රීඩා හා වෙනත් ක්‍රියාකාරකම් සඳහා අද්විතීය තැනක් හිම් කැනඩාවේ සියලු පහසුකම් වසර පුරා විවෘතව තැබේ. මෙකල උද්‍යානයට ඇතුළු වීමද නොමිලේය. අනෙක් අතට, අතිශයින් නෙත්කළු, අයස්කාන්ත, සුදෝසුදු හිම පලසින් වැසී ගිය සුපිරිසිදු රොකී කඳු බෑවුම් ආශ්‍රිත වනපෙත් ඈ පෙදෙසෙහි සුවිශේෂී චමත්කාරය දැකිය හැක්කේ ශීත සෘතුවේ විනා අන් කවර කලෙකද? හිම ක්‍රීඩා හා ක්‍රියාන්විතයන් පිළිබඳ කවර කතාද? මේවා විස්තර කිරීමට උත්සාහ නොකරමි. 'කැනඩාවේ ක්‍රීඩාංගනය' යැයි විරුදාවලි ලත් ඇල්බර්ටා ප්‍රාන්තයේ වොටර්ටන් ජාත්‍යන්තර සාම උද්‍යානයට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

ලෝක උරුමයක් වූ වොටර්ටන් ජාත්‍යන්තර සාම උද්‍යානය උද්භිද රක්ෂිතයක් (Biosphere Reserve) වශයෙන්ද 'යුනෙස්කෝව' විසින් හඳුනාගෙන තිබේ. යාබද අමෙරිකානු මොන්ටානා ප්‍රාන්තයේ 'හිම කඳු ආශ්‍රිත ජාතික උද්‍යානය' හා එකිනෙකට මායිම් වූ මේ උද්භිද උද්‍යාන ද්වය එක්වන්ව ලෝකයේ ප්‍රථම ජාත්‍යන්තර සාම උද්‍යානය වශයෙන් නම් කරන ලදී. මෙවන් සුවිශේෂිත වූ වොටර්ටන් උද්‍යානය වන ජීවීන්ගෙන් මෙන්මැ විශ්මිත වන මලින්ද ගහන ස්වභාව ධර්මයාගේ විෂ්මයානුකූල නිමැවුමකි.

උතුරු දෙසින් වූ අලංකාර විල්තෙර උස්බිමෙහි, 'ප්‍රින්ස් ඔෆ් වේල්ස්' නම් වූ නවසිය විසි අටේ සම්පූර්ණ දැවයෙන් නිම කළ පස්මහල් හෝටලයකි. මේ පිළිබඳවද අපූරු පුරාවෘතයෙකි. ඇමෙරිකානුවන් විසින් කැනඩා පැසිෆික් දුම්රිය මාර්ගය (CPR) ඉදිකෙරෙමින් පැවති ඒ කාලයේ ඔවුහු විසින් මෙම හෝටලය ගොඩ නැගූ බව කියති. එකල, ඇමෙරිකාවේ මත්පැන් තහනමක් විය. හෝටලය ඉදිකරන ලද්දේ කැනේඩියානු දේශසීමාව පැන අවුත් ඇමෙරිකානුවන්ට නිදැල්ලේ බීර පානය කිරීම සඳහා බව කියති. ඒ සම්බන්ධයෙන් ලියන ලද 'ප්‍රින්ස් ඔෆ් වේල්ස් හෝටලේ ඉතිහාසය' නම් වූ පොතක් ලෙත්බ්‍රිජ් මහජන පුස්තකාලයේ තිබී කියවන්නට ලැබුණි.

### යාන්ත්‍රික බෝට්ටු සේවාව

මැයි-සැප්තැම්බර් ගිම්හාන කාලයේදී වෝටර්ටන් විලෙහි එහා කෙළවර වූ ඇමෙරිකාවේ මොන්ටානා දක්වා ගොස් ආපසු පැමිණිය යුතු අපූර්ව විනෝද චාරිකාවක යාත්‍රා කළ හැක. බෝට්ටු සේවාව උදේ 10 ට, මධ්හ්න 1.00 ට, සවස 4.00 ට පිටත් වේ. සවස 7.00 ටද එක් චාරිකා වාරයක් තිබිය හැකිය. ගාස්තුව තරමක් ඉහළය. වැඩිහිටියෙකුට ඩොලර් 49 කි. වයස 13-17 ඩොලර් 24 කි. වයස 1-12 ඩොලර් 16 කි. කැනඩාවේ අනන්ත මහා විල් හා සාපේක්ෂව බලන විට, මතුපිට මීටර් 1,280 ක්ද ගැඹුර මීටර් 80 ක් හා වර්ග කිලෝමීටර් 11.6 ක් වූ මේ විල එතරම් විශාල නැත.

### කැල්ගරි නගරය

ඇල්බර්ටා රොකී කඳුමතින් ඉපිද කිලෝමීටර් 80 ක් මග ගෙවා පෙරදිගින් පහළට බස්නා අරතුරේ, අවරදිගින් නිහඬව ගලන 'එල්බෝ ගඟ' හා එක්ව අඩක් පැදකුණු කොට නගරයේ දකුණින් අවරදිගට ගලා ගොස් 'ඕල්ඩ්මෑන්' නමැති මහ ගඟට එක් වී හඩ්සන් බොක්ක සොයා යන, 'බෝ-ගඟැ' නිම්නයෙහි නොහොත් 'බෝ-වැලි' කලාපයේ දිදුළන සුපසන් මහ නගරයෙකි. ඒ වූකලී, ප්‍රාන්තයේ දෙවැනි තැන විරාජමානවන මෙරමා හද බැඳි ලස්සන 'කැල්ගරි' නගරයයි. ගංගා ද්වයය හා එක්වැ 'ග්ලෙන්මෝ' තටාක රක්ෂිතය ජනාකීර්ණ නාගරිකයේ සෞම්‍ය ගුණය තිව්ර කරන්නීය.

මේ සුන්දර මහන ගරය නිර්මාණය කිරීමේ ආරම්භය 1875 දක්වා දිවෙයි. එකල බ්ලැක්ෆුට්වරුන් විසින් නගරය හඳුන්වන ලද්දේ මෝකින්සිස් (Mohkinstsis) යන නමිනි. තවද, සෑන්ඩ්ස්ටෝන්සිටි, කව්ටවුන්, සීටවුන් යනාදී තවත් නම්වලින් මෙම නගරය හඳුන්වන අතර, 'ස්ටැම්පීඩ් සිටි' යන්න අනෙක් අන්වර්ථන නාමයයි. මන්දයත්, ආදිවාසීන්ගේ කායබලය සහ කුළුගවයින්, අශ්වයන් වැනි සතුන් හැසිරවීම සමග කරනු ලබන භයානක පෞරාණික ක්‍රීඩා වසරක් පාසා මහ ඉහළින් යළි පණ ගන්වනු ලබන්නේ මෙහි බැවිනි. නගරයේ ලොකුම 'ප්‍රශ්නය' රථ ගාල් කිරීමේ මඳ ඉඩකඩයි.

කැල්ගරි බහුජාතික, බහුවාර්ගික වත්මන් ජනගහනය 1,246,337 කි. මහනගරසභා (City) ප්‍රදේශය වර්ග කිලෝමීටර් 825.56 කි. ඇල්බර්ටා ප්‍රාන්ත මධ්‍යයේ දකුණු දෙසින් මෙම නගරය පිහිටා තිබේ. අගනුවර වූ එඩ්මන්ටන් කිලොමීටර් 281 ක් උතුරට පිහිටා ඇත. කැල්ගරි නගරය මධ්‍යස්ථානය කරගනු ලබන සංචාරකයෙකුගේ සාමාන්‍ය දැනුම සඳහා (උදාහරණයක් ලෙස) මෙසේ දක්වන්නට අදහස් කළෙමි.

| | දුර | ළඟාවීමට ගතවිය හැකි කාලය දළ වශයෙන් |
|---|---|---|
| එඩ්මන්ටන් | කි.මි. 281 | පැය 3 |
| ලෙත්බ්‍රිජ් | කි.මි 221 | පැය 2-1/4 |
| වැංකූවර් | කි.මි 676 | පැය 15 |
| මෙඩිසින් හැට් | කි.මි 266 | පැය 2-3/4 |
| වික්ටෝරියා | කි.මි 729 | පැය 18-20 (+ෆෙරි) |
| ටොරොන්ටෝ | කි.මි 3,400 | දවස් 2-1/2කට වැඩි විය හැකිය. |

### උරුමයන් පිළිබඳ උද්‍යානය
### Heritage Park

කැල්ගරි නාගරිකය තුළ සුවිසල් 'ග්ලෙන්මෝර්' තටාකයට ඉහළින් අක්කර 127 ක් වූ අලංකාර පරිසරයක නිර්මාණය කොට ඇති අතිශය ජනප්‍රිය ප්‍රදර්ශන භූමිය හෙවත් ජීවමාන ඓතිහාසික කෞතුකාගාරයයි. මෙය වර්ෂ 1964 ජුලි 1 වෙනි දින (නිදහස් දිනය සැමැරීම උදෙසා) විවෘත කරන ලදී.



මෙහි 19 හා 20 වැනි ශත වර්ෂ වලට අයත් බටහිරදිග කැනඩාවේ නන්විධ ඓතිහාසික භාණ්ඩ සංරක්ෂණය කොට ප්‍රදර්ශනය කෙරේ. වෙනෙකක් තබා, ඓතිහාසික, ඉපැරණි ඇතැම් ගොඩනැගිලි පවා මෙහි ප්‍රවාහනය කොට, සුරක්ෂිත අන්දමින් ස්ථාපිත කොට ඇත. ඒවායේ එදා පැවැති ශ්‍රී විභූතිය නොමැකෙන අන්දමින් ප්‍රතිනිර්මාණය කළ ඇතැම් ගෘහභාණ්ඩ සහ කලාත්මක නිර්මාණ පවා ඉතා හොඳින් නිමකොට තිබන ආකාරය ප්‍රශංසනීයයි. සම්පූර්ණ දවසක් එහි ගත කිරීමට සූදානමින් යායුතුය. අවශ්‍ය සියලු පහසුකම් එහි තිබේ. ශීත සෘතුවේදී ඇතැම්

22 වන පිටුව බලන්න

# UTHAYA'S SUPER MARKET

**FRESH FISH MEATS FRUITS VEGETABLES TROPOCAL FINE FOODS**




අලුත් නැවුම් එළවළු, පලතුරු, මස්, මාලු ඇතුළු ඔබට අවශ්‍ය සියලුම ශ්‍රී ලාංකේය නිෂ්පාදන ලබාගැනීමට පැමිණෙන්න UTHAYA'S SUPER MARKET

**5010 Steeles Ave. W. Toronto ON M9V 5C6**

**Tel: 416 740 7971 Fax : 416 740 8568**

# ඔබත් ජංගම දුරකථනයේ වහලෙක්ද?

## ජංගම දුරකථනයට ඇබ්බැහි වීම රෝගයක්



■ **රෝහණ ආර්යරත්න**

"මම මගේ ජංගම දුරකථනයේ වහලෙකු වෙලා. මට එය නැතුවම බැහැ. එය පාවිච්චි කරන්න කරන්න එය නැතිව බැරි තත්ත්වයට මාව පත්වෙලා. දොස්තර හමුවෙන්න ගිය විටත්, මගේ දරුවන් සමඟ පාසලට යද්දීත්, උදේ ආහාර ගනිද්දීත්, බොහෝ විට එය මගේ අතේ රැඳී තියෙනවා. මම හිතන්නේවත් නැතිව එයට තට්ටු කරනවා. මගේ විද්‍යුත් තැපෑල පරීක්ෂා කරනව. දිනය බලනවා වේලාව බලනවා. ෆේස් බුක් ට්විටර් බලනවා..."

මේ වදන් ජංගම දුරකථනයට වහලියක් වූ එක්තරා ගෘහිණියකගේ පාපොච්චාරණයකි. වෙන මොනවා නැති වුවත් ඇයට ඇයගේ ජංගම දුරකථනය අත්‍යාවශ්‍ය අංගයක් බවට පත් වී ඇත.

නව තාක්ෂණය සමඟ ඉදිරියට යන ලෝකයේ අත්‍යවශ්‍ය භාණ්ඩයක් ලෙසට හොඳට හෝ නරකට අප වෙත ලැබී ඇති භාණ්ඩය වන්නේ මේ ජංගම දුරකථනයයි.

එදා පණිවුඩ හුවමාරුව කරනු ලැබුවේ මිනිස් ශ්‍රමයෙනි. පසුව එය තැපෑල බවට පරිවර්තනය විය. ඉන්පසුව දුරකථනය එම කාර්යය හැකි පමණ හොඳින් ඉටු කළේය. හදිසි පණිවුඩයක් දීම සඳහා එදා දුරකථනය භාවිත කරනු ලැබූ නමුත් එම පහසුකම් සෑම දෙනෙකුටම එක හා සමානව ලැබුණේ නැත.

එහෙත් තාක්ෂණ දියුණුවත් සමඟ ලොකු, කුඩා, තරුණ, මහලු, දුප්පත්, පොහොසත් සියලු දෙනාටම එක හා සමානව ජංගම දුරකථන මගින් පණිවුඩ හුවමාරු කරගැනීමේ අවස්ථාව ලැබී ඇත.

කෙසේ වෙතත් මේ නව තාක්ෂණය කෙතරම් අපගේ ජීවන රටාව හා පැවැත්ම කෙරේ බලපා ඇත්ද යත් එය අපට නැතිවම බැරි භාණ්ඩයක් බවට පත් වී ඇත. වෙනත් අයුරකින් පැවසුවහොත් එය එක්තරා අන්දමක ඇබ්බැහි වීමක් බවට පත් වී ඇතැයි කීවොත් නිවැරැදිය. දුම්බීම, මත්වතුර බීම, සූදු කෙළීම, මත්ද්‍රව්‍යවලට දක්වන ළෙන්ගතුකම ජංගම දුරකථන කෙරේ යොමු වී ඇතැයි බටහිර මනෝ විද්‍යාඥයෝ අවධාරණය කරති.

■ ඔබ ජංගම දුරකථනවලට ඇබ්බැහිවූ කෙනෙක් ද?

■ ඔබ උදෙන්ම පිබිදුණු ගමන් ජංගම දුරකථනය පිරික්සන්නේද?

■ ඔබ ජංගම දුරකථනය සයනයේ තබාගෙන නිදා ගන්නේද?

■ ඔබ යන යන තැන එනම් කුස්සියට හෝ නිවෙසේ වෙනත් තැනකට යන අවස්ථාවේදී ජංගම දුරකථනය ගෙන යන්නේද?

■ ඔබ දරුවන් හා සැමියා හෝ බිරිය ආදි පවුලේ උදවිය සමඟ ගත කරන වේලාවලදී ජංගම දුරකථනය ගෙන යන්නේද? එසේම එය වරින් වර පිරික්සා බලන්නේද?

■ මොහොතකටවත් ජංගම දුරකථනය අසල නොමැතිව සිටීමට අපහසුතාවක් දැනෙන්නේද?

මේ ආදි ප්‍රශ්න රැසකට පිළිතුරුදීමේදී ඔබ "ඔව්" යන පිළිතුර දුනහොත් ඔබ මානසික වශයෙන් ඉතාම භයානක අසරණ තත්ත්වයකට පත්ව සිටින්නෙකි. ඔබ ජංගම දුරකථනයේ වහලෙකු බවට පත්වී සිටියි.

ඔබට තනිකමක් දැනුණු විට ඔබගේ එකම මිත්‍රයා ජංගම දුරකථනයයි. ඔබ විඩාවට පත් වී සිටින විට හිතට ගත සැනසීම ගෙන දෙන්නේ ජංගම දුරකථනයයි. ඔබ කම්මැළිකමින් සිටින විටදී ඔබට ප්‍රාණය ලබාදෙන්නේ ජංගම දුරකථනයයි.

මෙබඳු මානසික තත්ත්වයක් තුළ සිරවී සිටින බොහෝ දෙනා එක්කෝ මත්වතුර පානය කරති. එසේ නැතහොත් මත්කුඩු භාවිත කරති. එසේත් නැත්නම් දුම්වැටි උරති.

මේ අනුව ජංගම දුරකථනයද එවැනි ඇබ්බැහි වීමක් ඇති කරන භාණ්ඩයක් බව පැහැදිලි වශයෙන්ම හඳුනාගෙන ඇත.

ආසියාවේ මේ තත්ත්වය තවමත් රෝගී තත්ත්වයකට පරිවර්තනය වී නැති නමුත් ඇමෙරිකාව හා අනෙකුත් බටහිර රටවල මෙම ජංගම දුරකථන ඇබ්බැහි වීම දරුණු මානසික රෝගයක් බවට පත් වී ඇත.

ඇමෙරිකාවේ පිව් පර්යේෂණ මධ්‍යස්ථානය (Pew Research centre) මගින් 2011 පවත්වනු ලැබූ සමීක්ෂණයකට අනුව ඇමෙරිකාවේ වැඩිහිටි අය අතුරෙන් සියයට 46 ක් ජංගම දුරකථනයක අයිතිකරුවන් බවත් 2011 දී පවත්වනු ලැබූ සමීක්ෂණයට වඩා සියයට 25 කින් එම ප්‍රමාණය වැඩි වී ඇති බවත් කියැවේ.

එසේම හාවඩ් ව්‍යාපාරික විද්‍යාලයේ ආචාර්ය ලෙස්ලි පර්ලොව් පවසන අන්දමට උදයේ පිබිදීමෙන් පසු සියයට 70 ක් දෙනා තම ජංගම දුරකථනයේ පණිවිඩ පිරික්සා බැලීමට පුරුදුව ඇති අතර නින්දට යාමට පැයකට පමණ පෙර එම කාර්යයම සිදු කරති. එසේම සිකුරාදා ඇතුළුව සති අන්තයේදී 48% දෙනා සේම නිවාඩු කාලවලදී 51% ක් පමණ දෙනා එම පිරික්සීම සිදු කරති. ඒ හැමටම වඩා ජංගම දුරකථන නැති වී සතියක් ඇතුළතදී අලුතින් එකක් ගත නොහැකි වුවහොත් 44% ක පමණ පිරිසක් අතිශය කාන්සාවකට පත්වන බවත් පර්ලොව්ගේ සමීක්ෂණයෙන් හෙළි වී ඇත.

මේ අතර එංගලන්තයේ පර්යේෂණ ආයතනයක් මඟින් පැවැත්වූ සමීක්ෂණයකට අනුව එම රටේ සිටින ජංගම දුරකථන හිමිකරුවන් අතුරෙහි සියයට 53 ක්ම තම දුරකථනය නැති වීම, බැටරිය අකර්මණ්‍ය වීම හෝ මුදල් අවසන් වීම මෙන්ම පණිවුඩ ලබාගත නොහැකි තත්ත්වයක් ඇති වුවහොත් වැනි කරුණු නිසා අතිශය වික්ෂෝභයට හා මානසික අසහනයකට පත්වන බව දැක්වේ.

ඒ අනුව එම මානසික අසහනය 'ජංගම දුරකථනයක් නැතිවීමේ භීතිකාව' (No Mobile Phone Phobia) ලෙස හඳුන්වනු ලබයි. මෙම සමීක්ෂණයට අනුව පිරිමින් අතුරෙන් 58% ක් හා කාන්තාවන් අතුරෙන් 47% ක් මෙම භීතිකාවෙන් පෙළෙන බව පෙනේ. මෙම සමීක්ෂණය සඳහා 2163 පිරිසක් උපයෝගී කරගන්නා ලදී.

එසේම ළඟ එන විවාහ මංගල්‍යයක් නිසා ඇතිවන ආතතිය හා සමාන තත්ත්වයක් මෙම භීතිකාව නිසා ඇති වන බවද මෙම සමීක්ෂණය පෙන්වා දී ඇත. මෙම භීතිකාව ඇමෙරිකාවේ තවත් උග්‍ර තත්ත්වයකට පෙරළී ඇති බව පෙනී ගොස් ඇත. සෑම ඇමෙරිකානුවන් තිදෙනකුගෙන් දෙදෙනකුම ජංගම දුරකථන සමඟ රාත්‍රී නින්දට යන බව හෙළිවී ඇත. එසේම අඹු සැමියන් ලෙස හැසිරෙන විටදී පවා සියයට 34 ක් පමණ දෙනා ජංගම දුරකථන පණිවිඩවලට උත්තර දෙන බවද හෙළි වී ඇත. මේ හැර සපත්තු නැතිව සතියක් පමණ ගමන් යා හැකි නමුත් ජංගම දුරකථනයක් නැතිව ගමනක් යෑම ඇමෙරිකාවේ සිදු නොවන බව පෙනේ. එසේම ජංගම දුරකථන අයිති අයගෙන් වැඩි පිරිසක් කිසි අවස්ථාවක තම දුරකථනය අක්‍රීය කිරීම නොකරති. එසේම ජංගම දුරකථන නොමැති වීමේ භීතිකාවෙන් සියයට 66 ක් පමණ දෙනා දැනට පෙළෙන බවද හෙළි වී ඇත.

විශේෂයෙන්ම ජංගම දුරකථන කෙරේ වැඩි ඇබ්බැහිවීමක් සිදුව ඇත්තේ තරුණ වියේ පසුවන එනම් 18 ත් 30 ත් අතර වයස් සීමාවේ සිටින අය බවද පෙනී ගොස් ඇත.

ඇමෙරිකාවේ කනෙක්ටිකට් ජනපදයේ වෙස්ට්හාට්ෆඩ්හි වෙසෙන සුප්‍රකට මනෝවිද්‍යාඥයෙකු වන ඩේවිඩ් ග්‍රීන්ෆීල්ඩ් පවසන අන්දමට පරිගණක තාක්ෂණය ඇබ්බැහි වීමකට පහසුවෙන් ඉඩ සලසන්නේ, ඒවායේ ඉහළ මානසික ක්‍රියාකාරිත්වයක් (Psychoactive) පවතින නිසා බවත් එමඟින් චිත්ත ස්වභාවයේ වෙනසක් සිදු කිරීමටත් එසේම සතුටක් විනෝදයක් ඇති කිරීමටත් සමත් වන හෙයිනි.

ජංගම දුරකථන හදිසි අවශ්‍යතා සඳහා භාවිත කිරීමට අත්‍යවශ්‍ය භාණ්ඩයක් වන නමුත් එයින් සාමාන්‍ය දිවි පෙවෙතට සිදුවන හානි සහ බාධා වැඩි බව බටහිර මනෝ විද්‍යාඥයෝ අවධාරණය කරති.

බටහිර රටවල ජංගම දුරකථන සමඟ ජනිත වන භීතිකාව ඉතාම උග්‍ර තත්ත්වයට පත්ව ඇතැයි පවසන මනෝ විද්‍යාඥයෝ ආසියාවේද එම තත්ත්වය ශීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතින බවට අනතුරු අඟවති.

ජපානයේ ජංගම දුරකථන සම්බන්ධයෙන් උප සංස්කෘතියක් බිහිවී ඇති බවත් එය 'කෙයිටයි කල්චර්' (Keitai Culture) යනුවෙන් හඳුන්වනු ලබන බවත් වාර්තාවේ.

ජංගම දුරකථන බිලියන 2.5 ක් විසිර ගොස් ඇති ආසියාවෙන් එම දුරකථන නිසා සිදුවන අනතුරු රැසක් පිළිබඳවද වාර්තා වී ඇත.

මේ අතර සිංගප්පූරුවේ සෞඛ්‍ය මධ්‍යස්ථානයක් වන ටච් සයිබර් වෙල්නස් සෙන්ටර් (Touch Cyber Wellness Centre) ආයතනයේ කළමනාකාර චොං ඊ.ජේ. පවසන්නේ "තරුණයින්ට මේරූ මනසක් නොමැති නිසා ආත්ම පාලනයක් කර ගැනීමට නොහැකි වනවා. ඒ අනුව නවීන ජංගම දුරකථන පාලනයක් සහිතව පාවිච්චි කිරීමට ශක්තියක් නැතැ" යි යනුවෙනි.

සිංගප්පූරුවේ කුඩා දරුවන්ටත් මෙබඳු නවීන දුරකථන ලබාදීම නිසා ඔවුන්ගේ ඉගෙනීමට බාධා වනවා සේම මානසික වර්ධනය විකෘති වීමක් සිදුවන බව හෙතෙම පවසයි.

ජංගම දුරකථන අප රටේ පවා සංකීර්ණ ප්‍රශ්නයක් බවට පත්වෙමින් පවතී. ජංගම දුරකථනයෙන් කථා කරමින් රිය පැදවීම නිසා රියපදවන තැනැත්තාට පමණක් නොව මහ මඟ සිටින අහිංසක ජනතාවටද නොයෙකුත් ආපදාවලට මුහුණදුන් අවස්ථා ගැන අපට නොයෙකුත් වාර්තා ලැබී ඇත.

ජංගම දුරකථනයකින් කතා කරමින් මහ මඟ කහ ඉරෙන් පාර හරහා මාරුවෙන ගැහැනු ළමයෙකු පොලිස් නිලධාරියෙකු විසින් අත්අඩංගුවට ගනු ලැබ අවවාද කර නිදහස් කරන ආකාරය මා දුටු එක් සිදුවීමකි. එසේම මහ මඟ ගමන් කරන වැඩි දෙනා එසේ ගමන් කරද්දී ජංගම දුරකථනයෙන් කථා කරමින් යෑම අද ඉතාම සුලබ දසුනකි.

වඳුරාට දැළි පිහිය දුන්නාක් මෙන් නොමේරූ තරුණ තරුණියන් මෙම මෙවලමේ වහලෙකු බවට පත්වීම අතිභයානක තත්ත්වයක් බව බටහිර රටවලට සිදුවී ඇති ව්‍යසනයෙන් අපද වහාම පාඩමක් ඉගෙන ගත යුතුව ඇත.




උණුසුම් පුවත්

දැන් ශ්‍රී ලංකාවේ, කැනඩාවේ සහ ලෝකයේ
ඕනෑම රූපවාහිනී නාලිකාවක් සජීවීව

මසකට $ 15.00 පමණි

1500 කට අධික නාලිකා සජීවීව 1000 කට අධික නවීණ 2D සහ 3D චිත්‍රපට
සිංහල ටෙලිනාට්‍ය

අමතන්න
දිල්රුක්: 647 403 2259

# Tutoring
## From Grade 08 to 12

| Mathematics<br>Physics<br>Programming<br>(Java, C#) | Grade 12 Mathematics<br>Advance Functions<br>Limits<br>Calculus |
|---|---|

- Supporting for homework and tests
- Full attention for improving knowledge
- Home Visits possible

Experience and qualified teacher for excellent results

Contact
Kithsiri Jayasinghe
(BSc. , MSc. Mathematics & Comp. Science)

Email: jayakithsiri@hotmail.com

Phone - 647 705 1606 / 647 946 9504

# TRICO
TRICO MARITIME

SRI LANKA'S BEST AND LARGEST CLEARING FACILITIES IN THREE MAJOR CITIES SINCE 1980

special service to
Colombo, Jaffna, Kilinochchi, Batticaloa, Trincomalee, Vavuniya & Mannar

COLOMBO
GALLE
KURUNEGALA

(Sole Authorized Agent of
Trico Maritime (Pvt) Ltd. Sri Lanka)

The first Customs Bonded Warehouse for Personal Effects and gift items clearance in Sri Lanka

**Serving People Worldwide Reliably for 35 Years**




DOOR TO DOOR SERVICE
to any part of Sri Lanka

Our Canadian Agents

TORONTO: DERRICK ANTON / SUTHAN
647.833.3020 | 289.892.4289

OTTAWA : 613 513 6106 (SAMAN) • MONTREAL: 514 884 8550 (VICKIE / NOEL) • VANCOUVER: 604 771 0026 (Sunny)
CALGARY: 403 971 6721 (SAMAN) • WINNIPEG: 204 800 2364 (MANGALIKA) • ALBERTA : 403 971 6721 (SAMAN)

Trico Maritime Customer Services & Warehouses in Sri Lanka

| HEAD OFFICE | COLOMBO WAREHOUSE | KURUNEGALA WAREHOUSE | GALLE WAREHOUSE |
|---|---|---|---|
| Trico Maritime (Pvt) Ltd<br>50K Cyril Perera Mawatha<br>Colombo 13<br>Tel: 2345580 / 2345581<br>Fax: 2432000 | Trico Maritime (Pvt) Ltd<br>414/17 K. Cyril Perera Mawatha<br>Colombo 13<br>Tel: 2448270 / 2440114<br>Fax: 2432000 | Trico Maritime (Pvt) Ltd<br>Humbara Road Sandagala<br>Uhumeeya<br>Tel: 073 2238924 / 037 2238925<br>Fax: 037 2238967 | Trico Maritime<br>Pro Cargo Distribution (Pvt) Ltd<br>No. 331 Matara Rd, Kangoda, Galle<br>Tel: 091 2234842<br>Fax: 2234841 |

Trico Maritime Freight Forwarding Canada Inc.
151 Nashdene Rd, Unit #5, Scarborough On. M1V 4B9
Intersection: Markham Road/Nashdene Road

Tel: 413 335 8800
Fax: 416 335 8848

email: info@tricomaritime.ca
www.tricomaritime.ca

# මරණාසන්නයේ සිතෙහි පහළ වන දසුන්



## ඊළඟ භවයට බලපාන්නේ කෙසේද?

■ සුමනදාස වීරසිංහ

නිරයෙ අග්ගික්ඛන්ධ ච පෙතලොකං ච අන්ධකං
තිරච්ඡානයො නිං ච මං සක්ඛකධං ච මානුසං
විමා නං දෙව ලො කම්හි නිමිත්තං ච පංච දිස්රරෙ

මෙම ගාථා ධර්මයෙන් තමන් අදහන්නා වූ ආගම කුමක් වුවද මරණය සිදුවන මොහොතේදී දර්ශනය වන්නා වූ නිමිති පහක් ගැන සඳහන් වේ. එම නිමිත්තට අනුව ඊළඟ ප්‍රතිසන්ධි තලයේ පුනර්භවය ඇතිවන බැව් පැවසේ.

- අග්නි ජාලාවක් දර්ශනය වේ නම් - නිරයේ පුනර්භවය සිදුවේ
- අන්ධකාරයක් දර්ශන වේ නම් - ප්‍රේත යෝනියක පුනර්භවය සිදුවේ
- වන සතුන් හා වනාන්තර දර්ශනය වේ නම් - තිරිසන් යෝනියක පුනර්භවය සිදුවේ
- මියගිය ඥාතීන් හෝ මිනිසුන් දර්ශනය වේ නම් - මිනිසත් භවයේම පුනර්භවය සිදුවේ
- දිව්‍ය විමාන දර්ශනය වේ නම් - දිව්‍ය ලෝකයක පුනර්භවය සිදුවේ

මියයමින් සිටින කෙනකුට දර්ශනය වන මෙම පංච නිමිති ගැන පර්යේෂණය කර විමසා බලා අත්දැකීම් ලබාගත් විට මෙකී නිමිතිවල ඇති සත්‍යතාවය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට හැකි වේ. බුදුරජාණන් වහන්සේ ප්‍රේතවත්තු, විමානවත්තු වැනි සූත්‍ර දේශනා කොට වදාළේ මිනිසුන් අතින් සිදුවන්නා වූ අකුසල්වලින් වළක්වා කුසල් රැස්කර ගැනීමට උනන්දු කරවීමට හා ඒ තුළින් මිනිසාගේ මෙලොව පරලොව දෙකෙහිම යහපත සලසාදීමටය.

අපාය ගැන දේශනා කොට මිනිසුන් බිය ගන්වා හෝ දිව්‍යලෝක ගැන දේශනා කොට මිනිසුන්ට සුරංගනා ලෝක මවා පා බුදුදහමට මිනිසුන් පොළඹා ගැනීමට ක්‍රියා නොකළ ආගමික ශාස්තෘවරයකු වී නම් ඒ බුදුපියාණන් වහන්සේමය. ඒ භාග්‍යවතුන් වහන්සේ ලෝකත්‍රයම ඇති සැටියෙන්ම දැන වදාළ බැවින් ලෝකවිදූ නම් වන සේක. එවන් දහමක් ගැන සැක නොකොට මැරෙන මොහොත දර්ශනය වන පංච නිමිති ගැන විමසිලිමත්ව කරුණු අධ්‍යනය කර බලා සත්‍ය තේරුම් ගත හැකිය.

### අග්නි ජාලාවක් දර්ශනය වන්නෝ හඳුනාගත හැකි ලක්ෂණ

මියයන මොහොතේ ගිනි ගොඩක් පේනවා යැයි කියන අය මෙන්ම ඒ බව නොකියා දනවා දනවා යැයි කියමින් කෑ ගසන අයද සිටිති. තවත් සමහරු කිසිවක් නොකියා අභිනයන් මගින් (පිළිස්සෙන විට පළකරන ඉරියව්) පළ කරති. ගින්නක් ඇවිලෙන විට කටින් පිඹ එය නිවා දමන්නට හදන ලෙස හුළං පිඹින අය සිටිති. වතුර වතුර කියා ජලය හොයන අය සිටිති. එවන් අය නිරයේ යන්නෝ වෙති.

### අන්ධකාරය දර්ශනය වන්නෝ හඳුනා ගැනීම

"මට මොකවත් පේන්නෙ නෑ. ලාම්පු පත්තු කරන්න. ලයිට් දමන්න. හරිම කළුවරයි. මොකවත් පේන්නෙ නෑ" යැයි මරණ මොහොතේ කියන අය සිටිති. එළියක් අරගෙන එන ලෙස කෑගසන අය සිටිති. ඇස්පිල්ලන් ගසමින් ඇස් පොඩි කරමින් ඇස් නොපෙනෙන අය ඇස්වලින් පලකරන ඉරියව් පළ කරන අය සිටිති. එවන් අය කිසියම් ප්‍රේත යෝනියක පුනර්භවයක් ලබන්නෝ වෙති.

වන සතුන් හා වනාත්තර දර්ශනය වන්නෝ හඳුනා ගැනීම

අලි එනවා හරක් එනවා යැයි සතුන්ගේ නම් කියමින් කෑ ගසන අය මෙන්ම එසේ නොකියා සතුන් එලවන ශබ්ද පිට කරන්නෝ වෙති. එසේම නොයෙක් සතුන්ගේ කෑගසන හඬට සමාන හඬ පිටකරමින් මියයන්නෝ සිටිති. වනාන්තර ගැන තොරතුරු කියන්නෝ වෙති. එසේම කැළේ යන අය මෙන් විපරමින් වටපිට බලන ඉරියව් පල කරන අය සිටී. එසේ වන සතුන් හා කැළෑවන් දර්ශනය වන්නෝ මරණයෙන් පසු තිරිසන්ගත යෝනිවල පුනර්භවය ලබන්නෝ වෙති.

### ඥාතීන් හා මිනිසුන් දර්ශනය වන්නන් හඳුනා ගැනීම

මියයන මොහොත් තම මියගිය ඥාතීන් දර්ශනය වන අය මෙන්ම ජීවතුන් අතර සිටින අයගේ නම් කියමින් කතා කරන අය එම අයගේ තොරතුරු කියන අය ඒ අය සිහියට එන අය මරණයෙන් මතු මිනිසත් භවයේම පුනර්භවය ලබන්නෝ වෙති.

### දෙවියන් හා දිව්‍ය විමාන දර්ශනය වන අය

මරණාසන්න මොහොතේ ප්‍රසන්න මුහුණින් යුතුව මල් සුවඳ හා මල් ගැන කතාකරන එසේම බියකරු ඉරියව් කිසිවක් පළ නොකර අහස දෙස බලා සිටින්නාක් මෙන් උඩ සිටින දෙවිවරු ගැන කියන අය සිටී. එවන් අයගේ මුවින් දිව්‍ය විමාන දිව්‍ය රථ ගැන ප්‍රකාශ වේ. සුදත්ත සිටුතුමා, දුටුගැමුණු රජතුමා වැන්නවුන්ට මෙවන් දර්ශන පෙනුන බැව් බෞද්ධ පතපොතේ සඳහන්ව ඇත. වර්තමානයේද එවැන්නෝ ගැන අසන්නට ලැබෙන අවස්ථා ඇත. එසේ දිව්‍ය විමාන, දිව්‍ය රථ මල්මාලා, මල්වට්ටි ආදී දර්ශනය වන්නෝ මරණයෙන් මතු සුගතිගාමී දිව්‍ය ලෝකවල පුනර්භවයන් ලබන්නෝ වෙති.

මේ නිසාම මරණාසන්නව සිටින අය වෙත භික්ෂූන් වහන්සේ වැඩම කරවා ධර්ම දේශනා කරවීම, පිං පොත කියවීම ආදී සිරිත, චාරිත්‍ර අදත් බෞද්ධ සමාජයේ පවතී. බෞද්ධ ශාසන ඉතිහාසයේ සඳහන්ව ඇති ධම්මික උපාසකතුමාගේ කථාව තුළින්ද දිව්‍ය ලෝකවල උපදින අයට දිව්‍ය රථ හා දිව්‍ය විමාන දර්ශනය වන බව බුදුරජාණන් වහන්සේ භික්ෂුන් වහන්සෙලාට පැහැදිලි කර දී ඇත.

හදිසි අනතුරුවලින් ඉතාමත් කෙටි කාලයක් තුළදී මරණයට පත්වන අය තුළ ඉහත පංච නිමිති දර්ශනය වේද යන්න සිත පිළිබඳ ව නොදත් කෙනකුට ගැටලුවක් විය හැක. එහෙත් මෙකී දර්ශනයක් පහළවීමට චිත්තක්ෂණයක් ප්‍රමාණවත්ය.

විශුද්ධි මාර්ගයෙන් පෙන්වා දී ඇති ආකාරයට ජීවියකුගේ පරම ජීවිත කාලය ඉතා කෙටි මොහොතක් වන අතර එය එක් සිතිවිල්ලක් පවතින තෙක් පමණක් වේ. රථ රෝදයක් කැරකෙමින් යන විට රෝදය එක් මොහොතක් පොළව හා බද්ධ වී පවතින්නේ එක් ස්ථානයකින් පමණක් වන සේම ජීවියාගේ පැවැත්ම පවතින්නේ එක් සිතිවිල්ලක් පවතින තරම් සුළු මොහොතක් බව පෙන්වා දෙයි. ඒ අනුව යම් සිතිවිල්ලක් සත්වයාගේ සිත තුළ පහල වීද ඊට අදාළ ගති ස්වභාවයන් ඇත. ඒ ගති ස්වභාවය දේව ගතියක් විය හැක. මනුෂ්‍ය ගතියක් විය හැක. ප්‍රේත ගතියක් විය හැක. තිරිසන් ගතියක් විය හැක. දුගති සත්ව ගතියක් විය හැක. එම ගති නිමිති ස්වභාවය අනුව පංච නිමිති දර්ශන පහළ වීම චිත්ත නියාමය වේ.

මේ නිසා බුදුමඟ ගමන් කරන බෞද්ධයන් වශයෙන් තම තමාගේ චිත්ත සන්තානයක් තුළ නිරන්තරයෙන් මනුෂ්‍ය ගතිගුණ හා දේවගති ගුණ පවත්වාගෙන යෑමට සිහිබුද්ධියෙන් කටයුතු කිරීමට පුරුදු පුහුණු වන්නේනම් මරණාසන්න මොහොතේ සුගතිගාමී නිමිති දැකගැනීමට හැකියාව ලැබේ.

# සිනහවේ ප්‍රභේද

■ මංජුලා පුෂ්පරාංගනී

සිනහව හදවතේ කැඩපතයි. ඒ නිසා සිනහව තුළින් ගතිගුණ අනාවරණය කර ගත හැක. යමෙකුගේ සිනහවෙන් ආදරය, සෙනෙහස, අවඥාව, රැවටීම, කපටිකම, මෝඩකම, අහිංසක කම, උමතු බව හා සමච්චල් බව ආදී මෙකී නොකී බොහෝ කරුණු කාරනා තේරුම් ගත හැක. ඉහත සඳහන් ලෙස සිතුවිලි අනුව පහළ වන සිනහව විවිධාකාර වේ. ඒ අනුව දේහ ලක්ෂණ විද්‍යාවේ සිනහ වර්ග 6 ක් පෙන්වා දී ඇත. ඒවා මෙසේයි.

- සිතය සිනහව
- හසිතය සිනහව
- විහසිතය සිනහව
- උපහසිතය සිනහව
- අපහසිතය සිනහව
- අති හසිතය සිනහව

මෙම සිනහ වර්ග වෙන වෙනම අධ්‍යයනය කරමු.

### 1. සිතය සිනහව

මෙම සිනහව පහළ වන විට මුහුණ ඉතාම සෞම්‍ය ස්වභාවයක් ගනී. දැස මදක් විවර වේ. සිනහව මුහුණ පුරාම පැතිරී යයි. මෙම සිනහව දකින විට ගෞරවයක්, භක්තියක් ඇතිවේ. තොල් පෙති සෙලවේ. දත් නොපෙනේ. කිසිදු හඬක් ඇති නොවේ.

### 2. හසිතය සිනහව

දත්වල අග කොටස පමණක් පෙනේ. කිසිදු හඬක් සිනාසෙන විට නොනැගේ. මෙම සිනහවද මුහුණට ඇති කරණුයේ ශාන්ත ප්‍රසන්න බවකි. මෙම සිනහ වර්ගය හා ඉහත සිතය සිනහව යන දෙවර්ගය බුදු, පසේබුදු, මහරහත් උතුමන් උදෙසා පිහිටයි.

### 3. විහසිතය සිනහව

මෙම සිනහව බොහෝ විට කුඩා දරුවන් තුළින් මතුවේ. මිහිරි හඬකින් යුක්තය. මෙම සිනහව තුළ රාගය, ද්වේශය, මෝහය නැත. පුද්ගලයෙකු බොහෝ ප්‍රීතියෙන්, සිතේ සැහැල්ලුවෙන් සිටින විට ඇති වේ.

### 4. උපහසිත සිනහව

හිස හා උරහිස් පමණක් සැලෙන ලෙස පහළ වන සිනහවයි. පිරිසිදු සිත් ඇත්තන්ට මෙම සිනහව පහළවේ.

### 5. අපහසිත සිනහව

සිනහව පාලනය කර ගත නොහැකිව දෑස්වලින් කඳුළු ගලන තුරු පවතින සිනහවය. මෙහිදී සිරුරේ ඉනේ උඩ කොටසේ අවයව සෙලවේ. හඬ නගා සිනාසෙන අතර ඇතැම් විට අංගචලනයෙන්ද දැකිය හැක.

### 6. අති හසිතය සිනහව

මෙම සිනහවද පාලනය කර ගත නොහැක. දෑස්වලින් කඳුළු පනින තුරුම සිනා සේ. මෙම සිනාවේදී මුළු සිරුරම සෙලවේ. නූගතුන් මෙම සිනහව ප්‍රදර්ශනය කරයි.



LESSON 16

Hope you are now able to ask questions in French! Knowing how to ask questions will definitely help you in overcoming many situations. Last lesson has laid the very foundation to asking questions and forming sentences with 'Avoir' expressions. By now you have a certain knowledge about how French conversations and grammar work. There were some exercises given in order for you to put what you learnt so far in to practice. If there are questions with regard to any of the lessons or if you want your exercises to be corrected, you can email them to kumudu4444@gmail.com.

This month's Dasatha issue presents you the countries of the world in French. You will soon be able to name all the countries on a world map in French. The grammar lesson continues as usual to improve your grammar knowledge and to help you construct sentences using correct grammar. Exercises will help you put what you learnt so far in to practice. Enjoy learning! Thank you!




## Le Vocabulaire (ලවොකැබියුලෑර්) - Vocabulary

The vocabulary section of this month's Dasatha issue presents a lesson on the names of countries of the world. In order to improve your general vocabulary it is important to present the names of the countries. You would need to know the countries in order to hold a conversation confidently. In the table, the (m) and (f) indicate the gender of the country. You have to know the genders of the countries in order to get the correct preposition to construct a sentence.

✓ Countries that are masculine and plural take à or de and the appropriate definite article except when these countries that are masculine start with a vowel. Then they take en with the meaning of to or in and d' to mean from.

Ex: Je vais au Canada
Elle va aux États-Unis

✓ Countries that are feminine and continents take en or de without any article.

Ex: Elle va en Chine
Ils vont en Asie

Les Pays du monde (ලෙපෙයිදියු මොන්ද්) – The countries of the world

| | |
|---|---|
| l'Afghanistan (m) (ලෆ්ගනිස්තාන්) | Afghanistan |
| l'Afrique du Sud (f) (ලෆ්රික්දියුසියුද්) | South Africa |
| l'Albanie (f) (ලල්බනී) | Albania |
| l'Algérie (f) (ලල්ජෙරි) | Algeria |
| l'Allemagne (f) (ලල්මාන්සද) | Germany |
| l'Andorre (f) (ලන්දෝර්) | Andorra |
| l'Angleterre (f) (ලොංග්ලතෑර්) | England |
| l'Angola (m) (ලොංග්ලෝලා) | Angola |
| l'Antigua-et-Barbuda (f) (ලලොංතිගුආ ඒ බර්බුදා) | Antigua and Barbuda |
| l'Arabie saoudite (f) (ලරාබි සඋදිත්) | Saudi Arabia |
| l'Argentine (f) (ලර්ජොන්තීන්) | Argentina |
| l'Arménie (f) (ලර්මෙනී) | Armenia |
| l'Australie (f) (ලොස්ත්‍රාලී) | Australia |

| | |
|---|---|
| l'Autriche (f) (ලොත්‍රිෂ්) | Austria |
| les Bahamas (f) (ලෙබහමාස්) | Bahamas |
| le Bahreïn (ලබාහ්රෙයින්) | Bahrain |
| le Bangladesh (ලබංග්ලාදෙෂ්) | Bangladesh |
| la Belgique (ලාබෙල්ජික්) | Belgium |
| le Bhoutan (ලබූතාන්) | Bhutan |
| la Birmanie (ලාබිර්මානී) | Burma |
| la Bolivie (ලාබොලිවී) | Bolivia |
| le Botswana (ලබොස්වානා) | Botswana |
| le Brésil (ලබ්‍රෙසිල්) | Brazil |
| le Brunéi (ලබෘනායි) | Brunei |
| la Bulgarie (ලාබුල්ගරි) | Bulgaria |
| le Burundi (ලබුරුන්දි) | Burundi |
| le Cambodge (ලකාම්බෝජ්) | Cambodia |
| le Cameroun (ලකමෙරූන්) | Cameroon |
| le Canada (ලකනදා) | Canada |
| le Chili (ලචිලි) | Chile |
| la Chine (ලාෂීන්) | China |
| la Colombie (ලාකොලොම්බි) | Colombia |
| le Congo (ලකොංගෝ) | Congo |
| le Chili (ලචිලි) | Chile |
| la Chine (ලාෂීන්) | China |
| la Colombie (ලාකොලොම්බි) | Colombia |
| le Congo (ලකොංගෝ) | Congo |
| la Corée du Nord (ලකොරේදියුනෝර්) | North Korea |
| la Corée du Sud (ලකොරේදියුසියුද්) | South Korea |
| le Costa Rica (ලකොස්තාරිකා) | Costa Rica |
| la Côte d'Ivoire (ලාකොත්දිවෝර්) | Côte d'Ivoire |
| la Croatie (ලාක්‍රොඒෂී) | Croatia |
| Cuba (කියුබා) | Cuba |
| le Danemark (ලදනේමාර්ක්) | Denmark |
| la Dominique (ලාදොමිනීක්) | Dominica |
| l'Écosse (f) (ලෙකොස්) | Scotland |

| | |
|---|---|
| l'Égypte (f) (ලීජිප්ත්) | Egypt |
| les Émirats arabes unis (m) (ලේස්එමිරා අරාබ් යුනි) | United Arab Emirates |
| l'Équateur (m) (ලෙක්ආතර්) | Ecuador |
| l'Espagne (f) (f,iamdJH& | Spain |
| les États-Unis (m) (ලෙතාස්යුනි) | US |
| l'Éthiopie (f) (ලිතියෝපි) | Ethiopia |
| la Finlande (ලාෆින්ලොන්ද්) | Finland |
| la France (ලාෆ්රොන්ස්) | France |
| le Gabon (ලගබොං) | Gabon |
| la Géorgie (ලාජෙඔර්ජී) | Georgia |
| le Ghana (ලගආනා) | Ghana |
| la Grèce (ලාග්‍රෙක්) | Greece |
| le Guatemala (ලගෝතමාලා) | Guatemala |
| la Guinée (ලාගිනෙ) | Guinea |
| la Guyana (ලගියානා) | Guyana |
| Haïti (අයිටී) | Haiti |
| la Hongrie (ලඔංගරී | Hungary |
| Île Maurice (f) (ඊල්මොරීස්) | Mauritius |
| les Îles Marshall (ලේස්ඊල්මර්ෂල්) | Marshall Islands |
| les Îles Salomon (ලේස්ඊල්සලොමොං) | Soloman Islands |
| l'Inde (f) (ලැන්ද්) | India |
| l'Indonésie (f) (ලැන්දොනේසි) | Indonesia |
| l'Iran (m) (ලිරාන්) | Iran |
| l'Irak (m) (ලිරාක්) | Iraq |
| l'Irlande (f) (ලිර්ලොන්ද්) | Ireland |
| l'Irlande du Nord (f) (ලිර්ලොන්ද්දියුනෝර්) | Northern Ireland |
| l'Islande (f) (ලිස්ලොන්ද්) | Iceland |
| Israël (m) (ඉස්රාඑල්) | Israel |
| l'Italie (f) (ලිතාලි) | Italy |

## Grammaire (ග්‍රාමෑර්) Grammar



Hope you studied the lesson on Avoir expressions presented in the last lesson of Dasatha! Now you must be able to construct sentences correctly using the avoir expressions when required. In this issue, we are going to learn the possessive pronouns that indicate the possession in a different way. These pronouns are very important when constructing proper sentences and indicating possession.

| English Meaning | singular | | plural | |
|---|---|---|---|---|
| | masculine | feminine | masculine | feminine |
| Mine | le mien (ලමිඇං) | la mienne (ලාමියෙන්) | les miens (ලෙමිඇං) | les miennes (ලෙමියෙන්) |
| Yours | le tien (ලතිඇං) | la tienne (ලාතියෙන්) | les tiens (ලෙතිඇං) | les tiennes (ලෙතියෙන්) |
| His/Hers | le sien (ලසිඇං) | la sienne (ලාසියෙන්) | les siens (ලෙසිඇං) | les siennes (ලෙසියෙන්) |
| Ours | le nôtre (ලනෝත්‍ර) | la nôtre (ලානෝත්‍ර) | les nôtres (ලෙනෝත්‍ර) | les nôtres (ලෙනෝත්‍ර) |
| Yours | le vôtre (ලවෝත්‍ර) | la vôtre (ලාවෝත්‍ර) | les vôtres (ලෙවෝත්‍ර) | les vôtres (ලෙවෝත්‍ර) |
| Theirs | le leur (ලලර්) | la leur (ලාලර්) | les leurs (ලෙලර්) | les leurs (ලෙලර්) |

- The possessive pronoun always replaces the possessive adjective and its noun.

Ex: Est-ce que c'est votre stylo? – Is this your pen?
Oui c'est le mien – Yes it is mine

- The possessive pronoun agrees with the noun it replaces and not with the subject of the sentence

Ex: J'ai ma voiture et ma sœur a la sienne – I have my car and my sister has hers

- It is important to note that the prepositions à and de contract the definite article in the possessive pronoun as well

Ex: Il pense souvent à ses frères (He ofter thinks of his brothers) → Il pense souvent aux siens (He often thinks of them)

Son père est près de mon père (Her father is near my father) → Son père est près du mien (Her father is near mine)

- It must be translated by Ce before a pronoun

Ex: Ce sont les siennes - These are hers

- Mine, Yours, Theirs, Hers, His etc. can also be translated by à moi, à toi, à eux, à elle, à lui

Ex: C'est la maison de qui? – Whose house is this?
Cette maison est à moi – This house is mine

- Own is translated either by Propre or à moi, à toi, à eux, à elle, à lui

Ex: C'est notre propre voiture – It is our own car
C'est notre voiture à nous – It is our own car

**Kumudu Abeywardena**
Masters (French Literature), BA (Modern Languages), Dip (AFC)
kumudu4444@gmail.com

# ඇත රට...

6 වන පිටුවෙන්

නම් 'එය වැරදියි' යැයි කියන්නට, 'ඔවුන් කවුරුත් හෙළුවෙන්' යැයි කියන්නට මේ පාර්ලිමේන්තුවේ පොඩි ළමයෙකු නොසිටීමයි.

දෙවැනි කරුණ නම් පාර්ලිමේන්තුවේ සිදුවූ මේ වැරැද්ද පිළිබඳව කිසිවෙක් තමා තෝරා එවූ ජනතාවගෙන් සමාව නොඉල්ලීමයි. යමක් වැරදි යයි තමන්ට හැඟුන විට වත් "සමාවෙන්න" යැයි කීම මිනිසුන්ගේ සිරිතකි. ඒ වෙනුවට ඔවුන් කළේ සිදුවූ දේ වැරදි නැතැයි පෙන්වීමට හේතු සාධක ජනතාව ඉදිරියේ තබමින් තමන්ගේ ගොඩ වැඩිකර ගැනීමට විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය ඉදිරියේ නිදහසට කරුණු කීමයි. එක් අයෙක් කීවේ මෙවැනි සිදුවීම් ජපානය, කොසෝවා, තුර්කිය, තායිවානය වැනි පාර්ලිමේන්තුවලත් සිදුවී ඇති හෙයින් මෙය එතරම් දෙයක් නොවන බවයි. ඒ අනුව මොවුන් මේ අනුගමනය කොට ඇත්තේ අඳබාල, නොහික්මුණු පිටරැට්ටියන් කළ දේම නොවේද?

තෙවැනිව මොවුන් කවුරු කවුරුත් කළ වරද නම් මාධ්‍ය සාකච්ඡා තබමින් "මම නොවෙයි වැරදි මෙයා" යයි තුන් හතර හැවිරිදි ළමුන් කියන්නාක් මෙන් ජනතාව ඉදිරියේ තමන් නිවැරදි බවත් අනුන් වැරදි බවත් පෙන්වන්නට උත්සාහ ගැනීමයි. මේ සියල්ලට වැරදිකරු වසර තුනහමාරක් තිස්සේ රනිල් වික්‍රමසිංහ කළ වැරදිවලට උඩගෙඩි දෙමින් ඒවා වළක්වන්නට උත්සාහ නොකොට ආණ්ඩුව විසුරුවා හැරි 'ජනාධිපති' යැයි සමහරු කීහ. මේ සියල්ලට වැරදිකරු විසුරුවා හැර තිබුණු පාර්ලිමේන්තුව නැවත කැඳවීමට කටයුතු කළ 'කතානායක' යැයි සමහරු කීහ. ජනාධිපති පොළඹවා අගමැති කම ලබා ගැනීමට ඉක්මන් වූ 'මහින්ද රාජපක්ෂ' මීට වගකිව යුතු යැයි මේ අතර සමහරු කීහ. තවත් අය කීවේ ආණ්ඩුව විසුරුවා හැරිය පසුවත් ගෙවලයකු මෙන් අරලියගහ මන්දිරයට වැදී එක්සත් ජාතික පක්ෂය මෙහෙයවූ 'රනිල් වික්‍රමසිංහ' මෙයට වැරදිකරු බවයි.

කෙසේ වෙතත් මේ සිද්ධියේදී පැහැදිලිව පෙනී යන කරුණු දෙක තුනක් ගැනද මෙහිලා සඳහන් කරනු කැමැත්තෙමි. එකක් නම් පාර්ලිමේන්තුවට මන්ත්‍රීන් තෝරා යැවීමේදී පක්ෂ, පාට මෙන්ම ඔවුන්ගේ සමාජමය හා අධ්‍යාපනික පසුබිමද සැලකිල්ලට ගැනීම ජනතාවගේ වගකීමක් වන බවයි. එක්තරා සමාජ විද්‍යාඥයකු විසින්ද පැවසූ අන්දමට මන්ත්‍රීවරයකුට පාර්ලිමේන්තුව තුළ සිටිය හැකි කාල සීමාවක්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නිර්ණය කිරීමද වැදගත් වේ. දීර්ඝකාලීනව පාර්ලිමේන්තුව තුළ සිටීමේදී එහි අනවශ්‍ය අණසකක් පැතිරවීමට මානසිකව පෙළඹීම සාමාන්‍ය දෙයක් වන අතරම සමාජයට අලුතින් එක්වන පිරිස්වලට පාර්ලිමේන්තුව නියෝජනය කරන්නට අවස්ථාව නොලැබීමද එවැනි කාලසීමා නිර්ණයක් තුළින් වැළකෙන බව ඒ සමාජ විද්‍යාඥයා පෙන්වා දී ඇත.

මුල් කාලවලදී පාර්ලිමේන්තුවට පැමිණි පාර්ලිමේන්තු මන්ත්‍රීවරු බොහෝ දෙනෙක් පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ආදිය පිළිබඳව මනා හැදෑරීමකින් යුතු අය වුවද වර්තමානයේ බොහෝ මන්ත්‍රීවරු පාර්ලිමේන්තු ස්ථාවර නියෝග ආදිය පිළිබඳ දැනුමෙන් තොර වූවන් බව පෙනී යන හෙයින් අලුතින් පාර්ලිමේන්තුවට පිවිසෙන අයට ඒ පිළිබඳ මනා අධ්‍යයනයකට අවස්ථාව සලසා දිය යුතු බවද කියනු කැමැත්තෙමි.

පෙරදී කියූ පරිදි කවුරුන් වැරදිකරු යැයි කියතත් කවුරුන් නිවැරදිකරු යැයි කියතත් ජනතාව සියැසින් දුටු පරිදි නම් පාර්ලිමේන්තුවේදී කවුරුත් හැසිරුණු හැටි වැරදි යැයි නිගමනය කිරීමට සිදුවන්නේය. මනමේ නාටකයේ වැදි රජුත් මනමේ කුමරුත් අතර සිදුවුණු සටනේදී මනමේ කුමරු මිය ගියේය. අපට කියන්නට ඇත්තේත් එහිදී පොතේ ගුරු විසින් කී 'නොදනිමි කාගෙ දොසා' යන්නය. ඒ සමගම 'රට වනසා ඇත' යන්නද කිව යුතුමය.

# නත්තල් කැරොල්...

9 වන පිටුවෙන්

විශේෂයකි. කන්තාරු යනු සිංහල වචනයකි. කන්තාරු (CANTAR) ගීතිකාවලින් සමහරක් දේව මෙහෙය පැවැත්වෙන විට ස්වාමිවරුන් විසින්ද තවත් සමහරක් බැතිමතුන් විසින්ද ගායනා කරති. මේවාද බොහෝ සෙයින් ජනප්‍රිය ගීත වේ. ගැයෙන තාල සහ රිද්ම හිතට දැනෙන ඒවාය.

සැබැවින්ම කන්තාරු ගීතිකාවට වඩාත් නිවරදිව ගැලපෙන වචනය වන්නේ හීම් (Hymn) යන වචනයයි.මේවා දේවස්ථානයට එක්රැස් වන බැතිමතුන් අල්තාරය ඉදිරිපිටදී ගායනා කරති.

කතෝලික විශ්වාසයට අනුව 'ගැයීම යනු දෙවරක් යැදීමකි' හෙවත් යාච්ඤාවේ අනිශංසය මෙන් දෙගුණයක් එය ගායනා කිරීමෙන් ලැබේ. මෙය කියවන ඔබ අන්‍යාගමිකයෙකු වුවත් ජීවිතයේ එක් වරක් හෝ කිතුනු ගීතිකාවක් අසා ඇතැයි සිතමි. ළඟ එන නත්තල් සමයේදී රූපවාහිනියෙන් හෝ ගුවන් විදුලියෙන් එක් කිතුනු ගීතිකාවක් හෝ ගීතයක් අසන්නට ලැබෙනු ඇත.

## සරල ගීත සහ ගීතිකා

ගීත හා ගීතිකා (hymn) දෙකක්ද එකක්ද යන පැනය මතුවන්නට ඇතැයි සිතමි. කෙටියෙන් පැවසුවොත් ගීතිකාවක් යනු එක්තරා ආකාරයක ගීතයකි. නමුත් එය සාමාන්‍ය ගීතයෙන් වෙනස් වන්නේ එය ආගමික කතෘවරයෙකු හෝ ආගමිකව ගෞරව ලබන වෙනත් කෙනෙකු ප්‍රශංසා කිරීම, එතුමන්ට භක්තිය දැක්වීම හා යාච්ඤා කිරීම යන අරමුණුවලින් භාවිත වන නිසාය. හුදෙක් ඉංග්‍රීසි බසින් ගීතිකාව hymn ලෙස හඳුන්වන්නේ ග්‍රීක බසින් 'ප්‍රශංසාවේ ගීතය' තේරුමැති hymns වචනය නිසාය.

ගීතිකාවල ආරම්භය ගැන හරියටම කිව නොහැකි වුවත් එය ඉතා ඈත අතීතයට දිව යන බව නම් නොරහසකි. කිතුනුවන්ගේ ආගමික ග්‍රන්ථය වන ශු. බයිබලයේ අඩංගුව පවතිනා ගීත රාශියකි. විශේෂයෙන් සඳහන් කළහොත් ශු. බයිබලයේ ගීතාවලිය නම් පොත තනිකරම ගීතිකා පොතකි. එහි අඩංගු වන්නේ එකල ජුදෙව්වෝ දෙවියන් වහන්සේට ගෞරවය පිණිස ගායනා කළ ගීතිකා වේ. මේ ගීතාවලියේ අඩංගු ගීතිකා ඇසුරෙන් ගීතිකා නිර්මාණය වීම වර්තමාන කිතුනු ගීත සාහිත්‍යයේ ආරම්භය ලෙස සැලකිය හැක. ගීතාවලියේ ගීතිකා වෙනත් ගීතවලටද මූලාශ්‍ර වූ බව සැලකිය හැක්කේ Boney M ගායක කණ්ඩායමේ By Rivers of Babylon වැනි ගීත නිසාය.

ඒ නිසා ගීතිකාවකින් මේ අරමුණම ඉටුවන නමුත් සවන් දීමේදී වෙනසක් දැනෙනා ගීත ගීතිකා නොවේදැයි ඔබ අසනු ඇත. උදාහරණයකට රූකාන්ත ගුණතිලක මහතාගේ ගවහලේ ගීතය ගීතිකාවක් නොවන්නේදැයි අසනු ඇත.

මුල් යුගයේ ලතින් බසින් බිහිවූ කිතුනු ගීතිකා රසවත් නොවූ නිසා දිව්‍ය පූජාව පැවැත්වෙන අවස්ථාවලදී ගැයුනු ඒ ස්තෝත්‍රයන්හි ලතින් බස වෙනුවට සිංහල වචන යොදා දේව ස්තෝත්‍ර ගායනා කර ඇත.

කෙසේ වුවත් ගීතිකා අනෙක් ගීවලින් වෙනස්වන ප්‍රධාන කරුණු අතර ස්වාමිවරුන් විසින් ගායනා කරන ගීත වීමත් සමහරක් බැතිමතුන් විසින් ගායනා කරන ගීත කොටසක් තිබීමත් ගීතයක මෙන් සංගීත භාණ්ඩ විශාල ප්‍රමාණයක් භාවිත නොකිරීමත් විශේෂිතය.

ඇතැම් ගීතිකා සඳහා අතීතයේ පටන් එය ගායනා කළ යුතු පිළිවෙළ ඒ ග්‍රන්ථවල පැහැදිලිව සඳහන් කර ඇත. ඒ අනුව එක සංගීත භාණ්ඩයක් පමණක් භාවිත කිරීම, නැත්නම් සංගීත භාණ්ඩ දෙකක් පමණක් භාවිත කළ යුතු බව සඳහන් වන අවස්ථා ඇත. ඇතැම්විට ඒ ගීතිකාව සදහා භාවිත කළ යුතු සංගීත භාණ්ඩය පවා නම් කර තිබීම ගීතිකාවල විශේෂ වැදගත් ලක්ෂණයකි. මේ සඳහා යොදාගත්තේ තත් සහිත සංගීත භාණ්ඩයක් එනම් ගිටාරය, වයලිනය වැනි සංගීත භාණ්ඩයකි. නූතනයේ නිතර භාවිත වන විදුලි ඕගනය, හෝ පියානෝවද නිරන්තරයෙන් ගීතිකා සදහා යොදා ගනී. ගීතිකා කණ්ඩායම (Choir) මේ සංගීත භාණ්ඩයක් සමග ගීතිකා ගායනා කරයි.

අතීතයේ සිට පැවත එන් මේ ගීතිකාවලට නැවුම් බවක් ගෙන දුන්නේ ගරු මර්සලින් ජයකොඩි පියතුමා විසිනි. මෙරට විසිරී පැතිරී තිබූ කිතුනු ගීත සාහිත්‍යය නව ප්‍රබෝධයකින් යුතුව සියලුම ලාංකිකයන්ට රස විඳිය හැකි පරිදි උන්වහන්සේගේ අතින් නිර්මාණය වීමට පටන්ගත්තේ 1930 න් පසුවය. එදා මෙදා තුර ගරු මර්සලින් ජයකොඩි පියතුමා විසින් ලියූ සීනු හඬින්, රෑ තරු බබලනවා, නෙලුම් පිපීලා ආදී ගීත ජනප්‍රිය ගීතිකාවන් සේ පිළිගනී.

මෙලෙස ගීතිකාවකින් දෙවියන්වහන්සේට, දෙවියන් වහන්සේගේ පුත්‍රයාට ප්‍රශංසා කිරීම, භක්තිය දැක්වීම හා යාච්ඤා කිරීම යන අරමුණුවලින් ගැයෙන් ගීතිකා සාමාන්‍යයෙන් දේවස්ථානවල දේව මෙහෙයයන් තුළදී ගැයෙයි. එහෙත් දිව්‍ය පූජාවේ එක් එක් කොටස්වලදී ගැයීමට වෙනස් වෙනස් තේමාවලින් යුත් ගීතිකා තිබේ.

ඊට අමතරව නත්තල් කාලය, චතාරික කාලය ආදී කතෝලිකයන්ට අදාළ විවිධ උත්සව තේමා කරගෙන ගීතිකා ගැයේ. නත්තල් කාලය තුළ ගැයෙන ගීතිකා තනුවෙන්ද පදමාලාවෙන්ද සතුටුදායක බවක් පෙන්නුම් කරද්දී චතාරික කාලයේදී තනුවෙන්ද පදමාලාවෙන්ද දුක්ඛදායක බවක් පෙන්නු කරයි.

# කැනඩා චාරිකා...

16 වන පිටුවෙන්

ප්‍රදේශ වසා තැබේ.

1900 පමණ කාලයේ ඇමෙරිකාවේ නිෂ්පාදනය කරන ලද ෆෝඩ් ලොරි, බස් වැනි රථවාහන සහ ඇතැම් සුඛෝපභෝගී මෝටර් කාර් ඉතා ප්‍රවේසමෙන් සංරක්ෂණය කෙරෙන ආකාරය විශ්මයජනකය. උද්‍යානය වටේ යාම සඳහා යොදාගෙන තිබෙන ඉපැරැණි ජලවාෂ්ප මගින් දිවෙන දුම්රියෙන් ඩොලරයක් ගෙවා බොහෝ සංචාරකයෝ එහා-මෙහා යති. ඇතුළු වීමේ ගාස්තුව ඩොලර් 10 ක් හෝ 12 ක් (2017) පමණ වේ. කුඩා ළමෝ මෙහි දවස ගතකිරීමට අතිශයින් ප්‍රිය කරති. මේ ස්ථානයට කැල්ගරි ට්‍රාන්සිට් නගර-දුම්රිය (C-Train) හා බස් රථ සේවාවක් යොදවා ඇති බැවින් ගමනාගමනය ඉතා පහසුය. කඩිනම්ය.

## යුදහමුදා කෞතුකාගාරය

බටහිර කැනඩාවේ මෙවන් ගනයේ විශාලතම කටුගෙය මේ යයි කියනු ලැබේ. මෙහි එකම වහලය යට නන් මාදිලියේ කෞතුකාගාර අටකට (8) නිවහන වෙයි. දිනක් හෝ දින දෙකක් තිස්සේ බැලීමට තරම් කෞතුක අගයයෙන් යුත් ස්වයංක්‍රීය යුද ටැංකි වැනි ආරක්ෂිත වාහන, යුද අහස් යාත්‍රා, රෙජිමේන්තු පිළිබඳ ඓතිහාසික භාණ්ඩ හා තොරතුරු ආදී දහසකුත් එකක් ඓතිහාසික බටහිර ලොව යුද තොරතුරු ඒකරාශි කරන ලද කේන්ද්‍රය මෙය යැයිද කියනු ලැබේ.

කැනඩාවේ නාවික, ගුවන් සහ පාබල හමුදාවන් පිළිබඳව මහජනතාව - විශේෂයෙන් රටේ තරුණ පරපුර දැනුම්වත් කිරීමට හා අභිමානයක් ඇතිකරවන ආකාරයට මෙම කෞතුකාගාර සංවිධානය කොට ඇත.

## කැල්ගරි සත්වෝද්‍යානය

නගරයේ 'බ්‍රිජ්ලන්ඩ්' නමැති ප්‍රදේශයේ සහ බෝ ගංගා නිම්නයේ ශාන්ත ජෝර්ජ් දිවයිනෙහි වැඩි කොටසක් පවතින පරිද්දෙන් විද්‍යමාන සත්වෝද්‍යානය නගරසභා ගොඩනැගිල්ලේ සිට ඉතා පහසුවෙන් ළඟාවිය හැකි පෙරදිග ගම්මානය (East Village) යයි කියනු ලබන ගඟබඩ පෙදෙසේ පිහිටා තිබේ.

වසර 1929 තරම් ඈතදී 'කැල්ගරි සූලොජිකල් සංගමය' (Calgary Zoological Society) විසින් ලාභාපේක්ෂිත නොවන තවත් සංවිධාන දෙකක් සමග මෙය ස්ථාපනය කරන ලද බව කියති. සත්වයින් 800 ක් පමණ ජීවත් වන මෙහි ගොඩනැගිලි ඉදිකොට ඇති භූමි ප්‍රමාණය අක්කර 120 ක් පමණ වේ. නත්තල් දිනය (දෙසැම්බර 25) හැරුණ විට අවුරුද්ද මුළුල්ලේම උදේ 9 සිට සවස 5 දක්වා විවෘතය. වැඩිහිටියෙකුට ඩොලර් 23ක්, ජ්‍යෙෂ්ඨ අයෙකුට ඩොලර් 21 ක් සහ ළමයෙකුට ඩොලර් 15 ක් ගාස්තු වශයෙන් අය කෙරේ.

## ග්ලෙන්බෝ කලාකෙත - Glenbow Museum

ඇත්තවශයෙන්ම මෙහි නාමපුවරුව 'ග්ලෙන්බෝ මියුසියම්' (කෞතුකාගාරය) යනුවෙන් යොදා තිබුණද, කලා ඇසෙකින් බලන්නෙකුට එය කටුගෙයකට වඩා කලා සහ සංස්කෘතික කේන්ද්‍රයක් බව දැනේ නම් එය නිවැරදි විය යුතු යැයි සිතමි. මෙම ස්ථානය නගර මධ්‍යයේ පිහිටා ඇති බැවින් පහසුවෙන් පිවිසිය හැක. ඉතා මෑතකදී සංවිධානය කරන ලද මෙම කලා සහ සංස්කෘතික කේන්ද්‍රය 19 වන සියවසෙන් මෙපිට ඓතිහාසික, නවීනතම මෙන්ම වර්තමාන උතුරු ඇමෙරිකානු කලා නිර්මාණවලින් සමන්විතය. භූමි තල දර්ශන, විවිධ චිත්‍ර, ආදිවාසින් සහ ඉනුවිට්වරුන් විසින් කරන ලද සායම් කිරීම්, ඇමෙරිකානු චිත්‍ර, වන සතුන් සහ ලෝකයේ වෙනත් විවිධ රටවල නිමැයුම් සහිත කලා නිර්මාණ 33,000 ක් පමණ ප්‍රදර්ශනය වේයැයි කියති.

'ග්ලෙන්බෝ' සංස්කෘතික ඉතිහාසය ලෙස ලෝකයේ බොහෝ තැන්වල නිමාව දුටු 100,000 කට අධික ප්‍රදර්ශණ භාණ්ඩද මෙහි රැස් කොට තිබේ. විවිධ ජීවන රටා, පාලන තන්ත්‍ර, ජන ජීවිත, ඇඳුම්පැළඳුම්, දේවරූප, මැටිබඳුන් ඈ දහසක් දේ මෙහි දී දැකබලා, අධ්‍යයනය කළ හැකිය.

සඳුදා දින වසා තබන මෙම ආයතනය අඟහරුවාදා සිට සෙනසුරාදා, උදේ 9 සිට සවස 5 දක්වාද, ඉරිදා දිනවල දහවල් 12 සිට සවස 5 දක්වාද විවෘතය. අතුළු වීමේ ගාස්තුව වැඩිහිටියෙකුට (2017) ඩොලර් 16 කි. ජ්‍යෙෂ්ඨයෙකුට සහ හැඳුනුම්පත සහිත ශිෂ්‍යයෙකුටද එක හා සමාන ගාස්තුවක් වූ ඩොලර් 11 කි. අවුරුදු 7 - 17 දක්වා ළමයෙකුට ඩොලර් 10 ක් වන අතර, 6 න් පහළ ළමයින්ට ගාස්තුවක් අය නොකෙරේ.

සංචාරක ප්‍රජාව කැල්ගරි නගරයේ වීදි සංචාරයේ යෙදෙන බොහෝ අවස්ථාවල නිතැතින්ම මෙහි ඇතුළු වෙති.

**(මතු සම්බන්ධයි)**


KNOW YOUR RIGHTS
TB
TISSA BOYAGODA, LLM
TISSA BOYAGODA, LLM
Barrister, Solicitor & Notary Public
Former Staff Lawyer in Criminal and Family Law
with Manitoba Legal Aid, Former Judge, Sri lanka
Areas of Practice
| Criminal Law
| Family Law
| Real Estate
| Immigration Matters
| Civil Litigation
| Small Claim Court Matters
| Power of Attorneys
| Last Wills
| Notarizations
GET ALL YOUR LEGAL QUESTIONS ANSWERED
1965 Britannia Road West, Suite 208
Mississauga, ON, L5M 4Y4
100 Consilium Place, Suite 200
Scarborough, ON, M1H 3E3
TEL: 416.627.6090
FAX: 289.997.3426
EMAIL: tboyagoda@gmail.com
www.tissaboyagodalaw.com


MONEY PROBLEMS?™
ඔබගේ සියලුම ණය එක් කුඩා මාසික වාරිකයකින් ගෙවන්න
ඔබගෙන්ම විමසන්න....
■ ඔබගේ බැංකු අයිරාව (overdraft) සෑම විටම භාවිත කරන්නේද?
■ ඔබ රැකියාවේ නිරතව සිටින විටත් නිවසේ පසුවන විටත් නිරතුරුව ණය හිමියන්ගේ තර්ජන හිරිහැරවලට ලක්වන්නේද?
■ ඔබ නිවාස කුලිය, නිවාස උගස් වාරිකය හෝ වාහන සඳහා වන ගෙවීම් වෙනුවෙන් බලවත් පරිශ්‍රමයක් දරන්නේද?
■ ඔබගේ විවාහය සම්බන්ධයෙන් හෝ සෞඛ්‍ය ගැටලු නිසා මූල්‍යමය ගැටලුවලට මුහුණ පා සිටීද?
■ ඔබගේ ණය තක්සේරුව (credit rating) සෑම විටම අන්තරාකාරී මට්ටමක තිබේ යැයි ඔබ සිතනවාද?
■ ඔබගේ වාහනය, නිවස, RRSP, ව්‍යාපාර කොටස් හා වෙනත් වත්කම් කොයි මොහොතක හෝ අහිමි වේ යැයි බියෙන් පසුවෙත්ද?
■ ඔබට විරුද්ධව උසාවි නියෝග පනවා ඇත්ද?
■ ඔබ කැනඩා රජය හා සම්බන්ධිත ආදායම් බදු ගැටලුවලින් පීඩාවට පත්වී සිටීද?
gta credit™
ඉහත ප්‍රශ්නවලින් එකකට හෝ පිළිතුර 'ඔව්' යන්න නම් ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට වහාම අප හමුවන්න
Scarborough / Downtown Toronto: 416-489-2000
Mississauga / Brampton: 416-650-5400
Scarborough
201-4433 Sheppard Ave. E
Scarborough, ON, M1S 1V3
Toronto/Downtown
800-120 Eglinton Ave. E
Toronto, ON, M4P 1E2
North York
306-1280 Finch Ave. W
North York, ON, M3J 3K6
Mississauga
110-93 Dundas Street E.
Mississauga, ON, L5A 1W7
Brampton
201-7990 Kennedy Rd. South,
Brampton, Ontario, L6W 0B3
Mark Shamly
Sinhalese Consultant
Proudly Served over 15,000 Clients since 2004
Visit : GtaCredit.Com
Ajay Oberoi
Government Certified Counsellor



# ගුවන් තලය ජයගත් මිනිසා

■ කේ. ඩබ්ලිව්. ඒ. ජයවර්ධන

මිනිසා ගුවන්තලය ජයගෙන වසර 115 ක් සපුරන මේ අවස්ථාවේ එදා මෙදා තුර පැමිණි ගමන දෙස ආපසු හැරී බැලීම ඉතාමත් වැදගත්ය. පක්ෂීන් ගුවනේ සැරිසැරීම නිරීක්ෂණය කළ මිනිසා අනාදිමත් කාලයක සිටම ඔවුන් අනුකරණය කිරීමට බලවත් ආශාවක් දක්වා ඇත. ඒ පිළිබඳ ජනප්‍රවාද අපට හමුවේ. අපේ පැරණි ජනප්‍රවාදයක රාවණා රජතුමා හිමාල අඩවියේ පැවැත්වුණ වෛද්‍ය සම්මන්ත්‍රණයකට සහභාගි වීම සඳහා දඬුමොණර යන්ත්‍රයෙන් එහි ගිය බව සඳහන් වෙයි.

පුනරුද සමයේ චිත්‍ර ශිල්පියකු, ඉංජිනේරුවකු මෙන්ම විද්‍යාඥයකුද වූ ලෙනාඩෝ ඩාවින්සි පක්ෂීන් පියාසර කරන ආකාරය නිරීක්ෂණය කොට පියාපත් සවිකර ගත් මිනිසුන් අහසේ පාවන රූප ගණනාවක් සටහන් කොට තිබේ. එම මිනිසුන් පියාහැඹීම සඳහා බලය ලබාගෙන තිබූයේ සවිකරගත් පියාපත් මගිනි. වාතයට වඩා බර යානා මගින් ගුවනේ සැරිසැරීම පිළිබඳව විද්‍යානුකූලව ලොවට පළමුවෙන්ම හෙළිකල තැනැත්තා ලෙස මොහු ඉතිහාසගත වී ඇත.

## පියාපත් ලද මිනිසුන්

1781 දී ජර්මනියේ ගීසන්හි කාල් ෆ්‍රීඩ්රිච් මර්වීන් නමැත්තා පළමුවරට දෙපසින් බැඳගත් පියාපත් මගින් අහසේ පාවී ආවේය. මෙය ගුවන්ගත වීම සඳහා යොදාගත හැකි යැයි සිතූ පළමු ක්‍රමයයි. දෙවැන්නද සොබාදහමේ සිදුවීම් අවලෝකනය කොට වටහා ගත්තකි. රැල්ල මුහුදු වෙරළට ගසාගෙන එන විට දිය බුබුළු ඉහළට නගී. ඒවා තුළ ඇත්තේ වාතය පමණක් බැවිණි. බර අඩු වායුවක් තුනී පටලයකින් තැනූ යමක් තුළට යැවුවහොත් එය ඉහළ නගී. 1650 පමණ වන විටදීම ප්‍රැන්සිස්කෝ ද ලානා නමැත්තා වායුව පිරවූ ගෝලයක් උඩට නැංවිය හැකි විය යුතු යැයි පවසා තිබුණි. මෙසේ වායු බැලුනය බිහිවූයේය. 1783 දී බටහිර ප්‍රංශයේ ඇනොනිහි ජෝසප් සහ ඊටියන් මොන්ට් ගොල්ෆියර් යන කඩදාසි කර්මාන්තයේ නියුතු සොහොයුරන් දෙදෙනා විෂ්කම්භය අඩි 30 හා රාත්තල් 300 ක් බර බැලුනයකට උණුසුම් වායුව පුරවා අහසට නංවන ලදී. බැලුනය අඩි 6000 ක් තරම් උඩට නැග සැතපුමක දුරින් බිම පතිත විය. එහි වැසියන් මෙය භූතයෙකු යයි සිතා විනාශ කර දමන ලදී.

එම වසරේ සැප්තැම්බර් 19 වැනිදා ඔවුන් විසින් කුකුලෙකු, තාරාවෙකු, සහ බැටළුවෙකු බැලුනයක් මගින් ගුවනට යවන ලදී. නොවැම්බර් 21 වැනිදා ප්‍රංශ ජාතික ජීන් ප්‍රැන්කොයිස් පිලට්‍රේද රෝසියර් සහ ප්‍රැන්කොයිස් ලවුරන්ට් මාකුවිස් ඩි ආර්ලන්ඩෙස් ප්‍රථම වරට බැලුනයක් මගින් ගුවන්ගත වූහ. ඔවුහු ලද සාර්ථකත්වය මිනිසා කාලාන්තරයක් තිස්සේ දුටු සිහිනය සැබෑ වීමක් විය. තවදුරටත් පරීක්ෂණ පවත්වාගෙන යෑමේ ප්‍රතිඵලයක් වශයෙන් උණුසුම් වායුව වෙනුවට හයිඩ්‍රජන්, ආලෝක කිරීම සඳහා යොදාගන්නා ගෑස්ද ඉන්පසු මෝටරයක්, පසුව වාෂ්ප ඇන්ජිමක්ද, පසුව විදුලි මෝටරයක් දක්වා වැඩි දියුණු කරන ලද බලයක් යොදාගැනීමට මඟ පෑදුණි. 19 වැනි සියවස තුළ බැලුනය වැදගත් යානයක් බවට පත්විය.

බැලුනය අහසේ ගමන් කළද වාතයට අවනත විය යුතුය. එය ගමන් කරන්නේ වාතයට අවශ්‍ය දිසාවටයි. වාතයට වඩා බරින් වැඩි, පාලනය කළ හැකි යානයක් ගැන මිනිසා මින්පසු සිතන්නට විය. ලී සහ රෙදි වර්ගයකින් තනා ගත් ග්ලයිඩරයක නැගී උස් ස්ථානයක සිට පහතට පැන වාතයේ ගමන් කිරීම ඊළඟ පියවරයි. ඇතැම් ඒවායේ නියමු කුටි තිබිණ. ඇතැම් විට නියමුවා යානයේ එල්ලී සිටී. පළමුවන ලෝක මහා යුද්ධයෙන් පසු තැනූ ඒවායේ ඔසොවනය, සුක්කානම, වායු බාධක වැනි අංගෝපාංගද සවි කරන ලදී. චීන සුළං පෙත්ත ගැන විමසිලිමත් වූ ඉංග්‍රීසි ජාතික කේලේ වඩාත් දියුණු ග්ලයිඩරයක් නිපදවන ලදී. වාතයට වඩා බර වුවද වාතයේ ප්‍රතිරෝධය ඉක්මවා බලයක් යෙදවිය හැකි නම් එය ගුවනේ ගමන් කරවිය හැකි බව ඔහු පිළිගත්තේය. අද ගුවන් යානා සඳහා යොදා ඇත්තේ වැඩි දියුණු කළ ඔහු හඳුන්වා දුන් අංගයන්ම වේ.

## ගුවන් යානා සිහිනයට ළං වූවෝ

ජෝන් ස්ට්‍රිංපෙලෝ සහ විලියම් හෙන්සන් නමැති ලේස් කර්මාන්තයේ නියුතු ඉංජිනේරුවන් දෙදෙනකු ගුවන්යානයක් නිපදවීම ගැන සිහින මවමින් සිටියහ. ඔවුහු පක්ෂීන් සිය ගණනක් මරා ඔවුන්ගේ සිරුරු සහ පියාපත් පරිමාණ මැන බලමින් පරීක්ෂණ පවත්වන්නට වූහ. මින් හෙළිකරගත් දත්ත මත යානයක් තනා කිහිප වරක් අත්හදා බැලුවත් සාර්ථක වූයේ නැත. මින් අධෛර්යට පත් හෙන්සන් ඉන් ඉවත්ව ගියේය. එහෙත් ස්ට්‍රිංපෙලෝ හොර රහසේ තවදුරටත් පරීක්ෂණ පැවැත්වීය. ඔහු යානයක් නිපදවා ගොඩනැගිල්ලක් තුළම අත්හදා බැලීය. එය අහසට නැග ගොඩනැගිල්ලේ කෙළෙවර බිත්තිය දක්වා ගොස් නැවතින. මීටර් තුනක් දිග රාත්තල් 4 ක් බර වූ මෙම යානය ස්වශක්තියෙන් ගුවන්ගත වූ ලොව ප්‍රථම යානය ලෙස සැලකේ. මේ වනවිට දියුණු තත්ත්වයක ඉන්ධන ඇන්ජිමක් තිබුණේ නම් අද රයිට් සොහොයුරන්ට හිමිව ඇති තැන ස්ට්‍රිංපෙලෝ සහ හෙන්සන්ට හිමිවන බව බොහෝ දෙනකුගේ මතයයි.

1860 දී ඔටෝ ලිලියන්තල් නම් දරුවකු තම සොහොයුරාද සහභාගි කරවාගෙන ග්ලයිඩර් තැනීමට උත්සාහ ගත්තේය. එහෙත් එය සාර්ථක වූයේ නැත. ඔහු ඉංජිනේරුවෙකු වූ පසු පක්ෂීන් ඉගිලෙන ආකාරය ගැන පරීක්ෂණ පවත්වා සොයාගත් කරුණු ප්‍රකාශයට පත් කළේය. යාන්ත්‍රික ගුවන් ගමන් පිළිබඳ කරුණු අඩංගු පැරණීතම කෘතිය මෙය බව පිළිගැනීමයි.

ඔහු සොයාගත් දෙයින් වැදගත්ම කරුණ වූයේ යානාවක තටුවේ හැඩය සකස් විය යුතු ආකාරය හඳුනා ගැනීමයි. ඔහු ග්ලයිඩර් යානා තනා කඳු මුදුන් මතින් පනිමින් පරීක්ෂණ පැවැත්වීය. පසුව බර්ලිනයේ කෘත්‍රිම කන්දක් තනා ඒ මතින් පනිමින් තවදුරටත් පරීක්ෂණ පවත්වන්නට විය. 1896 දී වඩාත් දියුණු ග්ලයිඩරයක් තනා පරීක්ෂණ පවත්වද්දී ගුවනේදීම තම ස්ථානය වෙනස් කිරීමට උත්සාහ කිරීමේදී ලිස්සා වැටී මිය ගියේය.

## පළමු ගුවන් යානය ගුවන් ගත වේ

ඔහායෝහි හෝතෝන් වීදියේ ඩේටන් නිවසේ පදිංචිව සිටි විල්බර් සහ ඕවිල් දෙසොහොයුරන් කුඩා අවදියේ සිටම ගුවන් යානා ගැන දැඩි උනන්දුවක් දැක්වීය. කාර්මික දැනුම පිළිබඳ උපන් හපන්කමක් දැක්වූ මොවුන්ගේ පාසල් අධ්‍යාපනය සාර්ථක වූයේ නැත. ඕවිල් තම මිතුරන්ද සමඟ සරුංගල් තනා විකුණා සෑහෙන මුදලක් උපයා ගත්තේය. විල්බර් කඩදාසි නැවීම සඳහා යන්ත්‍රයක් නිපදවන ලදී. පල්ලිය විසින් ප්‍රකාශයට පත්කරන ලද සඟරාවක පිටු නමා දී මුදල් උපයාගත් බවද පැවසේ. දිනක් ඔවුන්ගේ පියා චීනයේ නිපදවන ලද රබර් පටියක් ඇද කරකවන රූං පෙත්තක් සහිත ක්‍රීඩා භාණ්ඩයක් ගෙනැවිත් දුන්නේය. එය කැඩී යනතෙක්ම ක්‍රියාකරවූ සොහොයුරන් දෙදෙනා එවැනි භාණ්ඩයක් නිපදවා අලෙවි කරන්නට විය. ඉන්පසු මුද්‍රණ ව්‍යාපාරයක් ආරම්භ කොට පසුව බයිසිකල් අලුත්වැඩියා කිරීම ඇරඹීය. ඒ ගැන වැඩි අවධානයක් යොමුකළ මොවුන් පසුව බයිසිකල් නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන ගියහ.

මේ අතර පියාසර කිරීම පිළිබඳව නොයෙකුත් පරීක්ෂණද පවත්වන්නට වූහ. ලිලියන්තල් වැනියවුන් ඉහතදී කරන ලද පරීක්ෂණවල ප්‍රතිඵලද හදාරා වැඩි දියුණු කළ යානයක් නිපදවීම සඳහා වෙර දැරීය. සැබෑ ගුවන් යානයක් ඒ මේ අත පැද්දීමට, ගුවනට නැංවීමට, බැස්සවීමට, හැරවීමට සහ පාලනය කිරීමට හැකි අයුරින් සකස් විය යුතු බව ඔවුහු වටහා ගත්හ. උතුරු කැරොලිනාවේ කිට් හෝක් පෙදෙසේ වැලි කඳු මත නැගී ඔවුන් සාදාගත් ග්ලයිඩර් යානාවලින් පහතට පියාඹමින් නොයෙකුත් පරීක්ෂණ පවත්වන ලදී. තටුවේ කුටිය, බලය අවරපෙත්ත ඔවුනට තවමත් විසඳා ගත නොහැකිව තිබූ ගැටලු විය. ඔවුන් වැඩි දියුණු කරන ලද යානයක් නිපදවන ලද මුත් ක්‍රියාත්මක කරවීම සඳහා ඇන්ජිමක් නොමැති වූයෙන් එවැන්නක් නිපදවා දෙන ලෙස කම්හල් කීපයකින්ම ඉල්ලා සිටි නමුත් ඉටුකර ගත නොහැකි විය. ඉන් පසුබට නොවූ මොවුන් රාත්තල් 170 ක් බර අශ්වබල 12 ක යන්ත්‍රයක් තමන් විසින්ම නිපදවා ගන්නා ලදී. මීළඟට අවශ්‍ය වූයේ එය අත්හදා බැලීමයි.

1903 දෙසැම්බර් මස 17 වැනිදාට උදා විය. සිසිල් සුළං උතුරු දෙසින් හමාවිත් සිහින් වැලි දසත විසුරුවමින් තිබිණ. යානයත්, එයට ආවරණය සැපයූ මඩුවත් සුළඟින් ලෙළෙන්නට විය. ඔවුහු යානයේ සියලු කොටස් නැවතත් හොඳින් පරීක්ෂා කර බැලූහ. සැතපුමක් පමණ දුරින් පිහිටුවා තිබූ ජීවිත ආරක්ෂක කඳවුරට ඇසෙන සේ සංඥාවක් නිකුත් කළේය. ඒ සෑම විටම එහි පැමිණ සහයෝගය දුන් නිසා මේ අවස්ථාවේ ඔවුන් අමතක කළ නොහැකි බැවිනි. සියල්ල සූදානම් කළ පසු සොහොයුරන් දෙදෙනා යානයේ ඇන්ජිම පණ ගැන්වීය.

"ඕවිල් ඔබ යන්න. මේ ඔබේ වාරයයි. මගේ වාරය අවසන් වූවානේ" යි තම සොහොයුරාගෙන් ලැබූ අණ පරිදි ඕවිල් රයිට් යානයේ පහළ තටුව මැද මුනින් දිගා වූයේය. හොඳහැටි හරි බරි ගැසී යානය සම්බන්ධකොට තිබූ වයරය විසන්ධි කළේය. යානය ඉදිරියට ඇදී යයි. සොයුරු විල්බර් පසුපසින් දුව එයි. වේගය වැඩිවේ. සොයුරා දක්නට නොමැත. යානය ගුවන් ගත වී ඇත. එය තත්පර 12 ක කාලයක් තුළ අඩි 120 ක් ගමන් කළේය. 'මිනිසා ගුවන ජයගත්තේය'. ෆ්ලයර් අංක 2 1904 දීත්, අංක 3 1905 දීත් ගුවන්ගත කරන ලදී. තුන්වැනි යානය වඩාත් දියුණු කළ එකකි. එය කෙලින්ම අහසට නැංවිය හැකිය. ඇලයට හැරෙමින්, කැරකෙමින් ගමන් කළ හැකි අතර අටේ ඉලක්කම හැඩයටද ගමන් කරවිය හැකිය. විනාඩි 30 ක කාලයක් දිගටම ගුවනේ ගමන් කිරීමට සමත්ය.









## භාණ්ඩ ප්‍රවාහනය, යුද්ධයට යොදාගැනීම සහ මගී ප්‍රවාහනය

මෙම ජයග්‍රහණයෙන් පසු රටවල් කිහිපයක්ම ගුවන් තරණය සඳහා දැඩි උනන්දුවක් දක්වන්නට විය. 1909 දී බ්ලේරියට් ඉංග්‍රීසි ඕඩය තරණය කළේය. ඔහායෝ සාප්පු සංකීර්ණයක් රයිට් සහෝදරයන්ගේ යානයක් කුලියට ගෙන ලොව ප්‍රථම සීඝ්‍රගාමී ගුවන් තැපැල් සේවය ආරම්භ කළේය. ප්‍රථම වරට යවන ලද්දේ පට රෙදි රෝලකි. ගුවන්යානය නිපදවීමෙන් පසු ලෝකයේ කුඩා වන්නට විය. මෙය යුද්ධය සඳහා යොදා ගතහැකි බව පෙනී ගියෙන් එම අංශයෙන් වැඩි දියුණු කොට ගල්ෆ් යුද්ධයේදී ඇමෙරිකාව භාවිතා කළ 'ස්ටෙල්ත්' යානය දක්වා දියුණු විය.

40 වන පිටුව බලන්න


ALPC
AHANGAMA LAW
PROFESSIONAL CORPORATION
Real Estate Law
Immigration Law
Corporate Law
Wills,
Power of Attorney and Estates
Family Law
Simple Divorce/ Separation and Marriage Agreements
100 Cowdray Court, Unit 328
Toronto, ON
M1S 5C8
Tel: 647-977-2263
Cell: 647-215-7642
Fax: 647-977-2264
E-mail: info@ahangamalaw.com
Anoshan Ahangama
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC


LAL LAW OFFICE
Real Estate
Mortgages
Immigration Law
Family Law
Tax Law
Lal Handapangoda
Barrister & Solicitor
90 Kennedy Road South. Unit #7
Brampton, Ontario, L6W 3E7
Tel. 905.457.1025 | Fax 905.457.1045 | Cell 416.838.3966
Email: lallawfirm@gmail.com


CanLanka Bussiness Association presents.....
CanLanka Night 2019
FEBRUARY 16th
SATURDAY 2019
7.00 pm onwards
at Grand Cinnamon Banquet & Convention Centre
For Tickets : Please call
Anura - 416 720 2386
Gamini - 416 822 2789
Ashok - 416 605 8300
Thilak - 647 994 6477
Dimuthu - 705 970 0753
Harold - 647 378 9242
Siri & Sriyani - 416 571 4270
Suranjan - 416 536 4488
Sam - 647 833 5783
Herman - 416 906 2341
Aloka - 647 986 2393
Ticket
$45
Full course meal
Live music & Dance
Cash bar
Raffle draw
Photo booth
Dress code – Smart casual
All proceeds go to charity
CanLanka
BUSINESS ASSOCIATION
3895 McNicoll Ave, Scarborough, ON M1X 0C1

# ANOMA PERERA

Barrister, Solicitor & Notary Public
(Attorney-at-Law, Sri Lanka)



- REAL ESTATE - Residential & Commercial
- WILLS & POWERS OF ATTORNEY

EVENING & WEEK END CONSULTATIONS
AVAILABLE BY APPOINTMENT

## ANOMA PERERA LAW OFFICE

2985 Drew Road , Suite 216, Mississauga, Ontario. L4T 0A4
Telephone: (905) 673-5665 Fax: (905) 673-1682
e-mail : anomaperera01@gmail.com

# IMPERIAL MORTGAGES INC.



**Residential Mortgages, Commercial Mortgage,
Refinancing, Second Mortgage,
First Time Home Buyers**

Refinancing: consolidate your debts to improve cash flow turn your home equity into cash when you need it most (home repairs and renovations, education financing); earn a return on your home equity through investments

Self-employed Non-income verifiers Credit issues New immigrants

## Abby Sri Haran

Senior Mortgage Specialist

Tel: 416 818 1633 Fax: 905 888 6201
Email: abby.residentialmortgages@gmail.com
Licence # 10782

# CanLanka
## BUSINESS ASSOCIATION
A NON- PROFIT ORGANIZATION ESTABLISHED IN 2011

## PROFESSIONAL SERVICES OFFERED BY MEMBERS



REAL ESTATE
**GAMINI ABEYSINGHE**
www.gaminiabeysinghe.com
**416.822.2789**



FINANCIAL SERVICES & INSURANCE
**ANURA RANAWEERA**
**647.872.6356**
**647.361.7509**EXT**100**



ACCOUNTING & TAX SERVICE
**SIRI & SRIYANI GAMAGE**
GS ACCOUNTING CO
www.gsaccounting.ca
**416.571.4270**



MONEY TRANSFER
**SURANJAN MAHADURAGE**
THISAL FINANCIAL SERVICES
**416.546.4488**



HEATING & AIR CONDITIONING
**ASHOK HETTIGE**
AIR CARE PLUS LTD.
**416.605.8300**



MORTGAGE
**SAM PREMARATNE**
**647.833.5783**



PASTRY CHEF
**DIMUTHU PERERA**
ANDRO CAKES
SWEETS FOR ANY REASON & SEASON'S
**416.857.4566**



CONSTRUCTION & RENOVATION
**THILAK WEERAKOON**
TOWERIIN SERVICES
**647.994.6377**



ELECTRICAL CONTRACTOR
**DON HERMAN**
MASTER ELECTRICIAN
309A NDT ELECTRICAL INC
**416.906.2341**



WORLDWIDE OCEAN & AIR SHIPPING
**ALOKA SAM WIJESINGHE**
CEYCAN TRANSHIPPING INC
**647.986.2393**



VEHICLE REPAIRS & SERVICES
**HAROLD FERNANDO**
TECH LAN CA AUTO INC
**647.378.9242**

**1274 WARDEN AVENUE, TORONTO ON MIR2R6, CANADA**
*Phone: 647.361.7509* *Fax: 289.813.5529* *Website: www.canlankabusiness.com*
*Toll free: 1.800.611.2882* *Email: info@canlankabusiness.com*

*DISCLAIMER – CAN LANKA BUSINESS ASSOCIATION WAIVES ITSELF FROM BEING LIABLE FOR ANY PROFESSIONAL SERVICES PROVIDED BY INDIVIDUAL MEMBERS*

RESERVE FEBRUARY 16th 2019 FOR
CanLanka Night Dinner Dance @ GRAND CINNAMON BANQUET HALL

දසත Dasatha



# පෝෂණ ගුණයත් ඖෂධීය ගුණයත් පිරුණු කෑම මේසයේ හැඩකාරයා

■ **කීර්ති එස්. කුමාර**

කුඩා දරුවන් මෙන්ම තරුණ, වැඩිහිටි, මහලු මේ සියලු දෙනා ඉහළ රුචියක් දක්වන එළවළුවක් වන කැරට් සඳහා වෙළඳපොළ තුළ ඉහළ ඉල්ලුමක් පවතී. වයස් භේදයකින් තොරව ඕනෑම කෙනෙකුට සුදුසු ආහාරයක් වන කැරට් විවිධාකාර ලෙස ආහාරයට ගත හැකිය. ව්‍යංජන හෝ සුප් ලෙසත්, ළමා ආහාරයක්, සලාදයක් ලෙසත් පමණක් නොව වර්තමානයේ කැරට් කේක්, කැරට් පුඩිං ආදී ආහාරද සකස් කරයි.

'ඩැයුකස් කැරෝටා' යනුවෙන් උද්භිද විද්‍යාත්මකව හඳුන්වන කැරට් විටමින් A බහුල එළවළුවකි. අතීත රෝමානුවන්ගේ කෑම මේසයේ මහේශාක්‍ය ලීලාවෙන් වැජඹුණු කැරට් යොදා පිළියෙළ කරගත හැකි විවිධ ව්‍යංජන ගැන 16 හා 17 වන ශතවර්ෂවල ලියැවුණු ප්‍රංශ හා ජර්මන් 'සූපශාස්ත්‍ර' පොත්පත්වල සඳහන්ව ඇත. කැරට් අලය මෙන්ම කැරට් මුල් තම්බා සාදාගත් පාන වර්ග ගැනද එහි සඳහන්ව ඇත.

ශරීර අභ්‍යන්තරයේදී විටමින් A සංයෝගය බවට පත්විය හැකි 'කැරොටින්' විශාල ප්‍රමාණයක් කැරට්වල අඩංගුය. කැරට් ග්‍රෑම් 100 ක කැරොටින් ඒකක 1890 ක් පමණ අඩංගු වේ. එළවළුවක අඩංගු කැරොටින් ප්‍රමාණය අතින් කැරට් දෙවෙනි වන්නේ 'ලීක්ස්'වලට පමණි (ලීක්ස් ග්‍රෑම් 100 ක කැරොටින් ඒකක 2435 ක් අඩංගුය) එමෙන්ම සියලුම අල එළවළුවලට වඩා 'පොස්පරස්' අඩංගු වන්නේද කැරට්වලයි.

කැරට් ග්‍රෑම් 100 ක පොස්පරස් ඒකක 530 ක් අඩංගු වේ. ග්ලූකෝස් බහුලව අඩංගු කැරට් අලයෙහි සුක්‍රෝස්ද සෑහෙන පමණකින් අන්තර්ගතය. එමෙන්ම පොටෑසියම්, සෝඩියම්, කැල්සියම්, මැග්නීසියම්, තඹ, යකඩ, අයඩින් හා කොබෝල්ට් වැනි ශරීරයේ පටක හා අස්ථි වර්ධනයට සුවිශේෂී වශයෙන් දායක වන ඛනිජ වර්ග රාශියක්ම කැරට්වල අඩංගුය. මීට අමතරව ලෙසිතීන් තෙල් සහ මේදද සෙලියුලෝස් සෑහෙන ප්‍රමාණයන්ද කැරට්වල අඩංගුය. සිරුරේ පෝෂ්‍යදායි වර්ධනයට අත්‍යාවශ්‍ය විටමින් වර්ග වන විටමින් A, B, C, D හා E කැරට් අලය තුළ ඒකරාශී වී ඇත.

### කැරට් ග්‍රෑම් 100 ක අඩංගු පෝෂ්‍ය පදාර්ථ

- ශක්ති කිලෝ ජූල් 1 සීනි ග්‍රෑම් 5, මේදය ග්‍රෑම් 0.2
- තයමින් මි. ග්‍රෑ. 0.04, විටමින් ඒ 93%
- තයසින් මි.ග්‍රෑ. 1.2, විටමින් බී 9.5%
- විටමින් ඩී මිලි ග්‍රෑම් 5, තැල්සිම් මිලිග්‍රෑම් 33
- මැග්නීසියම් මිලිග්‍රෑම් 18, සෝඩියම් මිලිග්‍රෑම් 2.4
- කාබෝහයිඩ්‍රේට් ග්‍රෑම් 9, තන්තු ග්‍රෑම් 3, ප්‍රෝටීන් ග්‍රෑම් 1,
- බීටා කැරොටින් 77%, රව්බොප්ලේවින් මි. ග්‍රෑ 0.05,
- විටමින් බී 6 මි.ග්‍රෑ. 0.1, විටමින් ඩී මිලි ග්‍රෑම් 7, විටමින් ඊ මිලි ග්‍රෑම් 4, යකඩ මිලිග්‍රෑම් 0.66, පොස්පරස් මිලිග්‍රෑම් 35

ඇසේ පෙනීම සඳහා වැදගත්ම විටමිනය වන්නේ විටමින් A ය. 'රාත්‍රී අන්ධ භාවය' විටමින් ඒ ඌනතාවය නිසා පහසුවෙන් අපට වැළඳෙන රෝගී තත්ත්වයකි. විටමින් ඒ ඌණතාවය අඛණ්ඩව කලක් පැවතීමෙන් කෙනෙකු සදාකාලික අන්ධභාවයට පත්වීමට හා ඔහු හෝ ඇයගේ ඇස්කොන් පිපිරීමටද ඉඩ ඇති බව වෛද්‍ය මතයයි.

අවුරුදු පහට වඩා අඩු දරුවන්ට විටමින් ඒ ඌණතාවය ඇතිවුවහොත් ඒ සඳහා ඉතා සුදුසු වන්නේ කැරට් හොඳින් ආහාරයට එක් කර ගැනීමයි. එමඟින් විටමින් ඒ හා සම්බන්ධ රෝගී තත්ත්වයන් මගහරවා ගත හැකි බව වෛද්‍ය මතයයි. කැරට්වල අඩංගු කැරොටින් වඩාත් හොඳින් සිරුරට අවශෝෂණය කර ගැනීමට අවශ්‍ය නම් කැරට් තම්බා පොඩි කරගැනීමෙන් අනතුරුව ආහාරයට ගත යුතුය. කුඩා දරුවන් හා දුර්වල රෝගීන් සඳහා මෙය වඩා පහසුවෙන් ක්‍රියාවට නැංවිය හැකිය. කැරට් අලයේ පත්‍ර පිහිටි කොටසට සමීප වන්නට ඇස්කොබික් අම්ලය සහ විටමින් B කාණ්ඩයේ විටමින් වර්ග රාශියක් අඩංගු වේ.

සිරුරේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ ප්‍රභලතාව දියුණු කර ගැනීමට අවශ්‍ය නම් ඒ සඳහාද කැරට් ඉතා යෝග්‍ය වේ. දිනපතාම අලුත් කැරට් ආහාරයට එක්කර ගැනීමෙන් රක්ත හීනතාව බොහෝ දුරට මගහරවා ගත හැකිවේ.

## පිළිකා නාශකයකි

සමහර එළවළු හා පලතුරු වර්ගවල පිළිකා නාශක ගුණ ඇති බව වෛද්‍ය පර්යේෂකයන් දීර්ඝ කාලයක් මුළුල්ලේ කළ පර්යේෂණවලින් සනාථ වී ඇත. කැරට් හා රතු මුල් ඇති ගෝවා එවැනි පිළිකා නාශක එළවළු දෙකකි. ඒ අනුව පියයුරු, මුත්‍රාශය, ආහාර මාර්ග පද්ධතිය වැනි අවයවවල පිළිකා තත්ත්වයන් අවම කර ගැනීමට කැරට් ආහාරයට ගැනීම ඉතාම සුදුසුය.

'කැරට්' පිළිබඳ සිදුකර ඇති පර්යේෂණ බ්‍රිතාන්‍යයේ නෝර්වුඩ්හි ආහාර පර්යේෂණායතනයේ වෛද්‍ය විශේෂඥයන් වන ඩේවිඩ් හොග් සහ කොලින් වෑන් විසින් සිදුකරන ලද පර්යේෂණ අනුව ආහාර වේලට වැඩි වශයෙන් කැරට් එකතු කර ගැනීමෙන් පිළිකා මර්දනයට විශාල පිටුවහලක් ලැබෙන බව සනාථ වී ඇත. කැරට්වල අඩංගු කහ පැහැති වර්ණකයන් සමඟ අන්තර්ගත 'බීටා කැරොටින්' රසායනිකය නිසා සිරුරේ ප්‍රතිශක්තිකරණ පද්ධතියේ පවතින පිළිකා සෛල විනාශකර දැමීමට හේතුවන අනු විශේෂයක වර්ධනය වේගවත් වන බව එම පර්යේෂකයන් විසින් සොයාගන්නා ලදී.

## හෘද රෝගවලටද ඔසුවකි

කැරට්වල තිබෙන අධික තන්තු (කෙඳි සහිත බව) ස්වභාවය වෙනත් මේද අධික ආහාර මගින් සිරුරට ලැබෙන කොලෙස්ටරෝල් උරා ගැනීම අවම කරයි. රුධිරයේ කොලෙස්ටරෝල් අඩු කිරීමේ විශේෂ හැකියාවක් කැරට්වල තිබේ. මේ නිසාම හෘදරෝගවලින් වැළකීම සඳහාද කැරට් වැදගත් මෙහෙයක් ඉටු කරයි. මේ සඳහා උපකාරීවන්නේ කැරට්වල ඇති බීටා කැරොටීන්ය.

දියවැඩියා රෝගියෙක් නම් කැරට් අන් අයට වඩා තරමක් අඩුවෙන් ගත යුතුය. කැරට්වල ඇති කාබොහයිඩ්‍රේට් සුළු ප්‍රමාණය මෙවැනි රෝගීන්ට අහිතකර විය හැකිය. එහෙත් රෝහල්වලින් පවා දියවැඩියා රෝගීන්ට තැම්බූ කැරට් ලබාදෙන්නේ එහි ඇති ශක්ති වර්ධන හැකියාව නිසයි.

හෘදයාබාධයකට ප්‍රතිකාර ගැනීමෙන් පසු ඉදිරි කාලය තුළ සිරුරට අවශ්‍ය කැරොටින් ලබා ගැනීමේ හොඳම ආහාරයක් ලෙස වෛද්‍යවරු නිර්දේශ කරන්නේ කැරට්ය.

## සිරුරේ විෂ ඉවත් කරයි

කැරට්වල අඩංගු 'පෙක්ටීන්' මගින් ආහාර මාර්ග පද්ධතියේ විෂ සහිත ද්‍රව්‍ය එක්වන විට ඒවා සිරුවෙන් ඉවත් කරයි. ආහාර මාර්ග පද්ධතිය තුළ බාධාවකින් තොරව ආහාර හොඳින් ගමන් කිරීමටත්, ආහාර හොඳින් දිරවීම සිදුවීමටත් 'පෙක්ටින්' වැදගත් මෙහෙයක් කරයි. එමෙන්ම තුවාල සුවවීම සඳහා මෙන්ම රුධිර පාරවිලයනයේදී සිරුරේ රුධිර පරිමාව වැඩි කිරීමටත් පෙක්ටීන් අවශ්‍යම සාධකයකි.

## පීනසට හා කැස්සට ගුණයි

පීනස නිසා ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ අපහසුතාවය ඇතිවූ විට අමු කැරට් අල ආහාරයට ගැනීමෙන් ප්‍රත්‍යක්ෂ සහනයක් ලබාගත හැකිය. එමෙන්ම කැස්ස පවතින විටද කැරට් ආහාරයට ගැනීමෙන් ඉක්මන් සහනයක් ලබා ගත හැකිය.

අමු කැරට් අල ආහාරයට ගැනීමෙන් විදුරුමස් ශක්තිමත් වන අතර විදුරුමස් හොඳින් වර්ධනය වෙයි. කැරට් යුෂ මුඛයේ ඇතිවන ආසාදන සඳහා හොඳ ඔසුවකි. අමු කැරට් අල පොඩිකර තලපයක් ලෙස සකසා පිළිස්සුම් තුවාල මත අලේප කිරීමෙන් ඉක්මන් සුවයක් ලබාගත හැකිය.

## කැරට් බීජ

කැරට් අල මෙන්ම කැරට් බීජද විවිධ රෝග සඳහා සුවය ලබා දෙන ඖෂධයක් ලෙස භාවිතා වේ. රුධිර නාළවල හටගන්නා ආබාධ සඳහා ප්‍රතිකාර වශයෙන් කැරට් බීජවලින් නිෂ්පාදනය කරන ඖෂධ භාවිත කෙරේ. ඉතාමත් යහපත් වේදනා නාශක ගුණයක් එහි අඩංගුය. වකුගඩුවල හට ගන්නා ගල් දියකර හැරීම සඳහා භාවිත කරන ඖෂධ විශේෂයක් නිපදවීමටද කැරට් බීජ භාවිත කරයි.

## කැරට් ප්‍රභේද

ටොප්වෙයිට්, කෝප් මාර්කට්, ගිම්කැරෝඩා හා ෆ්ලැති යනුවෙන් කැරට් ප්‍රභේද කීපයක් වේ. වඩාත්ම ජනප්‍රිය කැරට් ප්‍රභේදය වන ගිම්කැරොඩා නම් වර්ගය වෙළඳපොලේ බහුලව දක්නට ලැබේ. මෙහි අලයේ හැඩය සිලින්ඩරාකාර වේ. පැහැය තද තැඹිලි පාටය. වැලි පොළවක් සහිත කලු මැටිවලින් සමන්විත මැද පෙරදිග රටවල දම්පැහැයට හුරු පොත්ත සහිත ෆ්ලැති ප්‍රභේදයද හොඳින් ජනප්‍රියව ඇත.

# SILVY FERNANDO LAW

- ✓ Real Estate Law – Real Estate Buying, Selling, Refinance, and Private Mortgages
- ✓ Commercial Law - Sale or Purchase of Business, Company Incorporations, and Legal/Shareholder Agreements
- ✓ Family Law – Separation Agreements, Marriage Contracts and Divorce
- ✓ Personal Injury Law – Motor Vehicle Accidents, Slips and Falls
- ✓ Immigration – Skilled Immigration, Sponsorships, Work Permits, and Visitor Visas
- ✓ Estate Law – Wills
- ✓ Notary Public Services – Notarizations, Commissioning, Powers of Attorney, and Affidavits



Suite 213 - 350 Highway 7 East
Richmond Hill, ON L4B 3N2
Tel: 416-272-6587/ 905-597-1716
Email: Silvy@sfdolaw.com

Silvy Fernando LL.B.
Barrister, Solicitor & Notary Public

Century 21 Leading Edge Realty Inc. Brokerage | invis Canada's Mortgage Experts™

# THUSITH WEERASURIYA

REAL ESTATE SALES REPRESENTATIVE / MORTGAGE AGENT

416 616 2402
THUSITH.WEE@GMAIL.COM
WWW.THUSITH.COM

"HELPING YOU GET MORE FOR YOUR REAL ESTATE"



Bus: 905-405-8484 Fax: 905-405-8881
www.Century21LeadingEdge.ca
7071 Airport Rd Suite 201, Mississauga, ON L4T 4J3
*Independently owned and operated.

Markham 165 Main St N. | Scarborough 1825 Markham Rd. | Ajax 527 Kingston Rd. W | Toronto North 1053 McNicoll Ave.
Yorkville 1300 Bay St. | Stouffville 6393 Main St. | Whitby 408 Dundas St. W | Don Mills 801 York Mills Rd.

Designed@niukraids.ca

# දෙවියන්ගේ දියණිය

■ නිම්මි මුදිතා හේරත්



කිසිවෙකු නිවසේ දොරට තට්ටු කරන හඬ ඇසිණ. ස්ටෙෆානියාගේ සිරුරම බියෙන් කිලිපොලා ගියේය. නිවසේ සිටින්නේ ස්ටෙෆානියාත් ඇගේ අට හැවිරිදි නංගි හෙලේනාත් පමණකි. ඔවුන්ට වෙනත් කිසිවෙකු නැත. තාත්තා යුද්ධයේදී මිය ගොසිනි. අම්මාවත් අයියාවත් කම්කරුවන් ලෙස සේවය කිරීම පිණිස ජර්මනියෙන් නෙරපා දමා තිබිණ.

එසේ වහල් සේවයට රටින් නෙරපා දමා තිබුණේ ස්ටෙෆානියාගේ අම්මාත් අයියාත් පමණක් නොවේ. නැගෙනහිර පෝලන්තයේ දහස් ගණන් වැසියෝ බලහත්කාරයෙන් වැඩ ගැනීම පිණිස හිට්ලර් විසින් ජර්මනියට පන්නා දමා තිබිණ.

1942 වසරයි. ඒ වන විට නැගෙනහිර පෝලන්තය හිට්ලර්ගේ කුරිරු පාලනය නතු වී අවුරුදු තුනක් ගත වී තිබිණ. ස්ටෙෆානියාගේ උපන් නගරය වූ ප්‍රෙමිස්ල් නගරය ඒ වන විට රුසියාව බලා යමින් උන් ගැස්ටාපෝ නියෝජිතයින්ගෙන් සහ රුසියානු සොල්දාදුවන්ගෙන් පිරී පැවතිණ. ස්ටෙෆානියා වැඩට යන එන හැම විටකදීම ඒ නොහික්මුණු සොල්දාදුවන්ගේ අමුතු බැලුම් තමා වෙත යොමු වන බව ඇයට දැනී තිබිණ. එහෙත් ඒ කියා වැඩට නොයා සිටින්නට ඇයට නොහැකිය. ස්ටෙෆානියාත්, හෙලේනාත් යන්තමට හෝ දිවි රැකගන්නේ කුඩා කම්හලක යන්ත්‍ර ක්‍රියා කරවන්නියක ලෙස වැඩ කොට ස්ටෙෆානියා උපයා ගන්නා සොච්චම් වැටුපෙනි.

ඉතින් මේ දැන් දොරට තට්ටු කරන්නේ කවුද? මග තොටදී අමුතු බැලුම් හෙලමින් තමාව 'ආරක්ෂා කරන්නට' ඉදිරිපත් වෙන තවත් රුසියානු සොල්දාදුවෙක්ද?

ස්ටෙෆානියා බියෙන් ගැහෙමින් දොර ඇරියාය. එසැණින් ගෙට ඇතුළු වූ යමෙකු දොර වසා දොරට පිට දී හේත්තු වූයේය. ස්ටෙෆානියා බියෙන් ගල් ගැසුණාය. ඇය ඉදිරිපිට උන්නේ හිසේ සිට මඩත් කුණුත් තැවරුණු, තෙත් වැරහැලි ඇදගත් අසරණයෙකි.

"ස්ටෙෆී.... අනේ මට උදව් කරන්න...."

"ස්ටෙෆී".. ඒ ඇගේ හිතවත්ම මිතුරන් ඇය අමතන නමයි. ස්ටෙෆානියා උනන්දුවෙන් තමා ඉදිරිපිට සිටින අමුත්තා දෙස බැලුවාය. ඇයට ඔහු හඳුනා ගන්නට හැකි විය. ඔහු ජෝසෆ් ය. ඔහු මේ නගරයේ උන් ධනවත් යුදෙව් පවුලක පුතෙකි. මීට මාස කීපයකට පෙර නගරයේ උන් 20,000 කට අධික යුදෙව්වන් සංඛ්‍යාවක් නාසි හමුදාවන් විසින් නගරයෙන් පිටුවහල් කරන ලදී. ජෝසෆ්ගේ පවුලද ඒ අතර වීය. මේ නගරයෙන් පිටුවහල් වෙන්නට පෙර ඔවුන් තම නිවස බලාකියා ගන්නට පැවරුවේද ඔවුන්ගේ හිතවත්ම මිතුරියක වූ ස්ටෙෆානියාටය.

"මට එක රැයක් මෙහේ ඉන්න ඉඩ දෙන්න ස්ටෙෆී.." ඇඬෙන්නට ආසන්න ස්වරයෙන් ජෝසෆ් ඉල්ලා සිටියේය. "එකම එක දවසක්... මම හෙටම යනවා... මම පොරොන්දු වෙන්නම්... මං ඔයාව කරදරයක දාන්නෙ නෑ..." ඔහු බැගෑපත් වූයේය.

හිතේ නැගී එන බියට සිරුර අඩපණ කරවා දමන්නට ඉඩ නොදෙන්නට ඇය උත්සාහ කළාය. යුදෙව්වන්ට ආරක්ෂාව සපයන්නන්ට, හෝ උදව් කරන්නන්ට මරණීය දණ්ඩනය ලැබෙන බව ජර්මානු හමුදාව විසින් ප්‍රෙමිස්ල් නගරය පුරා අනතුරු ඇඟවීම් කර තිබිණ.

ඉතින් තමන්ගේත් හෙලේනාගේත් ජීවිත අනතුරේ හෙලා ගන්නේ කොහොමද..?

ඒ ත් මිතුරෙකු මේ තරමටම අසරණව ඉදිද්දී අහක බලාගන්නේත් කොහොමද.?

ස්ටෙෆානියා මදක් සිතුවාය. මේ වෙලාවේ අම්මා හිටියා නම් කුමක් කරාවිද.? ස්ටෙෆානියාගේ අම්මා කැතරිනා දැඩි ආගම් භක්තියෙන් යුතු කාන්තාවක් වූවාය. ස්ටෙෆානියා පුංචි කාලයේ දිනක් තවත් ළමුන් රංචුවක් යුදෙව් දරුවෙකුට හිරිහැර කරනු දුටු ස්ටෙෆානියාගේ මව ඒ දරුවාව බේරා යන්නට හැරියාය.

"ස්ටෙෆී.... ඔයා නම් කවදාවත් කාටවත් හිරිහැර කරන්නෙ නැතිවෙයි කියල මං හිතනවා.. අපි හැමෝම එකම දෙවියන්ගෙ දරුවෝ...." එවෙලේ අම්මා ස්ටෙෆානියාට කීවාය.

අම්මා මතක් වී ස්ටෙෆානියාගේ දෑසට කඳුළු පිරිණ. "ඔයා ජෝසෆ්ට පිහිට වෙන්න ඕන.." අම්මාගේ ආදරණීය කටහඬ තමන්ගේ කණට කොඳුරන්නාක් මෙන් ඇයට ඇසිණ.

තැලී සීරී තුවාල වුණු ජෝසෆ්ගේ කම්මුලකට අත තබා ඇය කරුණාවෙන් කතා කළාය.

"ඔව් ජෝසෆ්.... ඔයා මෙහේ නවතින්න.... දවසක් නෙවෙයි.. ඔයාට සනීප වෙනකල් නවතින්න...."

ස්ටෙෆානියා ජෝසෆ්ට තේ පිළියෙල කරන අතර ජෝසෆ් සිදුවුණු දේ විස්තර කළේය.

නගරයේ ඉතිරිව සිටින සියලුම යුදෙව්වන් මරා දැමීම පිණිස වධ කඳවුරුවලට යවන්නට නාසි හමුදාවන් විසින් තීරණය කර තිබිණ. එලෙසින් මරා දමන්නට තීන්දු වුණු යුදෙව්වන් අතර ජෝසෆ්ගේ පවුලේ අයද විය. යුදෙව් ජාතිකයින් සියල්ලන්ම සතුන් ගෙන යන බඩු දුම්රිය පෙට්ටිවලට ගාල් කරනු ලැබිණ. ජෝසෆ් හා ඔහුගේ සොහොයුරෙකු පවුලෙන් වෙන් කොට වෙනත් කෝච්චි පෙට්ටියක හිර කෙරිණ. දුම්රිය ඉදිරියට ඇදෙන්නට වූ විට ජෝසෆ් සිරකරුවන්ගේ ආරක්ෂාවට යොදා තිබුණු විදුලි වයරය සාක්කු පිහියකින් කපා දමා දුම්රියේ කවුළුවක් උඩට නැග ගත්තේය. කවුළුවෙන් අසීරුවෙන් පිටතට රිංගාගෙන ඔහු වේගයෙන් ගමන් ගන්නා දුම්රියෙන් පිටතට පැන්නේය. දුම්රියෙන් පිටතට පැනීමෙන් ඇතිවුණු තුවාලත්, සිරුරේ තැවරුණු මඩත් කුණුත් ඇතිව ඔහු පැය ගණනක් සිහිසුන්ව වැතිර සිටින්නට ඇත. සිහිය ලද වහාම ඔහු කළේ රහස් මාර්ග ඔස්සේ වහන් වෙමින් ප්‍රෙමිස්ල් නගරයට පැමිණීමය. "ඉතින් මට එන්න ඉතිරිවෙලා තිබුණ එකම තැන ඔයාලා ළඟට විතරයි...." ජෝසෆ් ඔහුගේ දීර්ඝ කතාව නිම කළේ ස්ටෙෆානියා ගෙනවිත් දුන් සැන්ඩ්විච් පිඟාන දෙස කෘතවේදීව බලමිනි.

ජෝසෆ් යන්තමින් හෝ සුවපත් වූයේ සති දෙකකටත් පසුවය. සුව වී නගරයට ගිය ඔහුට ඔහුගේ සොහොයුරු හෙනෙක් හා හෙනෙක්ගේ බිරිඳ හමුවිය. ඔවුන් උන්නේ හමුදාවන්ගෙන් සැඟවෙමින් කුසගින්නෙන් බැටකමිනි. ජෝසෆ්ගේ පවුලේ හිතවතෙකු වූ දොස්තර විලියම්ද ඔහුගේ දියණිය ජූඩිද ඔවුන්ගේ මිතුරෙකු වන මහලු දන්ත වෛද්‍යවරයෙකුද මේ අසරණ තත්ත්වයෙන්ම බියෙන් සැඟවී සිටියහ. මේ අසරණයින් පිරිසට ආහාර සපයා ගන්නට නගරයේ ඇවිදින්නට හැකි වන අයුරින් ජෝසෆ්, නගරයේ අප්‍රසිද්ධ මුද්‍රණාලයකින් ව්‍යාජ හැඳුණුම්පතක් සකසා ගත්තේය. දිනක් ඒ හැඳුණුම්පතද ඔහු අතින් නැතිවී ගියේය. හැඳුණුම්පතක් නැතිව නගරයේ ඇවිදින්නට හැකියාවක් නොවීය. ඒ නිසා සැඟවී සිටින පිරිසට ආහාර සොයා ගන්නට මගක්ද නොවීය.



දැන් ඉතින් ජෝසෆ්ට ඉතිරිව ඇති එකම පිහිට ස්ටෙෆානියා පමණකි. ඔහු නැවතත් ස්ටෙෆානියා සොයා ගියේය.

"ස්ටෙෆී.. අපි ටික දෙනෙකුට ඉන්න තැනක් හොයලා දෙන්න.. ඔයාගේ උදව් නැතිව අපිට ජීවත් වෙන්න විදිහක් නෑ.."

ස්ටෙෆානියා වික්ෂිප්ත වූවාය. තමාටත් පිළිසරණක් නැති මේ නපුරු නගරයේ අනුන් උදෙසා පිළිසරණ යදින්නට ඇය යන්නේ කා ළඟටද.? ඔවුන්ට නවාතැන් දීමට ඇති එකම තැන තමාගේ මේ කුඩා නිවස පමණකි. එහෙත් ඒ කී කාලයකටද.? මේ යුද්ධය තව අවුරුදු දහයකටවත් නිම නොවනු ඇත. "කවුරුහරි දොරට තට්ටු කරන හැම වෙලාවකම මං කොහොමද එයාලව ඇඳ යටට යවන්නෙ...? අනිත් එක කී දෙනෙක්ද...?" ස්ටෙෆානියා තනිවම සිතුවාය.

"අපි හැමෝටම ඉන්න පුළුවන් ගෙදරක් කුළියට ගමු...." ජෝසෆ් යෝජනා කළේය. ඔවුන්ට නවාතැන් දුන්නොත් තමාටත් නැගණියටත් ඔවුන් සමගම නාසි හමුදාවන් අතින් මැරුම් කන්නට සිදුවනු ඇති බව ඇය හොඳාකාරවම දැන උන්නාය. එහෙත් මේ අසරණයින්ව ප්‍රතික්ෂේප කොට, ඔවුන්ට කුසගින්නේ මිය යන්නට ඉඩ හැර සියදහස් වාරයක් හදවතින් මිය යන්නේ කෙසේද?

"අපි ඒ වගේ ගෙයක් හොයා ගමු...." ස්ටෙෆානියා එකඟ වූවාය.

සතියක පමණ උත්සාහයෙන් පසුව එබඳු නිවසක් ඇයට මුණ ගැසිණ. නිදන කාමර දෙකක්, කුස්සියක් හා අටුවක් සහිත ටාටරස්කා වීදියේ පැරණි කුඩා නිවසක් ඇය කුළියට ගත්තාය. අනතුරුව ජෝසෆ් හා එක් වී එම නිවස පිරිසිදු කොට, පිටත සිටින්නෙකුට නිවසෙහි ඇතුළත නොපෙනෙන පරිද්දෙන් අඳුරු තිර දැමුවාය.

මේ වැඩකටයුතු නිමවූ වහාම සැඟවී සිටින්නන්ගේ පැමිණීම ආරම්භ විය. පළමුවෙන් ජෝසෆ් සහ දන්ත වෛද්‍යවරයාගේ පුතා නිවසට පැමිණියහ. අනතුරුව දොස්තර ෂයිලෙන්ජර් සහ ඔහුගේ දියණියත් මහලු දන්ත වෛද්‍යවරයාත් පැමිණියහ.

නගරයේ සැඟවෙමින් සිටි දන්ත වෛද්‍යවරයාගේ මිතුරියක මේ අතරමැදට කඩා පැන්නාය. තමාටත් තම දරුවන් දෙදෙනාටත් නවාතැන් නොදෙන්නේ නම් මේ රහස් නවාතැන පිළිබඳ ඔත්තුව නාසි හමුදාවන්ට ලබා දෙන බව කියමින් ඇය තර්ජනය කළාය. ස්ටෙෆානියා මහත් අකමැත්තෙන් නමුදු ඇයවද බාර ගත්තාය. ඉන්පසුව දන්ත වෛද්‍යවරයාගේ ඉල්ලීම වූයේ තමන්ගේ දුවණිය හා බෑණන්ඩියවත් මේ නිවසට ගෙන්වා ගන්නා ලෙසයි. ස්ටෙෆානියා එයද ප්‍රතික්ෂේප කළේ නැත. ඉන්පසුව හෙනෙක් හා ධනුතාද පැමිණියහ. නගරයේ උන් යුදෙව් ජාතික තැපැල් කරුවාද මේ කණ්ඩායමටම එක් වූයේය. මෙසේ සැඟව සිටින යුදෙව්වන්ගේ සංඛ්‍යාව දහතුන දක්වා ඉහළ නැංගේය. නගරයේ සිටින අන්තිම යුදෙව්වා දක්වා මරණ කඳවුරු වෙත යවන්නට නාසි හමුදා ක්‍රියා කරන බව කියැවෙන ආරංචි වරින් වර ස්ටෙෆානියාට අසන්නට ලැබුණේ මේ අතරතුරය.

ස්ටෙෆානියා විසින් වරින් වර ගෙනෙන තහඩු උපයෝගී කරගෙන ජෝසෆ් විසින් ඉතා දක්ෂ ලෙස අටුවෙහි දහතුන්

**48 වන පිටුව බලන්න**



# 14 වන කොටස

# ප්‍රාර්ථනා මල් පිපුණා

**පද්මිණී ජයතිලක**

සඳගිරි වලව්ව මෙන්ම වලව් වත්තද දින දින අලංකාරවත් විය. සඳරුවන්ගේ ව්‍යාපාර කටයුතුද දියුණුවෙන් දියුණුවට පත්වෙමින් ඉදිරියට ඇදී යමින් පවතී. මේ දිනවල ලොකු මැණිකේගේ සතුට ඉහ වහා යමින් පවතී. තම එකම පුත්‍රයාගේ මංගල උත්සවයට ඇය සැරසේ. මේනකා සහ ජානකීද නිතර නිතරම වලව්වට පැමිණ තම මෑණියන්ට සහාය දෙමින් සිටී.

ලොකු මැණිකේ සඳරුවන් සමඟ එක්ව මංගල්‍යයට ආරාධනා දියයුතු අයගේ නාමලේඛනය සකස් කිරීමේ කටයුතු කළාය. මංගල උත්සවය දින තුනකට සීමා විය. පළමු දිනය කොළඹ ලොකු හෝටලයක මංගල්‍යය පැවැත්වෙන අතර දෙවෙනි උත්සවය වලව්වේ කළුතරින් පැමිණෙන ඥාතීන්ට හා තුන්වෙනි දිනය හිත මිත්‍රයින්ට සහ ගමේ අසල්වැසියන්ටද සේවක මඩුල්ලටද වෙන්විය. තුන්වන දිනයේ ආරාධිතයින් ගණන හය සියයද ඉක්මවූහ.

වලව්වේ පැවති ඇට්හෝම් උත්සවය දිනයේදී ශබ්ද විකාශන යන්ත්‍ර සවිකර සංගීත රාවය ගමටම ඇසෙන සේ විසුරුවා හැරිය නිසා සැතපුමක් පමණ ඈතින් සිටින පුෂ්පාටද එම හඬ මනා ලෙස ඇසුණාය. ඇය තම දරු කුස අතගාමින් ජයසේනට තව තවත් තුරුළු වෙමින් තම හිත් වේදනාව තුනී කර ගත්තාය.

‘මොනව කරන්නද? අපි කවුද? හාමුල කවුද? ඒත්... ඒත් මගෙ කුසේ මේ දඟලන්නේ හාමුගෙ දරුවෙක්. තව ටික දොහකින් මේ දරුව මෙලොව එළිය දැකල මේ අහිංසකයට තාත්තෙ කියල කතා කරාවි. ඒත් මගෙ පැටියො, උඹේ තාත්තා ඉටි රූපයක් වාගෙ බැබළෙන රාජ කුමාරයෙක් කියල මම උඹට කොහොම කියල දෙන්නද? මම කවදහරි දවසක උඹවත් හාමු කෙනෙක් කරනවා.’ ඇය තම කුස අතගාමින්  සුසුම්ලමින් මුහුණ කොට්ටයට තද කර ගත්තාය.

මේබලා සඳගිරි වලව්වට පැමිනුණේ තමාට හිතවත් මෙහෙකාරියක්ද රැගෙනය. සඳගිරි වලව්වට නිත්‍ය සේවිකාවක් මේ දිනවල නැති බව සඳරුවන් ඇයට පවසා තිබූ නිසා ඇය තම සේවිකාවද රැගෙන ආවාය.

මේබලා ඉතාමත් කඩිසර කම්මැලිකම අඳුරන්නේම නැති තැනැත්තියකි. කිසිම විටෙක නිකරුණේ කාලය ගත කිරීමට ඇය අකමැති විය. මේ නිසාම ඇය සිය කැමැත්තෙන්ම සඳරුවන්ගේ සමාජ කටයුතුවල සහ ව්‍යාපාර කටයුතුවල කොටස්කාරියක් වීමට වැඩි කලක් ගත වූයේ නැත. ඇය සමාජය තුළද ෆැක්ටරිය තුළද සමාජ සබඳතා ගොඩනැගීමට මහත් කැපවීමකින් කටයුතු කරන්නට විය.

මේබලා කෙබඳු ගැහැනියක්දැයි තේරුම් ගැනීමට ලොකු මැණිකේට වැඩි දවසක් ගත වූයේ නැත. ලොකු මැණිකේ කවදත් මුළුතැන්ගෙයි වැඩ කටයුතු කිරීමට කැමැත්තක් දැක්වූයේම නැත. කරලැයින් වියපත් වී පුෂ්පාද වලව්වෙන් පිටව ගිය පසු ඇයට මුළුතැන්ගෙය මහත් හිසරදයක්ව පැවතුණි. මේබලා සමඟ පැමිණි මෙහෙකාරිය මුළුතැන්ගෙය බාර ගැනීම ලොකු මැණිකේට මහත් සහනයක් විය. මේබලාද මුළුතැන්ගෙයි පාලනය හරහා වලව්වේ කටයුතු සහ වියදම් පැත්ත පාලනය සිය අතට ගත්තාය. තම පුතාට ඇති අසීමිත ආදරය නිසාම ඔහුගේ බිරිඳගේ අදහස් උදහස්වලට ඉඩ දී ඇය නිහඬ විය.

‘ඕවට කථා කරන්න ගියොත් අවුල් වෙන්නෙ මගෙ දරුවගෙ  ජීවිතේ, එතකොට එයාගෙ ජීවිතේ ආපස්සට යනවා. සඳරුවන්ට තව ජීවිතේ කොයිතරම් නම් දුර යන්න තියෙනවද? ඒ දෙන්න සතුටින් ඉන්න එක මට මදෑ....’ සිතමින් ඇය වතුපිටි පාලනය සඳහා තම කාලය යෙදවීමට යොමු වූවාය. ලොකු හාමු මිය ගිය පසු සඳරුවන්ගේ විදේශගත වීමද සිදුවූ නිසා දේපල පාලනය මැණිකේ වෙත පැවරුණේ නිරායාසයෙනි.

කරලැයින් දැන් බොහෝ සේ වයසට පත් වී ඇත. ඇයගේ ඇස් පෙනීමද කන් ඇසීමද බොහෝ සේ දුර්වල වී ඇත. ඇයව වැඩිහිටි නිවාසයට ඇරලීමට ලොකු මැණිකේ තවමත් ප්‍රමාද වන්නේ එය ඇයට වේදනා සහගත ක්‍රියාවක් නිසාය. තමාද වයසට පත් වෙමින් පසුවෙන නිසා තමාගේ අනාගතය පිළිබඳ බියක් කරලැයින් තුළින් ඇයට පෙනෙන්නේය.

කෙසේ වුවත් රැක බලා ගැනීමට තවත් කෙනෙකුගේ සහාය අවශ්‍ය වන තරමටම කරලැයින් දුර්වලව ඇති හෙයින් ඇය වැඩිහිටි නිවාසයට ඇරලීම හැර වෙනත් විකල්පයක් නැති බව දැන් ලොකු මැණිකේට තේරී ඇත. බොහෝ කාලයක සිට වලව්වේද උපකාර ලබමින් පවත්වාගෙන යන දූනගහ වැඩිහිටි නිවාසයට කරලැයින් බාර දීමට ලොකු මැණිකේ පියවර ගත්තාය. මසකට වතාවක් වැඩිහිටි නිවාසයට ගොස් ඇයගේ සුව දුක් විමසා බැලීමටද මැණිකේ අමතක කළේ නැත.

මේබලා සමඟ පැමිණි සෝමලතා ලොකු මැණිකේගේ කටයුතු සොයා නොබැලූ හෙයින් ජානකී රත්නපුරයෙන් ලොකු මැණිකේගේ සහායට කමලා ගෙනවිත් දුන්නාය. කමලා ලොකු මැණිකේට ලෙන්ගතු කමක් දැක්වූවාය. ජානකීගේ අණ පරිදි ඇය රාත්‍රී නින්ද ගත කළේද ලොකු මැණිකේගේ කාමරය තුළය.

වලව්වේ සියලු කටයුතු දැන් සිදුවන්නේ මේබලාට අවශ්‍ය පරිදිය. උදෑසන ආහාරයෙන් පසු සඳරුවන් සමඟ ෆැක්ටරියට යන මේබලා ඊට පෙර ඉවුම් පිහුම් සඳහා සියලු උපදෙස් සපයනු ලැබේ. දිවා ආහාරයට නිවසට පැමිණෙන ඇය සෝමලතා සමඟ එක්ව කඩපිලට ගොස් නිවසේ අඩුපාඩු රැගෙන පැමිණේ. සවස හතර වීමට ප්‍රථම ඇය නැවතත් ෆැක්ටරියට ගොස් එය වසා දමන තෙක්ම එහි රැඳී සිටී.

සඳරුවන්ගේ දේශපාලන උන්මාදයට මේබලා දැඩි කැමැත්තක් දැක්වූවාය. තම ස්වාමිපුරුෂයා රටේ බලවතකු වී සිටිනවා දැකීම ඇයට ලොකු සතුටක් ගෙන දෙන කරුණක් විය. ඉහලට නැගීමේ නොතිත් ආශාව නොමදව තිබූ මේබලා දේශපාලන භූමිකාව හොඳින් රඟපෑමට අවශ්‍ය වටපිටාව සඳරුවන්ට සකසා දීමටද ඉදිරිපත් වූවාය. සමාජ කටයුතුවලට තමාද අවතීර්ණ වී සඳරුවන්ට ඒ සඳහා ශක්තියක් ලබාදීමට ඇය හැකි සෑම උත්සාහයක්ම ගැනීමට යුහුසුළු විය.

මේ වන විට සඳරුවන්ගේ කොහු ගඩොල් කර්මාන්තය ඉතාමත් ඉහළ තත්ත්වයේ ව්‍යාපාරයක් බවට පත්ව ඇත. හයසියයක් පමණ සේවක පිරිසකට රැකියා ලබාදෙමින් රටට විශාල විදේශ විනිමයක් ලබා දෙන කර්මාන්තයක් නිසා විශාල ණය මුදලක් රජයෙන් ලබා ගැනීමට හැකි බව සඳරුවන් දැන සිටි නිසා ඔහු එයට අයදුම්පත් ඉදිරිපත් කළේය. එම මුදලින් තම දේශපාලන බල ප්‍රදේශය තුළම තවත් කර්මාන්ත ශාලාවක් ඇරඹීම ඔහුගේ බලාපොරොත්තුව විය. එහි මුල්ම අඩිතාලම ලෙස වේයන්ගොඩ ප්‍රදේශයෙන් පොල් අක්කර දහයක් ඔහු මිල දී ගත්තේය. රජයේ ණය මුදලින් ඔහු එහි විශාල කර්මාන්ත ශාලාවක් ඉදි කරනු ලැබීය. පසෙකින් අලංකාර වතු බංගලාවක්ද ඉදිකරනු ලැබුවේ ඔහුගේ ප්‍රයෝජනය සඳහාය. එම ෆැක්ටරිය සඳහාද ඔහු සේවකයින් සපයා ගත්තේ කර්මාන්ත ශාලාව අවටින්මය. ඉදිරියේදී ඡන්දයකදී මනාප ලැයිස්තුවේ ඉහළම මනාප ලබාගැනීමට රුකුල් වන පරිද්දෙන් තම ව්‍යාපාරය ව්‍යාප්ත කිරීම ඔහුගේ යටි අරමුණ විය.

“සඳරුවන්, මම හිතාගෙන ඉන්නවා ගමේ පන්සලේ ඉංග්‍රීසි පන්තියක් පවත්වා ගෙන යන්න.” දිනක් මේබලා සඳරුවන්ට එවැනි අදහසක් ඉදිරිපත් කළාය.

“ඒ වුණාට ඔය නගරෙ වාගේ මෙහෙ ළමයි පංතිවලට වැඩිය මුදල් ගෙවන්න කැමති නැහැ. ඔයාට පාඩු වෙයි.”

“පිස්සුද සඳරුවන් මම සල්ලි බලාගෙන නෙමෙයි මේක කරන්න හදන්නේ. කෝ... අපිට දේශපාලනය කරන්න හොඳ තරුණ කෙල්ලො කොල්ලො ටිකක්. මොකද ෆැක්ටරිය වහල දාන්නයැ. ඔය රස්සාවල් නැතිව ඉන්න කෙල්ලො කොල්ලො ටික එතකොට මගෙ පන්තියට එයි. වැඩිහිටි පන්තියක් විදිහට. ලොකු මහජන සේවයක් විදිහටයි මම මේක පටන් ගන්නෙ.”

“ඔව් .. ඒක නම් හොඳ සැලසුමක් තමයි.”

“ඔයා එනවද මාත් එක්ක පන්සලට ගිහින් හාමුදුරුවො හම්බු වෙන්න. මොකද මට දහම් පාසලේ උගන්නන්න හදාගන්න ලොකු හාමුදුරුවො එක්ක කථා කර ගන්න ඕනි. දහම් පාසලට යන්න පටන් ගත්තම මට පුළුවන් පන්සලේ හොඳ කුලඟන සමිතියකුත් පටන් ගන්න. ඊට පස්සෙ ඉංග්‍රීසි පන්තිය පටන් ගන්නවා. මේක හොඳ වැඩක් කියල ජේනකොට අනිත් ගුරුවරුත් මට උදව් කරයි.”

“ඔව්... මම පන්සලට හොඳ සේවයක් මේ වනවිටත් කරල තියෙනවා අපේ තරුණ බෞද්ධ සමිතිය හරහා. හැබැයි තරුණ සමිතියෙ හැම පක්ෂයකම අය ඉන්නවා. ඒකට නම් මම දේශපාලනය ගාවගත්තෙ නැහැ.”

“සඳරුවන්... මමත් මේක කරන්නෙ දේශපාලනය ගාවගෙන නෙමෙයි. මිනිස්සු ඉබේම අපේ දේශපාලනයට කැමති කර ගන්නයි. අපේ යටි අරමුණ අපි ලෝකෙට පෙන්නන්න හොඳ නැහැ. ඒක ඉබේම ඉටුවෙන්න ඉඩදෙන්න ඕනි.”

“ඔව් ඔව් ඔයා හරි. ඕන දෙයක් කියන්න. මම එන්නම්. ඕන තැනකට යන්න.”

සඳරුවන් තව තවත් විදේශ වෙළඳ පොළ ජයගැනීමට වෙර දරමින් සිටී. ඒ සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය ඔහුට මහත් සහායක් දැක්වීය. බොහෝ විදේශයන්හි පැවැත්වෙන වෙළඳ ප්‍රදර්ශනවලට ඔහුගේ භාණ්ඩ ඉදිරිපත් කිරීමට ඔහුට ඒ මගින් අවස්ථාව සලසා දුනි. ඒ සෑම විදේශ ගමනකටම සඳරුවන්ගේ පෞද්ගලික ලේකම්වරිය ලෙස මේබලාද සහභාගි විය.

පුෂ්පාගේ දරු ගැබට මේ වන විට මාස නමයහමාර වීමට ආසන්නය. ඒ බව දන්නේ පුෂ්පාත් වෛද්‍යවරයාත් පමණි. එබැවින් ඇය ඇගේ අම්මා කැඳවා ගෙන එන ලෙසට ජයසේනට ඇවිටිලි කළාය.

පුෂ්පාගේ මවට ජයසේනගේ කුඩා නිවස රජ මැදුරකි. ආහාරපානවලින් කිසිඳු හිඟයක් නැති, ජල බියෙන් තොර නිවසක ඇය කිසිම දිනක කල්ගත කර තිබුණේ නැත. තම නිවසේ සිටින විට අහස කළුවර කර වැසි වැටෙන විට ඇගේ ඇඟේ හිරිගඩු පිපී බිය සිතට එන්නේ කොයි වේලේ කැළණි ගඟ ගලා ගෙපැල යටවේද යන බියෙනි. එබැවින්, ඇයට දැනෙන්නේ තම දියණිය සියලු දෙයින් ආඪ්‍ය රාජ කුමාරයෙකු හා දීග ගොස් ඇති බවකි. ඇය මෙතෙක් කලක් බොහෝ දිනවලට උදය ආහාරය ගත්තේ නැත. සේවය සඳහා යන ගෙයකින් උදයට ලැබෙන දෙයක් ආහාරයට ගත්තත් සමහර දිනකට එය කහට කෝප්පයක්ම පමණක් විය. දවාලට බත් ටිකක් ලැබුණත් සමහරවිට එයද කුසට ප්‍රමාණවත් නොවීය. එහෙත් ඇය උපයාගත් දෙයින් රාත්‍රියට කරවල හොද්දක්, එලවළුවක් සමඟ බතක් පිළියෙල කළේ තම පුත්‍රයාට එක වේලක් හෝ බඩකට



32 වන පිටුව බලන්න

# ප්‍රාර්ථනා මල්...

31 වන පිටුවෙන්

පිරෙන්නට යමක් දියයුතු නිසාය.

"මේ ගෙදර මොකුත් අඩුපාඩුවක් නැහැ. කන බොන දේවල්වලින් පිරිල. ජයසේන හොඳ ධෛර්යවන්තයා. අනේ අපේ කොළුවගෙ තාත්තත් අපිට හොඳට කන්න බොන්න දුන්නා" කියා සිතමින් කුස්සිය දෙස විපරමින් බැලුවාය.

"අම්මේ, මොකද අම්මෙ කල්පනා කරන්නෙ."

"අනේ බං... මට කොළුව මතක් වුණා. ඌ කොහොම කයිද මන්ද?"

"මල්ලිට දැන් හොඳට බාස් වැඩේ පුළුවන්ද?"

"පුළුවන්යැ කියන්නේ. ඔය යන්නෙ මහ බාස් එක්ක ගෙවල් බඳින්න."

"ජයසේන නම් කිව්ව දැන් හොඳ බාස් කෙනෙකුට හොඳට සල්ලි හම්බු කරන්න පුළුවන් කියල."

"ඔව් ඌත් දැන් කීය කීය හරි හම්බු කරනවා. ඒකෙන් ටිකක් පොතකටත් දා ගන්නවා. සීට්ටු දෙකකුත් ගෙවාගෙන යනවා. ඌ හැම තිස්සෙම කියන්නෙ මෙහෙම හැමදාම වැස්සට පන්සලට යන්න බැහැ. වෙන තැනකින් ගේ පොඩ්ඩක් හදාගන්න ඉඩම් කෑල්ලක් ගන්න ඕනි කියලනෙ."

"ඒක නම් හොඳයි තමයි."

"ඌ ඔය වෙන්දේසි කෑල්ලකින් මාසෙන් මාසෙට ගෙවන්න දෙන පර්චස් දහයක් ගන්න හිතාගෙන ඉන්නෙ මගෙ හිතේ."

"එතකොට ඔය ඉන්න එක."

"ඒක අල්ලපු වත්තේ සියදෝරිස් ගන්න කැමතිලු."

"ඔව් ඉතින් ගනී තුට්ටු දෙකකට."

"කොහොමත් ඉතින් තුට්ටු දෙකයි තමයි ලැබෙන්නෙ. හැමදාම දියේ පාවෙවී ඉන්නවට වඩා පුළුවන් තැනකට යන එක හොඳයිනෙ බං. ඕකෙ ගෙවල් හැදුවත් ඇති වැඩක් නෑනෙ."

"අම්මට මා ළඟ ඉන්න පුළුවන් හැමදාම."

"ඔව් කොළුව පිළිවෙළක් වුණාහම එහෙමවත් කරමුකො. අනේ උඹට මෙහෙම කලක් ගිය එක මට නම් හරිම සතුටුයි. වලව්වේ උත්තමයන්ට පිං සිද්ධ වෙන්න. ඒ ඇත්තො උඹ ගැන හොඳට බලලනෙ."

පුෂ්පා සිදුවූ සියලු දෙය තම මවට පැවසීමට නොහැකි හෙයින් නිහඬ වී සිටියාය.

වින්නඹු මාතාව සති දෙකකට වරක් පුෂ්පාගේ නිවසට පැමිණ ඇයට අවශ්‍ය උපදෙස් සහ විටමින් වර්ග සපයා ගියාය. ජයසේනගේ කුලෑටි බව නිසා ඔහු කිසිම විටක ඇය පැමිණි විට ඇය සමඟ කථාවට නොගියේය. ඇය දුටු විගසම ඔහු නිවසින් පිටවී තම ගොවිපොළට යන්නේය. එබැවින් පුෂ්පාගේ දරුගැබ ගැන ඔහුට අවබෝධයක් නැත. එහෙත් ඇගේ මව දිනක්

"දුවේ උඹේ බඩනම් හරිම ලොකුයි. මාස හත වුණාට. මට නම් හිතෙන්නෙ ළමයි දෙන්නෙක්දවත් කියල." කීවාය.

"නැහැ අම්මේ, දොස්තර මහත්තයා කිව්වා නිවුන්නු නෙමෙයි කියල. ඒ මගෙ බඩේ හැටි කියල."

"උඹ යහමින් කෑම කාල තියෙනවා. එතකොට ඔය දරුව එළියට දා ගන්න හරි අමාරුවෙයි උඹට. ළමය ලොකු වැඩි වුණාම අම්මට හොඳ දුකක් විඳින්න වෙනවා."

"මිහ්...."

"දරුවට ඇඳුම් ටිකක්, පාංකඩ රෙදි ටිකක් හෙම ලෑස්ති කර ගන්න වෙයි. ඉස්සරහට එන්නෙ වැහි කාලෙ. කොච්චර රෙදි කෑලි තිබුණත් මදි."

"වලව්වෙ ලොකු මැණිකෙ ජයසේනගෙ අතේ මැණිකෙගෙ හොඳ සුදු සාරි දෙක තුනක්ම එවල තිබුණ. බේසමක් එහෙමත් එහෙ තියෙනව කියල එවන්නම් කිව්වලු."

"උඹට අඳින්න චීත්ත රෙදි දෙක තුනකුත් ඕනි වෙයි. උඹට අඳින්න හැට්ට කෑලි දෙක තුනකුයි, මේ කළමනායි ලෑස්ති කර ගනිං."

"ජයසේන පොලෙන් චීත්ත රෙදි තුනක් ගෙනත් දුන්න. හැට්ට කෑලිත් මැණිකෙ එවල තිබුණ."

"එහෙනම් ඔය මදෑ කළමනා."

පුෂ්පා වින්නඹු මාතාවටද වැරදි දින ගණන් පවසා සිටි නිසා ඇයද නොමග ගොස් සිටියාය. එහෙත් කොයි මොහොතේ හෝ ඇයට දරුවා ලැබෙන බව දැන සිටියේ රෝහලේ වෛද්‍ය වරයාත් පුෂ්පාත් ලොකු මැණිකේත් පමණි.

මේ පුංචි පැල තුළ සතුට දෝරේ ගලමින් තිබූ අතර, ජයසේන දරු පැටියාගේ මුණ දැක ගැනීමට බලවත් ආශාවකින් පසුවිය. ඔහු විටින් විට නගරයට ගොස් කළමනා රැගෙන ආ අතර, ආහාර ගබඩාවද හිස් කළේ නැත. පුෂ්පාට නිරතුරුවම රැකවරණය දෙමින් ඇයව බලා ගත්තේ බිඳෙන භාජනයක් සුරක්ෂිත කරන පරිද්දෙනි. ජයසේනගේ දෙමව්පියෝද සොයුරාද පුෂ්පාට අසීමිත ආදරයක් දැක්වූහ.

"කොහෙන් මේකට මම ගෑනියෙක් හොයන්නද?" කියමින් සිටි ජයසේනගේ අම්මාට පුෂ්පාගේ පැමිණීම ශ්‍රියා කාන්තාව වැඩියා බඳු එකක් විය.

දිනක් රාත්‍රියේ ඇති වූ තදබල බඩේ වේදනාව ක්‍රමයෙන් වැඩිවන විට ඇය ජයසේනට ඒ බව කීවාය. ඔහු හනිකට පිළියෙල කර තිබූ හුළු අත්තක් දල්වාගෙන ගරාජ් එකේ රොබට් අයියාගේ මොරිස් මයිනරය සොයා දුව ගියේය.

"ඕන කරන බඩුමල්ල ගන්න අම්මේ" කියමින් පුෂ්පා වාහනයට නැග ගත්තේද ඉතාමත් අපහසුවෙනි. මාතෘ නිවාසයට යන විට ඇගේ වේදනාව තව තවත් උත්සන්න වෙමින් තිබුණි.

"හත් මාසෙන් දරුවො උපදිනවා. බඩත් හරි විසාලනෙ." පුෂ්පාගේ අම්මා ජයසේන දෙස බලා පැවසූ විට

"මේ දරුව ඝදම්බු වෙන්නද අම්මේ පුෂ්පට අමාරු වෙලා තියෙන්නේ." කියා ජයසේන මවිතයට පත් වෙමින් ඇසුවේය.

"එවකොට අම්මෙ ළමයා මොඝදව හරි වෙයිද? අඩු මාවෙ හින්ද?"

"නැහැ හත්මාසෙ ළමයි හොඳට හැදෙනවා."

'අනේ දෙවියනේ පුෂ්පාට කරදරයක් නම් වෙඝද්ඝද එපා. දෙවියො එයාවයි දරුවවයි රැක දෙන්න ඕනි.' සිතමින් ඔහු මාතෘ නිවාසය ඉදිරිපස වූ බංකුවේ වාඩි විය.

"ඔහෙල දැන් ගෙදර යන්න. ලෙඩාව අපි භාර ගත්තනේ. දැන් ඉතින් හෙට උදේ හයට බොන්න මොකුත් හදාගෙන එන්න." වින්නඹු අම්මගේ කෑ ගැසීමට ජයසේන බංකුවෙන් නැගිට්ටාට ඔහුට එතනින් පිටව යාමට නම් හිත දෙන්නේම නැත.

"අම්මේ මොකඝද අපි කරන්නෙ."

"යමං පුතේ අපි ගෙදර. මේ ඇත්තො මේ දේවල් බලා ගනී."

ජයසේන පුෂ්පාගේ අම්මාව නිවසට ඇරලවා නැවත බයිසිකලයේ නැගී රෝහල වෙත ආවේය.

**ලබන කලාපයෙන් හමුවෙමු**

AIR-SEA-LAND
BRISK INTERNATIONAL CARGO INC
Worldwide Movers
Door To Door Service All Part Of sri Lanka
Packing / Moving / WoodenCrating / Storage

Colombo
LAKSIRI SEVA (PVT) Ltd
66 New Nuge Road,
Peliyagoda
Kelaniya
Tel: 011-9411-257-4180

Kurunegala
Laksiri Seva (PVT)Ltd
118/96 Negombo Road
Malkaduwawa
Kurunegala
Tel : 037-2052-810

Batticaloa
LAKSIRI SEVA (PVT)Ltd
26,Hmyl Lane
Main Street,Addapalam
Ninthavur,Batticaloa
011-94-672051050

Toronto: - A.R.Nathan / L.A.Wasanthi 416-321-0400
(Alberta) Edmonton,Calgary Tony: 1-587-708-5665
Ajax / Whitby : Prasad,1-289-200-4288 Montreal: Jeganathan 1-514-519-3213
Ottawa : Kannan -1-613-828-2221 Montreal: Uthayan -1-514-736-2525
Web:www.briskcargo.com Email: info@briskcargo.com
919 Ellesmere Road Suite # 306 M1P2W7



# ජීවිතයට හොඳ නරක ගෙනෙන සහ පෙන්වා දෙන හඳහන

## 2018 දෙසැම්බර් 01 දින සිට දෙසැම්බර් 31 වන දින දක්වා ලග්න අනුව ශුභාශුභ තත්ත්වය කෙසේද?

(මෙම ජ්‍යොතිෂ පලාපල සටහන් ලියැවෙන්නේ කැනඩාවට සුදුසුවන පරිදි ගණනය කිරීමෙනි)



### මේෂ ලග්නය

ලග්නාධිපති කුජ 11 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා ව්‍යාපාර කටයුතුවලට ශුභයි. දියුණුව ඇති කෙරේ. ක්‍රියාශීලී වේ. අධ්‍යාපන කටයුතුවලට ශුභ වේ. අලුත් දේ ඉගෙනුමට යොමු වේ. කලා කුසලතා ඇත. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. භූමි ලාභ ඇත. බාධක මැඩ ඉදිරියට යාමේ හැකියාව අධිෂ්ඨානය ඇත. තම නිදහස අගය කරයි. ආදායම් මාර්ග ශුභ වේ.

### වෘෂභ ලග්නය

ලග්නාධිපති සිකුරු 6 වැන්නේ ගමන් කරයි. රැකියා දියුණුව ඇති කෙරේ. හවුල් ව්‍යාපාරවලින් ලාභ ලැබිය හැකිය. අධ්‍යාපන කටයුතු ශුභ වේ. විභාග ජය ලැබේ. ගේ දොර, ඉඩකඩම් ගැනීමේ හැකියාව ඇත. තම වැඩකටයුතු සාර්ථක කර ගැනීමට හැක. සඳු 8 වැන්නේ නම් අනතුරු පීඩාද ඇතිවිය හැකි හෙයින් කල්පනාකාරී වීම මැනවි. ආදායම් මාර්ග ශුභ වේ.

### මිථුන ලග්නය

ලග්නාධිපති බුධ 6 වැන්නේ ගමන් කරයි. සතුරු කරදර අඩුය. රැකීරක්ෂා වෙළඳ ව්‍යාපාර කටයුතුවලින් දියුණුව ඇති කෙරේ. කරගෙන යන වැඩකටයුතු මෙන්ම අලුතෙන් ආරම්භ කරන වැඩකටයුතුවලින්ද දියුණුව ලාභ ලද හැක. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. ආදායම් මාර්ග ශුභ වේ.

### කටක ලග්නය

ලග්නාධිපති සඳු 2 වැන්නේ ගමන් කරයි. රැකියා කටයුතුවල දියුණුව ඇති කෙරේ. තනතුරු කීර්ති ප්‍රශංසා ලැබිය හැක. රැකියා අපේක්ෂිත අයට පත්වීම් ලැබීමටත්, ස්ථිර පත්වීම් ලැබීමටත් භාග්‍යය ඇත. ඉගෙනුමේ කටයුතු ශුභ වේ. විභාග ජය ලැබේ. ගේ දොර ඉඩකඩම් ගැනීමේ හැකියාව ඇත. ගමන් බිමන් අධික වේ. ආදායම් මාර්ග ශුභ වේ.

### සිංහ ලග්නය

ලග්නාධිපති රවි 4 වැන්නේ ගමන් කරයි. රැකී රක්ෂා දියුණු වේ. වාහන, ඉඩකඩම් ගැනීමට වාසනාව ඇත. අලුතෙන් ආරම්භ කරන ව්‍යාපාර කටයුතුද ශුභ වේ. රැකියා, පත්වීම් අපේක්ෂාවෙන් සිටින අයට එය ඉටුවීමට මේ කාලය යහපත්ය. අධ්‍යාපන කටයුතුද ශුභ වේ. ගමන් බිමන් අධික වේ. සිතිවිලි අධික වේ. පිරිස් බලය ලැබේ. සමාජසේවා කටයුතුවල නිරත වේ. ආදායම ශුභ වේ.

### කන්‍යා ලග්නය

ලග්නාධිපති බුධ 3 වැන්නේ ගමන් කරයි. පදිංචියේ රැකියාවේ වෙනසක් ඇති විය හැක. රැකියා කටයුතුවල දියුණුව ඇති කෙරේ. උසස් වීම් ලද හැක. අධ්‍යාපන කටයුතුවලට ඉතා ශුභයි. විභාග ජය ලැබේ. විවිධ භාෂා, වෙනත් දේ ඉගෙනුමටද යොමු විය හැක. විනෝද චාරිකා යාමටද අවස්ථාව ලද හැක. ආදායම් මාර්ග ශුභ වේ.

### තුලා ලග්නය

ලග්නාධිපති සිකුරු ලග්නයේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. විභාග ජය ලැබේ. රැකියා ව්‍යාපාර දියුණුව ඇති කෙරේ. තනතුරු, කීර්ති ප්‍රශංසා ලැබීමට පුළුවන. රැකියා අපේක්ෂිත අයගේ බලාපොරොත්තු ඉටුවිය හැක. කරගෙන යන වැඩකටයුතුවලින් අලුතෙන් ආරම්භ කරන ව්‍යාපාර වැඩකටයුතුවලිනුත් ලාභ ලද හැක. ධන ලාභ ඇත. ආදායම ශුභ වේ.

### වෘශ්චික ලග්නය

ලග්නාධිපති කුජ 4 වැන්නේ ගමන් කරයි. රැකියා ව්‍යාපාර දියුණුව ඇති කරන අතර රැකියා අපේක්ෂිත අයගේ අපේක්ෂාවන් සාර්ථක වීමට වාසනාව ඇත. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ ලෙස සිදු වේ. උසස් අධ්‍යාපනය සම්බන්ධයෙන්ද විභාග ආදිය සම්බන්ධයෙන්ද වඩා යහපත් ප්‍රතිඵල ලැබීමේ හැකියාව ඇති කරයි. තම මතයට ඍජුවම වැඩ කරන අවස්ථාවකි. හදිසි තීරණ ගැනීමට ඉඩ ඇත. ආදායම් මාර්ග ශුභ වේ.

### ධනු ලග්නය

ලග්නාධිපති ගුරු 12 වැන්නේ ගමන් කරයි. රැකියාවේ වෙනසක් ඇති විය හැක. රැකීරක්ෂා ව්‍යාපාරවල දියුණුව ශුභ වේ. අධ්‍යාපන කටයුතු ශුභ වේ. නිදහස අගය කරයි. මහජන සේවා වැඩ කටයුතුවල යෙදේ. මිතුරු මිතුරියන්ගේ ඇසුර ලැබේ. ශුභඵල ඇත. ආදායම් මාර්ග ශුභ වේ. ලග්නයේ සඳු ඇත්නම් ලග්න ඒරාෂ්ටකය හෙයින් අනතුරු පීඩා ඇතිවිය හැකි හෙයින් කල්පනාකාරී වීම මැනවි.

### මකර ලග්නය

ලග්නාධිපති ශනි 12 වැන්නේ ගමන් කරයි. අධ්‍යාපන කටයුතු ඉතා ශුභ වේ. විභාග ජය ලැබේ. විවිධ විෂයන්ද ඉගෙනුමට යොමු විය හැක. රැකියාවේ දියුණුව ඇති කෙරේ. උසස්වීම් ලැබීමේ හැකියාව ඇත. රැකියා අපේක්ෂිත අයට ඉල්ලුම් කිරීමෙන් යහපත් ප්‍රතිඵල ලබාගැනීමට, පත්වීම් ලැබීමට අවස්ථාව සහිතයි. අනවශ්‍ය වියදම් ඇති කෙරේ. ආදායම ශුභ වේ.

### කුම්භ ලග්නය

ලග්නාධිපති ශනි 11 වැන්නේ ගමන් කරයි. රැකියා අංශයෙන් වඩා දියුණුව ඇති කරයි. රැකියා ස්ථිර වීමටත් පත්වීම් ලැබීමටත් මේ කාලය යහපත් වේ. අධ්‍යාපන කටයුතු සාර්ථක වේ. විභාග ජය ලැබේ. අලුත් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමටද ශුභ වේ. වැඩ රාජකාරී අධික වේ. නිදහස අගය කරයි. පිනට දහමට යොමු වේ. ආදායම ශුභ වේ.

### මීන ලග්නය

ලග්නාධිපති ගුරු 9 වැන්නේ ගමන් කරයි. රැකීරක්ෂා, ව්‍යාපාර කටයුතුවල වැඩි දියුණුවක් ඇති වේ. තනතුරු ලැබීමටත්, අපේක්ෂිත අයට රැකියා ලැබීමටත් මේ කාලය යහපත් වේ. අධ්‍යාපන කටයුතුවලද වැඩි දියුණුව ඇති කෙරේ. විභාග ජය ලැබේ. පිරිස් බලය ලැබේ. සිතිවිලි අධික වේ. පිනට දහමට වඩා යොමු වේ. ආදායම් මාර්ග ශුභ වේ.



**එම්. වයි. ධර්මවිජය**
ජ්‍යොතිෂ ඩිප්ලෝමා, උසස් ඩිප්ලෝමා,
ජ්‍යොතිෂ ශිරෝමණී(රන්පදක්කම් ලාභී)
ඔබගේ සියලුම ජ්‍යොතිෂ කටයුතු සඳහා විමසන්න
දුරකථන අංක කැනඩාව: 01-905 990 2311
Email: ashawije18@yahoo.ca

# යාවත්කාලීන විය යුතු සිංහල ශබ්දකෝෂය

■ **සම්මානිත මහාචාර්ය ජේ. බී. දිසානායක**

ජාතියක අනන්‍යතාව හඟවන මූලික සංකේතය භාෂාවයි. 'සිංහලය' යනු සිංහල වර්ගයා සෙසු මානව වර්ගයාගෙන් වෙන්කොට දක්වන ප්‍රධානතම ලක්ෂණයයි. ජාතියක් සතු භාෂාව ඔවුන්ගේ 'මවු බස' ලෙස හැඳින්වේ. 'මවු බස' යන්න 'මාතෘ භාෂාව' යන්නෙන් වෙන්කොට හඳුනාගත යුතුය. 'මාතෘ භාෂාව' යනු එක් භාෂාවක සම්භවයට පාදක වන භාෂාවයි. සංස්කෘත හා පාලි යන භාෂා ද්වය සිංහලයේ මාතෘ භාෂා සේ සැලකේ.

'ශබ්ද කෝෂය' යනු භාෂාවක සම්භවය, පරිණාමය, සංස්ථිතිය හා ව්‍යවහාරය ඉතාම හොඳින් පිළිබිඹු කරන ග්‍රන්ථයයි. ඊට 'ශබ්ද කෝෂය' යැයි කියන්නේ එහි අන්තර්ගත වන්නේ ඒ භාෂාවට අයත් 'ශබ්ද' හෙයිනි. 'ශබ්ද' යන පදයෙන් මෙහිලා අදහස් කෙරෙන්නේ අක්ෂර මාලාවට අයත් ස්වර හා ව්‍යංජන වැනි 'ශබ්ද' නොව 'පද' යි. ඒ පද සියල්ල එහි ඉදිරිපත් කෙරෙන්නේ අකාරාදි පිළිවෙළින් නිසා ඊට 'අකාරාදිය' යන නම්ද යෙදේ.

සිංහල භාෂාව අළලා සම්පාදිත අංග පරිපූර්ණ, ශබ්දකෝෂයක් දැන් නිකුත් වී ඇත. 1927 දී රාජකීය ආසියාතික සමිතියේ පුරෝගාමිත්වයෙන් ආරම්භ වුණු මේ ශබ්දකෝෂය නිමවා පළකිරීමේ වගකීම පැවරුණේ වර්තමාන සංස්කෘතික අමාත්‍යාංශයටය. මේ ශබ්දකෝෂය හැඳින්වෙන්නේ 'සිංහල ශබ්දකෝෂය' යන නමිනි.

මේ දේශනය පියවර දෙකකින් යුක්තයි. පළමුවැනි පියවර සිංහල ශබ්දකෝෂයේ ගමන් මඟ සුවදායක කිරීමට ආචාර්ය පී. බී. එෆ්. විජේරත්න දැක්වූ දායකත්වය පැහැදිලි කිරීමයි. දෙවැන්න එතුමා විශ්‍රාම ගත් තැන් සිට එහි ගමන් මඟ හඳුනා ගැනීමයි.

මෙහි ආදි කර්තෘවරුන් ලෙස අනුපම සේවයක් කළ වියතුන් අතුරෙහි ඒබ්‍රහම් මැන්දිස් ගුණසේකර වාසල මුදලිතුමාත්, ඩබ්ලියු. එෆ්. ගුණවර්ධන වාසල මුදලිතුමාත්, සර් ඩී. බී. ජයතිලක මහතාත්, විල්හෙල්ම් ගයිගර් මහතාත් කැපී පෙනෙති. පසු කලෙකදී ජූලියස් ද ලැනරෝල්, මහාචාර්ය ඇම්. ඩී. රත්නසූරිය, මහාචාර්ය ඩී. ඊ. හෙට්ටිආරච්චි, ආචාර්ය. පී. බී. එෆ්. විජේරත්න හා මහාචාර්ය පුංචි බණ්ඩාර සන්නස්ගල වැනි වියතුන්ද මේ සත්කාරයට දායක වූහ. මේ වියතුන් අතරෙහි එහි ප්‍රධාන කර්තෘවරයකු වශයෙන් දශක තුනකට ආසන්න කාලයක් සේවයක් කළ පී. බී. එෆ්. විජේරත්න මහතා විශේෂයෙන් සිහිපත් කිරීම අද සිදු වෙයි.

අවුරුදු 78 ක් ආයු වළඳමින් සිංහල භාෂාවේ ප්‍රවර්ධනයට මහාර්ඝ සේවාවක් කළ පී. බී. එෆ්. විජේරත්න මහතා වචනයේ පරිසමාප්තාර්ථයෙන්ම භාෂාඥයෙක් විය. සිංහල භාෂාව පිළිබඳව පමණක් නොව සංස්කෘත, පාලි හා ඉංග්‍රීසි යන භාෂා පිළිබඳවද ඔහු සතු ඥාන සම්භාරය විශ්මයාවහය. එතුමා සිංහලයෙන් මෙන්ම ඉංග්‍රීසියෙන් ව්‍යක්තවද චතුර ලෙසද ලිවීය.

එතුමාගේ මේ අපරිමිත භාෂා ඥානයට මුල් අඩිතාලම වැටුණේ කොළඹ නාලන්දයෙන් හා ආනන්දයෙනි. අධ්‍යාපනඥයකු වශයෙන් ආනන්දය හා නාලන්දය නඟා සිටුවූ පී. ද ඇස්. කුලරත්න මහතා අධ්‍යාපන මාධ්‍යය වශයෙන් සිංහල හා දෙමළ යන ස්වභාෂා යොදා ගැනීමේ වැදගත්කම පෙන්වා දෙමින් ගෙන ගිය 'ස්වභාෂා සටන' විජේරත්න මහතාගේ භාෂා චින්තනය හැඩ ගැස්වීමෙහි ලා බලපෑ බවට කිසිදු සැකයක් නැත.

පාලිය හා සංස්කෘතය කෙරේ එතුමාගේ අවධානය වඩ වඩාත් යොමු වුණේ එවක ආනන්දයෙහි ඉගෙන ගත් හා ඉගැන්වූ පූජ්‍ය බලංගොඩ ආනන්ද මෛත්‍රෙය නාහිමියන් වැනි භික්ෂූන් වහන්සේලා නිසාය. ආනන්දය සමඟ සමීප සම්බන්ධයක් පැවැත්වූ පූජ්‍ය පැලෑනේ වජිරඥාණ හිමියන් වෙතින් එතුමා පාලි හා සංස්කෘත භාෂා හදාළේය. ඔහු එවක මෙරට උසස්තම අධ්‍යාපන ආයතනය වූ 'යුනිවර්සිටි කොලේජ්' නම් විද්‍යායතනයට ඇතුළත්ව ඉන්දු ආර්ය භාෂා තවදුරටත් ප්‍රගුණ කළේය.

1934 වන විට මෙහි අධ්‍යාපන කටයුතු නිමවා ප්‍රථම පන්තියේ සාමර්ථ්‍යයක්ද දිනා ගැනීමට එතුමා සමත් විය. ඒ වර්ෂයේ විශිෂ්ටම ශිෂ්‍යයාට පිරිනැමුණු රජයේ ශිෂ්‍යත්වයද දිනාගත් එතුමා වැඩිදුර අධ්‍යාපනය සඳහා එංගලන්තය බලා පිටත් වී ගියේය. 1935 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයට අනුබද්ධ පෙරදිග හා අප්‍රිකානු විද්‍යා පීඨයට (School of Oriental and African Studies) බැඳුණු එතුමා සුප්‍රකට ඉංග්‍රීසි මහාචාර්යවරයකු හා භාෂාඥයකු වූ රැල්ෆ් ටර්නර් (Ralph Turner) මහතා යටතේ පශ්චාද් උපාධිය සඳහා උගත්තේය.

ආචාර්ය උපාධිය සඳහා එතුමා තෝරා ගත්තේ දශවැනි ශත වර්ෂය දක්වා ලියැවුණු සිංහල ශිලා ලේඛනවල දක්නට ලැබුණු ශබ්ද යෝජනයයි. සිවු වසරකින් මේ නිබන්ධය ලියා අවසන් කළ එතුමාට 1945 දී ආචාර්ය උපාධිය ලැබිණ. Phonology of the Sinhalese Inscriptions up to the End of the Tenth Century A.D නම් වූ ඒ නිබන්ධය මෙතෙක් මේ රටේ ප්‍රකාශනයට පත්කොට නොතිබීම කනගාටුවට කරුණකි.

එසේ වුවද 'පෙරදිග හා අප්‍රිකානු විද්‍යා පීඨය' මගින් පළකරනු ලබන Bulletin නම් සඟරාවෙහි 11 වැනි කාණ්ඩයෙහි සිට (1945) මෙය කොටස් වශයෙන් පළකොට තිබේ. එහි ඇතුළත් 'පෙරවදන' සිංහල භාෂාවේ ප්‍රභවය අරභයා එවක පැවති මතවාද මැනවින් විශ්ලේෂණය කරන්නකි.

1945 දී මෙරටට ආ එතුමාගේ සේවය මේ වන විට සම්පාදනයට සූදානම් කෙරෙමින් පැවති සිංහල ශබ්දකෝෂ කාර්යාලයට අවශ්‍ය විය. සිංහලය අරබයා ශබ්දකෝෂ තුනක් සම්පාදනය කිරීම මෙහි ආදි කර්තෘවරුන්ගේ අභිප්‍රාය විය. සිංහල 'සිංහල මහා ශබ්ද කෝෂය', 'සිංහල - ඉංග්‍රීසි මහා ශබ්දකෝෂය' හා 'සිංහල - ඉංග්‍රීසි සංක්ෂිප්ත ශබ්දකෝෂය' යනුවෙනි.

ඒ වන විට මේ ශබ්ද කෝෂයේ ප්‍රධාන කර්තෘ ධුරය දැරුවේ ප්‍රථම සිංහල මහාචාර්යවරයා වූ ඇම්. ඩී. රත්නසූරිය මහතාය. 1946 දී සහකාර කර්තෘවරයකු මෙන් සේවයට බැඳුණු එතුමා කලක් එහි නියෝජ්‍ය කර්තෘ වශයෙන්ද සේවය කොට 1959 දී ප්‍රධාන කර්තෘවරයා බවට පත් විය. පසළොස් වසරක් ඒ පදවිය හෙබවූ එතුමා 1974 දී විශ්‍රාම ගත්තත් භාෂාඥයකු වශයෙන් එතුමාගෙන් සිදුවුණු සේවාව ඉන් අවසන් වූයේ නැත.

පූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ මහ නාහිමිපාණන්ගේ අධීක්ෂණය යටතේ මහරගම වජිරඥාණ ධර්මායතනය මගින් සම්පාදනය කරනු ලබන 'පාලි මහා අකාරාදියට' එතුමාගේ සේවය අවශ්‍ය විණ. අතිපූජ්‍ය පැලෑනේ වජිරඥාණ මහ නාහිමිපාණන්ගේ පා සෙවණෙහි පාලි භාෂාව උගත් එතුමාණන් ඒ සේවය ඉටු කළේ මුදල් සඳහා නොව හුදෙක් ශාස්ත්‍රෝන්නතිය තකාමය.

සිංහල අපට සිංහල - සිංහල ශබ්ද කෝෂයක් අවශ්‍ය වන්නේ කුමක් සඳහාද? එයින් පල නෙළා ගන්නෝ කවරහුද? දෙපිරිසක් ශබ්ද කෝෂ පරිශීලනය කරති. පළමු පිරිස පොදු පාඨක ලෝකයායි. දෙවැනි පිරිස විද්වත් ලෝකයායි.

පොදු පාඨකයාට ශබ්දකෝෂයක් අවශ්‍ය වන්නේ පදයක නිවැරැදි අක්ෂර වින්‍යාසයක් අර්ථයක් දැන ගැනීම පිණිසය. විද්වතුන්ට ශබ්ද කෝෂයක් අවශ්‍ය වන්නේ දුරවබෝධ පදයක අර්ථය දැනගැනීමට හෝ පදයක නිරුක්තිය හා විකාශනය ද දැන ගැනීමටය. විජේරත්න මහතාගේ අධීක්ෂණයෙන් සම්පාදිත 'සිංහල සිංහල ශබ්ද කෝෂයෙන්' මේ අවශ්‍යතා ඉටුවීදැයි මෙහි ලා විමසා බැලීම වටී.

ශබ්ද කෝෂයක ප්‍රධාන කර්තෘවරයාගේ කාර්යභාරය ක්ෂේත්‍ර කීපයකට විහිද යයි. පළමුවැන්න උපදේශනයයි. දෙවැන්න අධීක්ෂණයයි. තෙවැන්න විචක්ෂණයයි. සිවුවැන්න පරිසමාප්තියයි. 'උපදේශනය' යනු කුමක්ද? ශබ්ද කෝෂයකට අවශ්‍ය දත්ත සොයා ගැනීම පිළිබඳව උපදෙස් දීමයි. ශබ්ද කෝෂයක ඇතුළත් වන්නේ ඒ භාෂාවට අයත් පදයි. මේ පද සොයා ගන්නා ආකාරය ගැන සහකාර කතුවරුන් හෝ පර්යේෂණ සහායකවරුන් දැනුවත් කිරීම ඔහුගේ වගකීමයි.

සිංහල ශබ්ද කෝෂයක ඇතුළත් වන පද ලබා ගැනීමට මූලාශ්‍ර හතරක් ඇත. පළමුවැන්න 'සෙල් ලිපි' හා 'සීගිරි කුරුටු ගී' වැනි අභිලේඛනයි. දෙවැන්න 'අමාවතුර' හා 'කව්සිළුමිණ' වැනි සම්භාව්‍ය සිංහල සාහිත්‍යයි. තෙවැන්න නවකතා, කෙටිකතා නාට්‍ය ආදී වූ කලා නිර්මාණත් විද්‍යා ශාස්ත්‍ර ආදියත් ඇතුළත් සමකාලීන සිංහල සාහිත්‍යයයි. සිවුවැන්න ග්‍රන්ථ ව්‍යවහාරයෙන් ඈත් වූ කටවහර හෝ ජන වහරයි.

මේ අතුරින් වඩාත් දුෂ්කර වන්නේ ජන වහරෙහි එන තොරතුරු එක්රැස් කොට ගැනීමයි. ආරම්භයෙහිදී මේ තොරතුරු ලබාගැනීම ඉතා දුෂ්කර වූයේ ඒවා කිසි තැනක ග්‍රන්ථාරූඪ කොට නොතිබුණු හෙයිනි. එහෙත් දැන් ඒ කාර්යය පහසු වී ඇත්තේ සිංහල ජන වහර ගැන පොත්පත් නිරන්තරයෙන් පළවන හෙයිනි. මේ අලුත් පොත් පරිශීලනය කිරීමේ අවස්ථාව ශබ්දකෝෂයේ සහකාර කතුවරුන්ට සලසාදීම ප්‍රධාන කර්තෘවරයාගේ වගකීමයි.

ප්‍රධාන කර්තෘවරයාගේ දෙවැනි වගකීම වන්නේ මේ දත්ත තෝරා බේරා ගන්නා ආකාරය පිළිබඳ උපදෙස් දෙමින් ඒ නිසි අයුරින් ඉටු වේ දැයි අධීක්ෂණය කිරීමයි. පද තෝරා බේරා ගැනීම සඳහා භාෂාවේ අංගෝපාංග පිළිබඳ විචක්ෂණයක් අවශ්‍ය වේ. ඒ පද 'නාම පද' ද 'ක්‍රියා පද' ද එසේ නැතහොත් 'සරල පද' ද 'සමාස පද' ද යනු විසින් පැහැදිලිව හඳුනා ගැනීමට සහකාර කතුවරුන් පුරුදු පුහුණු කිරීම ඔහුගේ වගකීමයි.

ප්‍රධාන කර්තෘගේ අවසාන වගකීම වන්නේ මුද්‍රණයට සුදුසු පිටපතක් සකස් කොට භාරදීමයි. එහි ශෝධ්‍ය පත්‍ර බැලීමාදියෙහි අවසාන වගකීමද ඔහු සතුය. එහි ඇති 'මුද්‍රණ දෝෂ', 'ප්‍රමාදයෙන් සිදුවූවක්' යැයි කියා නිදහස් වීමට ඔහුට පුළුවන් කමක් නැත.

ජීවමාන භාෂාවක ව්‍යවහාරය කලින් කලට වෙනස් වන්නකි. එබැවින් ජීවමාන භාෂාවක් අරබයා පරිසමාප්ත ශබ්ද කෝෂයක් සම්පාදනය කිරීම අපහසුය. අලුත් අලුත් පද භාෂාවට එක් වෙයි. පදවලට අලුත් අලුත් තේරුම් ලැබෙයි. එබැවින් ශබ්දකෝෂ කාර්යාලයේ වගකීම විය යුත්තේ මේ වෙනස්කම් සහිත තොරතුරු කලින් කලට පාඨකයන් අතට පත් කිරීමයි.

යට කී සිව් වැදෑරුම් කරුණු අතින් සලකා බලන විට විජේරත්න මහතා සිය වගකීම මැනවින් ඉටුකොට ඇති බව පෙනේ. එතුමා නැවැත්වූ තැන් සිට යාවත්කාලීන කිරීම දැන් අපට පැවරී ඇති වගකීමයි. මේ සඳහා ඔබගේ අවධානයට හසුවිය යුතු කරුණු කීපයක් ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එක් නිදසුනක් හැටියට 'කිරි' යන සරල පදය ගනිමු. 'සිංහල ශබ්දකෝෂයෙහි' 6 වැනි කාණ්ඩය හෙවත් 26 වැනි භාගයෙහි මේ පදය ඇතුළත් වේ. (1982 මුද්‍රණය) එහි 2762 පිටුවෙහි සිට 2781 දක්වා පිටු 19 ක් පුරා ඒ පදය හා සම්බන්ධ ව්‍යවහාර 275 ක් පමණ ඇතුළත් වේ. මේ අතුරින් සමහරක් 'කිරි අම්මා, කිරි කෝඩු, කිරි ඉබ්බා, කිරි ගොට්ට, කිරි සයුර' වැනි 'සමාස නාම' ද තවත් සමහරක් 'කිරි උතුරවනවා, කිරි එරෙනවා, කිරි වරනවා' වැනි 'සමාස ක්‍රියා' ද වේ. එසේ වුවත් මෙහි අවශ්‍යයෙන්ම ඇතුළත් විය යුතු පද කීපයක් මඟහැරී ඇති බව පෙනේ. එකක් 'කිරි පැණි' යන සමාසයයි. සිංහල අපට 'කිරි පැණි' යනු හුදෙක් සමාසයක් පමණක්ද නොවේ. එහි රූඪී අර්ථයක්ද ඇතුළත් වන හෙයිනි. ඒ දෙන්නා 'කිරියි පැණියි වගේ' යැයි කියන විට මෙනි. තව එකක් 'කිරි කොටේ' යන්න යි. මෙය උඩරැටියන් කුඩා දරුවන්ට ආදරයෙන් ඇමතීම සඳහා යොදන්නකි. මොහාන් රාජ් මඩවල මහතා ලියූ 'මාගම් සෝලිය' නමැති නවකතාවේ 89 වැනි පිටුවේ මෙසේ සඳහන් වේ.

"මෙහෙ වරෙං... මයෙ කිරි කොටේ... ඔහොම බඩගින්නෙ ඉඳල හරි යනවද"

මඩවල මහතා මේ නවකතාව ලියුවේ 2012 දී බව ඇත්තය. එහෙත් එය 'උඩරට සිංහලය' යනුවෙන් අදට දශකයකට පමණ උඩදී මා පළකළ පොතේ පමණක් නොව සිංහල ජන වහර අළලා මා ලියූ බොහෝ පොත්වල ඇතුළත් වෙතත් සිංහල ශබ්ද කෝෂ කාර්යාලය එය නොදැකීම කනගාටුවට කරුණකි.

වැදි ජනයා නෑ යකුන් පිදීමට 'කිරි කොරහ' වටා යමින් නටන නැටුම හැඳින්වීමට 'කිරි කොරහ නටනවා' යැයි කියති. එහෙත් ඒ ගැන මෙහි කිසිවක් සඳහන් වන්නේ නැත. වැදි ජනයා ඇහැට කනට පෙනෙන තරුණියන් හඳුන්වන්නේ 'කිරි ලෝබ කැකුළියන්' වශයෙනි.

වයඹ පළාතේ ගැමි ලියෝ යම් යම් දේ සොයා යන විට 'අපි දර පාරේ යනවා, අපි බේත් පාරේ යනවා' යැයි කීමට පුරුදු වී සිටිති. ඔවුන් 'කිරි පාරේ යනවා' යැයි කියමින් යන්නේ කිරි සොයාගෙනයි. එහෙත් මේ ගැන කිසිදු සඳහනක් සිංහල ශබ්දකෝෂයෙහි නොඑයි.

මෙහි 'කිරිපණුගාය' හා 'කිරිපණු රෝගය' යන

**38 වන පිටුව බලන්න**

# Melodies From the Meadows



## ඡන්ද දායකයාගේ සාගත කවි

චීන පටස් පුපුරනවා පොළොව    දනී
දීන කමට ගුටි කනවා අහස    දනී
හීන කකා දිය බොනවා මුහුද    දනී
දාන දාන ඇම ගිල්ලා උගුර    දනී

වෙලක මහිම බල ඉපනැලි    පිරීලා
උලක මහිම බල පපුවෙම    ඇනීලා
ගලක මහිම බල ඔළුවෙම    වැදීලා
වලක මහිම බල දහවල්    වැටීලා

සීරුව බලා අදිනා මරුවැල්    බොහොම
මාරුව බලා පය ඔසවන්නේ    කොහොම
වාරුව නැතුව බෝ දුර යන්නෙද    මෙහෙම
පාරුව පදින්නේ මකරෙට දෝ    ඔහොම

මුණු දමාගෙන බණ දෙසනා    පැටියා
තල්ල සුදුයි හොම්බේ දිග දළ    කැටියා
යන එන හැම තැනම මඟ රැකගෙන    හිටියා
මිනී කකා හංකිති කවනා    පැටියා

වයිර ගොනා දණ ගහලා අනින    කොට
මයිල ගොනා ඇන්නෙම මහ    බඩවැලට
දොයිය බබෝ කියමින් නළවන    කලට
බයිල අසා වලිගය නටවමු    පිනට

ඇලෙව්වට රූප තරඟෙට    ඔට්ටුවට
බොලව් යළිත් සැරසෙන්නේ    වෙට්ටුවට
කෙලෙව්වට පසුත් සන්තක    සොච්චමට
ඉලව්වටද නියවන්නේ    ඔච්චමට

**කුමාර හෙට්ටිආරච්චි**

## සුනාමි නඩුවේ මුහුදේ සාක්ෂිය

විපතට පත් සැවොම පසුවන දුක් ගින්නේ
මහ සාගරයටයි දොස් නිති පවරන්නේ
කෙළෙසද එහෙත් හරි තතු වටහා දෙන්නේ
මට සිදුවුණු හදිය මා පමණයි දන්නේ

වැතිරී නිසසලව මා සිඳු පතුල බදා
ඉන්දිය සයුරු සයනේ සිටි විටදි නිදා
සෙළවිණි පොළොව තිබු මගෙ ජල තලය රඳා
එහි කැළඹුමෙන් මම මුසපත් වුණෙමි එදා

යටි බිම් කඩක් තිබු තැනෙකින් අව තැන් වී
හිටිහැටියේම ගැස්සී ඉහළට නැංවී
ආ විට මගේ නිදි සුවයද අවසන් වී
එතැනින් තල්ලු වූයේ මා සිහි සුන් වී

ගැඹුරෙහි තරඟ වැල් බඹ ගණනකින් යට
කැළැතී ඇරඹුණෙන් දිය සුළි නැඟෙන්නට
මින් පෙර නොගිය වේගයකින් එතැන් සිට
මට සිදුවුණේ සී සී කඩ දුවන්නට

වේගෙන් එසේ යද්දී වෙරළක වැද්දී
අඩි තිහ හතළිහක් යළි ඉහළට ඇද්දී
ඒ ආ වේගෙන්ම ගොඩ බිම දිග යද්දී
අමතක කළ නෙහේ වුණු දුක්මුසු සිද්දී

මගෙ රැලි පාගමින් උනුන්ට විහළු කොට
හිරිමල් සිනා පොදි පිබිදු දෙතොල පිට
සුරතල් සිඟිත්තන් සැඟවී දියඹ යට
පත්වන අයුරු දුටුවෙමි මරු වසඟයට

සිහි විකලයෙන් මා හැසිරුණු බව දැනුණී
මින් පෙර දෙයක් මට සිදුවී නැත එවැනී
ජීවිත දහස් ගණනක් මොහොතින් නැසුණී
එය මගෙ කැමැත්තෙන් එනමුදු සිදු නොවුණී

නියදම අණින් මා යා යුතු ගමන ගියා
ඉන්නට නොහැකි විය මට ඒ අනුව නොයා
ලොවටම කියමි "මා නිවරුදිකරුය" කියා
දක්වනු මැනවි ඔබ හැම මා වෙතට දයා

**ධනපාල නිශ්ශංක**

## කවියෙකුගේ චරිත සහතිකය

ඉරෙන් සිසිලස යදින
තරුවලට පෙම් බඳින
සඳට වරදේ බැඳෙන
වැරදිකරුවා නුඹය

කඳු එක්ක හිනාවෙන
මඳනලට කන් යොමන
දොළ සමග ගී ගියන
සොඳුරු පිස්සා නුඹය

දෙනෝදාහක් මැද
හුදෙකලාවේ වෙසෙන
නිදි ලොවේ නිදි වරන
අමුතු මිනිසා නුඹය

අන්සිත් පැහැර ගෙන
තනියම කඳුළු වළඳන
සොඳුරු සොරදෙටු නුඹය
කවියා නමින් හඳුනන

**නයනසේන වන්නිනායක**

## යෑම් ඊම්

පැමිණෙන සියල්ලෝ
පැමිණ
හමුවී
වෙන්ව
නික්මෙති

වියන්න තව ඉතිරි වී ඇති
වියමනෙහි අඩු තැන් ඇතත්
යළිත් එය ඔබ අතින් නොවියෙයි
නවමු වියමන් ඇරඹෙතත්

සැඳෑ අහසේ ගිලෙන හිරු සේ
එදා හිරු කැන් මියෙන මොහොතේ
අපෙන් සමුගෙන නික්ම ගිය ඔබ
පසු ගමන් කළ මගේ දෙනෙතේ
රැඳුණු කඳුළැලි ඔබට නොපෙනිණි
මා පැමිණි දා ඔබේ මුවඟට
නැගුණු හසරැළි මා නොදුටු සේ

යළිත් එන්නට නම්
ඇවිත් හමුවන්නට නම්
නික්ම යා යුතු බව උගත්තෙමි
පැමිණ හමුවුණු සියල්ලන්

**රද්මි හඳපාන්ගොඩ**

## අහිමි හිමි සඳ

මේ නුවර දැන් මට හීතලයි
හන්තාන හුළඟට හිත දැවෙයි
හිත දවන තනිකඩකම දුකයි
මගෙ කඳුළු මැද හිමි සඳ මැවෙයි

මහවැලියෙ අතිනත ගෙන ඔහේ
අපි ආව ගිය මඟ පාළුවෙ
උඩුනුවර ගිලගත් ප්‍රේමයේ
දුක විඳිමි කළුවර වීදියේ

පුරහඳට ඉඩ නැති කළුවරේ
වැව් දියට ඇයි අපි පෙම් කළේ
තනි නැතිව හිනැහෙනා වැව් දියේ
සුර ම'හිමි සඳ කොහිද ගෙන ගියේ

නිදි යහන අද කටු අකුලකි
අපේ මැඳුර මට අමු සොහොනකි
ඉර හඳද නැතුවත් සිටියැකි
නුඹ නැතිව මට මහා ශෝකෙකී

**අතුල දිසානායක**

## ගස්වැල්

සුන්දර පරිසරය ඇති කෙරුමෙහි    සුරුවෝ
වැසි පල ගෙනෙන අගනා පින හිමි    කරුවෝ
මිනිසත් කමේ හැදියාවට මුල    පිරුවෝ
ගස් වැල් සොබාදම් මාතාවගෙ    දරුවෝ

පවතී ගසක් මුල නිතරම    තෙතමනය
ඉන් පස සරුවීම මිනිසා සතු    පිනය
ළය තුළ මවා ගතහොත් එම    යහගුණය
මානව ලොවට ඉන් වන සෙත    අපමණය

බෙහෙතක් පිණිස මිස නොසිටිය යුතු    පැකිළී
කැඩුමත් පාපයකි ගස්වල අතු    රිකිළී
කතරක් වුවොත් ගස්වැල් මිය ගොස්    හැකිලී
බිහිවනු ඇත ලොවේ ඇවිදින    ඇටසැකිලී

සිය යහපත පිණිස ඔබ බිම හෙළන    ගස
වෙනුවෙන් ගසක් ඉල්ලයි මහ පොළොවෙ    පස
වැවුවොත් තුරු ලතා යොමුකර එයට    හිස
ලෝකය අපේ සුවපත් වේ නැතුව    දොස

පාරමි දම් පුරා දිගු කාලයක්    තුළ
අවසන උතුම් නිවනෙහි රස පසක්    කළ
සම්බුදු පියාණන් මේ ලොව එළිය    කළ
බුදු වී බැබළුණෙත් මහ බෝ ගසක්    මුල

**ජයවංශ පෙරේරා**

## මිනිසා ජීවිතය සහ මරණය

මරණය දෙසට ගමනේ යන ජීවිතය
ජීවිතෙ දෙසට ගමනේ එන මරණයද
මෙදෙකින් සත්‍ය වන්නේ නිති කවරක්ද
විමසා බලනු සකියනි සැම මොහොතකම

මරණය ජීවිතය එක කාසියෙ දෙපැතී
වාගෙයි වෙනස් නොමවෙයි ඉර හඳ ලෙසිනී
එක පාරේ එකට අත්වැල් බැඳ නිතිනි
ගමන් කරති ජීවිත සහ මරණ නිති

අල්ලාගෙන දැඩිව වෙහෙසී හති දමමින්
තණ්හාවෙන් ජීවිතෙ ගැල පදවවමින්
යන කෙටි ගමන යා යුත්තේ සැහැල්ලුවෙන්
බැව් නොසිතන දනන් ලොව තුළ පොකුරු පිටින්

මිනිසත් බව ලැබුවෙ පෙර කළ පින් හින්දයි
'සසර දුක් ගමන නවතනු' බුදු වදනයි
දුකෙන් මිදෙන මඟ ඔස්සේ යා යුතුමයි
'අප්‍රමාදි වෙනු මිනිසුනි' දිවිය කෙටියි

**කේ. ඩබ්ලිව්. සිරිසේන**

## පරිණාමය

එදා ඔබේ
නුවන් සඟල
මැණික් කැට දෙකක්
මෙදා උඹේ
ඇස් ගෙඩි දෙක
T 56 ක් !

**කරුණාරත්න ජයතිලක**

## සතුට

මලක්
පෙති විදා
හිනැහෙයි
නොසතුටු සිත්
සතුටු
කරනු පිණිස

**කපිල ජයවිලාල් හේරත්**


Andro Cakes
මංගල කේක්
ලාංකේය මංගල කේක්
මංගල හා ප්‍රිය සම්භාෂණ සඳහා තනි තනි අතුරුපස (Individual Desserts)
ඉල්ලීම අනුව නිර්මිත කේක් වර්ග (Custom Cakes)
කප් කේක් / කේක් පොප් / මැකරොන්
ප්‍රනීත ආහාර මේස (Sweet Tables)
ඩබල් චොක්ලට් ෆොන්ටන්
චොක්ලට් වර්ග
සජීවී ද්‍රාවය නයිට්‍රජන් අයිස් ක්‍රීම් (Liquid nitrogen Icecream (Live)
සජීවී උදෑසන ආහාර මේස
ලාංකේය ක්‍රමයට බත් සහ ව්‍යංජන
සැන්ඩ්විච් වර්ග
ලාංකේය බේකරි කෑම වර්ග (Pastries)
පලතුරු, චොක්ලට්, සීනිමය හා මාසිපෑන් වලින් නිර්මිත ප්‍රධාන කෑම සැරසිල්ල
(Edible Carvings for centre pieces)
සඳහා විශිෂ්ඨයන්.
25ක් වසරක අත්දැකීම් හා සහජ කුසලතාවෙන් සපිරි, ඔලිම්පික් රන් පදක්කම් ලාබී,
සූපන ආචාර්ය ශිල්පී
දිමු පෙරේරා
අතින් හැඩගැන්වෙන සම්මානනීය ආහාර සැරසිලි,
අප ඇන්ඩ්‍රෝ කේක් ආයතනයෙන් එළි දැක්වේ.
අප හා සම්බන්ධ වීමෙන් ඔබගේ විළග විශේෂ උත්සවය සඳහා,
අපගේ විශ්වාසනීය උපදෙස් නොමිලේ ලබා ගත හැක.
Andro Cakes
www.androcakes.ca
https://www.facebook.com/chefdimu
TP: 416-857-4566
order@androcakes.ca
ටොරොන්ටෝ හා තදාසන්න ප්‍රදේශ (GTA), ඇජැක්ස්,
බර්ලිංටන්, ඕක්විල් හා මුස්කොකා දක්වා සේවා සැපයේ.
අවම ඇනවුම දස දෙනෙකු සඳහා.
තම නිවසටම ප්‍රවාහනය කෙරේ.


AirCare Plus
ONE CALL WILL FIX IT ALL
Sales | Service | Repair | Installation
Line: 416.605.8300
Email: ashokdon@live.ca
Heating & Air Conditioning
FAST, AFFORDABLE SERVICE
Ashok Hettege
Licensed H.V.A.C Technician
Furnace
Gas Piping
Hot Water Tank
Tankless Water Heater
Humidifier
Air Cleaner
Air Conditioning
Dishwasher & Fridge Water Line Installation
Gas Stove and Gas Dryer Installation
ග්‍රීෂ්ම සමය නිමා විය.
ඔබේ නිවසේ තාපන යන්ත්‍රයේ (furnace)
නිසි ක්‍රියාකාරිත්වය පිළිබඳ
සැලකිලිමත් වන්න.
එහි අත්‍යවශ්‍ය නඩත්තු කඩයුතු අලුත්වැඩියා
කටයුතු හා අලුතින් සවිකිරීම් සඳහා විමසන්න.
A MEMBER OF
CanLanka
BUSINESS ASSOCIATION
2004-2014
10
CELEBRATING
10 YEARS IN BUSINESS
SATISFACTION 100% GUARANTEE



# අංශභාගය රෝගයක් නොවේ

■ උපාලි ද සේරම්

හෘදයාබාධයක් (Heart Stroke) ඇතිවීම සම්බන්ධව අප බොහෝ දෙනා තුළ යම් දැනුමක් තිබේ. නමුත් ආඝාතය (Brain Stroke) සම්බන්ධව අප තුළ ඇති දැනුම කෙතරම්ද? ආඝාතය රෝගයට වඩා බොහෝ දෙනාට අංශභාගය පිළිබඳව යම් දැනුමක් ඇත. එය ඇති වන්නේ රුධිර නාළයක සිදුවන රුධිර කැටියක් සිරවීම නිසා මොළයට රුධිරය සැපයුම අඩාල වීමෙන් බවත් ඉන් ස්නායු අඩපණ වී අංශභාගය ඇතිවන බවත් අප තුළ යම් දැනුමක් ඇත.

එනිසා අංශභාගය යනු රෝගයක් ලෙස හැඳින්වීමටද අපි පුරුදුව සිටින්නෙමු. නමුත් අංශභාගය යනු රෝගයක් නොව රෝග ලක්ෂණයක් කියා පැවසුවහොත් බොහෝ දෙනා එය පිළිනොගනු ඇත.

ඇත්තටම අංශභාගය යනු ආඝාතය රෝගයේ ප්‍රධාන රෝග ලක්ෂණයකි.

ආඝාතය ලෙසින් හඳුන්වන්නේ මොළයේ එක් ප්‍රදේශයකට රුධිර සැපයුම අඩාළ වීම නිසා මොළයේ ක්‍රියාකාරීත්වයේ ඇතිවන හදිසි වෙනස්වීමකටය. මෙය හදිසියේ ඇතිවන තත්ත්වයකි. හෘදයාබාධයකදී මෙන් වේදනාවක් ඇති නොවේ. සිදුවන්නේ සිරුරේ ක්‍රියාකාරීත්වය අඩපණවීමය. එවිට මුහුණේ පැත්තක් පණ නැති වීම, කට පැත්තකට ඇද වීම, එක් අතක් හෝ කකුලක් පණ නැති වීම, කතාවේ වෙනසක් ඇති වෙමින් කතා කරන විට පැටලෙන ස්වභාවයක් ඇති වීම ආදිය මතුවේ.

මොළයට හදිසියේ රුධිර සැපයුම අඩාළ වීමට බලපාන ප්‍රධාන හේතු දෙක ලෙස රුධිර නාළ අවහිරවීම (Ischaemic Stroke) සහ රුධිර නාළ පිපිරී මොළය තුළට ලේ ගැලීම (Haemorr hagic Stroke) හඳුනාගෙන ඇත.

මෙලෙස මොළයට රුධිරය සැපයුම අඩාල වූ විට මොළයේ ක්‍රියාකාරීත්වයට අවශ්‍ය ඔක්සිජන් සහ අනෙකුත් පෝෂ්‍ය පදාර්ථ නොලැබේ. එවිට මොළයේ රුධිර සැපයුම අඩාළ වූ ප්‍රදේශයේ ස්නායු සෛල මිය යයි.

මෙලෙස මොළයේ ස්නායු සෛල විනාශ වූ ප්‍රදේශය අනුව රෝග ලක්ෂණ මතුවේ.

## අංශභාගය

අංශභාගය ලෙසින් හඳුන්වන්නේ මොළයේ ස්නායු සෛල විනාශ වීම නිසා ඇතිවන ශරීරයේ ක්‍රියාකාරීත්වය ස්ථිරව හෝ තාවකාලිකව අඩපණ වීමය. එනම් අතක් හෝ පාදයක ක්‍රියාකාරීත්වය අඩපණ වීම හෝ ශරීරයේ එක්පැත්තක මතු වූ ක්‍රියාකාරීත්වයේ අඩපණ වීමටය.

මෙය ආඝාතයේ ප්‍රධාන රෝග ලක්ෂණයකි. මෙම අඩපණ වීම තාවකාලිකව හෝ ස්ථිරව පැවැතිය හැකිය.

## ආඝාතය වළක්වා ගන්නේ කෙසේද?

ලෝකයේ මරණයට පත්වන රෝග අතුරින් පළමු ස්ථානයේ පවතින්නේ හෘදයාබාධය. දෙවැනි ස්ථානයේ සිටින්නේ ආඝාතයයි. එය ලෝකය පිළිබඳව සලකා බැලූ විට සෑම තත්පර හතකට වරක් ආඝාතය රෝගය නිසා පුද්ගලයකු මියයන බව අනාවරණය වී තිබේ.

මෙම තත්ත්වය වළක්වා ගැනීමට නම් අප දියවැඩියාව, අධි රුධිර පීඩනය සහ කොලෙස්ටරෝල් මට්ටම වැඩි වීම පාලනය කරගත යුතුය.

පෝෂ්‍යදායී ආහාර වේලක් දිනපතා ගත යුතුයි. දිනකට පැය භාගයක්වත් ව්‍යායාම්වල නිරත විය යුතුය. ශරීරයේ බර පාලනය කරගත යුතුය. එනම් ශරීර ස්කන්ධ අගය 23-24 අගයක තබා ගත යුතුය. දුම්පානය සම්පූර්ණයෙන්ම නතර කළ යුතුය.

## ආඝාතයට ගොදුරු විය හැකි අය

ආඝාතය රෝගය ඇතිවීමේ අවදානම් සහිත පුද්ගලයන් ලෙස හඳුන්වන්නේ වයස අවුරුදු 40 ඉක්ම වූවන්ය. මෙම වයසේදී අධිරුධිර පීඩනය, දිය වැඩියාව, කොලෙස්ටරෝල් අධික බව ආදී බෝ නොවන ගණයේ රෝග මතුවීමේ ඉඩකඩ වැඩිවීම ඊට ප්‍රධාන හේතුවය.

විශේෂයෙන්ම පිරිමි පුද්ගලයනට ආඝාතය ඇති වීමට ඇති අවස්ථාව කාන්තාවන්ට වඩා වැඩිය.

එබැවින් තම රුධිර පීඩනය 120/80 හෝ 130/80 අගයක පවත්වා ගැනීමට අවධානය යොමු කළ යුතුය.

දිනකට පුද්ගලයකු ආහාරයට ගනු ලබන ලුණු ප්‍රමාණය තේ හැඳි 1 1/2 ට වඩා වැඩි නොවිය යුතුය.

අධි රුධිර පීඩනයට ඖෂධ ගන්නේ නම් එය වෛද්‍ය උපදෙස් මත අඛණ්ඩව ගත යුතු අතර වෛද්‍ය උපදෙස්වලින් තොරව එම ඖෂධ මාත්‍රාව වෙනස් නොකළ යුතුය.

ඇතැම් දෙනා අධි රුධිර පීඩනය සඳහා ගත යුතු ඖෂධ ගනු ලබන්නේ අධි රුධිර පීඩනය මතු වූ විටදීය. එය වැරදි පුරුද්දකි. අධි රුධිර පීඩනය ඇති පුද්ගලයන් නිසි වෛද්‍ය උපදෙස් මත දිනපතා අදාළ ඖෂධය නිසි මාත්‍රාවට අනුව ගත යුතුය.

රුධිර පීඩනය, දියවැඩියාව, පරීක්ෂණයකදී පමණක් ආහාර පාන ගැනීම පාලනයකින් යුතුව සිදුකර තම රුධිර පීඩන, දියවැඩියා වාර්තාවන්හි කිසිදු ගැටලුවක් නැතැයි කියා ඇතැම් දෙනා සතුටු වෙති. එසේ සතුටු වෙමින් අනෙක් දිනවල පාලනයකින් තොරව ආහාර පාන ගනිති. මෙය ඉතා භයානක තත්ත්වයකි. අදාළ පරීක්ෂණයන් සඳහා පමණක් නොව අනෙකුත් දිනවලදී ද ආහාර පාන පාලනයකින් යුක්තව ගැනීමට හුරුවිය යුතුය. එසේ නොවුණහොත් ක්ෂණිකව ඇතිවන ආඝාත තත්ත්වයකින් අංශභාගයට ගොදුරුව සදාකාලික ආබාධිත තත්ත්වයට පත්වීම හෝ ක්ෂණික මරණයට ලක්වීමට ඉඩ තිබේ.

## ආඝාත රෝගියකු රෝහල් ගත කිරීම

යම් පුද්ගලයකු එකවරම ශරීරය අඩපණ වූ විට සිනහසෙන්න උත්සාහ කරන විට කට ඇදවෙයි නම්, අත ඔසවන්න හදන විට එවිට අත පණ නැතිවේ නම්, කතා කරන්න වෙර දරන විට වචන පටලැවේ නම් වහාම එම පුද්ගලයාව ළඟම ඇති ප්‍රධාන රෝහලකට රැගෙන යා යුතුය. මෙය ආඝාත රෝග තත්ත්වය විය හැකිය.

ආඝාත රෝගියකු පැය තුනක් ඇතුළත ඉතා ඉක්මනින් රෝහල්ගත කළහොත් නිසි වෛද්‍ය ප්‍රතිකාර ලබා දී මතුවිය හැකි දරුණු ආබාධ වළක්වා ගත හැකිය.

**ස්නායු රෝග පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන් වන උදය රණවක, එම්. ටී. එම්. රිෆ්සි සහ පද්මා ගුණරත්න යන මහත්ම මහත්මීන් ආඝාතය සම්බන්ධව පැවැත්වූ දේශන ඇසුරින් මෙම ලිපිය සකස්කර ඇත.**

# යාවත්කාලීන විය...

34 වන පිටුවෙන්

වහර 2771 පිටුවෙහි විවරණය කෙරේ. මෙහි 'කිරිපණු ගාය' විවරණය කරන්නේ 'කිරිපණු රෝගය' යනුවෙනි. එහෙත් 'කිරි පණු ගාය' යනු හුදෙක් රෝගයක් පමණක් නොවන බව සිංහලයෝ දනිති. සිංහලයා කිසිවෙකුගේ හැසිරීම දැක, "මූට කිරි පණු ගාය" යැයි කියන්නේ හෝ කිසිවෙකුගෙන් "මොකෝ කිරි පණු ගාය දැ" යි අසන්නේ හෝ ඔහුට වැළඳී ඇති රෝගයක් නිසා නොවේ. 'කිරි කඳුළ' යන්නද මෙහි ඇතුළත් කිරීම සුදුසු යැයි සිතෙන්නේ එහි රූඩී අර්ථයක්ද ගැබ් වන හෙයිනි. "දරුවට ඇගේ කිරි කඳුළක් නෑ" යැයි මවක කියන්නේ කවර අවස්ථාවකදැයි සිංහලයෝ දනිති. මෙහි 'කිරි කපනවා' යන වහර ඇතත් ඊට උපකාර වන 'කිරි පිහිය' ගැන සඳහනක් නැත. රබර් වත්තේ කිරි කපන අයට වෙනම 'කිරි කට්ටි' වෙන්කොට ඇත. ඒ අය ඒ කිරි ගෙන යන්නේ 'කිරි වාඩියට' යි.

'කිරි බදුල්ල' යන්නෙන් (2773) හැඟවෙන්නේ එක්තරා ගස් වර්ගයක් බව ඇත්තය. එහෙත් බදුල්ල පළාත් වැසියන් තමා උපන් බදුල්ලට ආදරයෙන් කියන්නේ 'කිරි බදුල්ල' කියා බවද අමතක කළ යුතු නොවේ.

මේ කාණ්ඩයෙහි ඇතුළත් වන්නේ 'කිරි' යන පදයෙන් ආරම්භ වන වහර පමණකි. 'කිරි' යන පදය දෙවැනි පදය හැටියට යොදා සෑදුණු සමාස නාම පද ගණනාවක්ද සිංහලයෙහි ඇත. එබැවින් පහත දැක්වෙන වහරද මේ ශබ්ද කෝෂයෙහි නිසි තැන ඇතුළත් වී තිබේදැයි සොයා බැලීම වටී.

එළ කිරි-එළු කිරි-කජු කිරි කොල්ලා-කොස් කිරි
ටින් කිරි-තන කිරි-දිය කිරි-දී කිරි
පිටි කිරි-පොල් කිරි-මදු කිරි-මව් කිරි
මිටි කිරි-මී කිරි-මුදවපු කිරි-රන් කිරි කටගානවා

අනාගතයෙහිදී සිංහල ශබ්දකෝෂ කර්තෘවරුන්ගේ අවධානයට යොමුවිය යුතු තවත් කරුණක්ද ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි. එනම් ස්ථාන නාම හා පුද්ගල නාම ශබ්ද කෝෂයට ඇතුළත් කරනවාද යන කරුණයි. මෙය ප්‍රතිපත්තිමය තීරණයක් හෙයින් ඒ ගැන සිතීමට මෙය හොඳ අවස්ථාවකි.

'ස්ථාන නාම' හා 'පුද්ගල නාම' යන දෙවර්ගයම ඇතුළත් වන්නේ 'සංඥා නාම පද' ගණයටයි. බොහෝ ස්ථාන නාමවලට අර්ථ කථනයක් දීම අපහසු නිසා ඒ නාම ශබ්දකෝෂයෙන් ඉවත් කිරීමට ගත් තීරණයෙහි වරදක් නොපෙනේ. එසේ වුවද සිංහල උරුමය සොයා යන පර්යේෂකයකුට මේ සංඥා නාමපදවලින් සැලසෙන සේවය ඉමහත්ය.

නැවත 'කිරි' යන පදයම ගනිමු. 'කිරි' යන පදය සහිත ස්ථාන නාම රාශියක්ද පුද්ගල නාම රාශියක්ද ඇත. මේ ස්ථාන නාම බොහොමයක් මේ රටේම උපන් 'නිෂ්පන්න පද' බව පෙනේ. පුද්ගල නාම බොහොමයක්ද දැන් ව්‍යවහාරයෙන් මැකී යමින් පවතී.

දැන් පළ වී ඇති කාණ්ඩයෙහි ඇත්තේ එකම එක ස්ථාන නාමයක් පමණකි. ඒ 'කිරිගල්පොත්ත' යි. 'කිරිගල්පොත්ත' ඇතුළත් කළාක් මෙන් පහත දැක්වෙන ස්ථාන නාමද ඇතුළත් කොට ඒවා ස්ථාන නාම යැයි සඳහන් කිරීම වුවත් ප්‍රයෝජනවත්ය.

කිරි ඇල්ල-කිරි කිත්ත-කිරි දෙන-කිරිබත් කුඹුර
කිරි බත් ගොඩ-කිරි බමුණ-කිරි මැටියාන-කිරි වන්දල
කිරි වල්ලා පිටිය-කිරි වවුල-කිරි වාන-කිරි හපුව

දැන් පළවී ඇති කාණ්ඩයෙහි සිංහල අපටම උරුම වූ පුද්ගල නාම ඇතුළත් නොවේ. එහෙත් පහත දැක්වෙන වර්ගයේ නාමද 'පුද්ගල නාම' යැයි සඳහන් කොට ඇතුළත් කළහොත් අනාගතයෙහිදී සිංහල උරුමය ගැන සොයා බලන කෙනෙකුට එය පලදායී වනු ඇත.

කිරි උක්කුවා-කිරි එතනා-කිරි ගණිතයා-කිරි බයියා
කිරි බණ්ඩා-කිරි මහත්තයා- කිරි මැණිකා-කිරි මැණිකේ
කිරි සාදුවා-කිරි හටනා-කිරි හොටී-කිරි හොඳා

ආචාර්ය විජේරත්න මහතා මහත් ඇප කැපවීමෙන් අප අතට පත් කළ සිංහල ශබ්ද කෝෂය සිංහල ජාතියේ අභිමානයට හේතුවන පරිදි යාවත්කාලීන කිරීම අප සතු වගකීමයි.

ඔබ අත්දකින ශුභ අශුභ, සම්පත් විපත්, යස අයස, ඔබට පෙනෙන සාධක සේම නොපෙනෙන ග්‍රහ, භූමි, ස්ථාන දෝෂ මෙන්ම පෙර කුසල්, අකුසල්, සංසාර ගනුදෙනු, කර්ම ශක්තීන් මත පදනම් වූ විවිධ සාධකවල ප්‍රතිඵලයක් වේ. මේ සියලු දේ ඔබේ ජිවිතයේ සාර්ථකත්වයට, යහපත් සෞඛ්‍යයට, ජිවන ගමන් මගට බලපාන අයුරු දැනගැනීමට අවශ්‍යද?

එම බලපෑම් පරදවා ආධ්‍යාත්මික දුර දැක්මක් ඇතිව වේද ජ්‍යොතිෂ ඇසුරින් අනාගතය සැලසුම් කරගැනීමට සියලුදෙනාගේ යහපත ශාන්තිය උදෙසා මාගේ සේවාවන් කැප වී ඇත.

තවද මාගේ සියලු ජ්‍යොතිෂ සම්බන්ධ වැඩකටයුතු පාරම්පරික කේන්ද්‍ර බැලීමෙන් ඔබ්බට දියුණු කරගත් ආධ්‍යාත්මික බල ශක්තීන් මත පදනම් වී ඇත.

**මාගේ සේවාවන්**

කේන්ද්‍ර සෑදීම, පලාඵල කථනය, සියලු නැකත් සෑදීම, පොරොන්දම් පරීක්ෂාව, වාස්තු බැලීම, සෙත් කවි කියවීම, බෝධි පූජා තැබීම ඇතුළු බුදුගුණ සම්බන්ධ සියලු සෙත් කටයුතු සිදුකිරීම.

**තිනේත්‍රී - Thinethri**

**Spiritual Vedic Astrology Service**

SL Mobile +94 77 531 4844 (Viber)
US +1 347 384 6465
E-mail - thinethria@gmail.com
Skype - thinethri



**Jayasinghe**
Law Office

Immigration Law · Real Estate Law · Family Law · Wills & Estates Law · Power of Attorney · Notarizations

**Jayasinghe R. Arachchige.MCL.**
BARRISTER, SOLICITOR & NOTARY PUBLIC
ATTORNEY-AT-LAW, SRI LANKA

Office : 647 341 1540
Cell : 647 995 3996
Fax : 647 490 5132

795 Birchmount Road
Toronto ON, M1K 1R7
jayasinghera@gmail.com

For Sri Lankan Student Visa & PR Applications
Please contact:
19/2 Hekitta Road, Hendala, Wattala, Srilanka.
+94 112933996
chinthajanaki@yahoo.com

The Power Tools To Sell Your Property

Renovation Cost upto $4000.00 – Free
Advertising Signage & Photos – Free
Lawyer's Fee – Free
Market Evaluation & Home Inspection – Free
Home Staging – Free
Open Houses Showing – Free

**Some conditions apply.This promotion can be discontinued without prior notice.Not intended to solicit buyers or sellers currently under contract.

Save money when selling your home!

Selling real estate is what I do. I can help you save thousands when listing your property. You will pay less and get a full service listing with no hidden fees. My home marketing strategy will attract the greatest number of potential buyers and help you sell quickly and hassle-free for the best value.



**Nishantha**
Donsiyambalapitiyage
Real Estate Sales Representative

Mobile: 416 417 0763
Email: nishan.don@gmail.com

Mississauga Office: 350 Burnhamthrope Dr. W. Unit 127
Scarborough Office:2250 Markham Road Unit #3 Scarbotough ON M1B2W4

Century 21
INNOVATIVE REALTY INC




■ **පරිවර්තනය - ජෝ.සෙනෙවිරත්න**

මිනිසා යනු දන්නාව සහ නොදන්නාව අතර පාලමක්. දන්නාවට සීමා වී සිටින්නා මෝඩයෙක්. නොදන්නාව සොයා යෑමයි ප්‍රඥාවේ ආරම්භය. නොදන්නාව සමග ඒකත්වයට පත්වීමයි බුද්ධත්වය.

මතක තබාගන්න, මිනිසා තවමත් සත්වයෙක් නොවෙයි. ඔහු මග එමින් සිටින්නෙක්. ඔහුට තවමත් ගෙදරක් නැහැ. තමන් ගෙදරයි සිටින්නේ කියලා හිතන්නා මෝඩයෙක්. ඒ ඔහු සෙවීම නතර කරන නිසා. එවිට සෙවීම තවදුරටත් එතැන නැති නිසා ඔබ සෙවීම නතර කළ මොහොතේම ඔබ එක තැන සිටින පොකුණක් බවට පත්වෙනවා. ඔබ කුණු වීම ඇරඹෙනවා. එවිට ඔබ මැරෙනවා පමණයි. එවිට ඔබ කොහොමටත් ජීවත් වෙන්නේ නැහැ.

ජීවිතය තිබෙන්නේ ගැලීමක. ජීවිතය කියන්නේ ගඟක්ව පසුවීම. මොකද ගඟක් පමණයි සාගරයට ළඟාවෙන්නේ. ඔබ එකතැන රැඳුණු පොකුණක් බවට පත්වෙනවා නම්, එහෙනම් ඔබ කොහේවත් යන්නේ නැහැ. එහෙනම් ඔබ ඇත්තෙන්ම ජීවත් වෙනවා නොවෙයි. මෝඩයා ඇත්තෙන්ම ජීවත් වෙන්නේ නැහැ. ඔහු කරන්නේ ඒ බව අඟවනවා පමණයි. ඔහු ආදරය කරන්නේ නැහැ ඔහු කරන්නේ ආදරය කරන බව ඇඟවීම පමණයි.

නුවණක්කාරයා ජීවත් වෙයි. ආදරය කරයි ප්‍රඥාවන්තයා විමර්ශනය කරයි. සොයයි. ප්‍රඥාවන්තයා සූදානම්. හැම විටම සූදානම්. මින් පෙර නොගිය මුහුදකට යන්න ප්‍රඥාවන්තයා අවදානම ගනී. මෝඩයා බියට පත් වෙයි.

බුද්ධ 'මෝඩයා' කියන වචනය උපයෝගි කරගන්නා විට ඔබට සිදුවෙනවා ඒ වචනයේ මේ සියලු අර්ථ මතක තබාගන්න. බුද්ධට අනුව 'මෝඩයා' යන මනසේ ජීවත් වන පුද්ගලයා, නමුත් තොරතුරු මත ජීවත් වෙන්නාට, දැනුම මත යැපෙන්නාට, ප්‍රඥාවේ කිසිවක් රස නොබලපු තැනැත්තාට, ණයට ගත්තු ජීවිතයක් ගත කරන්නාට, අනුකරණය කරන්නාට, නමුත් ඔහුගේම පැවැත්ම තුළින් පැන නගින කිසිවක් ගැන මොනම දෙයක්වත් දන්නේ නැති කෙනෙකුටයි 'මෝඩයා' කියන්නේ.

'මෝඩයා' කියද්දී අදහස් කරන්නේ ශුද්ධ ලියවිලි ඉතාමත් කිට්ටුවෙන් ඇසුරු කරන්නෙක් ගැන නමුත් එක මොහොතක්වත් සත්‍ය රස නොබලපු අය ගැනයි. ඔහු මහා විද්වතෙක් වෙන්නට පුළුවන්. බොහෝම උගත් ඇත්තෙන්ම මෝඩයෝ විද්වත්තු. ඔවුන් එහෙම වෙන්න ඕනේ, මොකද වචන මගින් ඉගෙන ගැනීම තුළින් පමණයි න්‍යායයන් දර්ශන මගින් තමයි ඔවුන්ගේ අභ්‍යන්තර නොදන්නාකම සඟවා ගන්නේ. ඔවුන්ගේ හිස් බව සඟවා ගන්නේත්. ඔවුන්ට විශ්වාස කරන්නත් පුළුවන් තමනුත් දැනුමැත්තෝ කියලා.

ඔබට මෝඩයෝ සොයා ගන්න ඕනේ නම්, විශ්වවිද්‍යාලවලට යන්න. අන්ත මුග්ධභාවයේ නොදන්නාකමේ නමුත් දන්නා බව අඟවා ගත්ත ගමන්. ඔවුන් සත්තකින්ම දන්නවා අනෙක් අය මොනවද කීවේ කියලා. නමුත් ඒක නෙමෙයි හැබෑ දන්නාකම. අන්ධ මිනිහෙක් ආලෝකය ගැන ඇති සියලු තොරතුරු එක්රැස් කරගන්න පුළුවන්. නමුත් ඔහු තවමත් අන්ධයෙක්ව පවතීවි. ඔහුට ආලෝකය ගැන කතා කරන්න පුළුවන්. ආලෝක විෂය ගැන අධ්‍යයනවලින් නිබන්ධනයක් ලියන්නත් පුළුවන්. නමුත් තාමත් ඔහු අන්ධ මිනිසෙක්ව සිටීවි. ඔහු ආලෝකය ගැන වූ තොරතුරුවලින් අනෙක් අයව රවටනවා පමණක් නොවෙයි, එය ඔහුවත් රවටාවි. ඔහු හිතන්න ගන්න පුළුවන් ඔහු ආලෝකය ගැන දන්නා තැනැත්තෙක්ය ඔහු තවදුරටත් අන්ධ නැත කියලා.

බුද්ධ 'මෝඩයා' කියන වචනය යොදා ගනිද්දී ඔහු එයින් අදහස් කරන්නේ නිකම්ම මොකවත් නොදන්නා කියන එක නෙවෙයි, මොකද නොදන්නා තැනැත්තා දැනුවත් නම් තමන්ගේ නොදන්නා කම ගැන, ඔහු මෝඩයෙක් නෙවෙයි. එහිදී වඩාත් හැකියාව තිබෙන්නේ නොදන්නා තැනැත්තාට තමන් නොදන්නා බව දැනගන්න, ඊනියා උගත් අයටත් වැඩිය. ඔවුන්ගේ මමත්වය ඒ තරමට ඉදිමිලා. එනිසා ඔවුන්ට සිය තත්ත්වය දැකීම දුෂ්කරයි.

සොක්‍රටීස් මේ දෙයම තමයි ඇතන්ස් නුවර ඉඳගෙන කරන්න උත්සාහ කළේ. ඔහු උත්සාහ කළේ මේ උගත් මෝඩයා දැනුවත් කරන්න, ඔවුන්ගේ දැනුම ව්‍යාජයි, ඔවුන් ඇත්තෙන්ම මෝඩයෝය, දැනුමැත්තන් ලෙසම පෙනී සිටින්නන්ය, ඔවුන් කුහකයන්ය යන වග, ස්වභාවයෙන්ම සියලුම මහාචාර්යවරු, සියලුම දාර්ශනිකයෝ සහ සියලුම ඊනියා චින්තකයෝ ඔවුන්ගෙන් මුළු ඇතන්ස් නුවර පිරිලයි තිබුණේ. ඒ දවස්වල ඇතන්ස් තමයි දැනුමේ අගනුවර වුණේ. හුදෙක් අද කාලයේ ඔක්ස්ෆර්ඩ් නැතිනම් කේම්බ්‍රිජ් දිහා බලන්නා වගේ මිනිස්සු පුරුදුව හිටියේ ඇතන්ස් දෙස බලන්නයි. ඒක උගත් මෝඩයන්ගෙන් පිරී ගිය නගරයක්. සොක්‍රටීස් උත්සාහ කළේ ඔවුන් මහ පොළොවට ගෙන එන්නයි. ඒක ඔවුන්ගේ දැනුම ගසා බසා දැමීමක් වුණා. එවන් ප්‍රශ්න නගන එක එක විදිහකට සරලයි. නමුත් දුෂ්කරයි. පිළිතුරු දෙන්න පහසුයි අනෙකුන්ගෙන් එකතු කර ගත්තු දැනුම පමණක් ඇත්තන්ට.

ඇතන්ස් නගරය සොක්‍රටීස් එක්ක ඉතාමත් කෝපයට පත් වුණා. ඔවුන් මේ මිනිහාට වස දුන්නා. සොක්‍රටීස් මේ මිහිමත පානැගූ ශ්‍රේෂ්ඨතම මිනිසුන් අතරින් කෙනෙක්. ඔහු කළ දෙය කර තිබෙන්නේ බොහෝ අතළොස්සක් දෙනා පමණයි. ඔහුගේ විධි ක්‍රමය මූලික විධි ක්‍රමයක්. සොක්‍රටිසියානු විධි ක්‍රමය කොහොම ක්‍රමයක්ද කියනව නම් එය මෝඩයා මෝඩයා බව හෙළිකර දමන්නක්. මෝඩයෙක් මෝඩයා හැටියට හෙළිදරව් කිරීම ඉතා අනතුරුදායකයි. මොකද ඔහු පළිගන්නා නිසා. සොක්‍රටීස්ට වහ දුන්නා. ජේසුස් කුරුසියට පත් කළා. බුද්ධ හෙළා දැකීමට භාජන කළා. මහාවීර ගල් ගසා ගම්වලින් පලවා ඇරියා.

බුද්ධ මියගිය දවසේ බුද්ධාගම රටෙන් පිටතට විසිකර දැමුවා. විද්වතුන්ට, පණ්ඩිතයන්ට, බ්‍රාහ්මණයන්ට බැහැ එය තම රටේ තියෙන්න ඉඩ අරින්න. එය ඔවුන් පමණටත් වඩා අපහසුවක් දනවනවා. එහි මූලික ප්‍රහාරය එල්ල වුණේ බමුණන්ට, උගත් මෝඩයන්ට. ස්වභාවිකවම ඔවුන් ප්‍රකෝප කරවන්නක්. ඔවුනට බැහැ බුද්ධට මුහුණ දෙන්න. ඔවුන් බලා හිටියා අවස්ථාව එළඹෙනතෙක් කෛරාටික විදිහට. බුද්ධ මියගිය විට, ඔවුන් ඔහුගේ අනුගාමිකයන් සමග සටන් ඇතිකර ගත්තා. ආලෝකය ගියාට පස්සේ, ඊළඟට ආවේ බස්සාගේ, නිශාචරයාගේ වේලාවයි. උගත් මෝඩයාගේ වේලාව යළිත් රටේ පාලනය කරන්න. එදා පටන් මේ දක්වාම ඔවුන් තමයි රට පාලනය කරමින් ඉන්නේ. ඔවුන් තවමත් බලයේ. එම මෝඩයන්මයි.

මගේ ප්‍රයත්නය මෙතැනදී සොක්‍රටීසියානු විමර්ශන නැවත ඇති කිරීමටයි. බුද්ධ මතු කළ මූලික ප්‍රශ්නය යළිත් මතු කිරීමටයි.

මෝඩයෙකුට ගුරුවරයෙක් ළඟට එන්න පුළුවන්. නමුත් ඔවුන් එයින් ප්‍රයෝජනයක් අත්කර නොගත් අය හැටියට පසුවේවි. මොකද ඔහු දකින්නේ බාහිරය පමණක් නිසා. අත්‍යවශ්‍ය දේ දකින්න ඔහුට හැකි වෙන්නේ නැහැ. ඔහුට අරටුව දකින්න හැකි වෙන්නේ නැහැ. මෙහෙටත් මෝඩයා එනවා තමයි. නමුත් ඔහු සවන් යොමන්නේ වචනවලට පමණයි. ඔහු එම වචන තමන්ගේ අදහස්වලට අනුකූලව අර්ථ දක්වාවි. ඔහු මෙහි මොනව වෙනවද කියල තමන් දන්නවා යන තෘප්තියෙන් තමයි මෙහෙන් යන්නේ.

බොහෝ මෝඩයෝ ඉන්නවා මෙහෙට එන්නෙ නැති. ඔවුන්ට මෙහෙට එන්න ඕනෑ කමක් ඇතිවෙලා නැහැ. ඔවුන් සරල ආකාරයට අනෙක් මෝඩයන්ගේ වාර්තා මත යැපෙනවා. ඔවුන්ට ඒක ප්‍රමාණවත්. හුදෙක් එක මෝඩයෙකුට දහසක් මෝඩයන්ට ඒත්තු ගන්වන්න හැකි. මොකද ඔවුන්ගේ භාෂාව එකක්ම නිසා. ඔවුන්ගේ සංකල්පකරණයත් එකයි. ඒ නිසා ගැටලුවක් නැහැ. එක මෝඩයෙක් දැක තිබෙනවා, සියලු අනෙක් මෝඩයෝ ඒ ගැන ඒත්තු ගෙන තිබෙනවා. එක මෝඩයෙක් පුවත්පතකට වාර්තාවක් සපයලා අනෙක් සියලු මෝඩයෝ එය කියවල හිම්දිරි පාන්දරම. ඒත්තු ගෙන සෑහීමකට පත්වෙලා.

රාත්‍රිය බොහෝම දිගයි මුරකාරයාට. ඇයි? ඔහුට විවේකයට පත්වෙන්න බැහැ. ඔහු කොහොම හරි තමන්ව අවදියෙන් තබා ගන්න ඕනේ. ඒක අරගලයක්. ඔහුට ස්වභාවයට එරෙහිව තමන්ව අවදියෙන් තබාගන්න ඕනේ. මොකද රාත්‍රිය කියන්නේ විරාමයට පත්ව, විවේකීව නින්දට පත්වන්න ඕනේ. ඔහු ස්වභාවයාට එරෙහිව සටන් කරමින් ඉන්නවා. මෝඩයාත් එහෙමයි. මෝඩයා ස්වභාවයාට එරෙහිව යමින් සිටිනවා. ඔහු දියපහරට එරෙහිව පිහිනන්න උත්සාහ ගන්නව. එනිසා ඔහුගේ දුක දීර්ඝයි. අනවශ්‍ය ලෙස දීර්ඝයි. ඔහු දහස් වාරයකින් එය වැඩිකර ගන්නවා. මොකද ඔහුට එය යන අතේ යන්න දෙන්න බැහැ. ඔහුට විවේකයට පත්වෙන්න බැහැ.

මෝඩ මනස ගැන ඇති පළමුවන ඉඟිය වෙන්නේ එයට විවේකයට පත්වෙන්න බැරිකමයි. එය හැමවිටම ඉන්නේ ආතතියක. එය හැමවිටම ඉන්නේ ප්‍රවේසමක. එය හැමවිටම අනතුරක් ගැන බියක. රාත්‍රිය කොතරම් දිගුද මුරකරුට... විවේකයෙන් සන්සුන් වූ අයට, ගැඹුරු නින්දකට ගිය අයට ඒක එහෙම නෙවෙයි. ඒක ඒ තරම් වේගයෙන් ගතවෙනවා, හුදෙක් එක මොහොතකට ඔබ අවදියෙන්, එවිට ඔබ යළිත් නින්දට වැටෙනවා... ඊළඟ මොහොතේ ඔබ පිබිදිලා..... එය හිම්දිරියක්. ඔබට විශ්වාස කරන්නත් අමාරුයි කාලය මේ තරම් වේගයෙන් පියාඹා ගියාද කියලා. ඔබ සැබවින්ම විවේකයට පත්වුණා නම් රාත්‍රිය වඩා වේගයෙන් පියාඹා යාවි. ඔබ සම්පූර්ණයෙන්ම විවේකයට පත්වුණ ගමන් කාලය අතුරුදන් වේවි. මෙය වටහා ගන්න.

## ගුවන් තලය...

24 වන පිටුවෙන්

යුද්ධයෙන් පසු ගුවන්යානය මගීන් ප්‍රවාහනය සඳහා යොදාගත හැකි බව පෙනී ගියෙන් බෝම්බ හෙලීම සඳහා යොදාගත් යානා මගීන් ගෙන යෑම සඳහා සකස් කරන ලදී. ලොව ප්‍රථම මගී සේවය 1914 දී තම්පා සහ සෙන්ට් පීටර්ස්බර්ග් නගරය අතර ආරම්භ කරන ලදී. ප්‍රථම ගුවන් ගමන් සමාගම වන ඩියුස්චේ ලුප්ට්‍රිඩරී 1919 පෙබරවාරි 5 වැනිදා ලිප්සිග් සහ වෙයිමර් දක්වා ගමන් කිරීම සඳහා ආරම්භ කරන ලදී. එම වසරේදීම ජෝන් ඇල්කොක් සහ ආතර් විමන් බ්‍රවුන් සැතපුම් 1900 ක් දුර ගෙවමින් අත්ලන්තික් සාගරය තරණය කළෝය.

1920 සහ 1930 පමණ වන විට ගුවන් සේවා බෙහෙවින් ප්‍රචලිත වන්නට විය. 1939 අගෝස්තු මාසයේ ජර්මානු ජාතික අර්නස්ට් හෙයින්රිච් හෙන්කල් සහ හෑන්ස් වොන් ඔහේන් විසින් ජෙට් ඇන්ජිම හඳුන්වා දී ජෙට් යානය නිපදවූ පසු ශබ්දයේ වේගය අබිබවා යන 'කොන්කෝඩ්' වැනි යානා නිපදවූ අතර පිට සක්වල තරණය කිරීමට පවා දැන් මිනිසා සමත්ව සිටී. ගුවන් යානයේ කතාව අවසාන නැත. වායුගෝලයේ ඇතුලත හා පිටත ගමන් සඳහා එය තව තවත් වර්ධනය වෙමින් පවතී.











# ටොරොන්ටෝ මහා විහාරයේ කඨින පුජෝත්සවය



**ටොරොන්ටෝ මහා විහාරාධිපති
පූජ්‍ය අහංගම රතනසිරි ස්වාමින් වහන්සේගේ
අනුශාසකත්වයෙන්
ඔක්තෝබර් 27 දින සහ 28 වන දින
විහාරස්ථානයේ පවත්වනු ලැබූ
කඨින පූජෝත්සවයේ විශේෂ අවස්ථා.....**

මෙවර කඨින පිංකමෙහි ප්‍රධාන දායකත්වය උපුල් ද සිල්වා සහ ශ්‍රියානි අබේධීර, ඩෙන්සිල් සහ නීලා අබේවර්ධන, සාගර සහ සුමංගි වීරතුංග, ගාමිණී හේවගේ සහ ශ්‍රියානි හෙට්ටිආරච්චි යන දායක දායිකා පිරිස විසින් දරන ලදී.














# මිසසාගා බෞද්ධ විහාරස්ථානයේ කඨින පූජෝත්සවය

මිසසාගා බෞද්ධ විහාරස්ථානයේ වාර්ෂික කඨින පූජෝත්සවය විහාරාධිපති ගෞරවනීය කුළුගම්මන ධම්මාවාස නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ අනුශාසකත්වයෙන්, දායක සභාවේ සංවිධානයෙන් සහ සියලු දායක දායිකාවන්ගේ සහභාගිත්වයෙන් නොවැම්බර් මස 09 සහ 10 යන දෙදින තුළ ඉතාමත් අලංකාර අන්දමින් පවත්වන්නට යෙදුණි.

එම කඨින පිංකමේ විශේෂ අවස්ථා කීපයක් මෙම ඡායාරූපවල දැක්වේ.


















කෙටි කතාව

# කිටී

■ ප්‍රභා මාධවී අභයගුණසේකර

මල් ඉහිරුණ ගවුම් සාය සුළඟේ දැවටෙද්දී සුභානි කඩිනම් ගමනින් මිදුල හරහා ගියාය. ඇගේ කඩිනම ඇස් කොනට අල්ලා ගත්තද සුමනසේකර හිස නොඔසවාම පුවත්පත කියවීමේ යෙදුණේ එයටම ඇලුන සිතිනි. සැඳෑ අඳුරු සළු පොරවා ගන්නට අහස්කුස සූදානම්ව සිටී.

"චටස්" සුමනසේකරගේ බාහුවේ වසා සිටි මදුරුවා මරු වැළඳ ගත්තේය. පසුගිය දින කීපය ඔරවා ගෙන නොකඩවා වැසි දුන් අහස සිනාසෙන්නට පටන් ගත් පසු මදුරුවන් හිස ඔසවා ඇතී. උදැල්ලේ වැඩක් කළ විට දැනෙන තුනටියේ අපහසුතාව නිසා සුමනසේකර අතින් මගහැරුණ වටපිටාව නිල්ල පුරවාගෙන සිටී. ඝන සැරේට වැඩුණ වල් පඳුරු යට එක් රැස්වුණු වතුර පිරි කොළ රොඩු මදුරුවන්හට පාරාදීසයක් මවා දී වැන්න. තමා නැවත රැකියාවට ගිය පසු කුලිකරුවකු සොයාගෙන සුභා කැලය එළිපෙහෙළි කරගන්නා බව සුමනසේකර දනී. බල්ලාගේ වැඩේ බූරුවාට තල්ලු වෙයි. තමන් ගැන ලැජ්ජාවකුත් බිරිඳ ගැන දුකකුත් දැනුණ ඔහු පුවත්පත හකුළා දණහිස උඩ තබාගෙන අවට පිරික්සා බැලුවේය. මිදුලේ වැලිතලාවද වල් පඳුරු සොරාගෙන ඇත. සවස් යාමයේ පඳුරු අතර සැඟවෙමින් නටන බැළලි පැටික්කියට නම් මිදුල සෙල්ලම් පිටියකි.

"හෙටවත් වත්ත සුද්ද කර දාන්න ඕනා" තමාටම කියා ගත්තේය.

සුමනසේකර පුවත්පත බලන්නට පටන්ගෙන පැයක් විතර වෙයි. පුවත්පතේ වූ දේශපාලන තොරතුරුවලට ඇලුණ සිත් ඇති ඔහු සියලුම දේශපාලන ලිපි ටික කියවයි. රටේ දේශපාලන පෙරළියක් වෙන ලකුණු කියැවෙයි. ඉන්දියාවේ දේශපාලනයේ විශාල පෙරළියක් වුණේ පසුගිය සතියේය. ඉන්දියාවේ සිදුවන වෙනස්කම් ලංකාවට සෘජුවම බලපාන බව දේශපාලනය කෙරෙහි අවබෝධයක් ඇති ඔහු දනියි. තමා තරුණ කළ දේශපාලනය වෙනුවෙන් වෙන් වී සිටි අයුරු සුමනසේකරගේ සිහියට නැගිණිඩි ඡන්දය කාලයට නම් ඉවරයක් නැතිය. උදේම ඉණට හිරවෙන කලිසම ගැලවෙන්නේ දවසද අවසන් වූ පසුවය. දේශපාලන පෙරළියක් වී තමා ඡන්දය දෙන පක්ෂය බලයට එනු සුමනසේකර දකින සිහිනයකි. සුභා නම් කියන්නේ ඒවායින් අපට වැඩක් නොමැති බවයි. තමන් උනන්දු වී උපයා සපයා ගත්තොත් කරදරයක් නැතිව සිටීමට හැකි බවට සුභා අදහස් කරයි.

නමුත් ඇය නොදන්නා බොහෝ දේ ඇත. තමා විසින් උපයා ගන්නා දේ වුවත් හොඳින් හැසිර වීමට රටේ හොඳ පාලනයක් තිබිය යුතුය. "රාජා භවතු ධම්මිකෝ" තමන්ගේ විවාහයත් සුභාගේ රැකියාවත් තමාගේ දේශපාලන උණට බෙහෙත් සැපයූ බව ඔහු සිහිපත් කළේය. සුභා දේශපාලන පවුලකට අයත් කෙනකු වුවත් ඇය දේශපාලනයට කැමති නැත. ඇයගේ පියාගේ පියා රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මන්ත්‍රීවරයකුව සිට ඇත. ඉන් අනතුරුව අවදියෙන් අවදියට පවුලේ ඥාතීන් මැති ඇමැති තනතුරු දරමින් රාජ සභාව හැඩකර ඇත. දැනුදු ඇයගේ සනුහරේ බොහෝ පිරිස් ඒ ඒ තැන්වල යෙහෙන් වැජඹෙන නමුදු ඇගේ පවුලේ සාමාජිකයින් ඔවුන්ගෙන් දුරස්තරව සිටින්නේ ඉහළ පෙළේ අයට තමන් නොකැමැති බවත් ඔවුන්ව තමන්ට ලොකු නැති බවත් කියමින් වුවත් ඔවුන් තරමට ශක්තිමත් ආර්ථියක් තමන්ට නැති බැවින් බව සුමනසේකර නම් දනී. "තුට්ටු අස්සේ අලුක්කාල් ගහන්න බැහැනේ" සුමනසේකර සිතුවේය. කඩාගන්න බැරි මිදි සුභාලාටත් තිත්තය. සුමනසේකරගේ මුහුණට සිනාවක් නැංගේය.

තමා රෑ කාලයේ රූපවාහිනියේ එවැනි වැඩසටහන් බලාපොරොත්තු වෙන විට පුපුර පුපුරා නින්දට වැටෙන ඇගේ වත උදේට මැලවී ඇති අයුරු නොබලා සිටීමට සුමනසේකර පුරුදුව සිටියේය. දෙන්න දෙමහල්ලන්ගේ තරහ බත ඉදෙන තුරු බවට සාක්ෂි දෙමින් සුභාගේ තරහත් පවතින්නේ සුළු වේලාවකි. එය බත ඉදෙන කාලයවත් නොගන්නේ කුස්සියටත් තමාගේ අත දිගු වෙන නිසාද විය හැකිය. වෙනදාට නම් මේ වනවිට කිරි කහට එකක් ලැබෙයි. අද එය තාම නැත. සුභානි උදේ වරුවේ සිට අමනාප මුහුණකින් සිටින්නීය. තමා දැනුවත්ව නම් වරදක් වී නැති බව සුමනසේකර සිහි කෙරුවේය.

"දඩස් දඩස්" සුභානි හිතට එන තරහා ජනෙල් පිටින් යවන්නට මෙන් ජනෙල් පෙළ වසන්නට පටන් ගත්තාය.

"ජනේලයක් වහන්නවත් උඹලට බැරිද ටී වී එකේම එල්ලිලා හිටපල්ලා මම දාසිනේ. ඒකත් මමම කරන්නම්."

රූපවාහිනිය ළඟ පොරොත්තු වෙන දරුවන්ට මවගේ ආඩපළි කනට නොවැටේ. රූපවාහිනියේ දිග ඇරෙන හින්දි සිතුවම උන්ගේ සවන් වසා ඇත. විවෘත ආර්ථිකයත් සමඟ නිවෙස්වල අයිතිය දිනා ගත් රූපවාහිනිය දරුවන්ගේ රස අයිතියද උදුරාගෙන ඇත. ඔවුන්ට කොතෙක් කිව්වද රූපවාහිනියට ඇලී සිටිති. විෂය පරිබාහිර පොතපතකට ඇලුම් නොකරති. මෙය ජාතියේ අවාසනාවක් යැයි සුමනසේකරට සිතෙයි.

"මදුරු වසන්ගතෙත් ඉවරයක් නෑ. කොහෙද මේ කැළේ ඩිංගක් සුද්ද කරාගන්න මිනිහෙක් නැති හැටි."

ඇගේ වචන සුමනසේකරගේ කනට යවුල් අනියි. 'යක්කු ගස් නගින වේලාව', දවසේ කටයුතු හමාර කර විඩා නිවා ගන්න නවාතැනට යන යකෙක් සුභානි සමඟ හවුල් ගිවිසුමකට අත්සන් තබා වත්ද? කොහොමටත් සුභාගේ කට සැරය. 'අප්පාගේ පුතා නොවේ නම් ඒකා නොට්ටිගේ පුතා' කියා කියමනක් ඇතද, අම්මාගේ දුවට එවැනි කියමනක් ජනවහරේ පවතින බවට සුමනසේකරට මතකයක් නැත. මේකට කියමනක් තමා හැදුවොත් තමාගේ නම ලොව පවතිනු ඇත. ඒ තරමට මවගේ ගතිගුණ උරුම කරගෙන එන දූවරුන් ඔහු දැක ඇති බවට මෙනෙහි කළේය. ඇයටද මේ දායාදය ලැබී ඇත්තේ ඇගේ මවගෙන් බව සුමනසේකර දනී.

ඇගේ මවද නිතර බෙලිකටු මල්ල සොලවයි. නමුත් ඒ බෙලිකටු මල්ලත් නැත්නම් ඒ නිවසේ ජීවත් වී හමාරය. හැටවිය පැන්නද දහඅටේ ජීවත් වීමට වෙර දරන සුභාගේ පියා සමඟ මේ තරමින් හෝ පෑහීම දක්ෂකමකි. 'යා දෙක නොරත රත' නමුත් තමාගෙන් එවැනි අකටයුතුකම් සුභාට සිදු නොවෙයි. විදේශගත රැකියාවක නිරත තමා නිවසේ ගතකරන කාලයේදී ඇයගේ බොහෝ කටයුතුවලට උපකාර වෙයි. තමා නැති නිවස අඳුරු කර නොගෙන දරුවන්ද බැදිවලට යන මං අහුරා ඈ විශාල මෙහෙයක් කරන බව දන්නා ඔහු ඇයට උපරිම ආකාරයෙන් ගරු සත්කාර කරයි. 'මොකක් නමුත් වරදක් සිදුවී ඇති නැත්නම් ගේදොර වැඩවලින් තෙහෙට්ටු වී ඇති' යි සිතට නැගුණ සිතිවිලිල්ල ඇතිව සුමනසේකර පුවත්පත හකුළා ගෙන පුටුවෙන් නැගිට්ටේය. ඉස්තෝප්පුවෙන් සාලයට ගොඩවන තම සැමියා නුදුටු නිසා සුභා මුළුතැන්ගෙට ඇදුණාය.

'මෙයත් හොර බළලා වගේ හිටියට මොනවා කරනවද කවුද දන්නේ.'

සුභා තමන්ගේම සිත සමඟ පොරයකට වැටුණාය. එක අතකට තමා රැවටුණා යැයි සුභාට සිතෙයි. පාසල් ජීවිතෙන් සමුගත් මුල් අවදියේම සුමනසේකර සමඟ පෙමින් බැඳී විවාහ දිවියට ඇතුළත් වූවාය. ලෝකයේ තතු හරිහැටි නොදැන සිටි තමා මෙන් නොව සුමනසේකර සතුව ප්‍රේම කතන්දර කිහිපයක්ම තිබී ඇත. අද දින ඔහුගේ ජංගම දුරකථනයෙන් දැක්කේ තවත් එවැනි පෙම් කතාවක්දැයි එවේලේ සිට ඇගේ සිත කියයි.

'ඉලන්දාරි දරුවොත් දෙන්නෙක්ම සිටිද්දිත් මේ මිනිහට පිස්සුද මන්ද. නාකි විසේ ගෙටත් උසේ කියනවනේ.'

තමාගේත් සැමියාගේත් උරහිස පැන ගිය දරුවන් සිටියදී මෙවැන්නක් සිදුවේ යැයි සිතිය නොහැකි මුත් මෙකල සිදුවන විපරීත සිදුවීම් සමඟ සමපාත කරද්දී ඇගේ සිතට බියක් දැනේ. තම කොට්ඨාසයට අලුතින් කුලී නිවැසිව පැමිණ සිටින යුවළ වයස අවුරුදු හැට ඉක්මවා ඇත. ඔවුන් හා කතා කරද්දී ඇතිවූ සැකය නිවැරදි කරමින් අනියම් පෙමක රසයක් සොයා මෙහි පැමිණ ඇති බව සොයා ගැනීමට හැකිවිය. 'කිටී' නමින් ඥාති කාන්තාවක් ගැන තම සැමියා පෙර කාලයේ නිතර කියා ඇත. ඔහුගේ ගම වන ගම්පල පවුලේ මංගල අවස්ථාවෙකදී හමුවී ඇති මෙම කාන්තාව සුකොමළ රුවකට හිමිකම් ඇති අයෙක් බව සුභාට මතකය.

'මේකිගේ මොකක් හරි හොරයක් තිබුණා. ඒක තමා මේ මිනිහ එක්ක කොමළ කරකර කතා කළේ. චිංචි මානවිකාව'

'මේ මිනිහටත් අගේ ඒ වගේ එවුන් තමා.'

තමා නම් පාසල් අවදියේ හෝ පෙම් හසුනක්වත් ලියා නැත. පාඩම් පොතට ලොබ බැඳි තමා පාසල් අවදියේ සුන්දර ආදරයක් වින්දේත් නැත. නමුත් බලාපොරොත්තු තැනට යන්න ලැබුණේත් නැත. තමාගේ පියාගේ බීමත්කම නොවෙන්න තමාද අද පියාගේ පවුලේ අනිකුත් සාමාජිකයන්ගේ කරට කර සිටිනු ඇත. දරුවන්ට නොව බෝතලයට ඇලුම් කළ පියෙකුට දා වූ තමන්ට ගොඩ නගාගත් සිහින විජිතයට සමුදෙන්න සිදුවූ අයුරු සිහිව සුසුමක් පිටවිය. සුමනසේකර තමාට හොඳට සලකයි. අඩුපාඩුවක් දැනෙන්න තියන්නේද නැත. නමුත් බොහෝ විට පුවත්පතටත් රූපවාහිනි දේශපාලන වැඩසටහන්වලටත් මුවා වී තමාට නින්ද යනතුරු සයනය මගහරින බව සුභාට දැනෙයි.

'මේ කිටී සුමනෙගෙ හිත අවුල් කරලද?'

සුභාගේ සිතට භීතියක් ඇතිවිය. තවත් ගැහැනියක් ළඟට නොයන තරමට තමා සුමනේව බැඳගෙන සිටීමට තරම් කරුණු කාරණා දන්නා බවට සුභා විශ්වාස කළාය. කාලයෙන් කාලෙට මිනිස් හිත් වෙනස් වීමේ සත්‍ය සුමනෙටත් පොදුය. උඩරට දේශගුණයේ හැදුණු කිටී කොහොමටත් තමාට වඩා රූමත්ය. 'අපිත් ගමේ හිටිය නම් ලස්සන වෙලා හැදෙනවනේ කොහෙද අපට හරි හමන් තාත්තා කෙනෙක් හිටිය එකක්යැ' සුභාගේ මුවින් බර සුසුමක් පිටවිය. ඇයට පපුව රිදෙන ගතියක් දැනිණ. සුමනෙගේ ජංගම දුරකථනයේ 'කිටී' නම දුටු මතින් පපුව ගිනිගත් සෙයක් ඇයට දැනිණි. ගත වූ වසර විස්ස පුරාවට මෙවැනි ගැටලුවකට තමන්ට මුහුණ දීමට සිදුවී නැති බව සුභා සිහි කළාය. නමුත් මෑතක සිට ඔහුගේ ආලිංගනයන්ගේද වෙනසක් දක්නට ඇත. සුමනේ කුස්සියට එන හඬ ඇසී කේතලය ළිප උඩින් තබමින් ඔහුගෙන් මුහුණ වසන් කර ගත්තාය.

"මොකද මේ කරුවලේ ඉන්නේ."

සුමනේ විදුලි බුබුළ දැල්වූවේය. මුළුතැන්ගේ පුරාම විසිරී සිටි අඳුර අහුමුලුවල ඉඩ සොයා ගොස් සැඟව ගත්හ. අඳුරෙන් කොටසක් සුභාගේ මුහුණේද ලැගුම් ගෙන සිටී.

"මොකද අම්ම මූණ එල්ලගෙන සෙම් කෝප වෙලාද"

සුභා නිතර සෙම් කෝපවීම නිසා රෝගී වන්නීය. බෙහෙත් බීමට මැළි ඇය රෝගය උත්සන්න වෙනතුරු සිටින්නීය. ඉන්පසු තමාගේ උරහිසේ හිස හොවා වෛද්‍යවරයා වෙත යන ඇය නැවත සුවය ලබන්නේ දින දෙකක් තමාගේ සත්කාර විඳිමින් යහන් ගතව සිටීමෙන් පසුවය. නමුත් අද දින ඇය සෙම් කෝප වූ ගතියක් පෙනෙන්නටද නැත.

"අද රෑට විශේෂ දෙයක්ද? ඔයාට අමාරු නම් මොනවා හරි කඩෙන් ගෙනෙමු."

"මට මොන අමාරුවක්ද? ඊටත් කඩවලින් කන්න ඔය හැටි කොහෙ තියෙන සල්ලියක්ද? කට තියෙනවට කියවන්න එපා. චුට්ටට ඇහුණොත් කන ඇහිල ඉන්න නෑ."

සුභා කෝප වී සිටියි. කතාවත් ඇත්තය. පවුලේ බඩපිස්සා රස නහර පිනවන්න ඉතාමත් රුචියක් දක්වන්නේය. මේ කතාව ඇසුණා නම් එවේලේ සිට කෑමට පිටතට යෑමට ඇවිටිලි කරයි.

"හෙට මට කොළඹ යන්න වෙයිද දන්නෑ"

සුමනසේකර තමාගේ විගමනය ගැන සිහිපත් කළේය. තමා ඇයගේ ඇසුරින් මිදී විදේශගත වීම ඈ සිතට දුකකි. ඒ දුක හේතු කරගෙන ඇගේ සිතේ තමා කෙරෙහි තිබෙන දෝසයක් වේ නම් දුරු කරගන්නීය.

ළිපේ ගිනි සැර දරා ගත නොහැකි කේතලය සියුම් හඬක් නගමින් වේදනාව පිට කරයි. තමාගේ හිතට ඇතුළුව වධ දෙන සැකය හේතුවෙන් වන වේදනාව පිට කරගත නොහැකි සුභා දිගු සුසුමක් පිට කළාය. හෙට අනිද්දා නිවෙසින් මතු නොව රටින්ද පිටව යාමට නියමිත තම සැමියාගේ සිත රිදවිය නොහැකිය. මෙතුවක් කලක් මතු නොවුණු කරුණක් කතා කිරීමටද සුභාට ලැජ්ජාවක් මදිකමක් දැනෙයි.

'ගියාට පස්සේ ලියුමකින් අහනව'

සුභා සිත තද කර ගත්තාය.

'නෑ දැන්මම අහනව නියපොත්තෙන් කඩන්න තියෙන දේවල් පොරවෙන් කපන්න වෙනකල් තියා ගන්න හොඳ නෑ.'

ඇගේ සිත දෙපැත්තට වැනෙයි.

"ආ චූටි නෝනා නටල ඇති වුණාද"

හවස් වරුවේ මිදුලේ නටමින් සිටි බැළලිය කුස්සියට එනු දුටු සුමනසේකර ඇය වඩා ගත්තේය. බැළලිය දුටු සුභාගේ මුහුණ මොළොක් විය. තමා මෙන්ම සුමනේද සතුන්ට ආදරේ කරයි.

48 වන පිටුව බලන්න

# පෘතුගීසීන් හමුවේ නොසැලුණු කන්ද උඩරට



■ සුජීව දිසානායක

ඈත අතීතයේදී මලය රට නමින්ද ග්‍රීක ජාතික ටොලමි විසින් මලයිය කඳු යනුවෙන්ද හඳුන්වන ලද බිම මුල් කරගෙන ඉතිහාසයේදී බිහි වූ රාජධානිය අප කන්ද උඩරට රාජධානිය නමින් හඳුන්වන්නෙමු. මහනුවර නම් වූ නගරය මුල් කරගෙන බිහි වූ මේ රාජධානිය ඉතිහාසය තුළ කන්ද උඩරට රාජධානිය නමින්ද සෙංකඩගල රාජධානිය නමින්ද හඳුන්වා ඇත. සෙංකඩගල, කටුපුළු නුවර, කන්දේ නුවර හා ශ්‍රී වර්ධනපුර යන නම්වලින් හඳුන්වන ලද මහනුවර නගරය තුළ බලයට පත් පළමු පාලකයා වන්නේ සේනා සම්මත වික්‍රමබාහු රජුය. මෙලෙස ඇරඹුන උඩරට රාජධානියේ පළමුවන විමලධර්මසූර්ය රජු ඇරඹූ රජ පරම්පරාව වසර 147 ක් පමණද නායක්කාර් රජ පරම්පරාව වසර 76 ක් පමණද කන්ද උඩරට තුළ බලය දරන ලදී.

වසර 352 ක් පමණ බෞද්ධ ඉතිහාසයකට හිමිකම් කියන කන්ද උඩරට රාජධානි සමය තුළ ප්‍රබල යුරෝපා ජාතීන් 03 ගේ බලපෑම්වලට එම රාජධානිය සෘජුව හා වක්‍රව හසුවූ බවද පෙනේ. ක්‍රි.ව.1591 සිට පෘතුගීසීන් ප්‍රධාන අවස්ථා 05 කදී කන්ද උඩරට රාජධානියට තම බලපෑම් එල්ල කළ අතර ලන්දේසි 1764/65 කාලයේදීද බ්‍රිතාන්‍යයෝ ක්‍රි. ව. 1803 හා 1815 දීද මෙලෙස සෘජු බලපෑම් උඩරට ප්‍රදේශයන්ට එල්ල කළහ. මේ එල්ල වූ බලපෑම් හමුවේ ක්‍රි.ව.1815 වන තෙක් තම ස්වාධීනත්වය රැකගත් කන්ද උඩරට අවසානයේ බ්‍රිතාන්‍යයෝ කිසිදු ජීවිත හානියකින් තොරව යටත් කර ගත්හ.

මේ ජන කොටස් අතරින් ක්‍රිව.1591 වසරේ සිට ක්‍රි.ව.1638 දක්වා ප්‍රතිකාල් හෙවත් පරංගින් අවස්ථා 05 කදී උඩරට රාජධානිය ආක්‍රමණය කළහ.

පෘතුගීසීහු උඩරට රාජධානියට තම පළමු බලපෑම එල්ල කරන්නේ ක්‍රි.ව.1591 වර්ෂයේදීය. ඒ වන විට උඩරට රාජධානියට අයත් ප්‍රදේශ පාලනය කරන ලද්දේ සීතාවක පළමුවන රාජසිංහ රජුය. මේ ආක්‍රමණයේදී පෘතුගීසීන් බලාපොරොත්තු වූයේ උඩරට රාජධානිය ආක්‍රමණය කොට එය තමන්ට ඈඳා ගැනීම නොවේ. මෙහිදී ඔවුන්ගේ අරමුණ වූයේ කතෝලික ආගම වැළඳගත් අයෙකු උඩරට රජකමට පත් කරගෙන එය පෘතුගීසීන්ට අවැසි රාජධානියක් බවට පත් කර ගැනීමය. මේ හරහා පළමුවන රාජසිංහ රජුගේ ව්‍යාප්තවාදී ප්‍රතිපත්තිය තරමක් දුරට මෙල්ලකර ගත හැකිය යන්න පෘතුගීසීන්ගේ බලාපොරොත්තුවක් විය. මේ වන විට පෘතුගීසීන් යටතේ උඩරටට සම්බන්ධ පුද්ගල චරිත 03 ක් රැකවරණ ලබමින් සිටියහ. ඒ කුසුමාසන හෙවත් දෝන කතිරිනා, යමසිංහ බණ්ඩාර හෙවත් දොන් පිලිප් හා කොනප්පු බණ්ඩාර හෙවත් ඔස්ත්‍රියාවේ දොන් ජුවන් යන්නවුන්ය. මෙහිදී පෘතුගීසී අරමුණ වූයේ දොන් පිලිප් උඩරට රජ කරවා එම රාජ්‍යය තමන්ට පක්ෂපාති රාජ්‍යයක් බවට පත් කර ගැනීමයි. ඒ අනුව ඔවුන් තම අරමුණු ඉටු කර ගැනීමට ක්‍රි.ව.1591 වර්ෂයේදී උඩරට බලා පිටත් වූයේ මන්නාරම නගරය හරහාය. පෘතුගීසි හට කණ්ඩායමක්ද ලස්කිරිඤ්ඤ හට කණ්ඩායමක්ද මේ සඳහා ඔවුන් සම්බන්ධ කරගන්නා ලදී. එම හමුදා ක්‍රමයෙන් මාතලේ වහකෝට්ටේ නගරයට පැමිණියද උඩරටින් ප්‍රබල විරෝධයක් මතුව ආවේ නැත. ඒ නිසා ඔවුන් වහකෝට්ටේ නගරයේදී දොන් පිලිප් උඩරට රජු ලෙස නම් කරන ලදී. පෘතුගීසීන් සමග උඩරටට ගමන් කළ ඔස්ත්‍රියාවේ දොන් ජුවන් මේ ආක්‍රමණයේදී දොන් පිලිප්ගේ සේනානායකවරයා ලෙස කටයුතු කරන ලද්දෙකි. මේ කාලයේදී දොන් ප්‍රැන්සිස්කු නැමැත්තෙකු සීතාවක පාලනයට එරෙහිව උඩරට ප්‍රදේශයන් තුළ කැරැල්ලක් ඇති කර එහි බලය තමන්ට වාසිදායක වන ආකාරයට පත් කරගෙන තිබූ බවද කියවේ. පෘතුගීසි හමුදා උඩරටට ළඟා වනවාත් සමග දොන් ප්‍රැන්සිස්කු තම බලයට නතු කරගෙන සිටි ප්‍රදේශ පෘතුගීසීන්ට පවරා දුන් බව කියවේ. පෘතුගීසී ලේඛකයන් වාර්තා කරන්නේ ප්‍රැන්සිස්කු මේ ප්‍රදේශ යමසිංහ බණ්ඩාර හෙවත් උඩරට හිමිකරු වූ දොන් පිලිප්ට පවරා දුන් බවය.

මහා වංසය වාර්තා කරන ආකාරයට පෘතුගීසීන් උඩරටට ඇතුළු වී දොන් පිලිප් කුමාරයාට රජකමත් දොන් ජුවන් කුමාරයාට අග්‍ර සේනාපති තනතුරත් පවරා දී ඔවුන්ට බල කර ඇත්තේ පෘතුගීසි ජාතික ස්ත්‍රියක් හැර වෙනත් කාන්තාවක් විවාහ නොකර ගන්නා ලෙසයි. නමුත් පෘතුගීසි අරමුණු ඉටු වූ බවක් පෙනෙන්නේ නැත. පෘතුගීසි ලේඛකයන් වාර්තා කරන්නේ දොන් ජුවන් දොන් පිලිප් හා පෘතුගීසි හමුදා උඩරටින් පලවා හරින ලද බවයි. එසේ පසුබසින ලද හමුදා සත්කෝරලය හරහා මන්නාරමට පසුබැස ඇත. මේ තත්ත්වයන් තුළින් පෙනෙන්නේ පෘතුගීසි 1591 දී උඩරට තම ආධිපත්‍යය නතුකර ගැනීමට ගත් උත්සාහය අසාර්ථක වූ බවයි.

එයින් පසු ඔවුන් ක්‍රි.ව.1594 දී නැවත වරක් කන්ද උඩරට රාජධානිය ආක්‍රමණය කිරීමට කටයුතු කළේය. උඩරට ද්‍රෝහියා නමින් නම් කරන ලද පළමුවන විමලධර්මසූරියගෙන් පළි ගෙන දෝන කතරිනා හෙවත් කුසුමාසන උඩරට රජ කරවීම මේ ආක්‍රමණයෙහි ප්‍රධාන අරමුණ විය. මේ සඳහා ප්‍රධානත්වය ගත්තේ පෙඩ්රෝ ලෝපේස්ද සූසා නැමති කපිතාන් ජෙනරල් තැනය.

ක්‍රි.ව.1592 විමලධර්මසූරිය රජු උඩරට රජ වීමෙන් ටික කලකට පසු මලක්කාවේ සිට ගෝව බලා ගමන් කරමින් තිබූ යාත්‍රාවක් කොළඹ වරායට සේන්දු වී ඇත. මේ යාත්‍රාවේ නාවුකාධිපති ලෙස කටයුතු කර ඇත්තේ පෙද්‍රෝ ලෝපේස්ද සූසා නැමැත්තාය. ඔහු මෙරටට පැමිණ පෘතුගීසීන් විඳින්නා වූ තත්ත්වය දැක ගෝවට නැවත ගමන් කර ලංකාව යටත් කර ගැනීම සඳහා උපක්‍රමයක් යෝජනා කර ඇත. උඩරට රජකමට උරුමකම් ඇති කුසුමාසන දේවිය එහි රජ කළහොත් එහි ජනයා එයට විරුද්ධ නොවන බවත් ඉන් පසු ඇය ප්‍රතිකාල් වංශාධිපතියෙකුට විවාහ කර දී මුළු ලංකා රාජ්‍යය ක්‍රමයෙන් තමන්ට යටත් කර ගත හැකි බවත් මෙතුළින් කියවුනි. පෙඩ්රෝ ලෝපේස්ද සූසාගේ තවත් අරමුණක් වූයේ දෝන කතරිනා කුමරිය උඩරට රජ කරවා තම බෑණාවරුන් දෙදෙනාගෙන් කෙනෙකුට ඇය විවාහ කරදීමයි. ඒ අරමුණු ඇතිව මන්නාරමේ ගේව්‍රියෙල් කෝලකෝ මහතාගේ නිවසේ රැකවරණ සහිතව සිටි දෝන කතරිනාව ආරක්ෂා සහිතව මීගමුවට රැගෙන විත් ඇත.

සියලු කරුණු කාරණා සාර්ථක කරගනු සඳහා සූසා තමන්ට තහවුරු වූ හමුදා භටයන් 600 ක්ද සමගින් දෝන කතරිනාද පෙරටු කරගෙන උඩරට බලා පිටත් විය. ඒ ගමන් කරන අතරකදී සූසාගේ හමුදාවට අතරමගදී ජයවීර බණ්ඩාර නොහොත් මනන්පෙරුම මොහොට්ටාල නැමැත්තා විසිදහසක හමුදාවක්ද රැගෙන පෘතුගීසීන්ට එකතු වී ඇත. විමලධර්මසූරිය රජු පෘතුගීසීන්ට එරෙහිව සටනට තම හමුදාව මෙහෙයවූවද ඔවුන් බලන කපොල්ලේදී පරාජයට පත් වූහ. ක්‍රි.ව.1594 ජුලි මස 05 දින සිදුවූ මේ සටනින් පෘතුගීසි භටයන්ද සැලකිය යුතු ප්‍රමාණයක් මරණයට පත්ව ඇත. උඩරට ආක්‍රමණයට ගමන් කළ පෘතුගීසි හමුදාව මහා වංසය තුළ සමාන කර ඇත්තේ ස්පාඤ්ඤයේ ආමෙඩාව නම් නාවුක හමුදාවටය. මෙලෙස පළමුව පෘතුගීසීන් අතින් පරාජයට පත් උඩරට හමුදාව පසුබැසීමට තීරණය කළේ මහනුවර නගරයද ගිනිබත් කිරිම හරහාය. ඉන්පසු විමලධර්මසූරිය රජු ප්‍රමුඛ උඩරට හමුදාවෝ සිය ආරක්ෂාව පතා වෙල්ලස්ස හරහා වැදිපත්තුවට පසු බසින ලදහ.

මෙම ජයග්‍රහණයෙන් පසු පෘතුගීසීහු උඩරට රැජිණිය බවට දෝන කතිරිනාව පත් කරන ලදී. නමුත් ඔවුන් ඇයත් සමග කිසිවෙකුටත් ගනුදෙනු කිරීමට ඉඩ ලබා දුන්නේ නැත. එහිදී කිසිම සිංහලයෙකුට ඇය සමීපයටවත් පැමිණීමට පෘතුගීසීන් ඉඩ ලබා නොදුන් බව කියවේ.

කෙසේ වෙතත් පෘතුගීසි පාර්ශ්වයෙන් ජයවීර බණ්ඩාර හෙවත් මනන්පෙරුම මොහොට්ටාල ඝාතනය විය. ලංකාවේ මහාවංසයට අනුව මේ ඝාතනයට හේතුව වී ඇත්තේ විමලධර්මසූරිය රජු හා ජයවීර අතර ඇති වූ ලිපි ගනුදෙනුවකි. තවත් මූලාශ්‍රයක සඳහන් වන්නේ ජයවීර බණ්ඩාර දෝන කතරිනා විවාහ කර ගැනීමට කරන ලද යෝජනාවෙන් පෘතුගීසි කපිතාන් තැන උරණ වූ බවයි. කෙසේ වෙතත් මේ ඝාතනයත් සමග ජයවීර සමග එකතුව සිටි ලස්කිරිඤ්ඤ භටයන් පෘතුගීසීන් අතහැර උඩරට පාර්ශවය ගති. මතුව එන තත්ත්වයේ අවාසි සහගත බව දුටු ද සූසා කුසුමාසන කුමරියත් තම බෑණාවරුන් දෙදෙනාත් සිය හමුදාවත් රැගෙන නැවත කොළඹ බලා ඒමට පිටත් විය. නමුත් ඔවුනට බලන දුර්ගය තරණය කරගත නොහැකි විය. දන්තුරේ නම් ස්ථානයේදී මේ හමුදාව අන්ත පරාජයකට ලක් වූයේ පෘතුගීසීන් පෙරදිගදී ලද දරුණුතම පරාජය අත් කරදෙමිනි. මේ සටනේදී සූසා ඔහුගේ බෑණාවරුන් දෙදෙනා හා සමස්ත පෘතුගීසි හමුදාවම මරණයට පත් වී ඇත.

පෘතුගීසීන් ජාතික භේවායෙක් වූ ජෝන් රුබෙයිරෝ දන්තුරේදි ඇතිවූ පරාජය පිළිබඳ තම කෘතියේ මෙසේ වාර්තා කර ඇත.

'මේ ප්‍රතිඵලය ගැන මහත් කුතුහලයකින් බලා සිටි දොන් ජුවන් මහත් ශෝකයට පත් බව අඟවා ජයවීරගේ මරණයේ පළිය ගන්නා බවට දිවුරුම් දුන්නේ අපට මහත් සේ සාප කරමිනි. අප ගමන් ගන්නා අතර මේ සියලු හමුදා හා ඔහුව කලින් සිටි විසිපන්දහසක හමුදාවද අප සමග අප කරා පැමිණීමට හේ ඉක්මන් කළේය. ගස් කපා දැමීමෙන් අප ගමන් ගන්නා මාර්ගය අවහිර කිරීමට කුඩා ඇණියක් පිටත් කර යවන ලදී. ඔහුගේ දුනුවායෝද ගිනි තුවක්කු කාරයෝද වනය පුරා විසිරී අපේ මිනිසුන් වෙත බඩ ගා රහසින්ම තුවාල සිදු කළහ. අපේ හමුදාව බලනට පසුබැසීමට සූදානම් වූ නමුත් මාර්ගය විශාල හමුදාවක් විසින් අවහිර කර ඇති බව පෙනිණි. මෙසේ සියල්ලෝ අපකීර්තිමත් අන්දමින් සියදිවි හානි කර ගත්හ. කපිතාන් ජෙනරල් හා ඔහුගේ බෑණාවරුද මෙසේ මැරුම් කෑ අය අතර වූහ'

ක්‍රි.ව.1594 දන්තුරේ සටනින් පරාජයට පත් වූ පෘතුගීසීන් ඉන් අනතුරුව ලංකාවේ මුහුදුබඩට කපිතන් ජෙනරල් ලෙස පත් කර එවූයේ දොන් ජෙරනිමෝද අසවේදු නැමැත්තාය. ක්‍රි.ව.1597 වර්ෂයේදී සිදු වූ ධර්මපාල රජුගේ මරණින් පසු මොහුට කෝට්ටේ රදලයන් සමග මල්වානෙදී අත්සන් කළ ගිවිසුම හරහා කෝට්ටේ රාජධානියේ බලය පෘතුගීසි ආධිපත්‍යයට නතු කරගත හැකි විය. ඒ වන විට යාපන රාජධානියට පෘතුගීසීන් තමන්ට අවනත හෙන්දරමානසිංහම්ව බලයට රැගෙනවිත් තිබුනි. මේ වන විට සීතාවක දේශපාලනයද ඔවුන්ට අභියෝගයක් වූයේ නැත. පෘතුගීසීන්ට අභියෝගයක්ව තිබුණේ කන්ද උඩරට පමණි. ඒ නිසා ඔවුන් එය සෘජුව තමන්ට යටත් කරගැනීමට උත්සාහ දැරීය. මෙහිදී මොවුන් තමන් සතු අවි බලයෙන් උඩරට යටත් කර ගැනීමට උත්සාහ දැරීය. ක්‍රි.ව.1594 දෙසැම්බර් සිට ක්‍රි.ව.1612 නොවැම්බර් දක්වා කාලය තුළ මුහුදුබඩ කපිතාන් ජෙනරල් ලෙස කටයුතු කළ අසවේදු උඩරට අල්ලා ගැනීම පසෙක තබා මුලින්ම කළේ මුහුදුබඩ ප්‍රදේශයන් තුළ ඇති වූ කැරලි මැඩ පැවැත්වීමයි.

අසවේදු ක්‍රි.ව. 1602/03 අතර කාලයේදී උඩරටට ප්‍රබල ආක්‍රමණයක් එල්ල කළේය. ඒ වන විට ලන්දේසින් උඩරටට දූත ගමන් 02 ක් සිදු කර තිබුණි. මේ දූත ගමන් 02 න්ද අසවේදු තුළ බියක් ඇති විය. මේ නිසා ඔහු ගෝවෙන් ලබා ගත් අතිරේක පෘතුගීසි හමුදා ආධාරද සිංහල හා ඉන්දියානු භටයන්ගෙන් සමන්විත හමුදාවක්ද රැගෙන උඩරට ආක්‍රමණය කළහ. අසවේදු මෙහිදී උඩරට ආක්‍රමණය කළේ නිකම්ම නොවේ. ඔහු ඒ සඳහා යුදමය වශයෙන් ශක්තිමත් වීමටද කටයුතු කර ඇත. මැණික්කඩවර

47 වන පිටුව බලන්න



# කුලය හා දේශපාලනය

# J-R ගෙන් පාඩමක්

නිරූපමා රාජපක්ෂ මහත්මිය පදරවා වැඩි ඡන්ද 3521 කින් ආනන්ද කුලරත්න මහතා ජයග්‍රහණය කිරීමය.

■ **ආරියපාල මුදලිගේ**

'විවාහය ගැන සැළකීමේදී, මේ කාලයේ කුලය නොවැදගත් වනවා විය හැකිය. ඒත් ඡන්දය සඳහා විශේෂයෙන් දකුණු පළාතේදී එය ඉතා වැදගත්.'

ජේ. ආර්. ජයවර්ධන, 1996 දී සමස්ත ප්‍රතිඵලයට අනුව

1982 වසරේ ජනාධිපතිවරණයෙන් හා ජනමත විමසුමෙන් ජේ. ආර්. ජයවර්ධන මහතා පවත්නා පාර්ලිමේන්තුව දික්කර ගැනීමේ අදහස (ලාම්පු-කළගෙඩි) ජයග්‍රහණය කරන ලද්දේ වුවද මුල්කිරිගල අසුනෙන් ජේ. ආර්. ජයවර්ධන මහතා අභිභවා ප්‍රතිවාදී අපේක්ෂක කොබ්බෑකඩුව මහතා වැඩි ඡන්ද සංඛ්‍යාවක් ගෙන තිබුණි. එපමණක් නොව ජනමත විමසුමේදී 'ලාම්පුව' අභිභවා 'කළය' ට ජයග්‍රහණය හිමිව තිබුණි. මෙසේ පැරදුන අසුන් සඳහා අතුරු මැතිවරණ පැවැත්වීමට ජේ. ආර්. රජය තීරණයක් ගත්තේය. ඒ අනුව 1983 මැයි මස දී ආසන 18 ක් සඳහා අතුරු මැතිවරණ පැවැත්වීය.

1960 දී බිහිවූ මුල්කිරිගල අසුන දිගටම පාහේ ජයගත්තේ රාජපක්ෂවරුය. 1977 මහ මැතිවරණයේදී එම අසුන හිමිවූයේ එක්සත් ජාතික පක්ෂයටය. මෙම අතුරු මැතිවරණය ජය ගැනීම සඳහා ජේ. ආර්. ජයවර්ධන ඉතාම සූක්ෂම ලෙස කටයුතු කරන ලද්දේ අමුතුම ආකාරයකටය.

මුල්කිරිගල ඡන්දදායකයන්ගෙන් අඩක් පමණ අයත් වූයේ ගොවිගම කුලයටය. සියයට තිහක් පමණ දෙනා වහුම්පුර කුලයට හා ඉතිරිය මේ දෙපිරිසටම අයත් නොවන පීඩිත කුලවලට අයත් වූවෝ වූහ. ගොවිකුලයට අයත් ඩී. එම්. රාජපක්ෂ මහතාගේ සිටම හම්බන්තොට දිස්ත්‍රික්කයේම පීඩිත කුලවලට අයත් ජනතාවට ආත්ම ගෞරවය ඇතිව ජීවත් වීමට රාජපක්ෂ පරපුර වැඩ සැලසූ හෙයින් ඔවුන්ගේ ප්‍රධාන අනුගාමික පිරිසක් වූයේද මෙම පීඩිත කුලවලට අයත් ජනතාවය.

මුල්කිරිගල අසුන ජයගැනීමට නම් මේ පීඩිත ජනයාගේ බහුතරය එ.ජා.ප. ය විසින් දිනාගත යුතුව තිබේ. එවිට එ.ජා.ප.ය ට හිතැති ගොවිගම ජනයාගේ සහාය ඇතිව තම අපේක්ෂකයා දිනවිය හැකි බව ජේ. ආර්. ගේ අදහස විය. ඒ අනුව අතුරු මැතිවරණයට ශ්‍රී.ල.නි.ප. යෙන් ඉදිරිපත් වූ නිරූපමා රාජපක්ෂ මහත්මියට එදිරිව එ.ජා.ප.යෙන් ඉදිරිපත් කරනු ලැබුවේ ආනන්ද කුලරත්න නම්වූ තරුණ නීතිඥවරයෙකි. ඔහු අයත් වූයේ වහුම්පුර කුලයටය. මීට පෙර එම කුලයෙන් එම අසුනට කිසිම අපේක්ෂකයකු ඉදිරිපත්ව තිබුණේද නැත.

අනෙකුත් පක්ෂ ප්‍රබලයන් සමඟ එ.ජා.ප. අපේක්ෂක ආනන්ද කුලරත්න මහතාට සහාය පළකිරීම සඳහා වූ යෝධ රැස්වීමක් ඇමැතීමට ජයවර්ධන මහතා යන අතරතුරේදී, අපේක්ෂකයාගේ කුලය සම්බන්ධව කරුණු කාරණා සාකච්ඡා කරන්නටද යෙදුනි. මෙහිදී ඡන්ද ආධාරකරුවන්ගේ බලවත් ඉල්ලීම වූයේ කුලය හා සම්බන්ධ කිසිවක් නොපවසන ලෙසය. එසේ වුවහොත් එය ආපසු කැරකී අවුත් එ.ජා.ප.යට බලවත් හානියක් ගෙන දෙන්නට හැකි බැවිනි. මෙහිදී ජයවර්ධන මහතා මුණිවත රැකීය. එහෙත් ඒ ඔහු එම රැලිය අමතන තුරු පමණි. (එම අසුන වෙනුවෙන් ඔහු ඇමතූ එකම රැලියද එය විය.)

එම රැලියේදී ඔහු දිගු කථාවක්ද නොකළේය. ඔහු කියා සිටියේ රාජපක්ෂවරුන් ඉතා හොඳ මිනිසුන් බවත්, ප්‍රතිවාදී අපේක්ෂකයා වන්නේද දිගු කාලයක් තිස්සේ ප්‍රදේශයේ මෙන්ම රටේද ඉතා ජනප්‍රිය හා බලවත් පුද්ගලයකු වූ ජෝර්ජ් රාජපක්ෂ මහතාගේ දියණිය වන නිරූපමා රාජපක්ෂ මහත්මිය බවත්ය. එහෙත් මේ වෙලාවේ "අපි ඔබට අවස්ථාව දී තිබෙන්නේ ඔබගේම පුද්ගලයන්ගෙන් කෙනකු පත්කර ගැනීමටය."

කථාව අවසානයේදී මහත් වූ ප්‍රීතිඝෝෂා හා උද්යෝගී සටන් පාඨ කියවුණේ නැත. මැතිවරණ ප්‍රතිඵලය වූයේ, නිරූපමා රාජපක්ෂ මහත්මිය පදරවා වැඩි ඡන්ද 3521 කින් ආනන්ද කුලරත්න මහතා ජයග්‍රහණය කිරීමය.

ඡන්ද පෙත්සමක් නිසා අවලංගු වූ මන්ත්‍රී ධුරය සඳහා 1985 සැප්තැම්බරයේදී නැවත වරක් එම අසුන සඳහා අතුරු මැතිවරණයක් පවත්වන ලදී. මෙවර ශ්‍රී.ල.නි ප. යෙන් තරග කළේ චමල් රාජපක්ෂ මහතාය. එහිදීද වැඩි ඡන්ද 1329 ක්ලබා ආනන්ද කුලරත්න මහතා ජයග්‍රහණය කළේය.

1996 වසරේ දිනෙක ජේ. ආර්. ජයවර්ධන මහතා නලින් ෆර්නැන්ඩු නම් වූ තම හිතවතකු අමතා එකල එ.ජා.ප. නායකයා වූ රනිල් වික්‍රමසිංහ මහතාට පණිවුඩයක් යැවීමට අදහස් කළේය. පණිවුඩයෙන් කියැවුණේ දකුණු පළාතේ එජාපය දුර්වල තත්ත්වයක පවතින හෙයින් වහාම ඒ සඳහා පිළියම් කිරීම සඳහා තවමත් ප්‍රමාද නැති බවත්, ඡන්ද රැස්වීම් හැකි තරම් සංඛ්‍යාවක් ඇමතීම සඳහා ගාමිණී ෆොන්සේකා මහතා කැඳවා ගත යුතු බවත්ය. (මේ අවස්ථාවේ ගාමිණී ෆොන්සේකා මහතා සිටියේ ත්‍රිකුණාමලයේ වන අතර හේ ආණ්ඩුකාරයාද විය.)

එවිට නලින්ගේ ප්‍රතිචාරය වූයේ "නළුවෙකු මෙවෙලේ පක්ෂයට ඈඳා ගැනීමේ ඇති පලය කුමක්දැ" යි ඇසීමය.

එවිට ජේ. ආර්. ජයවර්ධන මහතාගේ පිළිතුර වූයේ මෙයයි.

"ඒක ඇත්ත. ඒ වුණත් ඔහු ජනප්‍රිය දුරාව කුලයේ කෙනෙක්. ඔහුව මංගල සමරවීරට එදිරිව යොදාගත හැකිය."

මේ අවධියේ මංගල සමරවීර කටයුතු කළේ ප්‍රබල ශ්‍රී.ල.නි.පාක්ෂිකයකු ලෙසිනි. ඔහුද අයත් වන්නේ දුරාව කුලයටය. කුලය හා සම්බන්ධිත දේවල් මේ වකවානුවේ යල් පැනගිය දෙයක් බව නලින් විසින් පවසන්නට යෙදුනි.

ලිපියේ මුලින්ම සඳහන් කර ඇති ප්‍රකාශය ජේ. ආර්. විසින් පවසන්නට යෙදුනේ මෙහිදීය. ඉක්බිති ඔහු නලින්ට කුලය හා දේශපාලනය පිළිබඳ දීර්ඝ ලෙස 'පාඩමක්' කියා දුන්නේය. මෙය දේශපාලන නායකයන්ට මෙන්ම තරුණ දේශපාලකයන්ට හා පක්ෂ සංවිධායකයන්ටද මෙරට පවත්නා කුල සම්බන්ධය නොදන්නා ඕනෑම කෙනකුට ඉතා වැදගත් වන්නක් බව ඔහු කීවේය. පසු කලකදී නලින් ෆර්නැන්ඩු මහතා එහි මූලික කරුණු පුවත්පත් ලිපියක් මගින් ජනතාවටද දැනගන්නට සැළැස්වූයේය.

ජේ.ආර්.ගේ පාඩමට අනුව දුරාව ජනයා ඉතා වැදගත් සාධකයක් වන්නේ හබරාදුව හා තිස්සමහාරාම අසුන් ජය ගැනීම සඳහාය. ගාමිණී ෆොන්සේකා මහතා කැඳවා ගැනීමේ වැදගත්කම රඳා පවතින්නේ දකුණේ රැස්වීම් අමතා ජනතාව දිනා ගැනීම සඳහා වූ බලගතු පුද්ගලයකු වන හෙයිනි. සමරවීර පැලැන්තිය මාතර බලගතුව ඇත්තේත්, නිදහසින් පසු මේ දක්වාම එම අසුන නියෝජනය කරනුයේද දුරාව කුලයට අයත් වන්නන් නිසාය. තවද දුරාව ව්‍යාපාරික ප්‍රජාව මාතර බලගතුය. ඔව්හු තමන්ගේ කෙනකු දිනවීමට කටයුතු කරති.

දකුණේ වෙරළබඩට ඇතුළතින් වූ ආසන සඳහා ගොවිගම අපේක්ෂකයන් ඉදිරිපත් වන අතර, ඔවුනට සියලුම දුරාව ජනයා හෝ වැඩි පිරිසක් හෝ නම්මාගත යුතුව තිබේ. අනෙක් පීඩිත කුලවල ජනයාද දිනාගත යුතුවේ.

කොළඹ දකුණ ආසනයද දුරාව ජනයාගේ බලවත් බව ප්‍රකාශ කරන තවද නිදසුනකි. ඒ අසුන සඳහා තරග කළ බර්නාඩ් සොයිසා (ල.ස.ස.ප) හා එඩ්මන් සමරවික්‍රම (එ.ජා.ප) යන දෙදෙනාම දුරාව ප්‍රජාවගේ බලගතු නායකයන්ය. ඔවුන්ගේ බලපෑම වැල්ලවත්ත, ගල්කිස්ස ප්‍රදේශය දක්වා පැතිර ඇත.

ජේ. ආර්.ගේ පාඩමට අනුව කුලය පමණක් නොව ආගම මෙන්ම ජාතියද දේශපාලනයේදී වැදගති. සමහර අසුන්වලට අපේක්ෂකයන් තේරීමේදී ඒ බව සැළකිය යුතුම කරුණක් වන්නේය. නිදසුන් ලෙස ඔහු දක්වා ඇති අසුන් කීපයක් මෙසේය.

- කටාන- සලාගම, දුරාව, සිංහල
- බළපිටිය - සලාගම,
- මොරටුව - කරාව, සිංහල බෞද්ධ
- අම්බලන්ගොඩ - කරාව සිංහල

තවද ජේ.ආර්. පැවසූ පරිදි විජය කුමාරණතුංග මහතා සිරගත කළේ 'නක්සලයිට් සම්බන්ධය' නිසාම පමණක් නොවේ. (ඔහු දුරාව කුලයට අයත් වූවෙකි) එ.ජා.පයට තර්ජනයක් වූ නිසාය. ඒ ඔහුගේ හා චන්ද්‍රිකාගේ සම්බන්ධය හේතුවෙනි. විජය කුමාරතුංග මහතා නිදහස් වීමෙන් පසු, කලකදී ඔහු හමුවූ විටදී අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් ජේ. ආර්. කනගාටුව ප්‍රකාශ කර සිටියේය. එවිට විජයගේ පිළිතුර වූයේ "සර්, ඔබගේ තත්ත්වයේ සිටියේ නම්, මම කරන්නේද එයමැ" යි යන්නය.

කුලය පිළිබඳව මෙසේ නිදහසේ කථා කිරීම නොමැනවයි ජේ.ආර්. පිළිගත්තද, දේශපාලනයේදී හා ඡන්ද ව්‍යාපාරයේදී එය අත්‍යවශ්‍ය වූ උපායමාර්ගයක් වන බවද හේ පැවැසීය. තරුණ දේශපාලකයන්, කුලය මේ රටේ වැදගත් සාධකයක් බව නොදන්නා එක ගැන තමා ඉතා කනගාටුවන බවද තවදුරටත් ඔහු කීවේය.

මේ විෂයය හා සම්බන්ධයෙන් ප්‍රවීණ කණ්ඩායමක් එ.ජා. පක්ෂයට සිටි බවද ඔව්හු ඡන්ද ව්‍යාපාරයට බැසීමට පෙර ඒ සම්බන්ධයෙන් අධ්‍යයනය කළහ. ඔවුනතර සිටිය පිරිසෙන් කීප දෙනෙකු ද ඔහු නම් කළේය. ඒ එස්මන්ඩ් වික්‍රමසිංහ, ජේ. එල්. පර්නැන්ඩු (ලේක්හවුස්) හා ආනන්ද තිස්ස ද අල්විස් යන මහතුන්ය. මේ අය අද වනවිට ජීවතුන් අතර නැත.

ප්‍රසිද්ධ වේදිකාවන්හි විශේෂයෙන් දේශපාලන රැස්වීම්වලදී කුලය ගැන කථා කිරීම හා ඒ ගැන කියමින් පුද්ගලයන්ට අපහාස කිරීම කළයුතු නොවේ. එහෙත් හොඳ දේශපාලනඥයකුට මෙම විෂය ඉතා හොඳින් කිසිවෙකුගේ සිත නොරිදෙන පරිදි නොඇසෙන හා නොපෙනන ආකාරයට සාර්ථක ලෙස මෙහෙයවිය හැකිය.

ජේ. ආර්. ජයවර්ධන මහතාගේ ඉහත සඳහන් පාඩමට අමතරව අපටද නිරීක්ෂණය කළ හැක්කක් අතීතයෙන් සොයාගත හැකිය. ඒ අතීත මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කරන කොමිසම විසින්ද කුලය ගැන සළකා කටයුතු කර ඇති බවයි. 1946 දී එම කොමිසම විසින් නිර්ණය කරන ලද බහු ආසන ගණනාවක්ද විය. මන්ත්‍රීවරුන් තිදෙනකු සඳහා මැද කොළඹද, දෙදෙනකු බැගින් තෝරාගත හැකි පරිදි ආසන හතරක්ද (කඩුග න්නාව, අම්බලන්ගොඩ, බළපිටිය, බදුල්ල හා බලංගොඩ) එමගින් බිහිවිය. මෙහිදී මැද කොළඹ හා බදුල්ල යන බහු ආසන දෙක වාර්ගික (ජාතිය) සංයුතිය සළකාද බිහිකර ඇති බව පෙනේ.

1947 ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයේදී ඉහත කී බහු ආසන තුන සඳහා පත්වූ නියෝජිතයන්ගේ කුලය සැළකීමෙන් මේ බව තහවුරු වේ.

### අම්බලන්ගොඩ - බළපිටිය

- ආතර් ඩී. සොයිසා (සලාගම), විලියම්ද සිල්වා (කරාව)

### කඩුගන්නාව

- ඒ. ඊ. නුගවෙල (ගොවිගම), එච්. ආර්. යූ. ප්‍රේමචන්ද්‍ර (පන්නාදුරයා)

### බලංගොඩ

- ඒ. එෆ්. මොලමුරේ (ගොවිගම), ඊ. ඩබ්ලිව්. මැතිව් (වහුම්පුර)

පසුව 1959 දී වෝල්ටර් තල්ගොඩපිටිය මහතාගේ ප්‍රධානත්වයෙන් ඇතිකරන ලද මැතිවරණ කොට්ඨාස නිර්ණ කොමිසමද යම් යම් ප්‍රබල වෙනස්කම් කරන ලද්දේ වුවද කුල සාධකයට විශාල වශයෙන් සැළකිල්ලක් දක්වා ඇති බව පෙනේ. සමානුපාතික ඡන්ද ක්‍රමය මෙම පීඩිත කුලයන්ට මහත් වූ අස්වැසිල්ලක් ගෙන දුන් බව නොකියා නොහැක.

සමස්ත සිංහල ජනගහනයෙන් ඒ ඒ කුලවලට අයත් ජන සංයුතිය ගැන සඳහන් නොකළොත් විශාල අඩුවක් වනු නිසැකය.

1981 මුළු ජනගහනයෙන් (සිංහල) සියයට 37 ක් ගොවි කුලයට අයත් වේ. කරාව, දුරාව සහ සලාගම කුලයන්ට අයත් වන සංඛ්‍යාව සියයට 07 කි. වෙනත් කුලවලට එනම් වහුම්පුර, බත්ගම, පන්නාදුරයා, නවන්දන, නැකති, කුඹල්, රජක හා හින්න යනාදී වශයෙන්වූ කුලයන් සියයට 30 කි.

**Sunday Island ඇතුළු පතපොත ඇසුරෙනි.**

## Saliroo Creations

**All Your Publishing Needs under one roof**

**Graphics**
Illustrations, Logos, Banners, Mags, Books, Brochures, Ads, Flyers.....

**Web Sites**
Web Design, Website Development, Webhosting (Linux & Windows), Shopping Cart Systems.....

**Computer Repairs**
Laptops, Netbooks & Desktop Computors, Replace LCD Screens, Software Installations

**ඔබගේ සියලු ප්‍රකාශන අවශ්‍යතා සහ පරිගණක අලුත්වැඩියාවන් සඳහා**
**Tel : 416 201 0628**

## French Tutoring

Individual and small group classes for French learners
'French reading, writing, and conversing'
Any grade from grade 1-12,
university minors and French Immersion

**Kumudu Abeywardena,**
Masters (French Literature),
BA (Modern Languages), Dip (AFC)

**T.P - 647 824 1897**

## රැකියා ඇබෑර්තු

CALGARY **හි පදිංචි පවුලක නැවතී අවුරුදු 4 ක දියණිය බලා ගැනීමට මැදි වියේ (50 - 60ත් අතර පමණ) කාන්තාවක් සොයනු ලැබේ. කෑම බීම , ඉඳුම් හිටුම් ලබා දෙන අතර වැටුප් සාකච්ජා කළ හැක.**

දු.ක. 647 854 6053

## MARRIAGE PROPOSALS

Professionally qualified well-mannered son is sought by Sri Lankan Buddhist parents living in Toronto, Canada for their daughter 29 years old 5'3" fair and pretty, currently working as a doctor (resident physician) in USA. USA/Canada citizens or permanent residents are preferred. Caste Immaterial. Reply with family details, horoscope and contact information.

**email: donitaproposals@gmail.com**

# පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා පුංචි කතා

## ගඟ ඔරුව හා බිසව

මහනුවර රාජ්‍ය සමයේ (ක්‍රි.ව. 1781-1798) ජීවත් වූ රජවාසල කවටයා යැයි සුපතල අන්දරේ පිළිබඳ විවිධ ජනකතා, කවි රාශියක් ඇත. අන්දරේ ගැන අප්‍රකට ජන කතාවක් ලෙස මෙය කාලයේ වැලිතලාවෙන් වැසී ගියත් ඔහුගේ කියුම් කෙරුම් මගින් ප්‍රබල හාස්‍යයක් මතුවී තිබේ.

එකල අග බිසවට අරුම පුදුම ආශාවක් ඇතිවිය. එනම් හිරු උදාවට පෙර මහවැලි ගඟේ එගොඩ මෙගො‍ඩ ඔරුවකින් ගමන් කිරීමය. මෙය රජතුමාට කී විට ඔහුද තරමක් විමතියට පත්විය. එහෙත් තම සුන්දර එමෙන්ම ආදරවන්ත අග බිසවගේ ආශාව ඉටු කිරීමට රජතුමා පියවර ගන්නේ එය අතිශය පෞද්ගලික කාර්යයක් ලෙස සිතමිනි.

මේ සඳහා තමාට අභ්‍යන්තරව විශ්වාසී පුද්ගලයෙකු ගැන රජතුමා වඩා දැඩි ලෙස කල්පනා කර අන්දරේව තෝරා ගත්තේය.

අන්දරේ මේ ඉල්ලීමට සපුරා කැමති වියශ්‍රී ඒ අනුව අවශ්‍ය ඔරුව, හබල පමණක් නොව බිසවට ඉතා හිතවත් පරිවාර කාන්තාවක්ද යොදා ගත්තේය.

ඉරු එළිය බිමට පතිත වීමට පෙර සිහිල් සුළඟේ පහස විඳිමින් බිසව හා පරිවාර ළඳ තොටුපළ වෙතට එති. අන්දරේ සියල්ල සූදානම් කොට එහි බලා සිටියි. බිසව හා පරිවාර කත ඔරුවට නඟිති. අන්දරේ තොටියාය. ඔහු මහවැලි නදියේ මහා ජල කඳ හබල් ගසා තරණය කරයි. බිසවට ඇති සතුට නිම් හිම් නැත. ඇය වරෙක මහා හඬින් සිනාසෙයි. ගඟ මැදදී ඇතැම් විට අන්දරේ ඇයට පුංචි කවටකමක්ද කරයි. ඇය ඈත කඳුයාය දෙස බලාගෙන විකසිතව සිටියි. මෙසේ සති කීපයක්ම මෙම රාජකාරිය කළත් බිසවට ඇති වීමක් නැත. මේ ආශාව නිමා නොවන අතර ඇය තව තවත් ඔරු පැදීමට ආශා කළාය. ටික දිනක් ගෙවී ගියේය. අන්දරේට මෙය මහත් කරදරයකි. ඔහු දස අත කල්පනා කළේ මෙම ඔරු පැදීම නවත්වන ආකාරය ගැනය.

සීතලේ ගැහි ගැහී ගඟ එගොඩ මෙගොඩ යෑම අන්දරේට අප්‍රමාණ වධයක් විය. ඒ ඔහුගේ වයස නිසාවෙනි. ඔහු මේ ගැන සිත සිතා කළකිරීමෙන් සිටියත් බිසවට ඒ වග හැඟවූයේ නැත. කවට බසින් ඇය සිනා ගන්වා ඔරුවේ තබාගෙන ඔහු තම රාජකාරිය ඉටු කළේය.

එක් දිනක් හිරු උදාවීමට පෙර පාන්දරම තොටුපළට ගිය අන්දරේ තමාගේ නිල ඇඳුම් සියල්ලම සෝදා අමුඩයකින් සැරසී ගත්තේය. එසේම ඔරුව හිල්කොට විසල් කිරිමැටි ගුලියක් එම සිදුර තුළට ඇතුළු කොට වසා දැම්මේය.

සුපුරුදු චාරිකාව සඳහා බිසව හා පරිවාර කාන්තාව පැමිණියහශ්‍රී අන්දරේගේ ඇඳුම ගැන ඔවුන් තුළ විමතියක් විය.

බිසව ඔරුවට අඩිය නොතබා ඒ ගැන ප්‍රශ්න කළාය.

“මොකද අන්දරේ මේ අමුතු ඇඳුමකින්?”

“එහෙමයි බිසවුන් වහන්ස... මගේ ඇඳුම් ඔක්කොම ගොමස්කඩවෙලා. මං අද ඒවා දියේ එබුවා. හේදුවා. ඒකේ ප්‍රශ්නයක් නෑ. යහපත් වෙන්න අපි ගමන පටන් ගමු.”

බිසව පරිවාර ස්ත්‍රිය සමඟ ඔරුවට ගොඩ වූහ. අන්දරේ ගඟ මැඳට ඔරුව ක්‍රමයෙන් පැදගෙන එත්ම කිරිමැටි ගෑ සිදුර ජලයෙන් පෙඟී දිය වී ඔරුවට වතුර ගලා එන්නට විය. ක්‍රමයෙන් ජලය ඔරුව තුළට ශීඝ්‍රයෙන් පැමිණේ. මෙය දුටු බිසවත් පරිවාර ස්ත්‍රියත් මර හඬ නඟන්නට වූහ.

මහවැලි ගඟේ මහා ජලස්කන්දයට අනිවාර්යයෙන්ම තමන් බිළිවෙන බව දැන් බිසවට විශ්වාසය. එහෙත් අන්දරේ ඒ බව නොදත් සේ ඔරුව පදියි. ඇයගේ මර හඬ වේගයෙන් ඇසේ.

“අනේ අන්දරේ අපි ඉවරයි ඔරුව හිල් වෙලා ඔන්න වතුර දානාව...” ඇය හඬමින් වැළපෙමින් කෑ ගසයි. අන්දරේගේ කිසිම ප්‍රතිචාරයක් හෝ බයක් නැත.

“අනේ අන්දරේ මොනව හරි කරන්න” නැත්නම් අපි ඉවරයි.

අන්දරේ වහා ක්‍රියාත්මක විය. තම අමුඩය කඩා ගුලියක් කොට තමාම සිදුරු කළ ස්ථානයට ඇබයක් සේ ගැසීය.

ඔවුහු සියලු දෙනාම නිරුපද්‍රිතව මෙගොඩට ආහ.

ඉන්පසු කිසිම දිනක බිසව ඔරුව පැදීමට නොව ගඟ ඇති පැත්තකට හෝ නොගියාය.

## ලොකුම බොරුව

අන්දරේගෙ කාලෙ හිටපු රජතුමාත් අන්දරේ වගේම තමයි. එතුමා විහිළු තහළු වලට බොහොම මනාපයි.

ඉතිං දවසක් දා අමාත්‍ය මණ්ඩලය රැස් වුණු වෙලාවක රජතුමා කියනවා “හෙට හැමදෙනාම එක බොරුව බැගින් කියන්ට වුවමනායි, ලොකුම බොරුව කිව් තැනැත්තාට වටිනා ත්‍යාගයක් දෙනවා” කියලා. මේ වෙලාවෙ අන්දරේ රාජ සභාවෙ හිටියෙ නෑ.

ඉතිං අමාත්‍යවරු ටික ගෙදර ගෙහුං තෑග්ග ගන්ට හිතාන රෑ නිදිවරාණ රටේ ලෝකෙ නැති බොරු බේගල් කල්පනා කොරා. ඉතිං කොහොම හරි පහුවදා රාජ සභාව රැස්වුණා කියමුකො. අන්දරෙත් ආවා. පස්සෙ ඉතිං මේ ඇමතිවරු ටික රාජ නියෝගය පරිදි නමෝවිත්තියෙන් බොරු කීම ආරම්භ කළා. අන්දරෙත් මොකද කරන්නෙ මේ ගල් පැලෙන බොරු අහගෙන හිනහ වෙවී හිටියා. කට්ටියම බොරු කියලා අහවර වුණාට පස්සේ අන්දරේ රජතුමා ළඟට ගෙහුං වැඳ “දේවයන්වහන්ස මටත් යමක් කීමට අවසරදැ” යි අසා සිටියා.

“ඔව් තොපටත් යමක් ඇත්නම් කියවැ” යි රජතුමා පිළිතුරු දුන්නා.

පස්සෙ අන්දරේ එවෙලේම ගොතාගත් කවියකින් මෙහෙම දෙයක් කිව්වා.

රජකම් කලත් ඉඳගෙන සිහසුනක මත
ඔබ ගොන් රජෙකි මේ මහ ගොන් රැලට හිත
ඔබ මෙන් කුහක නින්දිත අධමයකු කැත
මුළු ලංකාවෙ වෙන කිසියම් තැනක නැත

අන්දරේ මෙය කියා අවසන් වනවාත් එක්කම මුළු රාජ සභාවම කලබල තත්වයකට පත්වුණා. රජතුමා ඇතුළු තමනුත් ගොන් රැලක් යැයි පැවසූ අන්දරේ රාජ උදහසට ලක් විය යුතු බව රජු හැර අනෙක් සියලුදෙනා ඒකමතිකව තීරණය කලා. ඒත් රජතුමා මහ හඬින් හිනාවෙලා,

“අන්න හරි අන්දරේටයි තෑග්ග. මේ තරම් විශාල බොරුවක් කව්රුත් කිව්වෙ නැහැ. මගේ රාජ සභාවෙහි සිටින්නේ ගොන් රැලක් වගද මමද නින්දිත කැත අධමයෙක් යයි කීම අදහාගත නොහැකි බොරුවක්” යැයි කියා අන්දරේට තෑග්ග බාර දුන්නා.

## කැස්ස නැවැත්වීම

අන්දරේ කටකාරයා බව අමුතුවෙන් කියන්න ඕන නැහැනෙ. හැබැයි අන්දරේ තමන්ගෙ ගෞරවය ගැන මනාවට හිතපු කෙනෙක්. රජ්ජුරුවන්ට උසුළු විසුළු කිරීමට ඔහු කටයුතු කළාට ඔහුට විහිළුවක් කරන්න කාටවත් බැරිවුණා. ඒ අන්දරේ පරද්දන්න කාටවත්ම බැරි වුණු හින්ද. විහිළු වගේම අන්දරේ වස් වදින්න ගණ පිහිටුවා කවි කියන්නත් දක්ෂයි කියල දන්නවනෙ.

ඉතින් මේ විදිහට තමන්ගෙ දක්ෂතාවයන් පෙන්වමින් ඉන්නකොට දවසක් අන්දරේට නඩුවක සාක්ෂියකට කැඳවීමක් ලැබුණා. අද වගෙම ඒ කාලෙත් අධිකරණය තිබුණෙ කොටස් කිහිපයකින් සමන්විත වෙලායි. බරපතල නඩු රජ්ජුරුවන් අහනකොට මහා අධිකාරම්වරු, නිලමේවරු හා ගම්මුලාදෑනීන් සුළු නඩු විසඳන්න කටයුතු කළා. අන්දරේටත් කැඳවීම ලැබුණෙ නිලමේවරයෙක් අසන ලද සුළු නඩුවක් සඳහායි. අන්දරේ මෙයට සහභාගි වුණේ කැමැත්තකින් නොවෙයි. නොගිහින් බැරි නිසයි.

“සියල්ලොම නිෂ්ශබ්ද වෙනු” අධිකරණයෙ වැඩ ආරම්භ කළා. නමුත් නිශ්ශබ්දතාව කඩ කරමින් අන්දරේට කැස්ස.

නිලමෙ නැවත වරක් “සියල්ලොම නිෂ්ශබ්ද වෙනු” කියල කිව්වෙ අන්දරේගෙ කැස්ස කරදරයක් වුණු නිසයි.

නමුත් අන්දරේ අත ඇරියෙ නෑ. දිගටම කැස්සා. මහ හයියෙන් කැස්සා. කහින ගමන් කෙළිරි ගෑවා. වැඩේ කරගෙන යන්න දුන්නෙම නෑ.

“යුෂ්මතාට සිංහල තේරෙන්නෙ නැද්ද ?” නඩුකාර උන්නාන්සෙට කේන්ති ගිහින්. අන්දරේ ඇහුනෙ නෑ වගේ ඉන්නව. නැවත රාජකාරි ආරම්භ කළා. පුදන කොටම කාපි යකා කියල අන්දරේ පෙරටත් වඩා හයියෙන් කහිනව.

මේකට මළ පැනල නඩුකාර උන්නාන්සෙ “නිශ්ශබ්දතාව කඩ කිරීමේ වරදට යුෂ්මතාට පතාග දහයක් දඩ” යැයි නියමකරනව. ඔන්න එතකොට අන්දරේට මළ පනිනව. “ස්වාමිණි මම සාක්ෂි දීල ඉවරවෙනකම් මේ කැස්ස නතර කරල දෙන්න පුළුවන්ද ?” නක්කලේටම ඇහුවා. “ඒක කරල දුන්නොත් මම ඔබ වහන්සෙට පතාග දහයට සීයක්ම ගෙවන්නම්”

නඩුකාර උන්නාන්සෙට තරු පෙනුණා. ඔන්න එතකොට ඇවිත් ඉන්න ඔක්කොම හිනා වෙනව. තමන්ට දෙන්න උත්තරයක් නැති තැන නඩුකාර උන්නාන්සෙ දඩය අකුල ගත්තා.

## බෞද්ධ සංස්කෘතියේ එන

# රහත් වීම

■ **ලසිකා ආරියරත්න**

රහත් බව හා නිර්වාණය සඳහන් වන්නේ බෞද්ධ සාහිත්‍යයේ ඉපදීම දුකක් බව පවසන බුදු දහම, නිර්වාණ මාර්ගයේ උසස්ම අවස්ථාවට පත්වීම නැවත ඉපදීම නැවැත් වූ තැනැත්තන් බුදු, පසේ බුදු, අර්හත් යන නම්වලින් හඳුන්වා ඇත. එසේ රහත් බව ලැබූ භික්ෂූන් මෙන්ම බුදුන් වහන්සේද යම් යම් අවස්ථාවලදී ප්‍රාතිහාර්යය පෑ බවද බෞද්ධ සාහිත්‍යයේ සඳහන්ය. එපමණක් නොව රහත් බව නොලැබූ ධ්‍යානලාභීන්ද ප්‍රාතිහාර්ය පෑ අවස්ථා අට්ඨ කථාවල සඳහන්ය.

සරල උදාහරණයක් ලෙස මිහිඳු මහ රහතන් වහන්සේ අම්බස්ථලයට වැඩම වූ කල්හි දෙවනපෑතිස් රජතුමා උන්වහන්සේට අනුරාධපුර නගරයට වැඩම කිරීම සඳහා වාහනයක් යැවූ නමුත් උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කරමින් අහසින් අනුරාධපුරයට වැඩම කළ බවත් එසේ පැමිණ පා තැබූ තැන රජතුමා පඨමක චේතිය සෑදූ විස්තරයත් මහාවංසයේද එහි ටීකාවේද විස්තර වීම දැක්විය හැකිය.

සීහලවත්ථුපකරණයේ සඳහන් පරිදි කුඨජතිස්ස රහතන් වහන්සේ තම පරිනිර්වාණයෙන් පසු සද්ධාතිස්ස රජතුමා තුළ තම රහත්භාවය පිළිබඳ තිබූ සැකය නැති කිරීමට තම දේහය ආදාහනයට ගෙන යන අවස්ථාවේ ප්‍රාතිහාර්යයක් පෑමට සැලැස්වූ බව සඳහන්ය. මෙම පුවත මනෝරථපුරණියේද සඳහන්ය. මෙවැනි සිද්ධීන් බොහොමයක් බෞද්ධ සාහිත්‍යයේ සඳහන්ය.

එසේම සමහර භික්ෂූන් තමන් රහත් වී ඇතැයි මුලා වී කටයුතු කළ අවස්ථාද අට්ඨකථාවල සඳහන්ය. තමා රහත් යැයි යම් භික්ෂුවක් පැවසුවහොත් එම භික්ෂුවගෙන් ප්‍රශ්න කළ යුතු බවත් ඒ සඳහා ලැබිය යුතු පිළිතුරක් මජ්ඣිම නිකායේ ජබ්බිසෝදන සූත්‍රයේ සඳහන්ය. සමහර භික්ෂූන් තමා රහත් යැයි මුලා වී සිටි බවද එහි සඳහන්ය. අට්ඨකථාවල නිතර සඳහන් පරිදි රහතන් වහන්සේලා පෘථග්ජන මනුෂ්‍ය වාසයෙන් ඈත්ව විසීමට ප්‍රිය කළහ. ආරාධනා පිළිගැනීමට අකමැති පිරිසක් වූහ. මජ්ඣිම නිකායට්ඨ කථාවේ සඳහන් පරිදි තලංගර ධම්මදින්න රහතන් වහන්සේ භික්ෂූන්ට කමටහන් දීම සඳහා වුවද තිස්සමහාරාමයට ගෙන්වා ගෙන ඇත්තේ බොහෝ ඇවිටිලි කිරීමෙනි. මනෝරථපූරණියේ හා සීහලවත්ථුපකරණයේ දැක්වෙන්නේ සද්ධාතිස්ස රජතුමා කුඨජතිස්ස රහතන්වහන්සේ වෙත උපදෙස් ලබාගැනීමට ගිය සෑම අවස්ථාවකම එය මඟ හැරී බවකි.

'සපත්තභාරෝ පක්ඛී සකුණා විය' යන්නෙන් භික්ෂූන් පියාපත් බර පමණක් ඇති පක්ෂියෙකු මෙන් බහු භාණ්ඩවලින් තොර අල්පේච්ඡ දිවියක් ගත කළ බව සඳහන්ය. අඩුම වශයෙන් චීවරය පවා වටිනාකමකින් තොරව කැබලිවලට කපා කසට වර්ගවලින් වර්ණ පොවා ගත යුතු අයුරු විස්තරව ඇත.

සමන්ත පාසාදිකාවේ සඳහන් පරිදි රහතන් වහන්සේ නමකගේ හිසට හෙණ පහරක් වැදුණද බිය නොවන්නේය. විශුද්ධි මග්ගයේ දැක්වෙන්නේ සිල්වත් මහානාග තෙරුන් තමා රහත් වී ඇතැයි මුලා වී සිටියෙන් භයංකර වේසයෙන් තමා හඹා එන ඇතකු මවන්න යැයි සිය ශිෂ්‍ය ධම්මදින්න තෙරුන් ඉල්ලූ බවත් එසේ මැවූ කල හඹා එන ඇතා දුටු මහානාග තෙරුන් බිය වී දුවන්නට සැරසුන බව හා එමගින් තමන් රහත් වී නැති බව වටහා ගත් බවයි. එසේම රහත් වී ඇතැයි මුලා වූ ථෙර නමක් කැලණි ගඟේ දිය නාමින් සිටියදී වෙනත් භික්ෂුවක් උන් වහන්සේ පිරික්සීම සඳහා දියේ කිමිද ගොස් කකුල ඇල්ලූ කල්හි කිඹුලෙකැයි සිතා බිය වී මහ හඬින් කෑ ගැසූ බවට මඣිජිම නිකායට්ඨ කථාවේ ඇති පුවතකි. රහත් යැයි කී භික්ෂුවක් ඉදිරියේ ඒ බව පිරික්සීමට වසභ රජු මසන් අච්චාරුවක් අනමින් රස බැලූ කල්හි එම භික්ෂුවගේ කටට කෙළ ඉනූ බවත් එයින් උන්වහන්සේ රහත් වී නැති බව තේරුම් ගත් බවත් එහිම සඳහන්ය. අට්ඨකථාවන්හි මෙවැනි කථා බොහොමයක් ඇත.

චුල්ලවග්ගයේ කථාවක පිණ්ඩොලභාරද්වාජ ථෙර ප්‍රාතිහාර්යය පෑ පුවත සඳහන්ය. බලන්ගොඩ ආනන්ද මෛත්‍රිය තෙරුන්ගේ ග්‍රන්ථයක සඳහන් පරිදි හිමාලයේ ප්‍රාතිහාර්ය පෑ හැකි ධ්‍යානලාභී ඍෂිවරු සිටිති. මේ අනුව රහත් බව ලැබූ තැනැත්තන්ට ප්‍රාතිහාර්ය පෑ හැකි බව බෞද්ධ සාහිත්‍යයේ දිගින් දිගටම සඳහන් අතර ඒ බව සැක කළ අවස්ථාවල රහතන් වහන්සේලා ප්‍රාතිහාර්යය පා පෙන්වා ඇත.

---

## පෘතුගීසීන් හමුවේ...

44 වන පිටුවෙන්

බලකොටුවක් ඉදිකළ පෘතුගීසීන් එය තම මූලස්ථානය ලෙස යොදා ගන්නා ලදී. ඊට අමතරව අට්ටාපිටිය, ගනේතැන්න වැනි ස්ථානවල බලකොටු තනා උඩරට වට කිරීමටද කටයුතු කළේය. පෘතුගීසීහු තාවකාලිකව අත්තනගල්ල ප්‍රදේශයේද බලකොටුවක් ඉදි කර ඇත. මේ ආක්‍රමණයේදී පෘතුගීසින් ප්‍රදේශ 02 කින් උඩරටට ගමන් කර ඇත. ඒ ගලගෙදර හා බලන දුර්ගයන් හරහාය. ගලගෙදර දුර්ගයත් බලන දුර්ගයත් ආරම්භක මොහොතේදි යටත් කර ගත්තද පෘතුගීසීන්ට ටික දිනකින් බලන අතහැරීමට සිදුවිය. පෘතුගීසි ලේඛකයන් මේ අතහැරීම වාර්තා කර ඇත්තේ 'ගෞරවනීය පසුබැස්ම' වශයෙනි. එයට හේතුව මේ ආක්‍රමණයේදී අසවේදුට තම ජීවිතයත් තම හමුදාවන්ගේ ජීවිතත් ආරක්ෂා සහිතව රැකගෙන පැමිණීමට හැකිවීමයි. කෙසේ වෙතත් උඩරට හමුදාවෝ මැණික් කඩවර, තලම්පිටිය, මීගමුව, රුක්ගහවත්ත වැනි පෘතුගීසි බලකොටු පවා මෙහිදී අල්ලා ගැනීමට සමත් වූහ.

මේ ආක්‍රමණය අසාර්ථක වීමට බලපෑ ප්‍රධාන කාරණයක් වූයේ පෘතුගීසීන්ට සේවය කළ ලස්කිරිඤ්ඤ හටයන් උඩරටට එකතු වීමයි.

මෙවන් තත්ත්වයන් යටතේ පෘතුගීසීන් උඩරට රාජ්‍යයට යම් යම් බාධා කිරීම් කළ අතර ක්‍රි.ව.1628 හා 1629 දී ආක්‍රමණ 02 ක්ද මෙහෙයවිය. ඒ අවස්ථා දෙකේදිම ඔවුන් සෙංකඩගල නුවරට ඇතුළු වී එම නගරය ගිනිබත් කොට ආපසු කොළඹට පැමිණියහ. මේ වන විට ලංකාවේ මුහුදුබඩ පෘතුගීසි කපිතාන් ජෙනරල් ලෙස කටයුතු කලේ කොන්ස්තන්තිනු ද සා නොරොඤ්ඤොාය. ඔහු ක්‍රි. ව. 1630 අගෝස්තු 08 දා කොළඹින් උඩරට බලා පිටත් වූයේ උඩරට යටත් කර ගැනීමේ අරමුණ ඇතිවය. පෘතුගීසි හටයන් 508 ක්ද ලස්කිරිඤ්ඤ හටයන් 5000 ක්ද රැගෙන කොළඹින් පිටත් වූ පෘතුගීසි හමුදා මැණික්කඩවර හරහා ඉදල්ග ස්හින්නට පැමිණ බදුල්ල නගරයට පැමිණීමට සමත් වී ඇත. එම නගරය අල්ලා ගත් ඔවුන් එයට ගිනි තබා මහත් විනාශයක් කළහ.

තමන් සමග ගමන් කළ දේශීය හමුදාවේ සිංහල මුදලිවරුන් අතර කුමන්ත්‍රණයක් ඇතැයි කන වැකුණු කොන්ස්තන්තිනූ ද සා උඩරට අතහැර නැවත වරක් කොළඹ බලා ඒමට තීරණය කර ඇත. නමුත් පෘතුගීසීන්ට වැඩි දුරක්ගමන් කිරිමට හැකියාව ලැබී නැත. සේනාරත්න රජු සමග එකතු වූ සිංහල මුදලිවරුන් යටතේ වූ දේශීය හමුදාවත් රජුගේ හමුදාවත් යන දෙපිරිසම එකතු වී පෘතුගීසි හමුදාවට දින දෙකක් තිස්සේ නොකඩවා පහර දෙන්නට විය. උඩරට ප්‍රහාරයන් මධ්‍යයේ පෘතුගීසීන් බදුල්ල වැල්ලවාය ප්‍රදේශයට පැමිණ ඇත. වැල්ලවාය ප්‍රදේශයේ කන්දපල්ලේ රන්දෙණි වෙලේදී මේ දෙපිරිස අතර අවසන් සටන ඇති වූ බව කියවේ. 1630 අගෝස්තු 20 හා 22 අතර සිදුවූ මේ සටනේදී පෘතුගීසි හටයන් 350 ක් පමණ මරු වැලඳගත් අතර කපිතාන් ජෙනරල් කොන්ස්තන්තිනූ ද සා ද ඒ අතර වුණි. මේ දැවැන්ත යුදමය ජයග්‍රහණය උඩරට රජුට ලබා දීමේදි විශාල කාර්යභාරයක් කළ පුද්ගලයන් කිහිප පළකි. සේනාරත්න රජුගේ පුත් මහා අස්තාන හෙවත් දේව රාජසිංහ ඒ අතරින් ප්‍රබලම චරිතයයි. ඔහු යුද නායකයෙකු ලෙස ඉස්මතු වූයේද මේ සටන් මොහොතේදිය. සියනෑ කෝරලයේ මහා මන්ත්‍රි කත්තොට මන්ත්‍රි, අමරකෝන් මන්ත්‍රි, කුලතුංග වික්‍රමසිංහ මුදලි යන්නවුන්ද මේ යුද්ධයේදී උඩරට ජයග්‍රහණයට දායක වී ඇත. පෘතුගීසීන්ට එරෙහිව කුමන්ත්‍රණයක් කර උඩරට සමග තම යුද හමුදාවන් කැටුව එකතු වූයේ මොවුන්ය.

කෙසේ වෙතත් සේනාරත්න රජුද තම පුතුන් සමඟ පෘතුගීසීන් පැමිණීමට පෙර ඌවට පැමිණියේ මේ ආක්‍රමණය පිළිබඳ ඔහුද කල්වේලා ඇතිව දැන සිටි බැවිනි. මේ ආකාරයට විශාල සේනාවක් රැගෙන උඩරට යටත් කර ගැනීමේ අරමුණින් ගමන් කළ කොන්ස්තන්තීනූ ද සා නොරොඤ්ඤෝටද තම අරමුණ මුදුන් පමුණුවා ගැනීමට හැකි වූයේ නැත. එහිදීද කන්ද උඩරට තම අභිමානය රැක ගන්නා ලදී. ක්‍රි.ව.1635 වර්ෂයේදී උඩරට රාජත්වයේ වෙනසක් ඇති විය. ඒ සෙනරත් හෙවත් සේනාරත්න රජුගේ මරණයෙන් පසු උඩරට සිහසුන ඔහුගේම පුත් රාජසිංහට හිමි වීමයි. දෙවන රාජසිංහ නමින් අප හඳුනාගන්නා මේ පාලකයා කන්ද උඩරට රාජධානියේ බලය උපරිමයට රැගෙන ආ පුද්ගලයා විය. මොහු උඩරට රජවීමට පෙර පටන්ම පෘතුගීසීන්ට එරෙහිව ලන්දේසි නම් යුරෝපා ජාතියෙන් ආධාර ලබා ගැනීමට කටයුතු කරන්නට විය. රජුගේ අරමුණ වූයේ ලන්දේසි නැව් ආධාර රැගෙන පෘතුගීසීන්ට පහර දී ලංකාවේ බලය ලබාගෙන ත්‍රි සිංහලාධීෂ්වර වීමය. එය සාර්ථක නොවුවත් රජු පෘතුගීසීන්ට තවත් කදිම පාඩමක් උගන්වන්නට සමත් වුණි. ක්‍රි. ව. 1630 රන්දෙනිවෙල පරාජයෙන් පසු පෘතුගීසීහු 1633 අවසානයේ මෙරට මුහුදුබඩ කපිතන් ජෙනරල් ධූරයට ප්‍රබලයෙක් වූ දියෝගුදමෙලෝ කැස්ත්‍රෝ පත් කර එවූහ.

ක්‍රි. ව. 1635-38 අතර කාලයේ උඩරට පාලකයා හා ලන්දේසින් සමග ඇති වන ගනුදෙනු පිළිබඳ අවධානයෙන් සිටි කැස්ත්‍රෝ ක්‍රි.ව.1638 මාර්තු මස උඩරට ආක්‍රමණය කිරීමට තීරණයක් ගති. ඒ තීරණයේ හරි වැරැද්ද පිළිබද ඔහු අඩුම තරමින් තම පෙරදිග මූලස්ථානය වූ ගෝවෙන් පවා විමසා සිටියේ නැත. තනි කැමැත්ත මත උඩරට ආක්‍රමණයකට ඔහු සැරසුනේ ලන්දේසීන් සමග උඩරට රජු ඇති කර ගන්නා ගනුදෙනුව තමන්ට අහිතකර වේ යැයි යන බිය නිසාය. ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයන්ට කපිතාන් ජෙනරාල් ලෙස දෙවරක් පත්ව ආ මොහු තම උඩරට ආක්‍රමණයට පෘතුගීසි භේවායන් 700 ක්ද භේවාපන්න හටයන් 28000 ක්ද එක්රැස් කර ගත් බව කියවේ. මේ හමුදාවට පෘතුගීසි ජාතිකයන්ද කාපිරි හා කොන්කනි හටයන්ද ලස්කිරිඤ්ඤ හටයන්ද එකතු වී සිටියහ.

ක්‍රි.ව.1638 මාර්තු මුල හරියේදී ගෝවට ලිපියක් යවමින් සාකච්ඡාවකටත් පෙරම කැස්ත්‍රෝ උඩරට ආක්‍රමණය කළේ ඇයිද යන්න ප්‍රබල ගැටලුවකි. ඇතැම් විට ඔහුට උඩරට රජු හා ලන්දේසින් අතර ගිවිසුමක් ඇතිවේය යන පණිවුඩය දැනෙන්නට ඇත. එවැන්නක් ඇති වීම තමන්ට දැඩි අවාසියක් යයි සිතූ කැස්ත්‍රෝ මෙවැන්නකට පෙලඹෙන්නට ඇත. පෘතුගීසි මූලාශ්‍රයන්ට අනුව මේ ආක්‍රමණයට ආසන්න හේතුව වූයේ විකිණීම සඳහා ඔහු උඩරටට යැවූ අසුන් කණ්ඩායමක් උඩරට රජු පැහැර ගත් නිසා එයට පළිගැනීමක් ලෙස මෙය කළ බවයි.

ප්‍රබල හමුදාවක් රැගෙන පෘතුගීසීන් උඩරටට ගමන් කරද්දී පෙර පරිදිම උඩරට රජු හා ජනතාව මහනුවර නගරය අතහැර පසු බැස්සාහ. මහනුවර නගරයට ඇතුළු වූ පෘතුගීසීන් ඒ නගරයට ගිනි තබා ගන්නෝරුව වෙළේ කඳවුරු බැඳ ගති. මේ මොහොතේදීද උඩරට බලා ගමන් ගත් පෘතුගීසි හමුදාවේ කණ්ඩායමක් උඩරටට එකතු විය. බියට පත් වූ ඉන්දියන් භට කණ්ඩායමක් එලෙස එකතු වීමත් සමග පෘතුගීසින් නැවතත් දුර්වල වූහ. මතු වු තත්ත්වයෙන් ප්‍රයෝජන ගත් දෙවන රාජසිංහ රජුගේ හමුදා නැවතත් පෘතුගීසීන්ට පහර දී උඩරට රාජ්‍යයේ ස්වාධීනත්වය රැක ගත්හ. මහාචාර්ය ටිකිරි අබයසිංහ මහතා තම, පෘතුගීසීන් හා ලංකාව නැමති කෘතියේ සඳහන් කරන්නේ මේ සටනින් ජීවිතය ගලවා ගත්තේ පෘතුගීසි හටයන් 04 දෙනෙකු පමණ බවය. නමුත් මහාවංසය වාර්තා කරන්නේ මෙයින් 33 දෙනෙකු ජීවිතය ගලවා ගත් බවය. රාජාවලියද මේ ජයග්‍රහණය පිළිබඳ තොරතුරු වාර්තා කර ඇත.

### උඩරට රැකුණේ ඇයි

කන්ද උඩරට රාජධානියේ ස්වාභාවික පිහිටීමද ඇයට තම ස්වාධීනත්වය රැකගැනීමට යම් ප්‍රමාණයකට ආධාර විය. ඇතැම් උගතුන් මේ සාධකය ප්‍රබල කාරණයක් ලෙස හුවා දැක්වීමට උත්සාහ ගත්තද එය සාධාරණ නැත. මලය රට හෙවත් කන්ද උඩරට රාජධානිය වන දුර්ග, ගිරි දුර්ග හා ජල දුර්ග ආදියෙන් සමන්විත වුණි. ඇතැම් තැන්වල පංක හෙවත් මඩ දුර්ගද වුනි. මෙයින් උපරිම රැකවරණයක් නොලැබූ බව පහත සිදුවීම් තුළින් පෙනේ. ක්‍රි.ව.1594 දී පෙද්රෝ ලෝපේස් ද සූසා මහනුවරට ඇතුළු වී දෝන කතිරිනා රජ කළේ මේ සියලු තත්ත්වයන් මැදය. ක්‍රි.ව.1602/03 අතර කාලයේදී අසවේදු ගලගෙදර අල්ලා ගත් අතර ක්‍රි.ව.1611 දී බලන දුර්ගයද යටත් කරගත්තේය. එමෙන්ම මේ වර්ෂයේදී ඔවුන් හාරිස්පත්තුව, ගම්පොල, තුම්පනේ ඇතුළු ප්‍රදේශවලට ඇතුළු වූහ. ක්‍රි.ව.1630 කොන්ස්තන්ති නූ ද සා බදුල්ල නගරය අල්ලාගෙන එයට ගිනි තැබීය. එමෙන්ම කැස්ත්‍රෝ 1638 මහනුවර නගරය යටත් කරගෙන එයද ගිනි තැබීය. මේ අවස්ථාවලින් පෙනෙන්නේ උඩරට ස්වාභාවික රැකවරණය එහි ආරක්ෂාවට ප්‍රබල සාධකයක් නොවූ බවය.

කෙසේ වෙතත් පෘතුගීසීන් උඩරටදී මුහුණ දුන්නේ එළිපිට කරන ලද සටන්වලට නොව සැඟවී කරන ලද ප්‍රහාරයන්ටය. උඩරට සතු මේ ගරිල්ලා සටන් ක්‍රමයට මුහුණ දීමට පෘතුගීසීන්ට හැකියාවක් තිබුණේ නැත. මෙය ඔවුන්ට උඩරට යටත් කර ගැනීමට අපහසු වූ ප්‍රධානම කරුණ ලෙස පෙන්වා දීමට පුළුවන. මෙයට අමතරව කන්ද උඩරට රාජධානියේ ආරක්ෂාවට බලපෑ ප්‍රධානම කාරණය ලෙස පෙන්වා දිය හැක්කේ ඔවුන් සමග ගිය ලස්කිරිඤ්ඤ හමුදාව තීරණාත්මක අවස්ථාවලදී පෘතුගීසීන්ව අතහැර යෑම නිසා ඔවුන් උඩරටදී අතරමං වීමයි.

# දෙවියන්ගේ දියණිය...

30 වන පිටුවෙන්

දෙනෙකුට සැඟවී සිටින්නට ප්‍රමාණවත් තරම් ඉඩක් සහිතව බිත්තියක් බැන්දේය. මේ කාර්යය නිමවූ දිනට පසු දිනම ස්ටෙෆානියා අසුභ පුවතක් රැගෙන ගෙදර ආවාය.

"නාසි හමුදා භටයෙක් එහා ගෙදර ඉන්නවා.."

එතැන් සිට අල්පෙනෙත්තක් බිම වැටෙන හඬක්වත් නංවන්නට කිසිවෙකු බිය විය. නින්දෙන් ගොරවන ශබ්ද පවා වළකන්නට එක් එක් රාත්‍රීන්වල අවදිව සිටින්නට එක් එක් අයට පැවරිණ. කිසිවෙකු නින්දෙන් ගොරවන හැම වාරයකම අවදිව මුර කරන්නා විසින් ගොරවන තැනැත්තාව නිහඬ කරවන ලදී.

ස්ටෙෆානියාගේ මිතුරන් ඇයව දකින්නට පැමිණීමද ගැටලුවක් විය. ඇයව මුණ ගැහෙන්නට යම් කිසිවෙකු පැමිණෙන හැම අවස්ථාවකදීම කුමක් හෝ කියා ඒ අමුත්තාව ඉක්මනින් පිටත් කිරීමට ස්ටෙෆානියා කටයුතු කළාය. මෙවන් අවස්ථාවලදී බරපතලම කරදරය සිදුවූයේ ස්ටෙෆානියාට ආදරය ප්‍රකාශ කරමින් ඇය පසුපස ආ තරුණ ගැටයාගෙනි. ඔහු බොරු හේතු මවමින් ඉක්මනින් එළවා ගත හැකි කෙනෙකු නොවීය. එහෙත් එක් දිනක් ඔහු එන විට මහලු දන්ත වෛද්‍යවරයා නවත්වා ගත නොහැකි තරම් තද කැස්සකින් පෙලෙමින් උන්නේය. තරුණයා යන තුරු දන්ත වෛද්‍යවරයා කැස්ස නවත්වාගෙන උන්නේ වෑයමිනි. ඔහු ගිය පසු ස්ටෙෆානියා කළේ නගරයේ උන් කඩවසම් ජර්මන් සොල්දාදුවෙකුගේ පින්තූරයක් සාලයේ එල්ලා ගැනීමය.

"කවුද ඒ....?" ඊළඟ දිනයේ පැමිණි තරුණයා ස්ටෙෆානියාගෙන් ඇසුවේය. "ඒ මම බඳින්න ඉන්න කෙනා....." ස්ටෙෆානියා උත්තර දුන්නාය. ඉන්පසු ඒ තරුණයාගේ පැමිණීම එහෙම පිටින්ම නතර විය.

සති දෙක තුනක් යද්දී ඔවුන් අත වූ මුදල් සීඝ්‍රයෙන් ඉවර වී යමින් පැවතිණ. කුසගින්න නිවස තුළට රිංගා ගත්තේය.

මුදල් සොයන්නට නිවසින් පිටතට යා හැක්කේ ස්ටෙෆානියාට පමණකි. කුඩා කම්හලක, කම්කරු රැකියාවක් කරන යුවතියක් දහතුන් දෙනෙකුගෙන් යුතු පිරිසක් පෝෂණය කරන්නේ කෙසේද? පරිසරයේ වූ අධික ශීතල මකා ගන්නට පොරෝනාවක් ගන්නට හෝ සෑහෙන මුදලක් ස්ටෙෆානියා අත නොවීය. ඒ නිසා දිනක් කම්හලේ දහවල් කෑම පැයේදී ස්ටෙෆානියා වුල් පොරෝනාවක් ගොතන්නට වූවාය. ඒ දුටු එක් පුද්ගලයෙක් තමාට මුදලට පොරෝනාවක් ගොතා දෙන්නට හැකිදැයි ඇගෙන් ඇසුවේය. ස්ටෙෆානියා සතුටින් ඒ කාර්යය භාරගත්තාය.

කල් යත්ම ස්ටෙෆානියා අතින් ගෙතෙන පොරෝනාවලට හොඳ ඉල්ලුමක් ලැබෙන්නට විය. ටාටරස්කා වීදියේ නිවසේ සියල්ලෝම දිවා රෑ නොබලා පොරෝනා ගොතන්නට වූහ. පොරෝනාවල උසස් තත්ත්වයෙන් සෑහීමට පත්වෙන ගැණුම්කරුවන්ගේ අවධානය ස්ටෙෆානියා අතින් අලෙවි වන අසාමාන්‍ය පොරෝනා සංඛ්‍යාව ගැන යොමු නොවීය.

1943 වර්ෂයද එළඹිණ. ජර්මානුවන් යුද්ධයෙන් පැරදෙමින් සිටින බවට කට කතා පැතිරෙන්නට විය. එහෙත් ඕනවට වඩා සුභවාදී බලාපොරොත්තු තබා නොග න්නට ජෝසෆ් වගබලා ගත්තේය. "ජර්මානු හමුදා තාමත් නගරයේ ඉන්නවා.. පැරදෙන නිසා ඒ ගොල්ලෝ දරුණු වෙනවත් වැඩියි.."

දිනක් උදෑසන ස්ටෙෆානියා රැකියාවට යන්නට පිටත් වූවාය. පොලිස් සයිරන් නලා හඬක් ඇසිණ. නිවෙස් කිහිපයකට එහායින් වූ නිවෙසක් නාසි හමුදාව විසින් වට කරන ලදී. අනතුරුව ඔවුහු බියෙන් ගැහෙමින් උන් යුදෙව්වන් කිහිප දෙනෙකු හා යුදෙව්වන්ට ආරක්ෂාව සැපයූ පවුලේ අයද වැටලූ ගෙයින් එළියට ඇදගත්හ. ස්ටෙෆානියා සිටි තැනම ගල් ගැසුණාය. නාසි හමුදා භටයින්ගේ තුවක්කුවලින් නික්මුණු වෙඩි හඬට ත්‍රාසයෙන් ඇළලෙමින් සවන් දුන්නාය. මාවත තෙත් කරමින් ගලා යන ලේ දහරා දෙස මොහොතක් භීතියෙන් බලා උන් ඈ ආපසු හැරී නිවසට දිව්වාය. ඊලඟ සති කිහිපය තුළදී ඇයට කෑමට හෝ නිදාගැනීමට නොහැකි විය. තමන්ගේ තීරණයකින් හෙලේනාගේ ජීවිතයත් අනතුරේ හෙළන්නේ කෙසේද.?

තමන්ට තව දුරටත් ඔවුන්ට රැකවරණ සලසන්නට නොහැකි බව කියන්නට එක් දිනක් ඇය ජෝසෆ්ව සොයා කාමරයෙන් එළියට ආවාය. ජෝසෆ් හා අනෙක් තරුණයා උන්නේ හෙලේනාත් සමග සෙල්ලම් කරමිනි. ස්ටෙෆානියා මඳ වෙලාවක් ඔවුන්ගේ සෙල්ලම දෙස බලා උන්නාය. මෙතුවක් කල් තමාත් හෙලේනාත් හුදෙකලාව ගෙවූ දිවියට ලැබුණේ මොන තරම් වෙනසක්ද....? හෙලේනාගේ දෙනෙත් ප්‍රීතියෙන් බබලනු ස්ටෙෆානියා දුටුවාය.

"මේක තමයි මගේ පවුල.. මට මගේ පවුලෙ අයව පාවලා දෙන්න බෑ.." ස්ටෙෆානියා තීරණය කළාය.

මාස කීපයක් ගෙවිණ. මද වැසි සහිත එක උදෑසනක හෙලේනා හදිසියේම ස්ටෙෆානියා වෙතට දිව ආවාය.

"ජර්මන් හමුදාව එනවා...."

යුදෙව්වෝ වහ වහා අටුවට නැග නිසොල්මන් වූහ. ස්ටෙෆානියා ගොස් දොර හැරියාය. නිවසින් ඉවත් වෙන්නට ඔවුන්ට පැය දෙකක් කල් දෙන බව බුම්මා ගත් මුහුණින් යුතු හමුදා නිලධාරියෙක් කියා සිටියේය.

"ඇයි..? අපි මොනවද කළේ....?" ස්ටෙෆානියා ඇසුවාය.

"මේ වීදියේ හමුදා රෝහලක් පිහිටුවන්නයි යන්නෙ. අපේ හෙද නිවාසවලට අපිට මේ ගෙදර ඕන...." එය අණදීමකි.

"ඔයයි හෙලේනායි දැන්මම කොහේ හරි යන්න...." හමුදා නිලධාරීන් පිටව ගිය විට ජෝසෆ් ස්ටෙෆානියාට කීවේය.

"එතකොට ඔයාලා?"

"සටන් කරලා මැරෙනවා...." ජෝසෆ් පිළිතුරු දුන්නේය.

"අපි මෙච්චර දවසක් හිටියෙ එකටනෙ.. සටන් කරන එකත් එකටම කරමු" ස්ටෙෆානියා යාඥා කරන්නට මරිය මව්තුමියගේ පින්තූරය ඉදිරිපිට දණ ගසා ගත්තාය. තමන්ගේ විශ්වාසය තමන්ට පිටු නොපාන බව ඇය දැන උන්නාය.

"බය වෙන්න එපා.. ගෙදර අත් ඇරලා යන්නත් එපා.... දහතුන්දෙනාව උඩ තට්ටුවට යවලා ජනේල අරින්න.... ගේ අස්පස් කරන්න... සතුටින් ඉන්න..." කවුදෝ කාරුණික හඬකින් ඇගේ දෙසවනට මුමුණනු ඇසිණ.

"මං ඔයාලව අත් ඇරලා යන්නේ නෑ... හැම දේම හොඳින් සිද්ධ වෙයි. ඔයාලා උඩ තට්ටුවට යන්න" ස්ටෙෆානියා යුදෙව්වන්ට දැනුම් දුන්නාය.

අනතුරුව ඇය කවුළු විවෘත කොට දමා නිවස පිරිසිදු කරන්නට පටන් ගත්තාය. වැඩි වෙලාවක් යන්නට මත්තෙන් ජර්මානු හමුදා භටයා නැවතත් පෙනී සිටියේය.

"ගෙදර අත් ඇරලා යන්න ඕන නෑ.." ඔහු කීවේය. "අපිට ඕන එක නිදන කාමරයක් විතරයි.. අපේ හෙදියො දෙන්නෙකුට...."

මෙය කබලෙන් ලිපට වැටීමක්ද.? ජර්මන් හෙදියන් දෙදෙනෙකු සිටින නිවසක් තුළ යුදෙව්වන් දහතුන් දෙනෙකු සඟවා තබා ගන්නේ කෙසේද..?

"ඒ ගොල්ලො ඉන්න වෙලාවට කිසි කෙනෙක් කිසිම සද්දයක් නොකරන්න මං වගබලාගන්නම්.." ජෝසෆ් පොරොන්දු වූයේය.

සතියකට පසු ජර්මන් හෙදියන් දෙදෙනා ඒ නිවසෙහි පදිංචියට ආහ. ඔවුන්ගේ දවසින් වැඩි කොටසක් ගෙවුණේ රෝහලේය. එහෙත් රාත්‍රිය නම් සැබෑම හිසරදයක් විය. ජර්මන් සොල්දාදුවෝ නිතරම මේ හෙදියන් මුණ ගැසෙන්නට නිවසට එන්නට පටන් ගත්හ. බොහෝ රාත්‍රීන්වල ඔවුනගේ ඝෝෂකාරී සාදයන් ඉවසන්නට ස්ටෙෆානියාටත් නැගණියටත් සිදු විය. මේ හැම රාත්‍රියකදීම, සැඟවී සිටින යුදෙව්වන් තුළ බියත් දෙගිඩියාවත් කොයි තරම් ගින්නක් අවුළුවන්නට ඇතිද.?

එක් සැන්දෑවක ජර්මන් හෙදියන් දෙදෙනා නිවසට පැමිණියේ තවත් සොල්දාදුවන් දෙදෙනෙකු සමගය. ඔවුන්ගේ කතා බහද අමුතු විය. හදිසියේම එක් හෙදියක් අටුවට නගින තරප්පුව දිගේ නගින්නට වූවාය. යුදෙව්වෝ තනන ලද ව්‍යාජ බිත්තිය පසුපසට වී ගල් ගැසී සිටියහ. හුස්ම ගන්නා හඬ පවා නතර කරගන්නා තරමට ඔවුහු බියපත් වී සිටියහ. බිත්තියේ වූ සිදුරකින් ජෝසෆ් සියල්ල බලා උන්නේය. තරප්පු දිගේ ඇසුණු අඩි හඬ, දුඹුරු පැහැ හිසකේ සහිත හිස් බවට පත් වී මතු මහලට එබෙනු ඔහු දුටුවේය. මද වෙලාවක් එහි රැඳී උන් ඔවුන් නැවතත් තරප්පුව බැස යනු ජෝසෆ්ට ඇසිණ.

මරණයේ තවත් එක් පරීක්ෂණයකින් ඔවුහු සමත් වී සිටියහ.

පසුදින නැවතත් අවාසනාව ඔවුන් සොයා ආවේය. ස්ටෙෆානියා රැකියාව කළ කම්හල වසා දැමෙන බව එහි කළමනාකරු නිවේදනය කළේය. පහලොස් දෙනෙකුගේ ජීවිතවලට අත්වැල සැපයූ ස්ටෙෆානියාගේ වැටුපද ඔවුන්ට අහිමි වී ගියේය. පොරෝනා ගෙතීමේ ප්‍රයත්නය දෙගුණ කරන්නට සියලු දෙනාම උත්සාහ කළහ. එහෙත් එක් පොරෝනාවක් මුදල් සැපයුවේ තිදෙනෙකුට එක් දිනකට ප්‍රමාණවත් කෑම සැපයීමට පමණකි. පොරෝනා මිල දී ගන්නන් සොයා ගැනීමද කල් යත්ම අසීරු විය. කුසගින්නත් සමග දින ගණන් ගෙවෙන්නට විය. සියලු දෙනාම කුසගින්නේ සිටි එවන් දවසක තවත් අභාග්‍යයක පෙරනිමිත්තක් ඔවුන් සොයා පැමිණියේය. රෝහලේ සිට නිවසට පැමිණි එක් හෙදියක් ස්ටෙෆානියාට නියෝගයක් නිකුත් කළාය.

"අපි ආපහු ජර්මනියට යනවා. අපිට අත් උදව්කාරියක් ඕන.. අපිත් එක්ක යන්න ලෑස්ති වෙනවා.."

ස්ටෙෆානියා නිහඬව ගමනට ඇඳුම් සූදානම් කළාය. හෙලේනාට හොඳ ඇඳුම් අන්දවා ඇයවද සූදානම් කළාය. මේ ගමනට තමා කොතරම් කැමතිදැයි ජර්මන් හෙදියන් සමග ප්‍රීතියෙන් යුතුව අතොරක් නොමැතිව කතා කළාය. හෙදියන් පිටත්ව යන බස් රථය පැමිණි විට ඔවුන් රථයට නගිනතුරු බිම සිට පමා වූවාය. සියල්ලන්ම රථයට නැංග පසුත් ස්ටෙෆානියා නැංගේ නැත. බස් රථයේ රියදුරා කීප වරක්ම නළාව හඬ නැංවීය.

"මම යන්නෙ නෑ.. මගේ අදහස වෙනස් කළා.." ස්ටෙෆානියා බිම සිට හඬ නගා කීවාය. කෝප වූ හෙදියන් කෑ ගසන්නටත් බනින්නටත් වූ නමුත් ගමනට හදිස්සියෙන් සිටි රියදුරා රථය ඇද්දුවේය. ස්ටෙෆානියා ප්‍රීතියෙන් සිනාසෙමින් නැවතත් නිවසට දිව්වාය. නිවස තුළ තුෂ්ණිම්භූතව උන් ඇගේ දහතුන් දෙනාගේ පවුල වෙත දිවගොස් ජෝසෆ්ව වැළඳ ගත්තාය.

"මම කොහොමටවත් ඔයාලාව දාලා යන්නේ නෑ.."

ක්‍රමයෙන් නාසි හමුදාවෝ නගරයෙන් නික්ම ගියහ. "ජර්මන් කාරයෝ එනවා.." දිනක් උදෑසනම ජෝසෆ් දිව ආවේය. කවුළුවෙන් පිටත බැලූ ඔවුන්ට දක්නට ලැබුණේ තුවක්කු පවා නැතිව පරාජිත මුහුණුවලින් යුතුව වීදිය දිගේ ගමන් කරන ජර්මන් හමුදා භටයින් තිදෙනෙකි. ඒ ඔවුන් ජර්මන් සතුරන් දුටු අවසන් වතාව විය. ජර්මානුවන් නගරය හැර ගොස් ඇති බවත්, ඔවුන් ආරක්ෂිත බවත් පැහැදිලිවම නිශ්චය කොට ගත් යුදෙව්වෝ මතු මහලින් පහළට බැස්සහ.

නැවතත් ඔවුහු නගරයේ නිදහස් වැසියෝය. ටාටරස්කා වීදියේ නිවසේ සිටි නිවැසියෝ ප්‍රීතිය සමරන්නට වූහ. ජෝසෆ් ස්ටෙෆානියාවත් හෙලේනාවත් දෑතින් වැළඳ ගත්තේය.

1945 යුද්ධය අවසන් වී මාස කීපයක් ගත වූ විට ජෝසෆ් නැවතත් ස්ටෙෆානියාව සොයා ආවේය.

"ස්ටෙෆී.. අදත් මං ආවෙ දෙයක් ඉල්ලන්න. ඔයාට මතකද එදා මං මෙහෙට මුලින් ආපු දවස..? මං ඔයාගෙ න් ඉල්ලුවෙ.. එකම එක දවසක් මේ ගෙදර නවතින්න ඉඩ දෙන්න කියලා...."

"ම්.."

"අද මං ඉල්ලන්නෙ.. මගේ මුළු ජීවිතේම ඔයාගෙ ළඟින් නවතින්න මට ඉඩ දෙන්න කියල. මට ඒකට අවසර ලැබෙනවද...?"

එයින් දින කීපයකට පසුව ජෝසෆ් බර්මින්ස්කිත්, ස්ටෙෆානියා පොඩ්ගරස්කාත් විවාහ වූහ. 1961 දී බොස්ටන්හි රෝහලක දන්ත වෛද්‍යවරයෙකු ලෙස ජෝසෆ්ට රැකියාව ලැබිණ. හෙලේනා වෛද්‍යවරියක වී පෝලන්තයට ගොස් එහිදී විවාහ වූවාය. 1993 දී ජෝසෆ් හා ස්ටෙෆානියාට පෝලන්තය, ඊශ්‍රායලය, ඇමරිකාව වැනි රටවල ප්‍රභූන් සමග වොෂින්ටනයේ හොලොකෝස්ට් අනුස්මරණ කෞතුකාගාරයේ පැවති සමුළුවකට සහභාගි වෙන්නට අවකාශ ලැබිණ. ඔවුන්ගේ සංවේදී කතාන්දරය ලෝකය හමුවට පැමිණියේ එතැනදීය.

# කිටී...

43 වන පිටුවෙන්

මේ බැළලියද මෙම නිවෙසේ හැදෙන අනිකුත් බළලුන්ට වඩා සුරතල් වෙන්නේ ඇය ගැහැනු සතෙක් නිසා වෙන්න ඇතැයි සුභා නිතර සිතයි. මින් පෙර ගැහැනු සතුන් මෙම නිවෙසේ ඇති දැඩි වී නැත. මේ බැළලියද යාබද ගෙදරක හැදුණ බැළලියක් තම නිවෙස දරුවන් බිහිකිරීමට මාතෘ නිවාසය කරගත් බැවින් මෙම නිවෙසට බිළිඳි බැළලිය සින්න වී ඇත. මාස තුනකට වරක් පැටව් නොලැබෙන්නට බෙහෙත් විදිමින් බැළලිය රැක ගැනීමට තීරණය ගත්තේද සුභා වුවද ඒ කාරිය මෙතෙක් කෙරුණේ සුමනේ අතිනි. ඊළඟ බෙහෙත විදීමට ඇත්තේ සුමනේ ගියාට පසුවය.

"පූසිට බේත් විදින ඩොක්ටර්ගේ නම්බර් එක අමතක නොකර මට දීල යන්න."

සුභානි සුමනේ දෙස නොබලාම තේ කෝප්පය සඳහා වතුර ජෝගුවට වත් කළාය.

"අර මගෙ පෝන් එකේ 'කිටී' කියල නම්බර් එකක් ඇති. ඒක අරන් සේව් කරගන්න."

සුමනේ පූසියගේ හිස ආදරයෙන් අතගෑවේය. සුමනේ දෙස මොහොතක් ඇසිපිය නොගසා බලා සිටි සුභාට සිනා පහළ විය. සිනාව මුහුණේ ලැගුම් ගන්නට ඉඩ දුන් ඇය කිරිපිටි හැඳි දෙකක් එකතු කළ තේ කෝප්පය සුමනේ අත තැබුවාය.

සුභාගේ ගවුම් සායේ මල් මුහුණ පුරා විසිරුණ කාරණා නොදත් සුමනසේකර මඳ සිනා පළ කරමින් සුභා දුන් තේ කෝප්පය තොල ගෑවේය.




ඔබගේ සියලුම සංචාරක කටයුතු සඳහා

VMS TRAVELS AND TOURS හි

රාජ් අමතන්න

416 567 5104



VMS TRAVELS & TOURS INC.

3351, Markham Road, Unit 137A, Toronto Ont, M1X 0A6

416 293 5800 | 1 888 655 5575 www.flytrips.ca

48 A , Dr. Lester James Peries Mawatha (Dickmans Road) Colombo 5

94 11 250 21 98

info@vmstravels.ca | www.flytrips.ca





දසත Dasatha

සතුට, විනෝදය, දැනුම එකට කැටිවුණු සොඳුරු නවාතැන

# වෙළඳ දැන්වීම් සඳහා විමසන්න

**Gamini - 416 822 2789**

# ඔබේ නිවසටම දසත Dasatha

**සෑම මසකම දසත පුවත්පත ඔබේ නිවසටම තැපැල් මගින් ගෙන්වා ගැනීමේ අවස්ථාව දැන් සලසා ඇත.**

ඔබගේ නම සහ ලිපිනය සඳහන් කොට පහත සඳහන් ලිපිනයට අදාළ චෙක්පත යොමු කරන්න.

**දසත දායකත්ව ගාස්තු**
**Subscription Rates for Dasatha**

මාස හයක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 35

වසරක් සඳහා
දායකත්ව ගාස්තුව - CAD $ 70

Please make all Cheques payable to **Dasatha Publications**

Dasatha Publications, 114 Chatfield Dr. Woodbridge L4H 0Z7. Ontario. Canada
Tell: 416 822 2789 Fax: 289 553 5668 Email: dasathainfo@gmail.com

**www.dasatha.com**

# BEYOND YOUR EXPECTATIONS !

## Residential & Commercial Real Estate

**BUY or SELL your HOME with me**

**For Buyers**

**I will pay your first months mortgage***

*Limited to $300.00 for Each $100,000 Mortgage

**For Sellers**

**My commission for your listing will be 0% when you Sell & buy a home with me.****

**Sellers when buying will not receive the 'first month mortgage on me' rebate in combination with the '0% commission for me' rebate for listing, however the Seller will have the choice of either or.



**5% DOWN ? No problem!**

**I will guide you through obtaining your DREAM HOME through my proven system!**

ABR ACCREDITED BUYER REPRESENTATIVE

CNE CERTIFIED NEGOTIATION EXPERT

REMAX 100% Club Award

2016, 2014, 2013, 2011, 2010

REMAX Platinum Club Award

2015, 2012

The Diamond Realty Inc Brokerage

A member of CanLanka BUSINESS ASSOCIATION

REMAX HALL OF FAME

*With me as your agent, your dreams of finding the perfect home can be made a reality!*

**New to Canada, First time Buyers, lack of down payment, Credit problems ?**

**Call me Today !**

I will be happy to guide you through the process in a professional, friendly and accountable manner.

Join the many happy home owners I've helped and find the perfect home for you!

# Gamini Abeysinghe. ABR, CNE

**Real Estate Sales Representative**

E-mail : shinko@rogers.com Office - 416 235 2500 Fax - 416 235 2828
1570 Kipling Ave(N of Eglinton) Toronto. ON M9R 2Y1

**Toll Free: 1-800 611 2882 Ext 102**

# Mobile : 416 822 2789

**www.gaminiabeysinghe.com**

• Some conditions apply. Please feel free to contact me for further details ** • Not intended as solicitation of sellers under listing contracts or buyers under buyer representation agreements

# KATPAKAM GROCERY

**TEL: 905 785 0444**

*Christmas & New Year*

ANNIVERSARY SALE

**SALE START DECEMBER 20th 2018**
**END JANUARY 15th 2019**

*Merry Christmas*
& HAPPY NEW YEAR

**To All of Our CUSTOMERS FAMILIES & FRIENDS**

| | |
|---|---|
| Coconut Milk Powder 300g | - $ 2.99 |
| Coconut Milk Powder 900g | - $ 8.99 |
| MTR Vada Mix 2 for | - $ 5.00 |
| MTR Idly Mix 2 for | - $ 5.00 |
| MTR Rava Dosa 2 for | - $ 5.00 |
| Baba's Payasam 2 for | - $ 5.00 |
| Niru payasam 2 for | - $ 4.00 |
| MD Maldive Fish 2 for | - $ 14.00 |
| IDHAYAM Sesame Oil 1L 2 for | - $ 15.00 |
| Vanga Sesame Oil 1L 2 for | - $ 12.00 |
| Niru coffee 2 for | - $ 8.00 |
| Green Jackfruit Tin 2 for | - $ 3.00 |

Devaaya Basmati 7.99 8LB

Tusk Basmati 6.99 8LB

Priya Basmati 6.99 8LB

Uruthira White Raw Rice 6.99 8LB

Kalu Dodol 4.99

All Greenmount Masalas 1.00

Dry Sprats 4.99 400g

Red Raw Rice 6.99 8LB

MD Jam 1.99

Masoor Dall 1.99 4LB

BRU Coffee 4.99

Horlicks (UK) 6.99

Harischandra Noodles 3.00 2 for

MD Cordial 8.00 2 for

Parboiled Rice 6.99 8LB

Unico Vegetable Oil 4.99

Mackerel Fish Tin 1.99

Lemon puff 1.00

Every day Special, Meat and Fish in the store (Fish from Indian Ocean)

Nestomalt 4.99

Marie Biscuit 1.99

***THANK YOU for A SUCCESSFUL BUSINESS***




## KATPAKAM GROCERY

**6970 Lisgar Drive, Unit B1, Mississauga, L5N 8C8**

**Derry/ 9th Line(Behind 7 Eleven Gas Station)**